කේ.එම්. යුහානි එම්. චතුරංගි
සහකාර ලේකම්
පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා
බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා
ජලප්‍රවහන හා සංචාරක කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
අංක: 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මහා නගර සභා ආඥාපනත
## (252 වන අධිකාරය)

---

**2014 අංක 34**

**2017 අංක 20**

**දරන සංශෝධන සහිත**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

# පෙරවදන

මහා නගර සහා ආඥාපනත (252 අධිකාරය) මෙතෙක් සිංහලෙන් පළවී නොතිබීම බලවත් අඩුපාඩුවක් විය.

නාගරික පළාත් පාලන ආයතන වල කාර්ය සාධනය වර්ධනය කිරීමට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සහ අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා දියත් කර ඇති වැඩ සටහන යටතේ එම අඩුපාඩුව සපුරාලමින් මහා නගර සභා ආඥාපනත 1987 අප්‍රේල් 16 වන දින දක්වා කර ඇති සංශෝධන අන්තර්ගත කරමින් ප්‍රථම වතාවට සිංහල භාෂාවෙන් මුද්‍රණය කිරීමට හැකිවීම නාගරික පළාත් පාලන ආයතනවලට සම්බන්ධ සා හටින් සතුටට කරුණක් වනු ඇත.

හුදෙක් පහසුවෙන් එම නීතිය හැදෑරීමට උපකාරී වනු වස් ප්‍රකාශයට පත් කරන මෙය ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් ලෙස නොසැලකිය යුතුය.

මෙම මහා නගර සභා ආඥාපනත සිංහලෙන් පළ කිරීමට උපකාරී වූ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ප්‍රධානී, එන්. ජේ. අබේසේකර මහතාටත්, විශ්‍රාමිලත් ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක එස්. ජී. එච්. සී. වංශරත්න මහතාට හා පියසිරි සමරසූරිය මහතාටත් අපගේ කෘතඥතාවය පිරිනමමු.

ආර්. පාස්කරලිංගම්,
ලේකම්,
පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය.

පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය,
" සෙත්සිරිපාය ",
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.

## 252 වන අධිකාරය

# මහා නගර සභා

**මහා නගර සභාවලට සම්බන්ධ නීතිය සංශෝධනය කිරීම හා ඒකාබද්ධ කිරීම පිණිස වූ ආඥාපනතකි.**

1947 අංක 16,
දරණ ආඥාපනත

1949 අංක 16,
1950 අංක 9,
1951 අංක 3,
1951 අංක 12,
1951 අංක 39,
1952 අංක 8,
1953 අංක 38,
1954 අංක 7,
1954 අංක 26,
1954 අංක 44,
1955 අංක 22,
1956 අංක 22,
1957 අංක 15,
1958 අංක 39,
1959 අංක 12,
1961 අංක 9,
1961 අංක 39,
1967 අංක 2,
1967 අංක 8,
1968 අංක 42,
1969 අංක 4,
1971 අංක 48,
දරණ පනත්.
1973 අංක 38,
1974 අංක 8,
1975 අංක 4,
1975 අංක 5,
1977 අංක 18,
1977 අංක 24,
දරණ ජාතික
රාජ්‍ය සභාවේ
පනත්.

1079 අංක 18,
1979 අංක 42,
1979 අංක 57,
1981 අංක 10,
1981 අංක 33,
1981 අංක 61,
1983 අංක 5,
1983 අංක 13,
1983 අංක 48,
1985 අංක 20,
1986 අංක 39,
1987 අංක 19,
දරණ පනත්

**[1947 අගෝස්තු මස 15 දින.]**

ලුහුඬු නාමය

1. මෙම ආඥාපනත මහා නගර සභා ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### මහා නගර සභා සංස්ථාපනය කිරීම

ඒ ඒ ප්‍රදේශ මහා නගර ලෙස ප්‍රකාශයට පත් කිරීමට හා ඒවායේ සීමා නිශ්චය කිරීමට ඇති බලය.

2. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින්, අමාත්‍යවරයා විසින්,—

(අ) යම් ප්‍රදේශයක් මහා නගරයක් ලෙස ප්‍රකාශයට පත් කළ හැකි ය;

(ආ) එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ මහා නගරයේ සීමා නිශ්චය කළ හැකි ය; තව ද

(ඇ) එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ මහා නගරය සඳහා සංස්ථාපනය කරනු ලබන මහා නගර සභාවට නමක් සහ නිල නාමයක් නියම කළ හැකි ය.

එක් එක් මහා නගරයට මහා නගර සභාවක් සංස්ථාපනය කළ යුතු බව.

3. 2 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් මහා නගරයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ සෑම ප්‍රදේශයක් සඳහා ම, මෙම ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව මහා නගර සභාවක් සංස්ථාපනය කළ යුතු ය.

මහා නගර සභාවලට අයත් කර්තව්‍ය.

4. එක් එක් මහා නගරය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාව, මෙම ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් වෙනත් යම් අධිකාරයකට වෙන් කරන ලද හෝ පවරන ලද බලතලවලට යටත් ව, මහජන සෞඛ්‍ය, මහජන උපයුක්තතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ සියලු කාරණා විධිමත් කිරීම ද පාලනය කිරීම ද පරිපාලනය කිරීම ද සාමාන්‍යයෙන් මහජනයාගේ සැප පහසුකම්, පහසුකම් සහ ශුභ සාධක කටයුතු හා මහා නගරයේ සුඛ විහරණ ක්‍රම ආරක්ෂා කිරීම ද ප්‍රවර්ධනය කිරීම ද භාර වූ එකී මහා නගරයේ පරිපාලන සීමා ඇතුළත් වූ පළාත් පාලන ආයතනය වන්නේ ය.

මහා නගර සභාවල සංයුතිය.
[1977 අංක 24
§ 94.]

5. (1) එක් එක් මහා නගර සභාව නගරාධිපතිවරයාගෙන් ද, නියෝජ්‍ය නගරාධිපතිවරයාගෙන් ද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් සංඛ්‍යාවකින් යුක්ත වන අනෙකුත් සභිකයන්ගෙන් ද සමන්විත විය යුතු ය.

(2) සභික සංඛ්‍යාව තීරණය කිරීමේ දී මහා නගරයේ භූමි ප්‍රමාණය ද ජනගහණය ද පිළිබඳ ව අමාත්‍යවරයා සැලකිලිමත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතු ය.

මහා නගර සභා සංස්ථාපනයට පෙර ප්‍රාරම්භක වූ වැඩ පිළිවෙල.

*7. මෙම ආඥාපනත යටතේ යම් මහා නගර සභාවක් සංස්ථාපනය කිරීමට ප්‍රාරම්භක වූ යම් වැඩ පිළිවෙළක කාර්යයන් සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් හෝ නියමයන් මඟින්, අමාත්‍යවරයා විසින්, අවශ්‍ය හෝ යෝග්‍ය වූ සියලු විධාන නිකුත් කිරීම හෝ ඔහු විසින් එකී නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අන්දමකට හෝ ප්‍රමාණයකට මෙම ආඥාපනතේ විධිවිධාන කිසිවක් මඳ වශයෙන් වෙනස් කිරීම හෝ පරිපූරණය කිරීම නීත්‍යනුකූල වන අතර, එකී සෑම නියමයක් ම මෙම ආඥාපනතෙහි ඇතුළත් කරන ලද්දක් පරිද්දෙන් ම ඉහත කී කාර්යයන් සම්බන්ධයෙන් බලපවත්වන්නේ ය.

---

## II වන කොටස

### සභිකයන් තෝරා පත්කර ගැනීම හා ඔවුන්ගේ ධුර කාලය

සභිකයන් තේරීම සඳහා පවත්වන ප්‍රථම මහා ඡන්ද විමසීම.

8. මෙම ආඥාපනත යටතේ යම් මහා නගරයක් සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබිය යුතු අවස්ථාවක දී, සභාවේ ප්‍රථම සභිකයන් තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා මහා ඡන්ද විමසීමක් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව පැවැත්විය යුතු ය.

මහා නගර සභාවල ධුර කාලය ආරම්භ වීම සහ ඒ සභා සංස්ථාපනය කිරීමේ දිනය.

9. මෙම ආඥාපනත යටතේ සංස්ථාපනය කරනු ලැබිය යුතු මහා නගර සභාවක ධුර කාලය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක දී ආරම්භ වන්නේ ය. ඒ දිනය ඒ සභාව සංස්ථාපනය කරන ලද දිනය ලෙස මේ ආඥාපනතේ සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය; 5 වන වගන්තිය යටතේ නියමිත සම්පූර්ණ සභික සංඛ්‍යාව යථා පරිදි තෝරා පත් කර ගනු ලැබ නොමැති වුව ද, සභාව ඒ දිනයේ දී යථා පරිදි සංස්ථාපනය කරනු ලැබූ සේ සැලකිය යුතු ය.

සභිකයන්ගේ ධුර කාලය.

10. (1) මහා ඡන්ද විමසීමක දී තෝරා පත් කර ගනු ලබන එක් එක් සභිකයාගේ ධුර කාලය—

(අ) ප්‍රථම මහා ඡන්ද විමසීම සම්බන්ධයෙන් වූ විට, 9 වන වගන්තිය යටතේ වූ නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයේ දී;

(ආ) ප්‍රථම මහා ඡන්ද විමසීමෙන් පසුව පවත්වනු ලබන යම් මහා ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වූ විට, ඡන්ද විමසීම පැවැත් වූ දිනයට පසුව එළඹෙන ජනවාරි මාසයේ පළමු වන දිනයේ දී හෝ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් දිනයක දී

*6 වන වගන්තිය 1977 අංක 24 දරන පනත මඟින් ඉවත් කරන ලදී.

[1986 අංක 39 §2.]

ආරම්භ විය යුතු අතර, එසේ ආරම්භ වීමෙන් පසුව ඒ සභිකයාගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතු කොට ගෙන ඔහුගේ ධුරය කලින් හිස් කරනු ලැබුවේ නම් මිස, ඒ ධුර කාලය ආරම්භ වූ දිනයේ සිට මාස හතලිස් අටක කාලයක් සඳහා ඒ සභිකයා ධුරය දැරිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්—

(අ) ධුර කාලය අවසන් වන දිනය වෙනුවට ඒ වර්ෂයේ හෝ ඒ වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ ඒ ධුර කාලය අවසන් වන මාසයට පෙරාතුව වූ යම් මාසයක දිනයක් ආදේශ කිරීම නියම කිරීමෙන් (1) වන උපවගන්තියේ සඳහන් ධුර කාලය කෙටි කළ හැකි ය ; තව ද

(ආ) (1) වන උපවගන්තිය යටතේ ධුර කාලය අවසන් වන දිනය වෙනුවට හෝ මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියම කරනු ලබන දිනය වෙනුවට, ඒ වර්ෂයේ හෝ එසේ නිශ්චිතව සඳහන් කරන ලද හෝ නියම කරන ලද වර්ෂයට ඉක්බිතිව වූ යම් වර්ෂයක ධුර කාලය අවසන් වන දිනයට පසුව වූ යම් මාසයක දිනයක් නියම කිරීමෙන් එකී ධුර කාලය දීර්ඝ කළ හැකි අතර, ඉන් පසුව, අවසාන නියමයේ නිශ්චිතව සඳහන් ධුර කාලය අවසාන වන දිනය වෙනුවට පසුව වූ යම් දිනයක් නියම කිරීමෙන් එකී ධුර කාලය කලින් කල දීර්ඝ කළ හැකි ය :

එසේ වුව ද, ඒ ධුර කාලය දීර්ඝ කරන කාල සීමාව හෝ ඒ ධුරකාලය කලින් කල දීර්ඝ කරන කාල සීමාවල එකතුව මාස දොළහකට වැඩි නොවිය යුතු ය.

තදනන්තර මහා ඡන්ද විමසීම.

**11.** මහා ඡන්ද විමසීමක දී තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ ධුර කාලය 10 වන වගන්තිය යටතේ අවසාන වීමට නියමිත අවස්ථාවක, එකී සභිකයන් වෙනුවට අලුත් සභිකයන් තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව මහා ඡන්ද විමසීමක් පැවැත්විය යුතු ය.

*13. (1) සභිකයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබූ යම් තැනැත්තකු යම් හේතුවක් නිසා සභිකයකු වශයෙන් සේවය නො කිරීමට තීරණය කළ අවස්ථාවක දී— ධුරය ප්‍රතික්ෂේප කිරීම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම.

(අ) ඔහු නගරාධිපතිවරයා නොවේ නම්—

(i) ඔහු තේරී පත් වීමෙන් පසුව පැවැත්වෙන, සභාවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කොට ඇති දිනයට පෙර යම් වේලාවක, ඔහු විසින් සභික ධුරය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ව නගරාධිපතිවරයා වෙත හෝ නගරාධිපති ධුරය හිස් ව ඇත් නම් කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත දැනුම්දීමක් කිරීමෙන් ; හෝ

(ii) ඒ ප්‍රථම රැස්වීමෙන් පසුව යම් වේලාවක, සභික ධුරයෙන් ඉල්ලා අස්වීම පිළිබඳව නගරාධිපතිවරයා වෙත හෝ නගරාධිපති ධුරය හිස්ව ඇත් නම් කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත දැනුම්දීමක් කිරීමෙන්

ඔහු විසින් සභික ධුරය අත්හැරිය හැකි ය ; නැතහොත්

(ආ) ඔහු නගරාධිපතිවරයා නම්—

(i) ඔහු තේරී පත් වීමෙන් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කොට ඇති දිනයට පෙර යම් වේලාවක, තම ධුරය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත දැනුම්දීමක් කිරීමෙන් ; හෝ

(ii) ඒ ප්‍රථම රැස්වීමට පසුව යම් වේලාවක, සිය ධුරයෙන් ඉල්ලා අස්වීම පිළිබඳව කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත දැනුම්දීමක් කිරීමෙන්

ඔහු විසින් සභික ධුරය අත්හැරිය හැකි ය.

(2) සභාවේ අවසරය කලින් නොලබා, සභාවේ අනුගාමී සාමාන්‍ය රැස්වීම් තුනකට පැමිණ සිටීම පැහැර හරින සභිකයකුගේ ධුරය, එනයින් ම, ඔහු අත්හරින්නේ ය.

(3) සභිකයකු ලෙස තේරී පත් වුණු යම් තැනැත්තකු විසින් ස්වකීය ධුරය ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඔහු ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ මිය ගියහොත් හෝ (2) වන උපවගන්තිය යටතේ ධුරය හිස් කළහොත් හෝ වෙන යම් ආකාරයකින් එකී ධුරයෙහි අනියම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, අවස්ථෝචිත පරිදි, නගරාධිපතිවරයා විසින් නැතහොත් කොමසාරිස්වරයා විසින්, ඒ බවට වූ ලිඛිත සංදේශනයක් ඡන්ද විමසීම් නිලධරයා වෙත යැවිය යුතු ය. එම සංදේශනය ලැබුණු විට පළාත් 1977 අංක 24 97.)

* 12 වන වගන්තිය 1977 අංක 24 දරන පනත මගින් ඉවත් කරන ලදී.

පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව එම පුරප්පාඩුව පිරවීමට ඒ ඡන්ද විමසීම් නිලධරයා ක්‍රියා කරගෙන යා යුතු අතර, එවිට තෝරා පත් කරනු ලබූ තැනැත්තා, ඊට පෙරාතුව වූ ඡන්ද විමසීමේ දී තෝරී පත් වුණු සභිකයන්ගේ ධුර කාලය අවසන් වන තුරු සභිකයකු ලෙස සේවය කළ යුතු ය.

---

## III වන කොටස

### රැස්වීම් හා ඒවායේ කටයුතු කරගෙන යෑම

### නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා

[1977 අංක 24 § 98].
**නගරාධිපතිවරයාවරයාගේ සහ නියෝජ්‍ය නගරාධිපති වරයාගේ ධුර කාලය.**
[1977 අංක 24 § 99.]

**11.** (1) සභිකයන් විය යුතු වූ ද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතට අනුකූල ව තෝරා පත් කරගනු ලැබිය යුතු වූ ද නගරාධිපතිවරයකු ද නියෝජ්‍ය නගරාධිපතිවරයකු ද එක් එක් මහා නගර සභාවෙහි විය යුතු ය.

(2) (අ) මහා නගර සභාවක නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා ඒ ධුරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ ඒ ධුරය හිස් කළහොත් හෝ මිස, සභාවේ ධුර කාලසීමාව තුළ ධුරය දැරිය යුතු ය.

(ආ) නගරාධිපතිවරයකු හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයකු ස්වකීය ධුරය හිස් කළ කවර අවස්ථාවක වුව ද ඔහු සභිකයකු ව සිටීම ද ඒ හා සමග ම අවසන් වන්නේ ය.

(3) මහා නගර සභාවක නගරාධිපතිවරයා 254(ආ) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර සභාව විසින් කළ යුතු යැයි හෝ ඉටු කළ යුතු යැයි මෙම ආඥාපනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් විධානය කර ඇති හෝ බලය පැවරී ඇති සියලු විධායක ක්‍රියා සහ වගකීම්, පද සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධ චේතනාවක් පෙනී යන්නේ නම් මිස, නගරාධිපතිවරයා විසින් කළ හැකි ය, නැතහොත් ඉටු කළ හැකි ය.

(4) මේ ආඥාපනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් නගරාධිපතිවරයා වෙත පිරිනැමී ඇති, නියම වී ඇති හෝ පැවරී ඇති බලතල, කටයුතු හෝ කාර්ය අතුරින් කිසිවක් නගරාධිපතිවරයා විසින් නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ කොමසාරිස්වරයාට හෝ සභාවේ යම් නිලධරයකුට හෝ ලිඛිත නියමයක් මඟින් පවරා දිය හැකි ය.

(5) නගරාධිපතිවරයාගේ නියමයක් මඟින් තමා වෙත පවරා දෙනු ලැබූ යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක් නියෝජ්‍ය නගරාධිපතිවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ වෙන යම් නිලධරයකු විසින් හෝ ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම නගරාධිපතිවරයාගේ විධානයට හා පාලනයට යටත් ව විය යුතු

අතර, එහි නියමයෙහි දැක්වෙන යම් කොන්දේසිවලට සහ සීමා කිරීම්වලට යටත් විය යුතු ද එහි දැක්වෙන කාර්යයට හෝ කාර්යයන්ට සීමා විය යුතු ද වන්නේ ය. තව ද එසින් යම් පවරා දීමක් නගරාධිපතිවරයාගේ නියමයක් මගින් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම, කිරීම හා ඉටු කිරීම කළ හැකි ය.

(6) නගරාධිපති ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ දිනයෙන් ඇරඹී නව නගරාධිපතිවරයකු තෝරා පත් කර ගනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ හෝ රෝගාතුර වීම නිසා නැතහොත් වෙන යම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා නගරාධිපතිවරයා පැමිණ නොසිටින කාල සීමාව තුළ, නියෝජ්‍ය නගරාධිපතිවරයා විසින්, නගරාධිපතිවරයා ක්‍රියාත්මක කරන, කරන හෝ ඉටු කරන බලතල, කටයුතු, කාර්ය, ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කළ හැකි ය.

(7) මහා නගර සභාවක නගරාධිපති ධුරය හිස් වූ කවර අවස්ථාවක වුව ද ඒ පුරප්පාඩුව ඇති වූ බව දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයාට සභාවේ කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. එම දැනුම්දීම ලැබුණු විට, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව එම පුරප්පාඩුව පිරවීමට ඡන්ද විමසීම් නිලධරයා ක්‍රියා කළ යුතු ය.

16.* එක් එක් නගරාධිපතිවරයා ද එක් එක් නියෝජ්‍ය නගරාධිපතිවරයා ද, ස්වකීය ධුර කාලය ඇතුළත, මහා නගරය පිහිටි පරිපාලන දිස්ත්‍රික්කය සඳහා නිල බලයෙන් පත් වූ සාමදාන විනිශ්චයකාරවරයෙකු සහ නිල නොලත් මහේස්ත්‍රාත්වරයෙක් වන්නේ ය. නගරාධිපතිවරයා හා නියෝජ්‍ය නගරාධිපතිවරයා සමාදාන විනිශ්චය කාර වරයන් හා නිල නොලත් මහේස්ත්‍රාත් වරයන් වන බව.

## රැස්වීම්

17. එක් එක් මහා නගර සභාවක කටයුතු කිරීම සඳහා අවුරුද්දක් තුළ දී සාමාන්‍ය රැස්වීම් දොළහක් පැවැත්විය යුතු ය. සභාවේ සාමාන්‍ය රැස්වීම්, මහා නගර සභා කාර්යාලයේ දී සෑම මාසයේ දී ම මුල සතියේ දී හෝ නගරාධිපතිවරයා විසින් යථායෝග්‍ය යැයි සලකනු ලබන ඊට පසුව වූ හැකි තරම් ළඟ ම දිනයක පැවැත්විය යුතු ය. සාමාන්‍ය රැස්වීම.

18. නගරාධිපතිවරයා විසින් උචිත යැයි කල්පනා කරනු ලබන කවර වූ හෝ අවස්ථාවක සභාවේ විශේෂ රැස්වීමක් මහා නගර සභා කාර්යාලයේ දී පැවැත්වීම සඳහා කැඳවිය හැකි අතර සභිකයින් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබූ ලිඛිත ඉල්ලීමක් කළ විට එසේ වූ විශේෂ රැස්වීමක් නගරාධිපතිවරයා විසින් කැඳවිය යුතු ය. විශේෂ රැස්වීම. [1977 අංක 24 § 101]

* 15 වන වගන්තිය 1977 අංක 24 දරන පනත මගින් ඉවත් කරන ලදී.

රැස්වීම පිළිබඳ දන්වීම. [1977 අංක 24 § 102.]

**19.** සභාවේ සෑම සාමාන්‍ය රැස්වීමක් හෝ විශේෂ රැස්වීමක් හෝ අඛාල ව කල් තබනු ලැබූ රැස්වීමක් පිළිබඳ ව හා එහි දී කිරීමට ඇති කටයුතු පිළිබඳ ව ලිඛිත දැනුම්දීමක් නගරාධිපතිවරයා විසින් ඒ රැස්වීමට යටත් පිරිසෙයින් දින හතරකට පෙර එක් එක් සභිකයාට භාර දීමට සැලැස්විය යුතු ය.

රැස්වීම්වල කටයුතු.

**20.** රැස්වීම් පිළිබඳ දැන්වීමෙහි සඳහන් කර නොමැති කටයුත්තක් මහා නගර සභාවේ අවසරය නොමැතිව, යම් සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමක දී ඉදිරිපත් කිරීම හෝ කිරීම මහා නගර සභාවක් විසින් නොකළ යුතු ය.

ප්‍රශ්න තීරණය කිරීම හා ගණ-පූරණය.

**21.** (1) මහා නගර සභාවක් විසින් තීරණය කිරීමට මේ ආඥා පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් බලය පවරා ඇති සියලු ප්‍රශ්න හා කරුණු යම් සාමාන්‍ය රැස්වීමකට හෝ විශේෂ රැස්වීමකට පැමිණ සිටින සහ ඡන්දය දෙන සභිකයන් අතුරින් වැඩි දෙනකුන් විසින් තීරණය කළ යුතු ය.

(2) සභාවේ යම් රැස්වීමකට එදින ධුර දරමින් සිටින සභික සංඛ්‍යාවෙන් තුනෙන් පංගුවක් පැමිණ සිටියහොත් මිස, කිසි ම කටයුත්තක් ඒ රැස්වීමේ දී නොකළ යුතු ය.

නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා සභාවේ රැස්වීම්වල මූලාසනය දරිය යුතු බව. [1977 අංක 24 § 103.]

**22.** නගරාධිපතිවරයා හෝ ඔහු නොසිටින විට නියෝජ්‍ය නගරාධිපතිවරයා හෝ සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා යන දෙදෙනා ම පැමිණ නොමැති නම්, පැමිණ සිටින සභිකයන් විසින්, රැස්වීමේ මූලාසනය දැරීම සඳහා ඔවුන් අතුරින් එක් සභිකයකු තෝරා පත් කර ගත යුතු ය.

ගණපූරණය නොමැතිවුවහොත් රැස්වීම අඛාලව කල් තැබීම.

**23.** මහා නගර සභාවක සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමක දී, ගණපූරණයට අවශ්‍ය සභික සංඛ්‍යාවක් පැමිණ නොමැති නම්, නගරාධිපතිවරයා විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන්නා වූ ද එකී රැස්වීම් දිනයේ සිට දවස් පහළොවකට පසුව නොවන්නා වූ ද දිනයකට ඒ රැස්වීම අඛාලව කල් තැබිය යුතු ය. ගණපූරණයක් තිබිණි නම් එකී රැස්වීමේ දී ඉදිරිපත් කළ හැකිව තිබුණු කටයුතු එසේ කල් තබන ලද රැස්වීමේ දී ඉදිරිපත් කොට නිම කළ යුතු ය.

රැස්වීම අඛාලව කල් තැබීම.

**24.** සභාවේ ගණපූරණයක් ඇති යම් සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමක මූලාසනය දරන නගරාධිපතිවරයා, නියෝජ්‍ය නගරාධිපතිවරයා හෝ වෙනත් සභිකයා විසින්, රැස්වීමේ කැමැත්ත ඇතිව, කලින් කල රැස්වීම අඛාලව කල් තැබිය හැකි ය: එහෙත් එසේ අඛාලව කල් තබන ලද රැස්වීමක දී, කලින් පැවැත් වූ රැස්වීමේ දී නිම නොවී ඉතිරි වූ කටයුතු හැර වෙනත් කිසි ම කටයුත්තක් සභාවේ අවසරය නොමැතිව නොකළ යුතු ය.

25. මහා නගර සභාවක රැස්වීම්වල කටයුතු පිළිබඳ වාර්තා පිළියෙල කොට ඒ වාර්තා ඇතුළත් කිරීම සඳහා තබා තිබෙන පොතක සාධාරණව ඇතුළත් කළ යුතු අතර එක් එක් රැස්වීම අවසානයේ දී නගරාධිපතිවරයා, නියෝජ්‍ය නගරාධිපතිවරයා හෝ මූලාසනය දැරූ සභිකයා විසින් ඊට අත්සන් තැබිය යුතු ය. සෑම සාධාරණ වේලාවලදී ම, සභිකයන් විසින් නොමිලයේ ද වෙනත් යම් තැනැත්තකු විසින් ගත විසිපහක ගාස්තුවක් ගෙවීමෙන් පසු ද මහා නගර සභා කාර්යාලයේ දී ඒ වාර්තා පරීක්ෂා කළ හැකි වීමට ඉඩ සලස්වා තිබිය යුතු ය. රැස්වීම්වල කටයුතු පිළිබඳ වාර්තා.

## කමිටු

26. (1) සෑම මහා නගර සභාවක් විසින් ම, එක් එක් වර්ෂයේ පළමු වරට පවත්වන ඒ සභාවේ සාමාන්‍ය රැස්වීමේ දී මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවක් ද වෙනත් ස්ථාවර කමිටු දෙකකට නොඅඩු ගණනක් ද සභාවේ සභිකයන් අතුරින් ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් තෝරා පත් කර ගත යුතු ය. ස්ථාවර කමි.

(2) යම් ස්ථාවර කමිටුවකට තෝරා පත් කර ගනු ලැබීම සඳහා නගරාධිපතිවරයා සුදුස්සෙක් නොවන්නේ ය.

(3) නගරාධිපතිවරයා නොවන සෑම සභිකයකු ම යටත් පිරිසෙයින් ස්ථාවර කමිටු එකකටවත් තෝරා පත්කර ගනු ලබන තෙක්, ස්ථාවර කමිටු එකකට වැඩි ගණනක සභික ධුරවලට තෝරා පත් කර ගනු ලැබීමට ඒ කිසි ම සභිකයෙක් සුදුස්සෙක් නොවන්නේ ය. තව ද ඒ කිසි ම සභිකයෙක් ස්ථාවර කමිටු දෙකකට වැඩි ගණනකට තෝරා පත් කර ගනු ලැබීමට කෙසේවත් සුදුස්සෙක් නොවන්නේ ය.

(4) මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව නොවන සෑම ස්ථාවර කමිටුවක්ම ඉහත කී ලෙස තෝරා පත් කරගත් සභිකයන් හය දෙනකුගෙන් සමන්විත විය යුතු ය. මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව එසේ තෝරා පත් කර ගන්නා ලද සභිකයන් පස් දෙනකුගෙන් ද නිල බලයෙන් සාමාජිකයෙකු විය යුතු නගරාධිපතිවරයාගෙන් ද සමන්විත විය යුතු ය. වර්ෂය තුළ දී යම් ස්ථාවර කමිටුවක යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, සාමාන්‍ය රැස්වීමක දී හෝ විශේෂ රැස්වීමක දී ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සභාව විසින් සභිකයකු තෝරා පත් කර ගත යුතු ය.

(5) නගරාධිපතිවරයා නිල බලයෙන් මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ සභාපති විය යුතු ය. එහෙත් අනිකුත් සෑම ස්ථාවර කමිටුවක් විසින් ම එහි ප්‍රථම රැස්වීමේ දී ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් සභාපතිවරයකු තෝරා පත් කර ගත යුතු ය.

(6) මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව නොවන ස්ථාවර කමිටු අතුරින් යම් ස්ථාවර කමිටුවක රැස්වීමකට පැමිණීම ද ඒ රැස්වීම ඇමතීම ද නගරාධිපතිවරයා විසින් කළ හැකි නමුත් එහි දී ඔහු විසින් ඡන්දය දිය නොහැකි ය. මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේත් වෙනත් ස්ථාවර කමිටුවක හෝ කමිටුවලත් යම් ඒකාබද්ධ රැස්වීමකට නගරාධිපතිවරයා පැමිණ සිටියහොත් ඔහු එහි මූලාසනය දැරිය යුතු අතර, ඒ රැස්වීම ඇමතීම ද එහි දී ඡන්දය දීම ද ඔහු විසින් කළ හැකි ය.

(7) මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ රැස්වීමකට හෝ ඒ කමිටුවේත් වෙනත් ස්ථාවර කමිටුවක හෝ කමිටුවලත් ඒකාබද්ධ රැස්වීමකට නගරාධිපතිවරයා පැමිණ නොසිටි විටක ද අනිකුත් ස්ථාවර කමිටුවකට (5) වන උපවගන්තිය යටතේ තෝරා පත් කර ගනු ලැබූ සභාපතිවරයා පැමිණ නොසිටි විටක ද, ඒ ඒ කමිටුවල සාමාජිකයන් විසින් තමන් අතුරින් කෙනකු සභාපතිවරයා වශයෙන් තෝරා පත් කර ගත යුතු ය.

(8) මහා නගර සභාව විසින් සෑම ස්ථාවර කමිටුවකට ම පවරා දෙන ලද හෝ වෙනත් ආකාරයකින් පිරිනැමී, නියම වී හෝ සතු කරනු ලැබ ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ කිරීම ඒ ස්ථාවර කමිටුව විසින් කළ යුතු ය.

(9) ස්ථාවර කමිටුවක යම් රැස්වීමක දී හෝ ස්ථාවර කමිටු දෙකක හෝ ඊට වැඩි ගණනක යම් ඒකාබද්ධ රැස්වීමක දී, නියමිත ගණපූරණය ඇති වුවහොත් මිස, කිසි ම කටයුත්තක් නොකළ යුතු ය. ස්ථාවර කමිටුවක රැස්වීමක දී නැතහොත් ස්ථාවර කමිටු දෙකක හෝ ඊට වැඩි ගණනක ඒකාබද්ධ රැස්වීමක දී තිබිය යුතු ගණපූරණය නියම කෙරෙන අතුරු ව්‍යවස්ථාවක් සභාව විසින් සාදනු තෙක්, අවස්ථාවෝචිත පරිදි, ඒ කමිටුවේ හෝ කමිටුවල සභික සංඛ්‍යාවෙන් තුනෙන් පංගුව, ගණපූරණය වන්නේ ය :

එසේ වුව ද, ඒ එක් එක් කමිටුවේ යටත් පිරිසෙයින් එක් සාමාජිකයෙකුවත් පැමිණ සිටිය යුතු ය.

(10) (1) වන උපවගන්තියේ සඳහන් ස්ථාවර කමිටු තෝරා පත් කර ගැනීම, යම් වර්ෂයක දී පවත්වනු ලබන දෙවෙනි සාමාන්‍ය රැස්වීමට අඩාලව කල් තැබිය යුතු බව යෝජනා සම්මතයක් මගින් තීරණය කිරීම සභාව විසින් කළ හැකි අතර, එකී යම් යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පසු ඒ තෝරා පත් කර ගැනීම එසේ අඩාලව කල් තැබිය යුතු ය. එවිට ඒ යෝජනා සම්මතයෙන් කරනු ලැබූ සුළු වෙනස් කිරීමට පමණක් යටත් ව, (1) වන උපවගන්තියේ සිට (4) වන උපවගන්තිය දක්වා වූ උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

**විශේෂ කමිටු.**

27. (1) මහා නගර සභාවට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් විමර්ශනයක් කොට වාර්තාවක් සැපයීමේ කාර්යය සඳහා, සුදුසු යැයි මහා නගර සභාවක් විසින් අදහස් කරනු ලබන සභික සංඛ්‍යාවකින් සමන්විත විශේෂ කමිටු කලින් කල පත් කිරීම ඒ මහා නගර සභාව විසින් කළ හැකි ය.

(2) සෑම විශේෂ කමිටුවක් ම ඒ කමිටුවේ පළමුවන රැස්වීමේ දී, ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් එහි සභාපතිවරයා තෝරා පත් කර ගත යුතු ය. සභාවට සිය වාර්තාව ඉදිරිපත් කොට එය සභාව විසින් අවසාන වශයෙන් සලකා බලනු ලබන තෙක්, ඒ කමිටුව, කමිටුවක් ලෙස නොකඩවා පැවතිය යුතු ය.

(3) විශේෂ කමිටුවක් පත් කරනු ලබන අවස්ථාවේ දී, එහි ගණපූරණය සඳහා අවශ්‍ය සභික සංඛ්‍යාව කොපමණ ද යන්න සභාව විසින් නිශ්චය කළ හැකි ය. සභාව විසින් ගණපූරණය එසේ නිශ්චය කරනු නොලැබූ අවස්ථාවක, සභික සංඛ්‍යාවෙන් තුනෙන් දෙපංගුව එම කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය විය යුතු ය.

**මුදල් පිළිබඳ කරුණු සහ මුදල් පිළිබඳ කමිටුව.**

28. මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව විසින් කලින් සලකා බලා මහා සභාවට වාර්තා කරන තෙක්, මහා නගර සභාවක් විසින් කිසි ම මුදල් පිළිබඳ කරුණක් සම්බන්ධයෙන් අවසාන වශයෙන් ක්‍රියා නොකළ යුතු ය.

**මහා නගරසභාවේ පොත්පත්, ලියවිලි ආදියේ භාරය හා කමිටු විසින් සභිකයින් විසින් ද ඒවා පරීක්ෂා කළ හැකි බව.**

29. මහා නගර සභාවක් විසින් පත් කරන ලද සෑම ස්ථාවර කමිටුවක් හෝ උපකමිටුවක් මහා නගර සභා කාර්යාලයේ දී හෝ ඒ කමිටුව විසින් තීරණය කරනු ලබන වෙනත් ස්ථානයක දී තම සෑම රැස්වීමක් ම පැවැත්විය යුතු ය. තව ද, එකී යම් කමිටුවක් විසින් එකී යම් රැස්වීමක දී සභාවේ පොත් පත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර් සහ අනිකුත් ලේඛන හෝ ලියවිලි පරීක්ෂා කළ හැකි ය.

## විවිධ කරුණු

**තීරක ඡන්දය.**

30. සභාවේ යම් සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමකට හෝ ස්ථාවර හෝ වෙනත් කමිටුවක රැස්වීමකට පැමිණ සිටින හා එහි දී ඡන්දය දෙන සභිකයන්ගේ ඡන්ද ගණන යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සම සම ව බෙදුන හොත්, නගරාධිපතිවරයාට හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ ඒ රැස්වීමේ මූලාසනය. උසුලන සභිකයාට, සභිකයකු වශයෙන් හෝ කමිටුවේ සාමාජිකයකු වශයෙන් ඔහුට හිමි ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් හිමි වන්නේ ය.

**දැන්වීම තැපැල් මාර්ගයෙන් භාර කළ හැකි බව.**

31. රැස්වීම පිළිබඳව වූ සියලු දැන්වීම්, ඒවා භාර කරනු ලැබිය යුතු සභිකයා සාමාන්‍යයෙන් පදිංචිව සිටින ස්ථානයට හෝ ඔහු අන්තිම වරට පදිංචි ව සිටි ස්ථානය වශයෙන් දන්නා ස්ථානයට තැපැලෙන් යැවිය හැකි ය. දැන්වීමක් එසේ තැපැලෙන් යැවූ

අවස්ථාවක, ඒ දැන්වීම අඩංගු ලිපිය සාමාන්‍යයෙන් තැපැල් මාර්ගයෙන් ඔහුට භාර දෙනු ලැබිය හැකි වේලාවේ දී ඒ දැන්වීම ඔහුට භාර දෙනු ලැබුවාක් මෙන් සැලකිය යුතු ය.

සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය පවරා දීම.

**32.** මෙම ආඥාපනතින් හෝ මෙම ආඥාපනත යටතේ හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ මහා නගර සභාවකට පිරිනැමී ඇති, නියම වී ඇති හෝ පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරින් යමක් යෝජනා සම්මතයක් මඟින් නගරාධිපතිවරයාට හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ කොමසාරිස්වරයාට හෝ සභාවේ නිලධරයකුට නොහොත් නිලධරයන් වැඩි දෙනකුට හෝ කමිටුවකට නැතහොත් කමිටු එකකට වැඩි ගණනකට මහා නගර සභාව විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් පවරා දිය හැකි ය.

පුරප්පාඩු පැවතීමේ හෝ සභිකයන් පැමිණ නොසිටීමේ හේතුවෙන් සභාවේ ක්‍රියා අවලංගු නොවන බව.

**33.** 21 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, මෙම ආඥාපනතේ හෝ වෙන යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ මහා නගර සභාවක් විසින් කරනු ලද හෝ නිශ්චය කරන ලද කිසිවක්, එය කරනු ලැබූ වේලාවේ දී යම් සභිකයකු සභාවට පැමිණ නොසිටීමේ හෝ සභික සංඛ්‍යාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් ම නීති විරෝධි නොහොත් නිර්බල වන ලෙස නො සැලකිය යුතු ය.

## IV වන කොටස

## මහා නගර සභාවල තත්ත්වය, බලතල හා කාර්ය

මහා නගර සභා සංස්ථා විය යුතු බව.

**34.** (1) සෑම මහා නගර සභාවක් ම, අවිච්ඡින්න අනුප්‍රාප්තියක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු ය. මෙම ආඥාපනතට යටත් ව, දේපළ අත්කර ගැනීමට, දැරීමට හා විකිණීමට එයට බලය තිබිය යුතු ය. තව ද මේ ආඥාපනත යටතේ එයට දෙන ලද නාමයෙන් හා නිල නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(2) සභාවේ පොදු මුද්‍රාව කොමසාරිස්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා සහ කොමසාරිස්වරයා ඉදිරියේ දී මිස, යම් ගිවිසුමකට හෝ වෙනත් සාධන පත්‍රයකට සභාව වෙනුවෙන් ඒ මුද්‍රාව නොතැබිය යුතු ය. තව ද ඒ නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා ද කොමසාරිස්වරයා ද ඒ මුද්‍රා තැබීම තමන් ඉදිරියේ සිදු වූ බවට සලකුණක් වශයෙන් ඒ ගිවිසුමේ හෝ වෙනත් සාධන පත්‍රයේ තම නම් අත්සන් කළ යුතු ය.

මහා නගර සභා වෙත සතු කරන ලද ඉඩම්.

**35.** මෙම ආඥාපනත යටතේ හෝ යම් ඉවත් කරන ලද ප්‍රඥප්තියක් යටතේ අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයාගේ හෝ අග්‍රාණ්ඩුකාරවරයාගේ අනුමතය ඇතිව සභාවට භාර දිය හැකි

වූ හෝ භාර දෙනු ලැබ ඇත්තා වූ ද එක් එක් මහා නගර සභාවක සීමා ඇතුළත පිහිටියා වූ ද පහත සඳහන් පංතිවලට අයත් සියලු ම නිශ්චල දේපළ, එනම්—

(අ) මූඩු බිම් ;

(ආ) කළු ගල්, බොරළු සහ කබොක් ගල් ලබා ගන්නා ගල් වලවල් ;

(ඇ) විල්, පොකුණු, ජලාශ, වැව්, ජල පීලි හා වෙනත් ජල කර්මාන්ත ස්ථාන ; සහ

(ඈ) ගොඩනැගිලි සහිත හෝ රහිත රජයේ ඉඩම්

එකී මහා නගර සභාව වෙත සතු විය යුතු ය.

එකී ඉඩම්වල පරිපාලනය ආදිය ප්‍රදානය කිරීමේ ක්‍රමය.

**36.** (1) 35 වන වගන්තිය යටතේ යම් දේපළක් භාර දීම සඳහා බලය ලත් තැනැත්තා විසින් ද සභාව වෙනුවෙන් ඒ දේපළ භාර ගැනීමට බලය ලත් මහා නගර සභාවේ නිලධරයා විසින් ද අත්සන් කරන ලද සතු කිරීමේ නියමයක්, සහතිකයක් හෝ වෙනත් ලේඛනයක්, එකී දේපළ සහ එකී දේපළෙහි සම්පූර්ණ අයිතිවාසිකම, හිමිකම හා සම්බන්ධතාව මහා නගර සභාව වෙත සතු කිරීමට ප්‍රමාණවත් විය යුතු අතර සියලු කල්හි ප්‍රමාණවත් ව තිබූ ලෙස ද සැලකිය යුතු ය:

එසේ වුව ද, 35 වන වගන්තියේ වූ කිසිවකින් හෝ මෙම වගන්තියේ ඉහතින් ඇති විධිවිධානවල වූ කිසිවකින්—

(i) එකී යම් දේපළකට රජයට ඇති යම් අයිතිවාසිකමක් නොහොත් හිමිකමක් කෙරෙහි හෝ ඒ දේපළ පොදු කාර්ය සඳහා පුනර්ග්‍රහණය කිරීමට හෝ බැහැර කිරීමට රජයට ඇති අයිතිවාසිකම කෙරෙහි බල පෑමක් හෝ හානියක් සිදුවෙතැයි : හෝ

(ii) රජය වෙනුවෙන් ඉඩම් පවරනු ලැබ ඇති යම් යුද්ධ හෝ වෙනත් අධිකාරියකට එකී යම් දේපළක් හෝ එහි යම් කොටසක් කෙරෙහි ඇති යම් අයිතිවාසිකමකට, හිමිකමකට හෝ සම්බන්ධතාවකට බල පෑමක් හෝ හානියක් සිදුවෙතැයි ; හෝ

(iii) එකී යම් දේපළක් විකිණීම හෝ අන් ලෙසකින් අන්සතු කිරීම සඳහා ජනාධිපතිවරයාගේ ලිඛිත එකඟත්වය කලින් නොලබා ඒ දේපළ විකිණීමට හෝ අන්සතු කිරීමට සභාවට බලය ලැබෙතැයි නොසැලකිය යුතු ය.

(2) නගර සභාවක් වෙත සතු කොට තිබෙන සියලු දේපළ මේ ආඥාපනතේ කාර්ය සඳහා පරිපාලනය කරනු ලැබිය යුතු අතර ඒ දේපළවල ආදායම මේ ආඥාපනතේ කාර්ය සඳහා යොදා ගැනීම ද ප්‍රයෝජනයට ගැනීම් ද කළ යුතු ය.

මහා නගර සභා වෙත සතු කරනු ලබන වෙනත් දේපළ.

37. (1) පහත සඳහන් පංතිවලට අයත් දේපළ ද මෙම ආඥා පනතේ කාර්ය සඳහා එක් එක් මහා නගර සභාවක් වෙත සතු කරනු ලැබිය යුතු ය :—

(අ) සභාව විසින් අත්සන් ගනු ලැබූ අන් ලෙසකින් සභාව වෙත පැවරුණු සියලු ම පොදු උද්‍යාන, වතු සහ එළිමහන් ස්ථාන සහ ඒවායේ ඇති සියලු ඉදිකිරීම් සහ අනිකුත් ව්‍යුහයක් සහ ඒවායේ උපකරණ ; එහෙත් ඒ දේපළ එසේ සභාව වෙත පැවරුනේ යම් භාරයක් හෝ සාධන පත්‍රයක් මගින් නම් ඒ භාරයේ නියමයන්ට හෝ ඒ සාධන පත්‍රයේ කොන්දේසිවලට, ඒ දේපළ සතු කිරීම සෑම විට ම යටත් වේ;

(ආ) මහා නගරය තුළ පිහිටි (ජනාධිපතිවරයා විසින් විශේෂයෙන් නිදහස් කරනු ලබන වීථි හැර) සියලු ම වීථි ඒවාට අයත් පදික වේදිකා, ගල් සහ අනිකුත් දේ ද ඒවා සඳහා සපයා තිබෙන සියලු ඉදිකිරීම්, ද්‍රව්‍ය, උපකරණ සහ දේවල් ද සමඟ ;

(ඇ) මහජනයාගේ යහපත හෝ පහසුව උදෙසා මෙම ආඥාපනත යටතේ ගොඩ නගනු ලැබිය හැකි, ඉදි කරනු ලැබිය හැකි හෝ සපයනු ලැබිය හැකි වූ හෝ යම් ඉවත් කරන ලද ප්‍රඥප්තියක් යටතේ ගොඩනගනු ලැබ, ඉදිකරනු ලැබ හෝ සපයනු ලැබ තිබිය හැකි වූ හෝ සභාව වෙත අන්‍යාකාරයකින් පවරනු ලැබිය හැකි හෝ පවරනු ලැබ තිබිය හැකි සියලු ම පොදු වෙළෙඳ පොළවල් සහ සියලු ම කර්මාන්ත, ඉදිකිරීම් හෝ ව්‍යුහයන් සහ ඒවා සඳහා සපයා ඇති සියලු භූමි භාග, වෙන් කළ බිම්, අනුබද්ධ දේවල්, ද්‍රව්‍ය, ලී බඩු සහ උපකරණ, ඉහත කී පරිදි වූ යම් භාරයකට හෝ කොන්දේසියකට සෑම විට ම යටත් ව ;

(ඈ) සම්පූර්ණ වියදම හෝ ඉන් කොටසක් සභාවේ මහා නගර සභා අරමුදලින් වැය කර ගොඩනගන ලද හෝ සපයන ලද හෝ සභාවට අන්‍යාකාරයකින් පවරනු ලැබිය හැකි වෙනත් සියලු ම පොදු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමි භාග, ඒවායේ අනුබද්ධ දේවල්, ද්‍රව්‍ය, ලී බඩු සහ උපකරණ, ඉහත කී පරිදි යම් භාරයකට හෝ කොන්දේසියකට සෑම විටම යටත් ව :

(ඉ) සභාව සමඟ වූ ගිවිසුමකින් අන්‍යාකාරයකින් විධිමත් කළ යුතු තාක් හෝ පෞද්ගලික දේපළ විය යුතු ලෙස හෝ පෞද්ගලික අයිතිවාසිකම්වලට යටත් විය යුතු ලෙස අන්‍යාකාරයකින් පෙනෙන තාක් හෝ හැර සභාව වෙත පවරා ඇති වීථිවල හෝ වීථි අසල හෝ විවිධවලට අයත් ව ඇති සියලු ම ලාම්පුවල, ලාම්පු කොකුවල, ලාම්පු කණුවල, හොරොව්වල, වේලිවල, නළවල, කාණුවල, දම්වැල් වළ, ජම්බාර කණුවල, පීලිවල සහ එවැනි වෙනත් ඉදිකිරීම්වල සහ දේවල්වල සහ ඒවාට අයත් වූ සියලු ම ද්‍රව්‍යවල, ලී බඩුවල සහ දේවල්වල අයිතිය.

(2) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයෙහි සඳහන් යම් පද්ධතියක්, කලින් කල සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සභාව විසින් කළ හැකි අතර, එවැනි විකිණීමකින් හෝ බැහැර කිරීමකින් ලැබෙන ආදායම්, මහා නගර සභා අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

ස්මාරක පිහිටුවීම පාලනය කිරීම. [1975 අංක 4 § 7.]

37අ. යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අමාත්‍යවරයා විසින් දෙන ලද පූර්ව අනුමතය ඇතිව මිස කිසි ම තැනැත්තකු විසින් රජයට අයිති යම් ඉඩමක හෝ යම් මහා නගර සභාවක් වෙත සතු කර ඇති හෝ යම් මහ නගර සභාවකට අයිති යම් ඉඩමක ස්මාරකයක් පිහිටුවීම නොකළ යුතු ය.

[1975 අංක 4 § 9.

මේ වගන්තියෙහි "ස්මාරකය" යන්නට ජීවත් වන හෝ මිය ගිය යම් තැනැත්තකු සිහි කිරීම පිණිස පිහිටුවනු ලබන යම් ස්මාරකයක්, කුළුණක්, කණුවක් හෝ යම් ඉදිකිරීමක් ඇතුළත් වන නමුදු යම් සුසාන භූමියක හෝ ජිනී පිටියක පිහිටුවනු ලබන යම් ඉදිකිරීමක්, සොහොන් කොතක් හෝ කුරුසියක් ඊට ඇතුළත් නොවේ.

ප්‍රසිද්ධ උද්‍යාන ආදිය නම්කිරීම. [1975 අංක 4 § 8.]

37ආ. අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව මිස යම් මහා නගර සභාවක් විසින් යම් ප්‍රසිද්ධ උද්‍යානයක්, ක්‍රීඩා පිටියක්, පුස්තකාලයක්, කියවීම් ශාලාවක්, ක්‍රීඩාංගනයක්, ඔරලෝසු කණුවක්, පාලමක් හෝ නාන ළිඳක් නම් කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය.

යම් පොදු කාර්යයක් සඳහා භාරකරුවකු වශයෙන් ක්‍රියා කිරීමට ඇති බලය.

38. මහා නගරයක නිවැසියන්ගේ හෝ ඒ නිවැසියන්ගෙන් යම් කොටසකගේ ශුභ සිද්ධිය සඳහා හෝ සභාව විසින් පරිපාලනය කරනු ලබන යම් පොදු සේවයක කාර්ය සඳහා යම් දේපළක් ලබා ගෙන එය භාරකාරත්වයේ තබා ගැනීම මහා නගර සභාවක් විසින් කළ හැකිය. තව ද යම් පොදු කාර්යයක් වෙනුවෙන් භාරකරුවකු ලෙස කටයුතු කිරීම ද ඒ සභාව විසින් කළ හැකිය.

ශ්‍රී ලංකාවෙන් පිටත අනුයෝජිතයන් පත් කිරීමට ඇති බලය

39. (1) යම් කෘත්‍යයක් හෝ සේවයක් ක්‍රියාවේ යෙදවීම හෝ ඉටු කිරීම සඳහා ද යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය සැපයීම සඳහා ද ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින හෝ ව්‍යාපාර කරගෙන යන තැනැත්තන් සමග සභාව වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීම පිණිස යෝජනා සම්මතයක් මගින් ශ්‍රී ලංකාවෙන් පිටත සිටින අනුයෝජිතයකු හෝ අනුයෝජිතයන් පත් කිරීම යම් වේලාවක දී මහා නගර සභාව විසින් කළ හැකි ය.

(2) එකී යම් පත් කිරීමක් සභාව විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක්, සභාව විසින් ඉල්ලා සිටින අවස්ථාවල දී සභාව වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමට එසේ පත් කරනු ලැබූ අනුයෝජිතයාට හෝ අනුයෝජිතයන්ට ඒ පත් කිරීමෙන් බලය පැවරෙන්නේ ය.

සාමාන්‍ය බලතල.

40. (1) මේ ආඥාපනත යටතේ වූ ස්වකීය කාර්ය ඉටු කිරීමේ කාර්යය සඳහා මහා නගර සභාවකට, (එයට විශේෂයෙන් පවරා

ඇති වෙනත් යම් බලතලවලට හානියක් නොමැති ව) පහත සඳහන් කටයුතු කිරීමේ බලතල තිබිය යුත්තේ ය:—

(අ) අවශ්‍ය යැයි මහා නගර සභාව විසින් සලකනු ලබන තනතුරු සහ ධුර ඇති කිරීම;

(ආ) පළාත් පාලන සේවයේ තනතුරක් නොවන, සභාවේ සේවයේ යම් තනතුරකට, සුදුසු යැයි සභාව විසින් කල්පනා කරනු ලබන වැටුප්, දීමනා හෝ පාරිශ්‍රමික නියම කිරීම;

(ඇ) (ආ) ඡේදයෙහි සඳහන් තනතුරුවලට සහ ධුරවලට පත් වීම් දීම;

(ඈ) පළාත් පාලන සේවයේ සාමාජිකයකු නොවන සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු, මේ ආඥාපනතේ ප්‍රකාශිතව ම වූ විධිවිධානවලට යටත් ව, සේවයෙන් ඉවත් කිරීම;

*(ඉ) (3) වන උපවගන්තියේ අන්‍යාකාර විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි හැර, සභාවේ සේවයේ වූ යම් තනතුරක් හෝ ධුරයක්, ඒ තනතුර හෝ ධුරය පළාත් පාලන සේවයේ තනතුරක් වුව ද නොවුව ද අහෝසි කිරීම;

(ඊ) ඉහත සඳහන් ඉඩම් හෝ ගොඩනැගිලි සමස්ත වශයෙන් ම හෝ කොටස් කර හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම හෝ අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව ප්‍රසිද්ධ වෙන්දේසියේ නොවන වෙනත් ආකාරයකින් විකිණීම හෝ බදු දීම:—

(i) ජනාධිපතිවරයාගේ පූර්ව අනුමතය සභාව විසින් කලින් ලබා ගෙන ඇත් නම්, 35 වන හෝ 37 වන වගන්තිය ප්‍රකාර සභාව වෙත සතු වී ඇති යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්, සහ

(ii) සභාවේ වෙනත් යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් සභාව වෙත සතු වූයේ හෝ පැවරුණේ යම් සාධන පත්‍රයක් මගින් ද ඒ සාධන පත්‍රයෙන් ම ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල විකිණීම තහනම් කර ඇත මිස, ඒ සාධන පත්‍රයේ නියමයන්ට හා කොන්දේසිවලට යටත් ව, එකී යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්;

(උ) මේ ආඥාපනතේ ප්‍රකාශිතව ම ඇති විධිවිධානවලට යටත් ව, යම් වැඩක් කිරීම, යම් සේවා සැලසීම හෝ යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය සැපයීම සඳහා යම් තැනැත්තකු සමග ගිවිසුම් කට ඇතුළත් වීම;

*පළාත් පාලන සේවා පනතේ 19 (2) වන වගන්තිය ද බලන්න.

(ඐ) යම් කාර්යයක් සඳහා අනන්‍ය හෝ එසේ නොවූ බලපත්‍රයක් හෝ අනුග්‍රහයක් යම් කාල පරිච්ඡේදයක් සඳහා යම් ප්‍රතිඥාවක් මත සහ සුදුසු යැයි සභාව විසින් සලකනු ලබන නියමයන්ට හා කොන්දේසිවලට යටත් ව යම් තැනැත්තකුට, ව්‍යාපාර ආයතනයකට, සමාගමකට හෝ සංස්ථාවකට අමාත්‍යවරයාගෙන් කලින් ලබා ගත් අනුමතය ඇතිව ප්‍රදානය කිරීම ;

(එ) කරදර අනාවරණය කර ගැනීම සහ නතර කිරීම සඳහාත් මේ ආඥාපනත හෝ එය යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා, රීති හෝ නියෝග උල්ලංඝනය කිරීම් අනාවරණය කර ගැනීම, ඒවා වැළැක්වීම සහ නතර කිරීම සඳහාත් ස්ථානවල හෝ ගොඩනැගිලිවල අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් පැහැර හරිනු ලැබ ඇති හෝ පැහැර හරිනු ලැබ ඇතැයි සැලකිය හැකි වූ ද කළ යුතු බව මේ ආඥාපනතින් හෝ එය යටතේ නියමිත වූ ද ක්‍රියා ඉටු කිරීම සඳහාත් අවශ්‍ය වන්නාවූ පරිදි ඒ වෙනුවෙන් බලය පවරා ඇති සභාවේ නිලධරයන් සහ ඔවුන් කැටුව යන සේවකයන් සහ කම්කරුවන් ඒ ස්ථානවලට හෝ ගොඩනැගිලිවලට ඇතුළු වීමට සැලැස්වීම හා ඔවුන් ලවා එහි පරීක්ෂා කිරීම් කරවීම ;

(ඒ) මේ පනතේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය යැයි නගරාධිපතිවරයා විසින් සලකනු ලබන සියලු විභාග, නගරාධිපතිවරයා විසින් හෝ ඒ විභාග පැවැත්වීම සඳහා නගරාධිපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධරයකු විසින්, පැවැත්වීම සහ ඒ සියලු විභාගවල කාර්ය සඳහා දිවුරවීම සහ සාක්ෂිකරුවන් කැඳවීම ;

(ඔ) සභාවේ හෝ මහජනයාගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ හෝ ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා නැතහොත් සභාවේ නිලධරයන් හෝ සභිකයන් සිය කාර්ය ඉටු කිරීමේදී, හෝ ඉටු කිරීමට අදහස් කරන අවස්ථාවල දී ඔවුන් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි සභාව විසින් සලකනු ලබන යම් නඩු කටයුතු පැවරීම හා එවැනි නඩු කටයුතුවල දී විත්ති වාචක ඉදිරිපත් කිරීම;

(ඔඔ) මහා නගර සභා ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක සීමා ඇතුළත ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සංස්ථාපිත සංවර්ධන සභාව විසින් ඒ මහා නගර සභාව වෙත පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, සහ ඉටු කිරීම; තවද, ඒ සංවර්ධන සභාව විසින් ක්‍රියාවේ යෙදීම සඳහා මහා නගර සභාව වෙත භාරදෙන ලද යම් වැඩක් හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාවේ යෙදීම; [1987 අංක 19§ 2]

(ඔ) මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට යම් අය වැය ලේඛනයක් හෝ පරිපූරක අය වැය ලේඛනයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම ;

(ක) ස්ථාවර කමිටුවලින් ඉදිරිපත් කෙරෙන නිර්දේශ සලකා බැලීම, වියදම් ප්‍රමාණය අඩු කිරීම, හෝ වැඩි කිරීම ; අය වැය ලේඛනයේ එක් වැය ශීර්ෂයක් යටතට වෙන් කරන ලද මුදල් වෙනත් වැය ශීර්ෂයකට මාරු කිරීම ;

(ග) වාර්ෂික පරිපාලන වාර්තාව සලකා බැලීම සහ එය අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ ඊට එකතු කිරීම ;

(ච) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ භාරගත යුතු වැඩ හෝ පොදු සේවා සඳහා ණය ලබා ගැනීම හෝ, ඒ වැඩ හෝ සේවා කිසිවක කාර්ය සඳහා හෝ ඒ වැඩ හෝ සේවා සම්බන්ධයෙන් හෝ අවශ්‍ය වන යම් ඉඩමක් හෝ ගොඩනැගිලි අත් කර ගැනීම සඳහා හෝ එකී යම් පොදු සේවයක කාර්ය සඳහා අවශ්‍ය යම් යන්ත්‍ර සූත්‍ර, පිරියත් හෝ උපකරණ අත් කර ගැනීම සඳහා හෝ ණය ලබා ගැනීම අනුමත කිරීම ;

(ජ) මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ලැබීම් සහ වියපැහැදම් පිළිබඳ වාර වාර්තා සහ කරන ලද වැඩ පිළිබඳ ප්‍රගති වාර්තා සලකා බැලීම සහ සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන යෝජනා ඒ සම්බන්ධයෙන් සම්මත කර ගැනීම ;

(ට) මහා නගර සභාවේ යම් වැඩ නොසලකා හැරීමක් කෙරෙහි හෝ මහා නගර සභාවේ දේපළවල යම් නාස්තියක් කෙරෙහි හෝ යම් සභිකයකු විසින් පෞද්ගලික ව දැනුම් දුන් පරිදි වූ හෝ නිවැසියන් විසින් ඔහු වෙත දැනුම් දෙන ලද පරිදි වූ යම් ප්‍රදේශයක විශේෂ අවශ්‍යතා කෙරෙහි නගරාධිපතිවරයාගේ අවධානය යොමු කිරීම සහ සුදුසු යැයි පෙනී යන වැඩිදියුණු කිරීම යෝජනා කිරීම ;

(ඩ) මහා නගර සභා අරමුදල පිළිබඳ ව සාමාන්‍ය ප්‍රශ්න හෝ මේ ආඥාපනතින් බලය දෙනු ලැබ ඇති කාර්යයන්ට අදාළව අලුත් වැඩ පිළිවෙලවල් හෝ ඉදිරිපත් කිරීම ;

[1987 අංක 19 § 2] (ඩඩ) මහ නගර සභා ප්‍රදේශයේ වාසය කරන්නන් සඳහා සේවා නියුක්ති වැඩ සටහන් සංවිධානය කිරීම ;

[1987 අංක 19 § 2] (ඩඩඩ) (i) මහ නගර සභා ප්‍රදේශය ඇතුළත ගොඩනැගිලි, ගෘහ භාණ්ඩ, ක්‍රීඩා භූමි, නේවාසිකාගාර, ගුරු නිල නිවාස, ක්‍රීඩා උපකරණ සහ පුස්තකාල පහසුකම් වැනි අධ්‍යාපන පහසුකම් සඳහා වූ වැඩ සටහනක් පිළියෙල කර, උචිත බලධරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ii) මහා නගර සභා ප්‍රදේශය ඇතුළත වූ පාසල් විවෘත කිරීම, වසා දැමීම, ඒකාබද්ධ කිරීම, නම් කිරීම සහ උසස් කිරීම සම්බන්ධයෙන් උචිත බලධරයාට නිර්දේශ කිරීම ;

(ණ) මේ ආඥාපනතේ කාර්ය සඳහා, මහා නගර සභාවේ ඉඩම් අනුයෝජනය කිරීමට හෝ ඉඩම් අත් කර ගැනීමට අනුමතය දීම :

(ත) කවර හෝ තැනැත්තකුට විරුද්ධව සභාව විසින් ලබාගත් යම් අධිකරණ තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් ක්‍රියාවේ යෙදවීමේ දී විකිණිය හැකි යම් ඉඩමක් හෝ වෙනත් නිශ්චල දේපළක් මිලයට ගැනීම සහ එය නැවත විකිණීම;

(ද) පහත සඳහන් පොදු සේවා අතුරින් කිසිවක් ඇති කිරීම සහ පවත්වා ගෙන යැම :—

(i) ජල සම්පාදනය,

(ii) වීථි, පොදු ස්ථාන සහ පොදු ගොඩනැගිලි ආලෝකමත් කිරීම,

(iii) විදුලි ආලෝකය හෝ විදුලි බලය සැපයීම,

(iv) වෙළෙඳපොලවල්,

(v) පොදු නාන ගෙවල්, නාන ස්ථාන, රෙදි සෝදන ස්ථාන සහ සතුන් නාවන ස්ථාන,

(vi) අදාළ සේවය ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව වෙනත් යම් නීතියකින් කර ඇති තහනම් කිරීම්වලට හා සීමා කිරීම්වලට යටත්ව වෙනත් යම් ආකාරයක පොදු සේවයක් ;

(දද) 154අ වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවක් විසින් පිළියෙළ කරනු ලබන යෝජනා ක්‍රමයකට අනුකූලව, ඒ කමිටුව විසින් කරනු ලබන නිර්දේශයක් මත දිවි ගැන්වීමේ දීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලබන යම් නිවාස ස්ථානයක පදිංචිකරුවන්ට ඒ ගෙවීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබීම ; [1981 අංක 61 § 2]

(දදද) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය සහිතව—

(i) මහා නගර සභා ආඥාපනත හා නගර සභා ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් මහා නගර සභාවක් හෝ නගර සභාවක් මගින් පිහිටුවා නඩත්තු කරනු ලැබිය හැකි, අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා හෝ මහජන උපයෝගිතා සේවා සඳහා අවශ්‍ය විය හැකි යන්ත්‍ර, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය හා බඩු සෑදීම හා නිෂ්පාදනය කිරීම සඳහා වානිජ හා කාර්මික ව්‍යවසායවල නියුක්ත වීම ; හා [1986 අංක 39 § 3.]

(ii) ඒ යන්ත්‍ර, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය හෝ බඩු වෙනත් යම් මහා නගර සභාවකට හෝ නගර සභාවකට හෝ මහජනයාට හෝ සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි හා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි මිළට විකිණීම ;

(න) මේ ආඥාපනතේ කාර්ය සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීම, ඉවත් කිරිම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම ;

(ප) සාමාන්‍යයෙන් සභාවේ බලතල සහ කාර්ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු දේ කිරීම ;

(2) මහා නගර සභාවක් විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් විකිණීමකින් හෝ බදු දීමකින් ලැබෙන මුදල මහා නගර සභා අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, මහ නගර සභා කොමසාරිස් හෝ නාගරික මහෙස්ත්‍රාත් ධුරය අහෝසි කිරීමට (1) (ඉ) උපවගන්තියේ කිසිවකින් මහා නගර සභාවල බලය ලැබෙන සේ සලකනු හෝ තේරුම්ගනු නොලැබිය යුතු ය.

වානිජ හා කාර්මික ව්‍යවසාය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල. [1983 අංක 13 §3.]

**40අ.** (1) අමාත්‍යවරයා විසින් 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (දදද) ඡේදය යටතේ යම් වානිජ හෝ කාර්මික ව්‍යවසායක්--

(අ) ඒ ව්‍යවසායේ ආර්ථික ජීව්‍යතාවය ;

(ආ) ඒ ව්‍යවසාය ක්‍රියාත්මක වීමෙන් යම් මහා නගර සභාවකට හා මහජනයාට අත්විය හැකි ප්‍රතිලාභ ;

(ඇ) ඒ ව්‍යවසායේ නියුක්ත මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සලකා බැලීමෙන් පසු අනුමත කරනු ලැබිය හැකිය.

(2) 185 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පාර්ලිමේන්තුව විසින් මහා නගර සභාවකට වෙන් කරන ලද කිසිම මුදල් ප්‍රමාණයක් හා 185 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් මහා නගර සභාවකට වෙන් කරන ලද කිසිම ප්‍රදානයක් යම් වානිජ හෝ කාර්මික ව්‍යවසායක් පිහිටුවීමේ හෝ නඩත්තු කිරීමේ කාර්ය සඳහා ඒ සභාව විසින් ප්‍රයෝජනයට නොගත යුතුය.

(3) නොමනා ලෙස පාලනය කිරීමේ හේතුවෙන් යම් මහා නගර සභාවක යම් වානිජ හෝ කාර්මික ව්‍යවසායක් නොකඩවා ක්‍රියාත්මක කිරීම ඒ සභාවේ යහපතට හානිකර විය හැකි බව හෝ සභාවට මූල්‍ය පාඩුවක් වීමට ඉඩ ඇති බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් සභාවේ අදහස් විමසීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් ඒ ව්‍යවසාය

ක්‍රියාත්මක කිරීම අවසන් කොට ව්‍යවසායේ සියලු පොත්, ලේඛන හා වත්කම් තම භාරයට ගෙන ඒ නියමය බලාත්මක කිරීමට අවශ්‍ය විය හැකි පියවර ගැනීමට සභාවට විධානය කරනු ලැබිය හැකිය.

(4) අමාත්‍යවරයා විසින් කලින් කල යම් වානිජ හෝ කාර්මික ව්‍යවසායක නියුක්ත වී සිටින යම් මහා නගර සභාවකට එහි ව්‍යාපාරය පවත්වා ගෙනයාම හෝ ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

(5) අමාත්‍යවරයා විසින් කලින් කල ඔහු විසින් නියම කරනු ලබන ආකෘති පත්‍රයක, ව්‍යවසායේ ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්තා ගිණුම් හා වෙනත් තොරතුරු සැපයීමට සභාවට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, සභාව විසින් ඒ සෑම විධානයක්ම ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

41. මහා නගර සභාවක් පාර්ශ්වකරුවකු වන, නිශ්චල දේපළ එලව බල පෑහ යම් විනිශ්චයකට, බද්දකට, උකසකට, නිදහස් කිරීමකට හෝ වෙනත් එකඟවීමකට හෝ ගිවිසුමකට වංචා වැළැක්වීමේ ආඥාපනතෙහි කිසි ම විධිවිධානයක් අදාළ නොවිය යුතුය. වංචා වැළැක්වීමේ ආඥාපණත අදළ නොවිය යුතු බව.

42. (1) පෞද්ගලික ඉඩම්, ගොඩනැගිලි හෝ ස්ථාන කිසිවක් පරීක්ෂා කිරීම හෝ මැනීම යම් මහා නගර සභා කාර්යයක් සඳහා අවශ්‍ය ව ඇති බව මහා නගර සභාවකට පෙනී යන කවර අවස්ථාවක දී වුව ද, ඒ මැනීම කිරීමට සභාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට සභාව විසින් විධාන කිරීම නිත්‍යානුකූල වන අතර ඉන් පසු ඒ නිලධරයා හෝ සේවකයා ඔහුගේ කම්කරුවන් සමග එකී ස්ථානයට ඇතුළු වී එහි දී පහත සඳහන් කවර හෝ ක්‍රියාවක් කිරීම ද නිත්‍යානුකූල වන්නේ ය :— මැනුම් ආදිය සඳහා බලය පැවරීමේ බලය.

(අ) ඒ ඉඩම මැනීම සහ එහි මට්ටම් ගැනීම ;

(ආ) යටිපස කැණීම හෝ විදීම :

(ඇ) ඉඩම එකී කාර්යය සඳහා සුදුසුදැයි නිශ්චය කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම ;

(ඈ) අත්කර ගැනීමට ඇති යම් ඉඩමක මායිම් හෝ වීථි රේඛා හෝ කිරීමට යෝජිත යම් වැඩක රේඛන දැක්වීම ;

(ඉ) එකී මට්ටම්, මායිම් හෝ රේඛා, එහි ඇති ගොඩනැගිලිවල, ගස්වල, කානුවල, බිත්තිවල, වැටවල්වල හෝ වෙනත් සවිකර ඇති වස්තුවල අවශ්‍ය වන අන්දමට ස්ථාවර සලකුණු යෙදීමෙන් හෝ අගල් කැපීමෙන් ලකුණු කිරීම ;

(ඊ) මැනීමක් සම්පූර්ණ කිරීම හෝ මට්ටම් ගැනීම් හෝ මායිම් සහ රේඛා ලකුණු කිරීම, ඊට බාධකව ඇති යම් යම් දේවල් කපා නොහෙලා හෝ ඉවත් නොකර, කළ නොහැකි වන අවස්ථාවක එබඳු යම් බාධකයක් කපා හෙලීම හෝ ඉවත් කිරීම :

එසේ වුවද, ඒ නිසා සිදු වන යම් අලාභයක් වෙනුවෙන් සම්පූර්ණ වන්දි ගෙවනු ලැබිය යුතුය ;

එසේම තව දුරටත්, යම් ගොඩනැගිල්ලක් තුළට හෝ යම් වාසස්ථානයකට සම්බන්ධ යම් කොටු කළ ප්‍රදේශයකට හෝ ඇතුළු වීම, එහි පදිංචිකරුගේ කැමැත්ත ඇතිව හැර), එසේ ඇතුළු වීමට අදහස් කර ඇති බව ඒ පදිංචිකරුට යටත් පිරිසෙයින් දින තුනකටවත් කලින් දැනුම් නොදී, නොකළ යුතුය.

(2) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ සවි කර ඇති සෑම සළකුණක්ම සභාවේ දේපළ ලෙස සලකනු ලැබිය යුතුය.

**බලය නොලත් ගොඩනැගිලි කඩා දැමීම.**
[1957 අංක 15 §2. ]

42අ. (1) යම් බලය නොලත් ගොඩනැගිල්ලක් කඩා දමන ලෙස විධානය කෙරෙන ලිඛිත දැන්වීමක් මහා නගර සභාවක නගරාධිපතිවරයා විසින් ඒ ගොඩනැගිල්ලේ පදිංචිකරුට භාරදීමට සැලැස්විය හැකිය.

(2) බලය නොලත් ගොඩනැගිල්ලක පදිංචිකරු විසින් (1) වන උපවගන්තිය යටතේ භාර දෙන ලද දැන්වීමක් අනුව ක්‍රියා කිරීම, ඒ දැන්වීම භාර දුන් දිනයේ සිට දවස් දහහතරක් ඇතුළත දී සිදු වී නොමැති අවස්ථාවක, නගරාධිපතිවරයා විසින් ඒ ගොඩනැගිල්ල කඩා දැමීමට සැලැස්විය හැකි අතර, නගරාධිපතිවරයාගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඒ ගොඩනැගිල්ල පිහිටි ඉඩමට ඇතුළු වී ඒ කඩා දැමීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු ක්‍රියා කළ හැකිය.

(3) 68 වන වගන්තියේ විධිවිධාන, 67 වන වගන්තිය යටතේ බිඳ හෙළන ලද යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් අදාළ වන ආකාරයටම හා ඒ තාක් දුරටම, (2) වන උපවගන්තිය යටතේ කඩා දමන ලද, යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් ද අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේ ය.

(4) (2) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව කිසිම නඩුවක් හෝ නඩු කටයුත්තක් නොපැවරිය යුතු අතර, එවැනි ක්‍රියාවක් නිසා ඇති වූ යම් හානියකට හෝ අලාභයකට වන්දි ලැබීමට කිසි ම තැනැත්තෙක් හිමිකම් නොලබන්නේ ය.

(5) මේ වගන්තියෙහි "බලය නොලත් ගොඩනැගිල්ලක්" යන යෙදුමෙන්, රජයට අයත් හෝ රජය වෙත සතු කරන ලද හෝ මහා නගර සභාවකට අයත් හෝ මහා නගර සභාවක් වෙත සතු කරන ලද හෝ මහා නගර සභාවකට අයත් හෝ මහා නගර සභාවක් වෙත සතු කරන ලද යම් ඉඩමක, අවිච්ඡින්නව පරිදි, රජය හෝ ඒ සභාව විසින් හෝ රජය හෝ ඒ සභාව වෙනුවෙන් කලින් දෙන ලද අවසරය නොමැතිව ගොඩනගන ලද්දා වූ ද සභාවේ පරිපාලන සීමා ඇතුළත පිහිටියා වූ ද යම් ගොඩනැගිල්ලක් අදහස් වේ.

43. (1) මහා නගර සභාවේ වැඩ කටයුතු කිරීම සඳහා කාර්යාලයක් මහා නගර සභාව විසින් මහා නගරය ඇතුළත පිහිටුවා පවත්වාගෙන යා යුතුය. ඒ කාර්යාලය "මහා නගර සභා කාර්යාලය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

මහා නගර සභා කාර්යාලය.

(2) පෙත්සම් ලබා ගැනීම සඳහා පෙට්ටියක් ද, ඒ පෙත්සම් ලේඛනගත කිරීම සඳහා සහ නිසි නිලධරයා විසින් විභාගයක් පවත්වා, ඒ සම්බන්ධයෙන් කරන ලද නියමයන් ලේඛනගත කිරීම සඳහා පොතක් ද මහා නගර සභා කාර්යාලයේ වැඩ කරන සියලු වේලාවන් තුළ දී එහි තබා තිබිය යුතුය.

44. යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් යොදවනු ලබන කාර්ය සඳහාත් නොකොට, සභාවක් විසින් සභාවේ පොදු කාර්ය සඳහා ඉඩම් හෝ ගොඩනැගිලි අත් කර ගත හැකිය.

සාමාන්‍ය පොදු කාර්ය සඳහා ඉඩම් හෝ ගොඩනැගිලි අත්කර ගැනීම.

45. මහා නගර සභාවේ කාර්ය සඳහා අවශ්‍ය වූ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්, ඉඩම් අත් කර ගැනීමේ පනත යටතේ ආණ්ඩුව විසින්, මහා නගර සභාව සඳහා අත් කර ගත හැකි ය.

ඉඩම් සහ ගොඩනැගිලි අනිවාර්යයෙන් අත්කර ගැනීම.

46. සෑම මහා නගර සභාවකටම එහි පරිපාලනය සීමා ඇතුළත පහත සඳහන් කාර්ය පැවරේ:—

සභාවේ සාමාන්‍ය කාර්ය.

(අ) සභාව වෙත සතුව ඇති හෝ එහි කළමනාකාරිත්වය යටතට පත් ව ඇති සියලු පොදු වීදි සහ එළිමහන් භූමි නඩත්තු කිරීම සහ ශුද්ධ පවිත්‍ර කිරීම;

(ආ) සියලු පෞද්ගලික වීදි නිසි සේ නඩත්තු කරන ලෙස, ශුද්ධ පවිත්‍ර කරන ලෙස හා අලුත්වැඩියා කරන ලෙස බල කිරීම;

(ඇ) වීදි සැලසුම් කොට පළල් කිරීමෙනුත්, එළිමහන් භූමි වෙන් කිරීමෙනුත් පොදු වැඩ දියුණු කිරීම් සැලසීමෙනුත් මහා නගරයේ වර්ධනය සහ දියුණුව සැලැස්වීම හා එය අධීක්ෂණය කිරීම;

(ඈ) සියලු කරදර නතර කිරීම;

(ඉ) පවත්වාගෙන යෑමට මේ ආඥාපනත යටතේ සභාවට බලය ලැබී ඇත්තා වූ ද මහජනයාගේ ශුභ සිද්ධිය, සැප විහරණය සහ පහසුව සඳහා අවශ්‍ය වූ ද යම් පොදු උපයෝගී සේවාවක් (සභාවේ සම්පත්වල ප්‍රමාණය අනුව) පිහිටුවා පවත්වාගෙන යෑම;

(ඊ) පොදුවේ මහජන සෞඛ්‍යය, ශුභ සාධනය සහ සැප විහරණය ද මහා නගරයේ දියුණුව, සනීපාරක්ෂාව සහ පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

## V වන කොටස

### වීථි සම්බන්ධ බලතල සහ කාර්ය

#### වීථි

අලුත් වීථි තැනීමෙ සහ පවත්නා වීථි වැඩි දියුණු කිරීමෙ බලතල.

47. මේ ආඥාපනතේ විධිවිධානවලට යටත් ව—

(අ) අලුත් වීථි, පාලම් හෝ උමං සළකුණු කිරීම හා තැනීම ;

(ආ) මංමාවත් ආඥාපනත අදාළ නොවන්නා වූ යම් වීථියක් ද මංමාවත් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමතය ඇති ව වෙනත් කවර හෝ වීථියක් ද සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් පළල් කිරීම, විවෘත කිරීම, විශාල කිරීම හෝ අන්‍යාකාරයකින් වැඩි දියුණු කිරීම, හැරවීම, විපථ කිරීම, නතර කිරීම හෝ වැසීම,

ඒ කාර්ය සඳහා අවශ්‍ය යම් දේපළක අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට හෝ එයින් ස්වකීය නීත්‍යනුකූල අයිතිවාසිකම් කඩ වුණු යම් තැනැත්තකුට නිසි වන්දි ගෙවා, මහා නගර සභාවක් විසින් කළ හැකි ය.

විපථ කිරීම හෝ විශාල කිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත් කර ගැනීම.

48. (1) යම් වීථියක් සලකුණු කිරීම, හැරවීම, විපථ කිරීම, පළල් කිරීම, විවෘත කිරීම, විශාල කිරීම හෝ වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු ගේ ඉඩමක් පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීම යම් මහා නගර සභාවකට අවශ්‍ය වුව හොත්, එකී ඉඩම සඳහා සහ එහි ඇති යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරකඩක්, වැටක් හෝ ගසක් සඳහා ගෙවිය යුතු වන්දිය, කලින් තිබූ වීථියේ භූමිය හෝ ඉන් කොටසක් සන්තකයට ගැනීමට ඉඩ දීමෙන් හෝ හුවමාරුවක් වශයෙන් වෙනත් ඉඩමක් දීමෙන් හෝ මෙකී ක්‍රම දෙකක් හෝ ඊට වැඩි ගණනකින් ගෙවීමට සැලැස්වීම සඳහා ඒ සභාව විසින් අයිතිකරු සමග එකඟවීමට එළඹීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ එකඟවීමක් අනුව මහා නගර සභාවක් විසින් සන්තකය ලබා ගත් ඉඩමක්, එහි යම් විධිමත් පැවරීමක් නොමැති ව සභාව වෙත සතු වන අතර, (1) වන උපවගන්තිය යටතේ වූ එකඟවීමක් මත, කලින් තිබූ වීථියක භූමියෙන් කොටසක් හෝ හුවමාරුවක් වශයෙන් දුන් යම් ඉඩමක් සන්තකයට ගැනීමට සභාව විසින් යම් තැනැත්තකුට ඉඩ දුන් බවට සභාවේ නගරාධිපතිවරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් සමග වූ එකී භූමිය හෝ ඉඩම පිළිබඳ මැනුම් පිඹුර, එකී භූමිය සාක්ෂි වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ගෙවීමට නියමිත වන්දිය පිළිබඳ ව මහා නගර සභාව විසින් යම් ඉඩමක අයිතිකරු සමග එකඟවීමට එළඹිය නොහැකි අවස්ථාවක දී හෝ ඒ අයිතිකරු සොයා ගත නොහැකි අවස්ථාවක දී හෝ යම් ඉඩමක අයිතිකරු සමග මේ එකඟවීමට එළඹීම ප්‍රඥාගෝචර නොවේ යැයි සභාව විසින්

කරනු ලබන අවස්ථාවක දී, 45 වන වගන්තියෙන් නියමිත ආකාරයට ඒ ඉඩමේ සන්තකය ලබා ගැනීමට සහ අයිතිකරුට වන්දි ගෙවීමට ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම එකඟවීමක් ම ලියවිල්ලකින් විය යුතු ය. එහෙත් වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය, එකී යම් එකඟවීමකට හෝ (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සහතිකයකට, අදාළ නොවන්නේ ය.

*වීථි විපථ කිරීම හෝ විශාල කිරීම සඳහා අවශ්‍ය ඉඩම තෑගි කිරීම.*

49. යම් වීථියක් සළකුණු කිරීම, හැරවීම, විපථ කිරීම, පළල් කිරීම, විවෘත කිරීම, විශාල කිරීම හෝ වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ ඉඩමක සන්තකය මහජන ප්‍රයෝජනය සඳහා ලබා ගැනීමට යම් මහා නගර සභාවකට අවශ්‍ය වී, ඉඩම ඒ කාර්යය සඳහා සභාවට තෑගි කිරීමටත් ඒ සඳහා වූ වන්දිවලට ඇති සියලු හිමිකම් පෑම් අත්හැරීමටත් ඒ ඉඩමේ අයිතිකරු බවට හිමිකම් පාන තැනැත්තා කැමති වන්නේ නම්, ඒ බවට නගරාධිපතිවරයා ඉදිරිපිට දී හෝ තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තකු ඉදිරිපිට දී පළමු කී තැනැත්තා විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ වාර්තාවක් ඉඩම සභාව වෙත සතුවීම සඳහා ප්‍රමාණවත් වන්නේ ය. ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහ සාක්ෂිකරුවන් විසින් සහතික කිරීම පිළිබඳ ව, වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ නියමයන්ට අනුකූල නොවීමේ හේතුව නිසා ම පමණක් එකී කිසි ම වාර්තාවක් අවලංගු වූ ලෙස හෝ නීතිය අනුව බලරහිත වූ ලෙස හෝ නොසැලකිය යුතු ය.

*අත්හැර දමන ලද වීථි බැහැර කිරීමේ බලය.*

50. මහා නගර සභාවක් වෙත සතු වූ යම් වීථියක් හෝ යම් වීථියක කොටසක්, වීථියක් ලෙස භාවිත කිරීම නතර වූ කවර හෝ විටෙක, ජනාධිපතිවරයාගේ පූර්ව අනුමතය ඇති ව සභාව විසින් එකී වීථිය හෝ එහි කොටස විකිණීම හෝ බදු දීම හෝ හුවමාරු කිරීම කරනු ලැබිය හැකි ය. තව ද එවැනි විකිණීමක් හෝ බදු දීමක් කරනු ලැබූ අවස්ථාවක ඉන් ලැබෙන මුදල මහා නගර සභා අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

*ගොඩනැගිලි තැනීමේ කාර්ය සඳහා අලුත් වීථි වලට යාවූ ඉඩම ගැනීමේ බලය.*

51. යම් අලුත් වීථියක් සළකුණු කිරීමේ දී හෝ තැනීමේ දී හෝ යම් වීථියක් හැරවීමේ දී, විපථ කිරීමේ දී, පළල් කිරීමේ දී, විවෘත කිරීමේ දී, විශාල කිරීමේ දී හෝ අන්‍යාකාරයකින් වැඩි දියුණු කිරීමේ දී, එහි රථ මාර්ගවල සහ අඩිපාරවල කාර්යයන් සඳහා අවශ්‍ය ඉඩම්වලට අතිරේක ව එකී වීථිය සකස් වීමට අවශ්‍ය නිවාස සහ ගොඩනැගිලි සඳහා වුවමනා ඉඩම් ද මහා නගර සභාවක් විසින් මිල දී ගත හැකි අතර, එම ඉඩම් 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ විධිවිධානවලට යටත් ව සහ එම ඉඩම්වල ඉදි කළ යුතු නිවාසවල හෝ ගොඩනැගිලිවල වර්ගය සහ ආකාරය පිළිබඳ ව සභාව විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත් ව ද, විකිණීම, බදු දීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම ද කළ හැකි ය.

විශී අලුත්වැඩියා කිරීම ආදිය සඳහා නිසි නිලධරයන්ට ඉඩම්වලට ඇතුළු වීමට බලය පවරා ඇති බව.

52. යම් මහා නගර සභාවක නිසි නිලධරයා විසින් ද ඔහු විසින් හෝ ඔහු යටතේ සේවයෙහි නියුක්ත කොට ඇති සේවකයන්, **වැඩකරුවන් සහ කම්කරුවන් විසින් ද සියලු කල්හි අවශ්‍ය සහ** සුදුසු සියලු රථ, කරත්ත, සතුන් සහ වෙනත් සියලු දේ සමග ඒ මහා නගරය තුළ ඇති හෝ යෝජිත යම් වීථියකට යා වූ හෝ ඒ අසල ඇති යම් ඉඩමකට ඇතුළුවීම සහ එහි දී එකී යම් වීථියක් අනුරේඛනය කිරීමේ, මැනීමේ, සෑදීමේ, නිර්මාණය කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ, අලුත්වැඩියා කිරීමේ, ශුද්ධ කිරීමේ, වැඩි දියුණු කිරීමේ හෝ ඊට වැටක් බැඳීමේ කාර්යය සඳහා හෝ එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් ඉදි කිරීම, නැනීම, අලුත්වැඩියා කිරීම, ශුද්ධ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා හෝ මේ ආඥාපනතේ හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථා වක හෝ නියෝගයක විධිවිධාන යටතේ යම් ක්‍රියාවක්, කරුණක් හෝ දෙයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේවල්, වෙන් වෙන් ව කිරීම සහ ඉටු කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

ද්‍රව්‍ය ගැනීමට ඇති බලය.

53. යම් මහා නගර සභාවක නිසි නිලධරයා විසින් ද ඔහු විසින් හෝ ඔහු යටතේ සේවයෙහි නියුක්ත කොට ඇති සේවකයන්, වැඩකරුවන් සහ කම්කරුවන් විසින් ද සියලු සාධාරණ වේලාවන් තුළ දී අවශ්‍ය සහ සුදුසු සියලු රථ, සතුන් සහ වෙනත් සියලු දේ රැගෙන, ඒ මහා නගරය තුළ ඇති හෝ යෝජිත යම් වීථියක් අනුරේඛනය කිරීමේ, මැනීමේ, සෑදීමේ, නිර්මාණය කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ, අලුත්වැඩියා කිරීමේ, ශුද්ධ කිරීමේ, වැඩි දියුණු කිරීමේ හෝ ඊට වැටක් ගැසීමේ කාර්යය සඳහා හෝ අනුරේඛනය කිරීම, මැනීම, සෑදීම, නිර්මානය කිරීම, විවෘත කිරීම, වෙනස් කිරීම, හැරවීම, අලුත්වැඩියා කිරීම, ශුද්ධ කිරීම, වැඩි දියුණු කිරීම හෝ ඊට වැටක් ගැසීම සම්බන්ධයෙන් යම් ආකාරයකින් සහාය වීම සඳහා හෝ ; එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ යම් පාළමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් ගොඩ නැගීමේ, අලුත්වැඩියා කිරීමේ, ශුද්ධ කිරීමේ හෝ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා හෝ ; ඉහත සඳහන් ප්‍රකාර වූ යම් නිලධරයකුගේ හෝ ඔහු යටතේ සේවයේ නියුක්ත කොට ඇති යම් වැඩකරුවන්ගේ, සතුන්ගේ, රථවල, කරත්තවල, තැනැත්තන්ගේ හෝ දේවල්වල ප්‍රයෝජනය සඳහා එකී යම් වීථියක හෝ ඒ අසල අවශ්‍ය වන්නා වූ කවර අන්දමක හෝ කම්කරු නිවාස නැතහොත් ගොඩනැගිලි ඉදි කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා, එබඳු යම් වීථියකට යා වූ හෝ ඒ අසළ ඇති යම් ඉඩමක් තුළින් හෝ ඉඩමකින් වතුර, දැව දඬු, කැපූ අතු, ගල්, බොරළු, මැටි හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් සෙවීම, හෑරීම, කැපීම, ගැනීම සහ ඉවත ගෙන යෑම ද යම් තැනැත්තකුගේ ඉඩමක් මැදින් එය ඉවත ගෙන යෑම ද නීත්‍යනුකූල වන අතර, එකී කටයුතු කිරීමේ දී එවැනි තැනැත්තකු අයුතු අන්දමින් ඇතුළු වන්නකු ලෙස සලකනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ ආසන්නයේ ඇති මුඩුබිම්වලින් හෝ, පොදු හෝ අත්හල භූමිවලින් සෑහෙන තරම් ද්‍රව්‍ය පහසුවෙන් ලබා ගත නොහැකි නම් මිස, ගෙමිදුලකින්, ගෙයකට ප්‍රවේශ වන මාර්ගයකින්, තණ බිස්සකින් හෝ කොටු කර ඇති යම් වත්තකින්, වැවිල්ලකින්, කුඹුරකින් හෝ කැලයකින් හෝ ඒ මත, එහි අයිතිකරුගේ කැමැත්ත නොමැති ව, එබඳු ද්‍රව්‍ය හෑරීම, කැපීම හෝ ඉවතට ගෙන යෑම නොකළ යුතු අතර, එසේ ඒ ද්‍රව්‍ය මුලින් සඳහන් කළ මුඩු බිම්වලින් හෝ අත්හල භූමිවලින් පහසුවෙන් ලබා ගත හැකි අවස්ථාවක ඒ ද්‍රව්‍ය යම් ප්‍රමාණයක් ලබා ගත හැකි ය;

එසේ ද වුවත් එසේ ලබා ගත් සියලු ද්‍රව්‍ය සඳහා සහ ඒ ද්‍රව්‍ය ලබා ගැනීමෙන් සහ ඉවතට ගෙන යෑමෙන් සිදුවූ අලාභය සඳහා ද එහි අයිතිකරුට සෑහෙන වන්දි ගෙවිය යුතු ය;

එසේ ම තව දුරටත්, එකී ද්‍රව්‍ය කිසිවක් ලබා ගත් යම් ගල් වළක් හෝ වළක්, එය යම් තැනැත්තකුට හෝ සතෙකුට අන්තරාදායක නොවන පරිදි, ඒ නිලධරයා විසින් හරාදිවලින් වට කිරීම හෝ වැටක් බැඳ වෙන් කිරීම කරනු ලැබිය යුතු ය.

54. යම් මහා නගරයක් තුළ ඇති හෝ යෝජිත යම් වීදියක් අනුරේඛනය කරන, මනින, සාදන, නිර්මාණය කරන, විවෘත කරන, වෙනස් කරන, හරවන, අලුත්වැඩියා කරන, ශුද්ධ කරන හෝ වැඩි දියුණු කරන අවස්ථාවක හෝ එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් ගොඩනගන, සාදන, අලුත්වැඩියා කරන, ශුද්ධ කරන හෝ වැඩි දියුණු කරන අවස්ථාවක, ඒ මහා නගර සභාවේ නිසි නිලධරයා විසින්— ගොඩනැගිලි ඉදි කිරීමට සහ ගවාදි සතුන් තබා ගැනීමට ඇති බලය.

(අ) වැඩය කර ගෙන යන අතරතුර, ඒ නිලධරයාගේ වාසය පිණිස හෝ ඔහු විසින් සේවයෙහි නියුක්ත කොට ඇති සේවකයන්ගේ, වැඩකරුවන්ගේ, කම්කරුවන්ගේ, සතුන්ගේ වාසය පිණිස හෝ රථ හෝ වෙනත් දේවල් තැබීම පිණිස ඊට යා වූ හෝ ඒ අසල ඇති යම් වත්තක තාවකාලික ගොඩනැගිලි සෑදීම සහ ඉදි කිරීම; සහ

(ආ) ඔහු විසින් සේවයෙහි නියුක්ත කොට ගනු ලබන එබඳු ම සතුන්, ඊට යා වූ හෝ ඒ අසල ඇති ඉඩම්වල නිසි ලෙස දිගේලි කිරීම සහ ගාල් කිරීමක් අවශ්‍ය තරම් කල් ඒ සතුන් එසේ දිගේලි කර හෝ ගාල් කර තබා ගැනීමත්

නීත්‍යානුකූල වන්නේ ය:

එසේ වුව ද, යම් වගා කළ ඉඩමක හෝ, ඒ ගොඩනැගිලි ඉදි කිරීමේ හෝ සතුන් බැඳ තැබීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගත හැකි මුඩු බිම් හෝ පොදු හෝ අත්හල භූමි හෝ අසල ඇති ඉඩමක, එබඳු ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ එබඳු යම් සතකු තැබීම නොකළ යුතු ය;

එසේ ම තව දුරටත්, ඉඩමකට යම් අලාභයක් සිදු වූ සෑම අවස්ථාවක දී ම එහි අයිතිකරුට සාධාරණ වන්දි ගෙවිය යුතු ය.

යාබද ඉඩම්වලට කුණු විසි කිරීමට ඇති බලය.

55. යම් මහා නගරයක් ඇතුළත ඇති හෝ යෝජිත යම් වීථියක් අනුරේඛනය කිරීමෙහි, මැනීමෙහි, සෑදීමෙහි, නිර්මාණය කිරීමෙහි, විවෘත කිරීමෙහි, වෙනස් කිරීමෙහි, හැරවීමෙහි, අලුත්වැඩියා කිරීමෙහි, ශුද්ධ කිරීමෙහි හෝ වැඩි දියුණු කිරීමෙහි ලා හෝ එහි ඇති හෝ ඊට යම් වෙසකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් සෑදීමෙහි, නැනීමෙහි, අලුත්වැඩියා කිරීමෙහි, ශුද්ධ කිරීමෙහි හෝ වැඩි දියුණු කිරීමෙහි ලා, එබඳු යම් කර්මාන්ත ස්ථානයකින් ඉවත් කිරීමට අවශ්‍ය වන පස්, කුණු කසළ හෝ ද්‍රව්‍ය, මහා නගර සභාවේ නිසි නිලධරයා විසින් වීථියට යා වූ හෝ ඒ අසල් ඇති ඉඩම් කිසිවකට විසි කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

තාවකාලික පාරක් සෑදීමට ඇති බලය

56. යම් මහා නගරයක ඇති හෝ යෝජිත යම් වීථියක යම් කාර්යයක් හෝ ඊට යම් ලෙසකින් සම්බන්ධ කාර්යයක් ක්‍රියාත්මක කෙරෙන කල්හි මහා නගර සභාවේ නිසි බලධරයා විසින් ඒ පාරට යා වූ හෝ ඒ අසල ඇති භූමි මැදින් තාවකාලික පාරක් සෑදීම නීත්‍යනුකූල වන්නේය :

එසේ වුව ද, යම් ගොඩනැගිල්ලක් පිහිටා ඇති යම් භූමියක් උඩින් හෝ කොටු කොට ඇති වත්තක් හෝ මිදුලක් උඩින් එබඳු පාරක් නොසෑදිය යුතු ය.

ගස් කැපීමට ඇති බලය.

57. යම් මහා නගර සභාවක නිසි නිලධරයා විසින්, මහා නගරය තුළ යම් වීථියක වැවෙන හෝ ඊට පාත් වී ඇති හෝ ඊට බාධක ව ඇති සියලු ම ගස්, පඳුරු හෝ අකුල් සහ ගස්වල සියලු කොළ හෝ අතු හෝ මුල් කපා ඉවත් කිරීම ද යාබද හෝ ඒ අසළ පිහිටි යම් ඉඩමක් මත දැමීම ද, ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි නැනැත්තන්, සතුන් සහ උපකරණ ගෙන යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළු වී, එහි දී ඒ ගස්, පඳුරු, අකුල්, කොළ, අතු හෝ මුල් කැපීම, සිඳීම හෝ ඉවත් කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු දේ කිරීම ද නීත්‍යනුකූල වන්නේ ය.

වැටවල් ඉදිකිරීමට ඇති බලය.

58. මහා නගර සභාවක නිසි නිලධරයා විසින් අවශ්‍ය යැයි ඔහුට පෙනී යන කවර විටක වුව ද, මහා නගරය තුළ ඇති යම් වීථියක පසකින් ඇති වැටවල්, බඩවැටි, අගල්, කාණු හෝ ඉවුරු ඉදි කිරීම හෝ සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. තවද, ඒ වැටවල්වලට, බඩවැටිවලට, අගල්වලට, කාණුවලට හෝ ඉවුරුවලට යාබද ව ඇති එක් එක් ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒවා මනා හා ප්‍රමාණවත් අලුත්වැඩියාවෙන් සහ තත්ත්වයෙන් තබා ගත යුතු අතර ඒවා එසේ මනා හා ප්‍රමාණවත් අලුත්වැඩියාවෙන් සහ තත්ත්වයෙන් තබා ගන්නා ලෙස එකී අයිතිකරුට හෝ පදිංචිකරුට මෙයින් නියම කරනු ලැබේ.

*අගල් ආදිය කප විවෘත ව තබා ගැනීමට සහ ප්‍රධාන නළ ආදිය යෙදීමට ඇති බලය.*

59. යම් මහා නගරයක් තුළ ඇති යම් වීථියක් ඔස්සේ තිබෙන සියලු අගල්, ඇලි, කාණු හෝ දිය ඇලවල් තැනීමට, සෝදා හැරීමට, ශුද්ධ පවිත්‍ර කිරීමට සහ විවෘත කර තැබීමට සහ යම් වීථියක් හෝ යෝජිත වීථියක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, දියුණු කිරීම, අලුත්වැඩියා කිරීම, හෝ ගොඩනැගිලි සඳහා අවශ්‍ය යැයි නිසි නිලධරයා විසින් සලකණු ලබන, ඒ කාණු, දිය ඇලවල්, ප්‍රධාන නල, ළිං, පීඩැලි කට්ටි හෝ පාලම්, ඒ වීථියට හෝ යෝජිත වීථියට යාව හෝ ඒ අසල ඇති යම් ඉඩම් හෝ භූමි තුළ හෝ ඒ මැදින් තැනීමට හෝ යෙදීමට ද ඒ මහා නගර සභාවේ නිසි නිලධරයාට බලය තිබිය යුතු ය.

*ගල් ආදිය තැබීමට ඇති බලය.*

60. යම් මහා නගරයක් තුළ වූ යම් වීථියක් මත යම් ගල් ගොඩක් හෝ බොරළු ගොඩක් හෝ යම් ලී කොටයක් හෝ වෙනත් තාවර හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක් තැබීමට සහ එම වීථියට අලුත් වැඩියා කරන කාලය තුළත් අලුත් වැඩියා කිරීම් ආරම්භ කිරීමට පෙර සහ අලුත්වැඩියා කිරීම් නිම කිරීමෙන් පසුවත් එම අලුත් වැඩියා කිරීම් පහසු කිරීම සඳහා හෝ ළඟ දී අලුත්වැඩියා කරන ලද වීථියට අලාභ හානි වැළක්වීම සඳහා හෝ අවශ්‍ය තරම් කාලයක් ඒ ද්‍රව්‍ය එහි තිබෙන්නට හැරීමටත් ඒ මහා නගර සභාවේ නිසි නිලධරයාට බලය ඇති නමුත් ඒ වීථිය ඔස්සේ ගමන් කරන තැනැත්තන්ට අනතුරක් හෝ පීඩාවක් සිදුවීම වැළැක්වීම සඳහා යෝග්‍ය වූත්, සාධාරණ වූත් පූර්වාරක්ෂක විධිවිධාන ඔහු විසින් සැලැස්විය යුතු ය.

*ට්‍රෑම් රථ මාර්ග තැනීමේ සහ පවත්වා ගෙන යාමේ බලය*

61. අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව යම් මහා නගර සභාවක් විසින්, එහි නිලධරයන් සහ සේවකයන් මගින් මහා නගරය ඇතුළත ට්‍රෑම් රථ මාර්ගයක් හෝ ට්‍රෑම් රථ මාර්ග තැනීම, පවත්වා ගෙන යෑම සහ ප්‍රයෝජනයට ගැනීම කළ හැකි ය.

*ට්‍රෑම් රථ මාර්ග සඳහා ගිවිසුම් ඇති කර ගැනීමේ බලය.*

62. මහා නගරය ඇතුළත ට්‍රෑම් රථ මාර්ගයක් හෝ ට්‍රෑම් රථ මාර්ග තැනීමේ, පවත්වා ගෙන යාමේ සහ ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම යම් තැනැත්තකුට, සංස්ථාවකට හෝ සමාගමකට ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා එකී තැනැත්තා, සංස්ථාව හෝ සමාගම සමග යම් එකඟ වීමක් හෝ ගිවිසුමක් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ඒ එකඟවීමෙහි හෝ ගිවිසුමෙහි සඳහන් නියමයන් මත, එහි සඳහන් ප්‍රතිඵලය සඳහා සහ එහි සඳහන් කොන්දේසිවලට යටත් ව මහා නගර සභාවක් විසින් ඇති කර ගත හැකි ය.

*වාහන මගින් පොදු ගමනාගමන සේවා සැලැස්වීම.*

63. මහා නගර සභාවක පරිපාලන සීමා ඇතුළත යම් ප්‍රදේශයක නිවැසියන් සඳහා ට්‍රෑම් රථ මාර්ගයක් නොවන යම් ආකාරයක පොදු වාහන ගමනාගමන සේවයක්, ඒ ගමනාගමන ක්‍රමය සංවිධානය කිරීම සහ පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් වෙනත් යම් නීතිය කින් පනවනු ලබන තහනම් කිරීම්වලට සහ සීමා කිරීම්වලට යටත් ව, එම මහා නගර සභාව විසින් ම එහි නිලධරයන් මගින් හෝ 62 වන වගන්තියෙන් නියමිත ආකාරයට යම් ප්‍රරෝහකයකු හෝ ප්‍රරෝහකයන් සමග එකඟ වීමෙන්, සංවිධානය කිරීම සහ පවත්වා ගෙන යෑම එම මහා නගර සභාව විසින් කළ හැකි ය.

මහා නගර සභා වක වෙනත් බල තල.

**64.** මහා නගර සභාවක් වෙත පැවරී ඇති වෙනත් බලතලවලට හානියක් නොමැතිව, එම මහා නගර සභාව විසින් පහත සඳහන් ක්‍රියා අතුරින් කිසිවක් කිරීම නීත්‍යානුකූල වන්නේ ය :—

(1) වීථිවලට ජලය ඉසීම ;

(2) යම් වීථියක තෙරුම්, යම් වීථියක ප්‍රසර්පණ හෝ යම් වීථියකට බාධක සිදු වී ඇති විටෙක එයින් එම වීථිය නිදහස් කිරීම. එහෙත් මේ සඳහා යම් ක්‍රියා මාර්ගයක් ගැනීමේ දී ඒ තෙරුම්වලට, ප්‍රසර්පණවලට හෝ බාධකවලට වගකිව යුතු තැනැත්තා කවරකු දැයි සභාව දැන සිටින අවස්ථාවක, ඒ ක්‍රියා මාර්ගය ගත යුතු වන්නේ ඒ තැනැත්තාට දැන්වීමක් කිරීමෙන් පසුව සහ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම හෝ දැන්වීමේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත ඒ තෙරුම් හෝ බාධක හෝ ප්‍රසර්පණ ඉවත් කිරීම හෝ ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇති විටක පමණ ය ;

(3) පාළු ගෙවල් වසා තැබීම සහ ආරක්ෂා කිරීම ;

(4) මෙහි (2) වන සහ (3) වන ඡේද යටතේ කරන ලද යම් ක්‍රියාවක් සඳහා ගිය වියදම, එකී ක්‍රියාව අවශ්‍ය වූයේ යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ අතපසු කිරීමක් නිසා ද ඒ තැනැත්තාගෙන් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කර ගැනීම.

පෞද්ගලික දේපළ අයිතිකරුවන්ගේ යහපත සඳහා පාරවල්.

**65.** යම් මහා නගරයක් ඇතුළත පිහිටි යම් වත්තක හෝ යම් කර්මාන්ත ව්‍යාපාරයක හෝ ඊට වැඩි ගණනක අයිතිකරු විසින් හෝ අයිතිකරුවන් විසින් ඉල්ලීමක් කරනු ලැබුවා වූ ද එසේ කරන ලද ඉල්ලීමක් මත මිස ඒ ප්‍රදේශය තුළ පාරක් ඉදි කිරීම හෝ පවත්වාගෙන යෑම ජනතා අවශ්‍යතා අනුව සලකා බලන විට සාධාරණ නොවේ ය යන්න සභාවේ මතය වන්නා වූ ද අවස්ථාවක, පාර ඉදි කිරීම හෝ පවත්වාගෙන යෑම වෙනුවෙන් දැරීමට සිදු වන වියදම උදෙසා සභාව විසින් අනුමත කරනු ලබන දායක මුදලක් ගෙවීමට යටත් ව ද සුදුසු සාධන පත්‍රයක් මගින් එකී පාර පොදු පාරක් ලෙස සංස්ථාපනය කරනු ලැබිය යුතු බවට සහ සභාව වෙත සතු කරනු ලැබිය යුතු වූ බවට වූ කොන්දේසියකට යටත්ව ද අදාළ වත්තේ හෝ වතුවල හෝ ව්‍යාපාරයේ හෝ ව්‍යාපාරවල ප්‍රයෝජනයට පාරක් ඉදි කිරීම හෝ පවත්වා ගෙන යෑම සඳහා වූ ගිවිසුමක් සභාව විසින් එකී අයිතිකරු හෝ අයිතිකරුවන් සමග ඇති කර ගත හැකි ය. තවද එසේ ගිවිසගන්නා ලද සියලුම දායක මුදල්, ප්‍රයෝජන සැලසුණු ඉඩම් සඳහා නියම කරන ලද විශේෂ වරිපනම් බදු ලෙස සැලකිය යුතු අතර, ඒවා මේ පනත යටතේ පනවන ලද වරිපනම් බදු අය කර ගන්නා ආකාරයෙන් ම අය කර ගත හැකි වන අතර වරිපනම් බදු සම්බන්ධයෙන් මේ පනතේ ඇති සියලු විධිවිධාන ඒවාට අදාළ වන්නේ ය.

දිරාපත් වූ සහ අන්තරාය දායක තත්වයක තිබෙන ගෙවල්.

**66.** යම් මහා නගරයක යම් වීථියකට යා වූ යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක හෝ ඊට සවිකර ඇති යම් කිසිවක් අන්තරායදායක වුවද නොවුවද දිරාපත් තත්වයක පවතින බව හෝ කඩා වැටීමට ඉඩ ඇති බව සභාව සලකන්නේ

නම්, අවශ්‍ය යැයි පෙනී ගියහොත් ඒ⁣ම වීථිය ප්‍රයෝජනයට ගන්නා ගැනැත්තන්ගේ ආරක්ෂාව සඳහා නිසි රැකුම් වැටක් හෝ වැටක් සභාව විසින් වහා ම ඉදි කරවිය යුතු අතර, ඒ ගෙය, ගොඩනැගිල්ල, බිත්ති තාප්පය, දොරටුව හෝ එහි සවිකර ඇති දෙය පවතින තත්ත්වය අනුව අවශ්‍ය වන පරිදි, වහා ම කඩා දමන ලෙස හෝ රැකවරණය කරන ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදීමට සැලැස්විය යුතු ය.

67. 66 වන වගන්තිය යටතේ සභාව විසින් හෝ සභාව වෙනුවෙන් හෝ දැන්වීමක් භාරගනු ලැබූ යම් තැනැත්තකු එය භාර දෙනු ලැබූ දින සිට දවස් තුනක් ඇතුළත ඒ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම ආරම්භ නොකළහොත් හෝ නිසි අනලස්භාවයෙන් වැඩ පරිසමාප්ත නොකළහොත්, සම්පූර්ණ වැඩය හෝ ඒ වැඩයෙන් කිරීමට අවශ්‍ය යැයි සභාව අදහස් කරන තරම් කොටස හෝ සභාව විසින් කරවිය හැකි අතර සභාව විසින් දරන ලද සියලු වියදම් ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ය. තව ද ඒ වියදම් ගෙවීම පැහැර හැරියහොත් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට එය අය කරගත හැකි වන්නේ ය. දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම.

68. 67 වන වගන්තිය යටතේ සභාව විසින් හෝ සභාවේ අධිකාරය යටතේ යම් ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ තාප්පයක් හෝ එහි යම් කොටසක් කඩා දමනු ලැබුවහොත්, එහි ද්‍රව්‍ය හෝ කඩා දමනු ලැබූ තාක් ද්‍රව්‍ය ප්‍රමාණය ඒ සභාව විසින් විකිණිය හැකි අතර, එයින් ලැබෙන මුදල, දරන ලද වියදම් පියවීමට යෙදිය හැකිය. තවද ඒ විකිණීමෙන් ලැබෙන අතිරික්තයක් වුවහොත් එය ඒ ගෙයි, ගොඩනැගිල්ලේ හෝ තාප්පයේ අයිතිකරු විසින් ඉල්ලා සිටි විට ඔහුට ගෙවිය යුතු ය: දිරාපත් වූ ගෙවල්වල ද්‍රව්‍ය විකිණීම.

එසේ වුව ද, එලෙස ඉල්ලීමක් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තකු විසින් මාස දොළහක් ඇතුළත ඒ අතිරික්තය සඳහා ඉල්ලීමක් කරනු නොලැබූ විටක, ඒ අතිරික්තය මහා නගර සභා අරමුදලේ බැරට ගෙවීමට සෑම විට ම සභාවට නිදහස ඇති අතර, එසේ ඉල්ලා නොසිටිනු ලැබූ අතිරික්තය ගෙවීමට හෝ ඒ සඳහා හෝ ඒ සම්බන්ධයෙන් වගඋත්තර කීමට ඇති බැඳීමෙන් ද සභාව නිදහස් වන්නේ ය:

එසේ ම තව දුරටත්, ඉහත සඳහන් කාර්යයන් සඳහා එකී ද්‍රව්‍ය සභාව විසින් විකුණනු ලැබ තිබිය හැකි වුව ද, සම්පූර්ණ වියදම් ගෙවීමට බල කිරීම සඳහා මේ පනතින් සභාවට දී ඇති ප්‍රතිකර්ම එකී විකිණීමෙන් ලත් මුදල් යෙදීමෙන් පසුවත් ගෙවීමට ඉතිරි වී ඇති යම් වියදමක් ගෙවන ලෙස බල කිරීම සඳහා ද සභාවට තිබිය යුතු ය.

**වීථි රේඛා.**

69. මහා නගර සභාවක මතය අනුව යම් වීථියක් හෝ යම් යෝජිත වීථියක් මාධිම් විය යුතු සීමාවන් රේඛා අනුසාරයෙන් පෙන්වන පිඹුරු ඒ සභාව විසින් කලින් කල පිළියෙල කරවිය හැකිය. එකී යම් පිඹුරක් සභාව විසින් අනුමත කරනු ලැබ ඇති විට එහි දක්වා ඇති රේඛා එම වීථියේ වීථි රේඛා ලෙස 70 වන වගන්තියේ කාර්යයන් සඳහා ගත යුතුය.

**ගෙවල්, වීථි රේඛාවලින් පිටුපසට ගැනීම.**

70. වීථි රේඛාවලින් ඉදිරියට ඇති යම් ගොඩනැගිල්ලක් හෝ එහි කොටසක් සම්පූර්ණයෙන් ම හෝ එයින් වැඩි කොටසක් කඩා දමා, පිළිස්සී හෝ බිඳ වැටී ඇති අවස්ථාවක, ඒ ගොඩනැගිල්ල හෝ කොටස යළි ගොඩනංවන විට වීථි රේඛාවලින් පිටුපසට කර ගොඩ නගන ලෙස සභාව විසින් නියම කළ හැකි අතර, ගොඩනැගිල්ල එසේ පිටුපසට ගැනීමෙන් වීථියට එකතුවන ඉඩම් කොටස එතැන් සිට වීථියේ කොටසක් ලෙස ද සභාව වෙත සතු කරන ලද්දක් ලෙස ද සැලකිය යුතු ය:

එසේ වුව ද, ඒ නිසා එකී යම් ගොඩනැගිල්ලක අයිතිකරුට සිදු වන යම් අලාභයක් වෙනුවෙන් සභාව විසින් සෑම විට ම සම්පූර්ණ වන්දි ගෙවිය යුතු ය.

**වීථි නම් කිරීම සහ ගෙවල් වලට අංක යෙදීම. [1975 අංක 4§3]**

71. (1) අමාත්‍යවරයා විසින්, සිය මෙහෙයීමෙන් ම හෝ මහා නගර සභාවක් විසින් කරනු ලැබූ ඉල්ලීමක් පිට, යම් වීථියක් හැඳින්විය යුතු නාමය නිර්ණය කළ යුතු අතර යම් වීථික යම් වීථි යක නාමය වෙනස් කිරීම ද ඒ ආකාරයෙන් ම කළ යුතුය.

*(3) යම් ගෙයක් හෝ ගෙපනක් හඳුනා ගැනීම සඳහා වූ අංකය සභාව විසින් නිශ්චය කළ යුතු අතර කලින් කලට අවශ්‍ය වන පරිදි ඒ අංකය වෙනස් කළ හැකි ය.

(4) සභාව විසින් යම් වීථියක නම හෝ යම් ගෙයක හෝ ගෙපනක අංකය යම් පෞද්ගලික දේපලක් මත ඇඳීම හෝ වෙනත් ක්‍රමයකින් ලකුණු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම ද ඒ නම හෝ අංකය වෙනස් කරන ලද්දා වූ හෝ ඒ නාම හෝ අංක සටහන කියවිය නොහැකි අවස්ථාවට පත් වූ හෝ කවර අවස්ථාවක වුව ද, අවස්ථාවෝචිත පරිදි, ඒ නාම සටහන හෝ අංකය කලින් කල වෙනස් කිරීම හෝ අළුත් කිරීම ද නීත්‍යනුකූල වන්නේ ය.

(5) සභාව විසින් නීත්‍යනුකූල ව පිහිටුවා ඇති යම් වීථි නාම සටහනක් හෝ යම් ගෙයක් හෝ ගෙපනක අංකය, සභාවේ අධිකාරය නොමැතිව විනාශ කරන, කඩාදමන, විකෘති කරන හෝ වෙනස් කරන හෝ යම් වීථියකට නීත්‍යනුකූල ව දෙන ලද නාමට වඩා වෙනස් නමක් එම වීථියේ පිහිටුවාලන හෝ යම් ගෙයකට හෝ ගෙපනකට නීත්‍යනුකූල ව දෙන ලද අංකයට වඩා වෙනස්

* (2) වන උප වගන්තිය ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 4 දරන පනත මඟින් ඉවත් කරන ලදී.

අංශයක් එම ගෙයි හෝ ගෙපතෙහි සවි කරන යම් තැනැත්තෙක් වරදක් කරන්නේ ය.

(0) මේ වගන්තියේ සහ 188 (1) (ඇ) වන වගන්තියේ කාර්යයන් සඳහා "වීදිය" යන්නට, ගෙවල් හෝ ගෙයිම් දෙකකට හෝ ඊට වැඩි ගණනකට ළඟාවීමේ මාර්ගයන් වශයෙන් භාවිතා වන හෝ භාවිතා කිරීමට අදහස් කරන්නා වූ සහ මහජනයාට මාර්ග අයිතියක් ඇති හෝ නැති යම් පාරක්, පාමගක්, හෝ ප්‍රවේශ මාර්ගයක් මෙන් ම, එම භූමියේ වූ පැනි මඟක් හෝ වෙන් කළ බිම් කඩක් ද ඇතුළත් වේ.

දොරවල් ආදිය පිටතට විවෘත නොවිය යුතු බව.

72. (1) යම් වීදියකට විවෘත වන්නාවූ ද, 1897 ජනවාරි මස පළමු වන දින හෝ ඉන් පසු සවි කරන ලද්දා වූ ද සියලු ම දොරවල්, ගේට්ටු, බාධක සහ බිම් මාලයේ ජනෙල්, සභාව විසින් අනුමත කරනු ලබන ආකාරයකට ඒවා සවි කර හෝ තබා ඇත්නම් හැර, පිටතට විවෘත නොවන පරිදි සවි කර හෝ තබා තිබිය යුතු ය.

(2) එවැනි යම් දොරක්, ගේට්ටුවක්, බාධකයක් හෝ ජනේලයක් (ඉහත කී ආකාරයට හැර) එකී යම් වීදියකට විවෘත වන පරිදි සවි කර හෝ තබා ඇතහොත්, එය සවි කර ඇති ස්ථානයේ අයිතිකරු විසින් ඒ ගැන සභාවෙන් දැන්වීමක් ලැබීමෙන් දින අටක් ඇතුළත, එය පිටතට විවෘත නොවන ආකාරයට වෙනස් කරවිය යුතු ය; අයිතිකරු එසේ කිරීම පැහැර හැරි හෝ අතපසු කළ අවස්ථාවක ඒ වෙනස් කිරීම සභාව විසින් කරවිය හැකි අතර ඒ සඳහා වැය වූ වියදම ඒ අයිතිකරු විසින් ගෙවිය යුතු ය. එම වියදම ගෙවීම පැහැර හැර ඇති විටක එම වියදම මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කර ගත හැකි වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් දිනයට ප්‍රථම සවි කරන ලද යම් දොරක්, ගේට්ටුවක්, බාධකයක් හෝ බිම් මාලයේ ජනේලයක් යම් වීදියකට විවෘත වන පරිදි සවි කර හෝ තබා ඇත්නම්, විවෘත කළ විට එහි කිසි ම කොටසක් බාධකයක් වන ලෙස එබඳු යම් වීදියකට විවෘත නොවන ආකාරයට සභාව විසින් ස්වකීය වියදමින් වෙනස් කළ හැකි ය.

## වීදිවලට අවහිර කිරීම

හිමිකම ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ බලය.

73. (1) යම් මහා නගර සභාවක පාලනය යටතේ ඇති යම් වීදියක හෝ ඊට යාබදව ම පිහිටි රජයට අයිති යම් මුඩු ඉඩමක හෝ වෙනත් යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක්, කොරටුවක් හෝ බාධකයක් ඉදිකර හෝ සාදා ඇති බව එම සභාවට පෙනී ගිය කවර හෝ අවස්ථාවක දී, ඒ ගොඩනැගිල්ල හෝ කොරටුව ඉදිකරන ලද හෝ ඒ බාධකය ඇති ස්ථානයේ අයිතිකරු බවට හිමිකම් පාන

තැනැත්තා වෙත, ඒ හිමිකම ඔහුට ලබා දීමට හේතු කාරක වූ සෑම ඔප්පුවක්, ලේඛනයක් සහ සාධන පත්‍රයක් ම ඉදිරිපත් කරන ලෙස නියම කරමින් ඒ සභාව විසින් ලිඛිත දැන්වීමක් භාරදීම නිත්‍යානුකූල වන්නේ ය.

(2) පහත සඳහන් යම් අවස්ථාවක, එනම්—

(අ) යම් ස්ථානයක ප්‍රෝක්ත අයිතිකරුගේ නම සහ පදිංචිය පිළිබඳ සම්පූර්ණ තොරතුරු දන්වන ලෙස සභාව විසින් ඉල්ලා සිටින ලද, ඒ ස්ථානයේ ප්‍රෝක්ත අයිතිකරු නොවන ඒ ස්ථානයේ පදිංචිකරු විසින් එසේ දැන්වීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක ; හෝ

(ආ) යම් ස්ථානයක ප්‍රෝක්ත අයිතිකරු ඒ ස්ථානය පිළිබඳ අයිතිය පිළිබඳ හිමිකම් පෑමට පදනම් කර ගන්නා වූ ද තමා සන්තකයේ ඇත්තා වූ ද සෑම ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබීමෙන් දවස් දහයක් ඇතුළත ඒ තැනැත්තා විසින් ඒ ඔප්පු, ලේඛන හෝ සාධන පත්‍ර ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක ; හෝ

(ඇ) අදාල ඔප්පුව, ලේඛනය හෝ සාධන පත්‍රය තම සන්තකයේ නැති යම් ස්ථානයක ප්‍රෝක්ත අයිතිකරු, ඒ ඔප්පුව, ලේඛනය හෝ සාධන පත්‍රය සන්තකයේ තබා ගෙන සිටින තැනැත්තාගේ නම සහ පදිංචිය පිළිබඳ සම්පූර්ණ විස්තර සභාවට සපයන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට ඒ තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක ; හෝ

(ඈ) එකී යම් ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධන පත්‍රයක් සන්තකයේ ඇති තැනැත්තකු, එය ඉදිරිපත් කරන ලෙස සභාව විසින් ලිඛිත ව ඉල්ලා සිටිනු ලැබීමෙන් දවස් දහයක් ඇතුළත එය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක

එසේ ප්‍රතික්ෂේප කරන්නා වූ සෑම පදිංචිකරුවෙක් ම, ප්‍රෝක්ත අයිතිකරුවෙක් ම හෝ තැනැත්තෙක් ම වරදක් කරන අතර වරද කරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

[1986 අංක 39 § 4]

**ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමේ බලයට පරීක්ෂා කිරීමේ බලයද ඇතුළත් විය යුතු බව.**

**74.** (1) 73 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලෙස සභාව විසින් ඉල්ලන ලද සෑම ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ම එය අදාළ වන ස්ථානයේ දී හෝ සභාව විසින් නියම කරනු ලබන වෙනත් ස්ථානයක දී ඉදිරිපත් කළ යුතු ය; තව ද ඒවා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට එම වගන්තියෙන් පවරන ලද බලයට, අවශ්‍ය විය හැකි පරිදි ඒ ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර පරීක්ෂා කිරීමට සහ ඒවායේ පිටපත් ගැනීමට ඇති බලය ද ඇතුළත් වන බව සැලකිය යුතු ය.

(2) තත් කාර්යය සඳහා සභාවට හෝ සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට යම් ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධන පත්‍රයක් පරීක්ෂා කිරීමට හෝ එහි පිටපතක් ගැනීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය. 1986 අංක 39§5]

**ස්ථානයක් මැනීමට ඇති බලය.**

**75.** 73 (1) වන වගන්තියේ සඳහන් යම් අවස්ථාවක දී, ඉදි කරන ලද හෝ සාදන ලද ගොඩනැගිල්ල හෝ කොරවුව හෝ බාධකය නිසා යම් වීථියක හෝ වීථියකට යාව පිහිටි යම් රජයේ ඉඩමක ප්‍රසර්පණයක් සිදු වී තිබේ දැයි නිශ්චය වශයෙන් දැන ගැනීමට සභාවට හැකි වීම පිණිස, එම කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් අවශ්‍ය විය හැකි පරිදි ඒ ස්ථානය මැනීමටත් ඒ මැනීමේ කාර්යයන් සඳහා ඒ ස්ථානයට සහ ඇතුළු වීම අවශ්‍ය යැයි ඔහු අදහස් කරන වෙනත් කවර හෝ ස්ථානයකටත් ඇතුළු වීම නීත්‍යානුකූල වන්නේ ය.

**ප්‍රසර්පණයක් බව පෙනෙන අවස්ථාවක දී අයිතිවාසිකම ඔප්පු කිරීම අයිතිකරුට භාර කාර්යයක් බව.**

**76.** (1) සභාවේ පාලනය යටතේ ඇති යම් වීථියක පථය නිසි බලය නොමැතිව වෙනස් කර තිබෙන බව හෝ නවත්වා තිබෙන බව හෝ ඊට අවහිරයක් කර තිබෙන බව හෝ එහි ප්‍රසර්පණයක් කර ඇති බව සභාවට පෙනී යන කවර හෝ අවස්ථාවක දී, වීථිය වෙන පැත්තකට හරවන ලදැයි කියන්නේ හෝ සැක කරනු ලබන්නේ යම් ඉඩමකින් ද ඒ ඉඩමේ, හෝ ඒ නැවැත්වීම හෝ බාධකය සිදු කරන ලදැයි හෝ ප්‍රසර්පණය සිදු වී ඇතැයි කියන්නේ හෝ සැක කරනු ලබන්නේ යම් ඉඩමක ද ඒ ඉඩමේ පදිංචිකරු වෙත, සභාව විසින් හෝ සභාවේ විධානය පරිදි ඉඩම මැන තිබෙන බවට ලියවිල්ලකින් වූ දැන්වීමක් සභාව විසින් කළ යුතු අතර, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන ස්ථානයක දී ඒ මැනුම් පිඹුර ඒ පදිංචිකරු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි බව ද ඒ දැන්වීම භාර දුන් දින සිට මාසයක් ඇතුළත ඔහු විසින් හෝ, ඔහු එම ඉඩම දරන්නේ යම් තැනැත්තකුගේ බලය යටතේ ද ඒ තැනැත්තා

විසින් හෝ ඒ පිළිබඳ ව අවශ්‍ය හිමිකම තහවුරු කිරීම සඳහා සහ එබඳු යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීම වැළැක්වීම සඳහා නීති කෘත්‍ය ආරම්භ කරනු ලැබුවහොත් මිස, 77 වන වගන්තියෙන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට ඒවා ඉවත් කිරීම සඳහා සභාව විසින් ක්‍රියා කරන බව ද ඉන් දැන්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිත ව නියමිත කාලය ඇතුළත නීති කෘත්‍ය ආරම්භ කරනු නොලැබුවහොත් හෝ නීති කෘත්‍ය ආරම්භ කරනු ලැබූ මුත් ඒවා යථා පරිදි පවත්වාගෙන යනු නොලැබුවහොත්, 77 වන වගන්තියේ විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට එකී යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් වහා ම ඉවත් කරවීම සභාවේ යුතුකම වන්නේ ය.

(3) නීති කෘත්‍ය ආරම්භ කරනු ලැබූ අවස්ථාවක, යම් වීථියක පථය වෙනස් කරන ලදැයි හෝ වෙන පැත්තකට හරවන ලදැයි කියන්නේ යම් ඉඩමකින් ද ඒ ඉඩමේ හෝ නැවැත්වීම හෝ බාධකය හෝ ප්‍රසර්පණය සිදු කරන ලදැයි කියන්නේ යම් ඉඩමකින් ද ඒ ඉඩමේ අයිතිකරු බවට හිමිකම් පාන තැනැත්තාට ඒ ඉඩමට ඇති හිමිකම ඔප්පු කිරීම ඔහුට භාර කාර්යයක් වන්නේය.

බාධක හෝ ප්‍රසර්පණ ඉවත් කිරීම.

77. (1) සභාවේ පාලනය යටතේ ඇති යම් වීථියක බාධකයක් හෝ ප්‍රසර්පණයක් වහා ම ඉවත් කරන ලෙස හෝ අස් කරන ලෙස ඒ බාධකය හෝ ප්‍රසර්පණය සිදු කළ යම් තැනැත්තකුට සභාව විසින්, තත් කාර්යය සඳහා සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ මාර්ගයෙන් වාචිකව හෝ ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කිරීම නීත්‍යනුකූල වන්නේ ය; තව ද ඒ නියමය ලැබූ තැනැත්තකු විසින් සෑහෙන කාලයක් ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් හෝ ඒ නියමය ලැබිය යුතු නියි තැනැත්තා කවරෙක් ද යන්න ගැන යම් සැකයක් ඇති වුවහොත් ඒ දැන්වීම ඒ බාධකයෙහි හෝ ප්‍රසර්පණයෙහි සාධාරණ කාලයක් අලවා තිබීමෙන් පසුව සභාව විසින් එබඳු යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් නොපමාව ම ඉවත් කරවීම හෝ නතර කරවීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීමේ හෝ නතර කිරීමේ කාර්යය සඳහා සභාව විසින් හෝ සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් අවශ්‍ය විය හැකි තැනැත්තන් සමග සහ අවශ්‍ය විය හැකි උපකරණ සහ ද්‍රව්‍ය ද රැගෙන යම් ගෙයකට, වත්තකට, කොරටුවකට හෝ වෙනත් ස්ථානයකට ඇතුළු වී, ඒ ඉවත් කිරීම හෝ නතර කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු ක්‍රියා හෝ පියවර ආරම්භ කිරීම හෝ ආරම්භ කිරීමට සැලැස්වීම නීත්‍යනුකූල වන්නේ ය.

(3) යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීමෙහි ලා හෝ නතර කිරීමෙහි ලා සභාව විසින් හෝ සභාවේ අධිකාරය යටතේ දරන ලද වියදම්, එම වියදම් එසේ දරන්නට සිදු වූයේ යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ වූ නියමයට අනුකූල ව ක්‍රියා කිරීම පැහැර හැරීම නිසා ද ඒ තැනැත්තා විසින් ඒ වියදම් ඉල්ලූ විට නොගෙවන ලද අවස්ථාවක දී සභාව විසින් ඒ වියදම් ඒ තැනැත්තා පදිංචි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත සහතික කළ යුතු අතර ඒ වියදම් ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අය කර ගන්නා ආකාරයට ඒ අධිකරණය විසින් අය කර ගත යුතු ය. එසේ අය කර ගන්නා ලද සියලු ම මුදල් අධිකරණය විසින් මහා නගර සභා අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(4) යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීම හෝ නතර කිරීම ඒ ස්ථානයට ඇති හිමිකම දක්වන සියලු ම ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර ඉදිරිපත් කිරීමෙන් පසුව කරන ලද නමුත් ඒ ස්ථානය ඊට හිමිකම් කියන පාර්ශ්වකරුගේ දේපළ යැයි නිශ්චිත ව ඇති අවස්ථාවක දී, ඉන් සිදුවන සියලු ම පාඩු හා හානි සඳහා සභාවෙන් වන්දි ලැබීමට ඒ පාර්ශ්වකරු හිමිකම් ලැබිය යුතු ය; එහෙත් ඒ සියලු ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර ඒ ස්ථානයේ අයිතිකරු බවට හිමිකම් පාන පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරනු හෝ අතපසු කරනු ලැබූ නමුත්, එසේ නැත හොත් ඒ ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර ඒ වෙනුවෙන් ඉල්ලීමක් කරනු ලැබූ පසු දවස් දහයක් ඇතුළත ඉදිරිපත් කරනු නොලැබූ නමුත්, එබඳු ගොඩනැගිල්ලක්, කොරටුවක් හෝ ප්‍රසර්පණයක් සභාව විසින් ඉවත් කිරීමට සලස්වනු ලැබූ අවස්ථාවක දී ඒ ස්ථානය එයි අයිතිකරු බවට හිමිකම් පාන පාර්ශ්වකරුගේ දේපළ වශයෙන් විනිශ්චය කරනු ලැබුව ද ඉන් සිදු වූ යම් පාඩුවක් හෝ හානියක් සඳහා යම් වන්දියක් ලැබීමට ඒ පාර්ශ්වකරු හිමිකම් නොලැබිය යුතු ය.

### විථි ආදියට හානි පැමිණවීම

78. පහත දැක්වෙන යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. එම වරද නොකඩවා කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් දෙසිය පණහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය :—

සැතපුම් ගල්, පාලම් ආදිය නාශ කිරීම.

[1986 අංක 39 § 6]

[1986 අංක 39 § 6]

(1) යම් වීථියකට අයත් වූ හෝ පාරවල් සෑදීමේ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන හෝ ඒ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා කපා ඇති යම් වළක් හෝ ගල් වළක් හෝ ඒ ආසන්නයේ ඉදි කර ඇති යම් සැතපුම් ගලක්, සැතපුම්

කාණුවක්, මායිම් ගලක්, මායිම් කණුවක්, ලාම්පු කණුවක්, නියාමක කණුවක් හෝ යම් පාලමක්, බෝක්කුවක්, තාප්පයක්, ආරුක්කුවක්, බිත්තියක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ඇළදොරක්, ඉවුරක්, ආධාර බැම්මක්, ගොඩැල්ලක්, කරුවක්, කුළුනක්, ලාම්පුවක්, අත්වැලක්, දම්වැලක් හෝ වැටක් ඕනෑකමින් ම හෝ නොසැළකිලිමත්කමින් විනාශ කිරීම, උගුල්ලා දැමීම, විකෘත කිරීම, පෙරලා දැමීම, කැඩීම හෝ ඊට හානි පැමිණවීම ; හෝ

(2) යම් වීථියක් ප්‍රයෝජනයට ගනු ලැබීම තාවකාලික ලෙස වැළැක්වීම සඳහා හෝ එය අලුත්වැඩියා කරන අතරතුර එහි එහා මෙහා ගමන් කරන තැනැත්තන්ට අනතුරක් හෝ හානියක් සිදු වීම වැළැක්වීම සඳහා යම් කිසි බලධරයකුගේ විධානය මත එහි තබන ලද හෝ ඉදිකරන ලද යම් වැටක්, කාණුවක්, ගලක්, ලී කොටයක් හෝ වෙනත් දෙයක් ඕනෑකමින් ම හෝ නිකරුනේ ඉවත් කිරීම ; හෝ

(3) නිසි බලධරයකුගේ අවසරය නොමැති ව යම් වීථියකින් ගල්, බොරලු, වැලි හෝ වෙනත් ද්‍රව්‍යයක් හෝ මඩ, කුණු, හුළඟට ගසාගෙන යන දේ හෝ පස් එකතු කිරීම, ගොඩ ගැසීම හෝ රැගෙන යෑම ; හෝ

(4) යම් වීථියකට හානි සිදු වන අන්දමින් ඒ වීථියට හෝ වීථියෙන් ඉවතට හෝ ඒ වීථියෙහි යම් හස්තියකු, ගවයකු, අශ්වයකු, ඌරකු හෝ වෙනත් සතකු හෝ යම් වාහනයක් ගෙන යෑම හෝ ඇක්කීම හෝ ඒ වීථියට අලාභ හානි කිරීමට එකී යම් සතකුට ඉඩ හැරීම ; හෝ

(5) යම් වීථියකට යාබද යම් ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරුව සිටිමින් ඒ වීථියේ සිට හෝ ඒ වීථියේ සිට දිවෙන යම් අගලක හෝ කාණුවක සිට තමාගේ ඉඩම මැදින් හෝ ඉඩම තුළට ගලන ජලය එසේ ගලායෑම අවහිර වීමට ඉඩ හැරීම හෝ ඒ ඉඩමේ හෝ ගෙයි සිට වතුර, කැලි කසළ හෝ වෙනත් ද්‍රව්‍යයක් හෝ දෙයක් එකී යම් වීථියකට ගලාගෙන ඒමට හෝ නසා ගෙන ඊමට ඉඩ හැරීම හෝ ඔහුගේ ගෙය හෝ ඉඩම ඉදිරිපිට ඇති යම් කාණුවක ජලය ගලා යෑමට බාධා වන පරිදි ඒ කාණුවේ කුණු හෝ අපවිත්‍ර ද්‍රව්‍ය එක් රැස්වීමට ඉඩ හැරීම ; හෝ

(6) සභාවෙන් කලින් ලබා ගත් එකඟත්වය නොමැති ව ඔහුගේ ඉඩමේ කරනු ලබන යම් ක්‍රියාවකින් යම් වීථියක වූ යම් කාණුවක් හෝ බෝක්කුවක් ඔස්සේ හෝ එබඳු කාණුවකින් හෝ බෝක්කුවකින් නිදහසේ ජලය ගලා යෑමට බාධා කිරීම ; හෝ

(7) යම් වීථියකට අලාභ සිදු වන පරිදි, ඒ වීථිය මත යම් දැව දණ්ඩක්, ගලක් හෝ වෙනත් දෙයක් රෝද සහිත වාහනයකින් නොවන වෙනත් ක්‍රමයකින් ඇදගෙන යෑම හෝ ගෙන යෑම හෝ රෝද සහිත වාහනයක් තුළ සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් පටවා ගෙන යන යම් දැව දණ්ඩක්, ගලක් හෝ වෙනත් දෙයක් ඒ වීථිය මත ඇදී යෑමට හෝ ඇතිල්ලෙමින් යෑමට ඉඩ තැබීම; හෝ

(8) යම් වීථියක් මත හෝ ඒ හරහා යම් වේල්ලක්, අගලක්, කාණුවක් හෝ ජල මාර්ගයක් සෑදීම හෝ සෑදීමට සැලැස්වීම හෝ වෙනත් ක්‍රමයකින් යම් වීථියක මතුපිට කැඩීම හෝ ඊට අලාභ හානි සිදු කිරීම; හෝ

(9) සභාවේ අවසරය නොමැති ව හෝ ඒ අවසරයේ නියමයන්ට හා කොන්දේසිවලට අනුකූල නොවන ක්‍රමයකින් ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් යම් වීථියක හෝ වීථියක් ඔස්සේ හෝ වීථියක් යට හෝ වීථියක් මත යම් කාණුවක්, කුළුණක්, ලාම්පුවක්, කම්බියක්, නළයක්, වැටක් හෝ වෙනත් පිරියතක්, ද්‍රව්‍යයක් හෝ වැඩ බිමක් ඉදි කිරීම, සිටුවීම, දැමීම හෝ ගොඩනැගීම; හෝ

(10) යම් වීථියක පැති කාණුවේ පිට ගැට්ය අවුරා පාර දෙසට නෙරා යන සේ තමාගේ ගෙට අලුත් කොටසක් එකතු කිරීම හෝ යම් තාවකාලික ආධාරක මගින් හෝ වෙනත් ක්‍රමයකින් වීථියක යම් කොටසක් මත හෝ එහි පැති කාණුව මත යම් වර්ගයක බඩු විකිණීම පිණිස තැබීම හෝ පැති කාණුවලට කවර හෝ අන්දමකින් හානි සිදු වන ආකාර යට තමාගේ වාසස්ථානය ඉදිරිපිට කරත්තවලට බඩු පැටවීමට හෝ කරත්තවලින් බඩු බෑමට සැලැස්වීම.

79. මහා නගර සභාවක පාලනය යටතේ අලුත් වීථියක් ඉදි කරන ලද විට හෝ තිබෙන වීථියක යම් අලුත්වැඩියා කිරීමක් ක්‍රියාත්මක කරන ලද විට, ඉදිකිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කටයුතු නිම වීමෙන් පසු එක් මාසයකට නොවැඩි නිශ්චිත කාල සීමාවක් තුළ එම වීථියේ යම් සතකු පිට යෑම හෝ යම් සතකු දක්කීම හෝ යම් වාහනයක් ධාවනය කිරීම, එම වීථියෙහි හෝ එම වීථියට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මගින් සභාව විසින් තහනම් කිරීම නීත්‍යනුකූල විය යුතු ය; තව ද ඒ දැන්වීම උල්ලංඝනය වන පරිදි යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

තැනීමෙන් පසු අලුත් වීථියක් එක්තරා කාලයක් තුළ පාවිච්චි කිරීම.

[1986 අංක 39 § 7

කාණුව උඩින් තමාගේ ගෙට යෑමට පාලමක් ආදිය සෑදීමට අයිතිකරු හෝ පදිංචිකරු බැඳී සිටින බව.

**80.** පැත්තකින් කාණුවක් තනා හෝ හාරා ඇති යම් වීථියකට යා වූ යම් ගෙයක හෝ ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට ඒ වීථියේ සිට ඒ ගෙට හෝ ස්ථානයට අවතීර්ණ වීමේ මාර්ගයක් අවශ්‍ය වුවහොත්, ඒ කාණුවේ දිගින් අඩි තුනකට කිසි විටකවත් අඩු නොවිය යුතු ප්‍රමාණයක් ආවරණය වන පාලමක්, වේදිකාවක් හෝ ආරුක්කුවක් සභාව සෑහීමට පත් වන ආකාරයකට දැමීමට ඔහු බැඳී සිටින්නේ ය ; තව ද යම් තැනැත්තකුට එසේ පිහිටි යම් ගෙයකට හෝ ස්ථානයකට ඒ වීථියේ සිට අවතීර්ණ වීමට අයිතිය ඇති බවට ද ඒ පාලම, වේදිකාව හෝ ආරුක්කුව සැපයිය යුතු බවට ද සභාව සෑහීමට පත්ව ඇති විට, එම පාලම, වේදිකාව හෝ ආරුක්කුව වහා ම ඉදි කරන ලෙස එම ගෙයි හෝ ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට සභාව විසින් නියම කිරීමත්, සාධාරණ කාලයක් ඇතුළත එසේ එය ඉදි කිරීම ඔහු පැහැර හැරියහොත් සභාව විසින් එම වැඩය කරවීමත් ඒ සඳහා ගිය වියදම් 77 වන වගන්තියේ සඳහන් වියදම් අය කර ගැනීම සඳහා ඉන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කර ගැනීමත් නීත්‍යානුකූල වන්නේ ය.

වීථිවලට හානි පැමිණෙන අන්දමට ගස් වැවෙන්නට ඉඩ හැරීම.

[1986 අංක 39 § 8 ]

**81.** තමා අයිතිකරු වන හෝ තමා පදිංචි ව සිටින යම් ස්ථානයක, යම් වීථියකට හානියක් සිදුවන අයුරින් යම් ගසක් වැවෙන්නට ඉඩ හරින යම් තැනැත්තකු ඒ හානිය නතර කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඔහුට නියම කරමින් සභාව විසින් ඔහුට දැන්වීමක් භාර දීමෙන් පසුව ද දැන්වීමෙහි ඒ කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සාධාරණ කාලයක් ඉකුත් වීමෙන් පසුව ද එසේ වැඩෙන්නට ඉඩ හරින්නේ නම් ඔහු වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. තවද අවශ්‍ය පියවර ගැනීම වරදකරු විසින් පැහැර හැර ඇති විටක, ඔහු එසේ වරදකරු කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ද ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ පියවර සභාව විසින් ගත යුතු බවටත් ඒවායේ වියදම් 77 වන වගන්තියේ සඳහන් වියදම් අය කර ගැනීම සඳහා විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කර ගන්නා ලෙසත්, විධාන කළ හැකි ය.

ආසන්න ඉඩම එළි කිරීමෙන්, ඒවායේ වතුර බැස්සවීමෙන් හෝ කැළෑ කැපීමෙන් වීථිවලට හානි සිදු කිරීම.

**82.** (1) යම් වීථියකට හානියක් වීමට හේතු විය හැකි පරිදි ජලය හෝ මඩ රොන් පිටට ගලා යෑමේ හෝ ගලා ගෑම වැඩි වීමේ හේතුව නිසා ඒ වීථියේ තත්ත්වය නරක් වීමට හේතු විය හැකි පරිදි ඒ වීථිය ආසන්නයේ පිහිටි යම් ඉඩමක් එළි කිරීම, එහි වතුර බැස්සවීම හෝ කැළෑ කැපීම ආදී යම් ක්‍රියාවක් කිරීමට අදහස් කරන විට—

**(අ) තමාගේ යෝජිත ක්‍රියාව ගැන සභාව වෙත ලියවිල්ලකින් දැන්වීමක් කිරීම ; සහ**

(ආ) සභාව විසින් ගනු ලබන පියවරවලට අතිරේක ව වීථියට සිදු වන හානිය හෝ ඒ වීථියේ තත්ත්වය කරණ විම වැළැක් වීමට සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි සියලු පියවර තම වියදමින් ගැනීම

එකී ක්‍රියාව කිරීමට අදහස් කරන සෑම තැනැත්තකුගේ ම යුතු කම වන්නේ ය.

(2) (1) වන උපවගන්තියෙන් නියම කර ඇති දැන්වීම නොදී ඒ උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් කිරීමට භාර ගන්නා හෝ එහි සඳහන් නියමයන්ට අනුකූල ව ක්‍රියා කිරීම අනාකාරයකින් පැහැර හරින යම් තැනැත්තකු එකී ක්‍රියා නිසා සිදු වූ යම් අලාභ යක් සඳහාත් ඒ ක්‍රියාවල ප්‍රතිවිපාකයක් වශයෙන් සිදු විය හැකි හෝ සිදු විය හැකි යැයි බලාපොරොත්තු වූ යම් අලාභයක් වැළැක් වීමේ හෝ ඊට පිළියම් යෙදීමේ කාර්යය සඳහා සභාව විසින් දරන ලද වියදම් කිසිවක් සඳහාත් වගකිව යුතු අතර එබඳු යම් අලාභයක හෝ වියදම්වල මුදල 77 වන වගන්තියේ සඳහන් වියදම් ලබා ගැනීම සඳහා ඉන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කර ගත හැකි ය.

### වීථිවල කෙරෙන කරදර ආදිය

83. (1) මහා නගරයක් ඇතුළත යම් වීථියකට යන ආකාරයට හෝ යම් වීථියක් මත යම් හස්තියකු, ගවයකු, මී හරකකු, අශ්වයකු, බැටලුවකු, එළුවකු හෝ වෙනත් සතකු ලිහා දමන හෝ ලිහා ඇමීමට ඉඩ හරින හෝ ඕනෑම වර්ගයක සතකු ඒ සතාගේ පිට උඩ බඩු පැට වීම සඳහා හෝ උගේ පිට උඩ ඇති බඩු බෑම සඳහා හෝ ඒ සතා අයත් යම් කරත්තයකට හෝ බෝට්ටුවකට බඩු පැටවීම සඳහා හෝ එහි ඇති බඩු බෑම සඳහා හෝ අවශ්‍ය කාලය තුළ ඒ සතා බැඳ තබන හෝ දිගේලි කරන විටක හැර, යම් වීථියක් හරහා හෝ වෙතට යෑමට ඉඩ ලැබෙන යම් ආකාරයකින් බැඳ තබන හෝ දිගේලි කරන හෝ බැඳ තැබීමට හෝ දිගේලි කිරීමට ඉඩ හරින සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියය කට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය: වැරදි. [1986 අංක 39 § 9 අ]

එසේ වුව ද, යම් වීථියක් මතට හෝ තුළට එවැනි යම් සතකු යා හැකි වන ආකාරයට යම් වීථියක් මත හෝ තුළ ඒ සතා හමුවන හෝ බැඳ හෝ දිගේලි කර තබනු ලබන අවස්ථාවක, ඒ සතාගේ අයිති කරු විසින් ප්‍රතිවිරුද්ධ තත්ත්වය සම්බන්ධයෙන් අධිකරණය සෑහී මට පත් කරන්නේ නම් මිස, ඔහු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ සතා ලිහා දමන ලද බව හෝ ලිහාදැමීමට ඉඩ හරින ලද හෝ බැඳ තබන ලද හෝ දිගේලි කරනු ලැබ ඇති බව හෝ බැඳ තැබීමට හෝ දිගේලි කිරීමට ඉඩ හැර ඇති බව හෝ සලකනු ලැබිය යුතු ය.

(2) මහා නගරයක් ඇතුළත යම් වීථියක හෝ ඇතුළත බැඳ තබා ඇති හෝ අයාලේ හැසිරෙන හෝ බිම හාරමින් හෝ බිම වැතිර සිටින යම් ඌරකුගේ අයිතිකරුවකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. තව ද එකී යම් වීථියක හෝ ඇළක බැඳ සිටින, අයාලේ හැසිරෙන, බිම හාරමින් හෝ බිම වැතිර සිටින යම් ඌරකු දකින යම් තැනැත්තකු විසින් එම ඌරා අල්ලා ගැනීම, ඌට වෙඩි තැබීම හෝ අන්‍යාකාරයකින් ඌ විනාශ කිරීම නීත්‍යනුකූල වන්නේ ය ; තව ද ඒ තැනැත්තා කැමති නම් ඒ වරද සිදු වූ ප්‍රදේශයේ යම් සාම නිලධරයකු හෝ පොලිස් නිලධරයකු වෙත ඒ ඌරා ගෙන යා හැකි අතර ඒ නිලධරයා විසින් නොපමාව ම ඒ ඌරා විකුණා ඒ විකිණීමෙන් ලත් මුදල ඒ තැනැත්තා වෙත ගෙවිය යුතු ය.

[1986 අංක 39 §9 ආ]

(3) මහා නගරයක් ඇතුළත—

(අ) යම් වීථියක් ප්‍රයෝජනයට ගැනීමට බාධාවක් කිරීමට තරම් වන පරිදි ඒ වීථියෙහි හෝ වීථියේ පසෙක ඇඳුරු, ඇඳුම් හෝ කවර ස්වභාවයක හෝ යම් ද්‍රව්‍ය කිසිවක් එල්ලා තබන හෝ අන්‍යාකාරයකින් ප්‍රදර්ශනය කර තබන ;

(ආ) යම් කරත්තයක් හෝ වෙනත් රථයක් යම් වීථියක් මත අනතුරුවකින් කැඩුණහොත් මිස, එකී කරත්තයක් හෝ රථයක් එහි වියගසෙහි ගොනුන්, අශ්වයන් හෝ වෙනත් සතකු බැඳ තොමැතිව හෝ ඊට ඈඳා නොමැතිව යම් වීථියක තබන හෝ තැබීමට ඉඩ හරින සහ එවැනි අනතුරුවකින් කැඩීමක දී නම් ඒ කරත්තය හෝ රථය ඉවත් කර ගෙන යාමට අවශ්‍ය කාලයට වඩා වැඩි කාලයක් එය ඒ වීථියෙහි තබා ගෙන සිටින හෝ තබා ගෙන සිටීමට ඉඩ හරින ;

(ඇ) රථ වාහන ආඥාපනතින් හෝ මෝටර් රථ ගමනාගමන පනතින් නියම කර ඇති පරිදි ලාම්පු සවි නොකරන ලද යම් වාහනයක් ඉර බැසීමෙන් පැය කාලකට පසු ව සිට සහ ඉර පෑයීමට පැය කාලකට පෙර දක්වා යන කාල පරිච්ඡේදය ඇතුළත යම් වීථියක තිබෙන්නට ඉඩ හරින ;

(ඈ) යම් දිය ඇළක් පාවිච්චි කිරීමට බාධා පැමිණෙන අන්දමින් ඒ දිය ඇළේ යම් බෝට්ටුවක් හෝ තෙප්පමක් දමා යන ;

(ඉ) යම් ගල්, ගඩොල්, පහුරු, ලී, වැලි, හුණු, සතුන්ගේ කසළ, පිදුරු, කුණු හෝ යම් අගලකින් හෝ කාණුවකින් ගොඩ දමන ලද මඩ හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් යම් වීථියක, ගඟක හෝ ඇළක දමන හෝ ඊට වීසි කරන සහ ඒ ද්‍රව්‍යය හෝ දෙය ඉවත් කිරීමට නියතයෙන් ම අවශ්‍ය විය හැකි කාල සීමාවට වැඩි කාලයක් තිබෙන්නට ඉඩ හරින ;

(ඩ) ලී, ලෑලි, යකඩ හෝ වෙනත් බඩු, ඒ ද්‍රව්‍යයක කොතන් දෙකෙන් කවර හෝ කොනක් යම් කරත්තයක හෝ වෙනත් රථයක රෝද හෝ දෙපැත්ත ඉක්මවා පිටට නෙරා සිටින ලෙස පටවනු ලැබ ඒ කරත්තය හෝ රථය යම් වීථි යක තල්ලු කරගෙන, ඇදගෙන හෝ පදවාගෙන යන ;

(ඪ) යම් වීථියක හෝ ඒ මත යම් ගොඩනැගිල්ලක්, වේදිකාවක්, පාලමක්, අගලක් හෝ වැටක් හෝ වෙනත් බාධකයක් තනා හෝ තැනීමට සලස්වා යම් වීථියක් ප්‍රසර්පණය කරන ;

(ණ) යම් කරත්තයක් හෝ වෙනත් රථයක්, කන්දක් හෝ ආරෝහණ භූමියක් නගිද්දී හෝ බසිද්දී මග ඇහිරීමට හෝ එය නතර කිරීමට උපයෝගී කරගත් ගලක්, ලීයක් හෝ වෙනත් දෙයක් යම් වීථියක් මත තිබීමට සලස්වන හෝ තිබීමට ඉඩ හරින ; හෝ

(ත) යම් වීථියක් ඔස්සේ වෙන යම් තැනැත්තකු ගමන් කිරීම හෝ ඔහුගේ ආරක්ෂාව යටතේ තිබෙන යම් රථයක්, බෝට්ටුවක්, පහුරක් හෝ වෙනත් වාහනයක් යෑම සිතා මතා යම් ආකාරයකින් වළක්වන

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද, එම වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පණහක් නොඉක්මවූ අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය. 1986 අංක 39 § 9 ඇ]

(4) මහා නගරයක් ඇතුළත යම් ඇළක හෝ ගංගාවක පහසු වෙන් යාත්‍රා කිරීමට අවහිර වන හෝ යම් අන්දමකින් බාධාවක් වන අයුරින් ඒ ඇළේ හෝ ගංගාවේ කොටුවක් හෝ වැටක් හෝ වෙනත් යම් බාධකයක් සාදන හෝ තබා ගන්නා සෑම තැනැත්තකුම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. එසේ සාදා ඇති හෝ තබා ගන්නා එකී යම් කොටුවක්, වැටක් හෝ බාධකයක් සභාව විසින් කඩා දැමීම හෝ අන්‍යාකාරයකින් විනාශ කිරීම සහ ඒ සඳහා ගිය වියදම් 77 වන වගන්තියෙහි සඳහන් වියදම් අය කර ගැනීම සඳහා ඉන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කර ගැනීම නීත්‍යනුකූල වන්නේ ය. [1986 අංක 39 § 9 ඇ]

යාලේ යන ගවයන් අල්ලා ගැ ෙ.

84\. (1) මහා නගරයක් ඇතුළත යම් වීථියක හෝ ඒ අවට බැඳ, දිගේලි කර හෝ අයාලේ යමින් සිට තමාට ගමු වන යම් ගවයකු, මී හරකකු, අශ්වයකු, බැටළුවකු, එළුවකු හෝ ඌරකු, ඒ සතා යම් කරත්තයකට හෝ බෝට්ටුවකට අයත් නම් සහ බඩු පටවන හෝ බඩු බාන තුරු ඒ කරත්තයේ හෝ බෝට්ටුවේ හෝ බැඳ ඇත්නම් ද මිස, සභාව විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් අල්ලා ගැනීම ද එසේ අල්ලා ගන්නා ලද සෑම සතකු ම ඒ සතුන් ගාල් කිරීම සඳහා සභාව විසින් පිහිටුවනු ලැබ ඇති කොටුවේ තැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

[1986 අංක 39 § 10 අ]

(2) (1) වන උපවගන්තිය යටතේ අල්ලා ගනු ලැබූ කිසිම සතෙකු ඒ සතා අල්ලා ගනු ලැබුවේ කවර තැනැත්තකු විසින් ද, ඒ තැනැත්තාගේ ප්‍රයෝජනය සඳහා ද, ඒ සතා කොටුවේ තබාගෙන සිටියා වූ එක් එක් දිනය සඳහා ද සභාව විසින් තත් ප්‍රාදේශීය තත්ත්වයන් සැලකිල්ලට ගෙන කලින් කලට යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබුවහොත් මිස, ඒ සතාගේ අයිතිකරුට භාර නොදිය යුතු ය.

[1986 අංක 39 § 10 ඇ]

(3) යම් සතකු අල්ලා ගැනීමෙන් පසු ව දවස් දහයක් ඇතුළත කොටුවේ තබා ඇති ඒ සතා සම්බන්ධ ව යම් තැනැත්තකු විසින් හිමිකම් පානු නොලැබුවහොත් හෝ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති අය කිරීම් ගෙවනු නොලැබුවහොත්, සභාව විසින් ඒ සතා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ද ඒ විකිණීමෙන් ලත් මුදලින් එම සතා ඉල්ලාගනු ලැබූ තැනැත්තා වෙත සහ කොටුවේ තබා ගැනීම සහ නඩත්තුව වෙනුවෙන් එක් එක් දිනයන් සඳහා තත් ප්‍රාදේශීය තත්ත්වයන් සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට යෝජනා සම්මත මගින් නියම කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් පසුව ඉතිරි වන යම් ශේෂයක් මහා නගර සභා අරමුදලට ගෙවීම ද විකිණීමේ දින සිට එක් අවුරුද්දක් වූ කාල සීමාවක් ඇතුළත ඒ ශේෂයට හිමිකම් ඇති යම් තැනැත්තකු ඒ මුදලට හිමිකම් කියනු නොලැබුවහොත් සහ ඒ මුදල ලබා නොගත හොත් ඒ ශේෂය මහා නගර සභා අරමුදලට ගෙවීම ද නීත්‍යානුකූල වන්නේ ය.

(4) සත්ව ආඥාපනතේ කුමක් සඳහන් ව තිබුණ ද මේ වගන්තියේ විධිවිධාන සෑම මහා නගරයක ම බල සහිත වන්නේ ය.

85. 84 වන වගන්තිය යටතේ හෝ 83 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ යම් සතකු ඇල්ලීමට බලය ලත් යම් තැනැත්තකුගේ නීත්‍යනුකූල භාරයෙන් එම සතා ඉවත් කර ගෙන යන හෝ ඒ තැනැත්තාගේ බලතල හෝ යුතුකම් ක්‍රියාත්මක කිරීමෙහි දී හෝ ඉටු කිරීමේ දී ඒ තැනැත්තාට යම් අන්දමකින් පිරිහැර කරන හෝ බාධා පමුණුවන යම් තැනැත්තකු වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට ඔහු රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතුය. බල්ලන් අල්ලන්නන්ගේ හෝ ඌරන් අල්ලන්නන්ගේ කටයුතුවලට මැදිහත්වීම. [1986 අංක 39 §7]

## විශේෂ කාර්යයන් සඳහා වීථි ප්‍රයෝජනයට ගැනීම

86. ට්‍රෑම් රථ මාර්ග සම්බන්ධ යම් වැඩ පිළිවෙළක, ගෑස්, විදුලි බලය, ජලය හෝ වෙනත් මහජන සේවයක් සැපයීමේ හෝ යම් පෞද්ගලික ව්‍යවසායක හෝ අරමුණක කාර්යයන් සඳහා මහා නගර සභාවක පාලනය යටතේ ඇති වීථි ප්‍රයෝජනයට ගැනීමට ද එකී මහජන සේවය, අරමුණ හෝ ව්‍යවසාය සඵල අන්දමින් සංස්ථාපනය කිරීමේ හෝ පවත්වාගෙන යෑමේ හෝ එය වෙනස් කිරීමේ හෝ සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි ඒ සභාව අදහස් කරන සියලු ම වැඩ කිරීමට ද සියලු ඉදිකිරීම් හෝ යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට ද, නඩත්තු කිරීමට ද (මෙහි මින්මතු "ප්‍රවර්ධකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට හෝ යම් පුද්ගල මණ්ඩලයකට හෝ නීතිය මගින් සංස්ථාපනය කරන ලද යම් පළාත් පාලන ආයතනයකට බලය පැවරීම සඳහා යම් මහා නගර සභාවක් විසින් තනිවම හෝ වෙනත් යම් මහා නගර සභාවක් සමග අනුබද්ධ ව තත් කාර්යය වෙනුවෙන් වූ යම් විශේෂ ප්‍රඥප්තියක ඇති නියමයන්ට යටත් ව එකී ප්‍රවර්ධකයකු සමග කලින් කල ගිවිසුමකට එළඹිය හැකි ය. විශේෂ කාර්යයන් සඳහා වීථි ප්‍රයෝජනයට ගැනීමේ බලය පැවරීම සඳහා සභාවට ඇති බලය.

87. (1) 86 වන වගන්තියේ සඳහන් යම් ගිවිසුමක කාර්යය සඳහා ද ගිවිසුම අදාළ වන යම් මහජන සේවයක්, පෞද්ගලික ව්‍යවසායක් හෝ අරමුණක් සම්බන්ධ ව මහජනයාගේ, මහා නගර සභාවේ සහ ප්‍රවර්ධකයන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් ඉටු වීම සහතික කිරීම සඳහා ද ඒ සභාව විසින් පහත සඳහන් කාර්යයන් උදෙසා (ඒ වෙනුවෙන් යම් විශේෂ ප්‍රඥප්තියක් මගින් විධිවිධාන සලස්වා ඇති තාක් ප්‍රමාණයට හැර) රීති සාදනු ලැබිය හැකි ය :— රීති.

(අ) එම රීති මගින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් ව—

(i) සභාව වෙත සතු කොට ඇති යම් වීථියක පස්, ගල් සහ පදික වේදිකා කඩාලීමට ;

(ii) වීථි ඇතුළත හෝ යට පසළ කාණු, කාණු හෝ උමං විවර කිරීමට සහ කඩාලීමට ;

(iii) ඒ වීථියේ, ඒ ඔස්සේ, එහි යට හෝ ඒ මත යම් කාණුවක්, කුළුනක්, ලාම්පුවක්, කම්බියක්, නළයක්, අත්වැලක් හෝ වෙනත් යන්ත්‍රයක්, ද්‍රව්‍යයක් හෝ කර්මාන්තයක් සථිර ලෙස හෝ තාවකාලික ලෙස ඉදි කිරීමට, සවි කිරීමට හෝ පිහිටුවීමට ;

(iv) ඒ වීථියේ හෝ ඒ අසළ ඇති යම් පොදු සේවා මාර්ගයක්, කම්බියක් හෝ වෙනත් උපකරණයක් හෝ යන්ත්‍ර[illegible] ඇති ආකාරය වෙනත් යම් පොදු සේවාවක කාර්යයක් සඳහා වෙනස් කිරීමට

ප්‍රවර්ධකයන්ට සහ ඔවුන්ගේ අනුයෝජිතයන්ට, සේවකයන්ට හෝ වැඩකරුවන්ට හෝ සභාවේ නියෝජිතයන්ට සේවකයන්ට හෝ වැඩකරුවන්ට බලය පැවරීම ;

(ආ) එකී රීති මගින් දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී සිදු වන අලාභ හැකි තාක් අඩුවෙන් සිදුවන පරිදි ක්‍රියා කරන ලෙස සහ එකී බලතල ක්‍රියාත්මක කිරීමේ දී සිදු වූ යම් අලාභයක් සඳහා වන්දි සලසන ලෙස ප්‍රවර්ධකයන්ට නියම කිරීම.

(ඇ) ඒ රීති යටතේ කිරීමට ප්‍රවර්ධකයන්ට බලය ලැබී ඇති යම් වැඩක් හැකි තාක් ඉක්මණින් සම්පූර්ණ කරන ලෙසත්, ඉවත් කිරීමට, වෙනස් කිරීමට හෝ ඒ සඳහා සම්බන්ධ වීමට ඒ රීති අනුව බලය ලැබී ඇති යම් වීථියක්, කසළ කාණුවක්, කාණුවක්, උමඟක් හෝ යම් යන්ත්‍රයක් හෝ උපකරණයක් යළි ඉදි කරන ලෙස, අලුත්වැඩියා කරන ලෙස, ප්‍රකෘතිමත් කරන ලෙස, ඒ ප්‍රවර්ධකයන්ට නියම කිරීම ;

(ඈ) තමන්ගේ වැඩවල ප්‍රතිඵලයක් වශයෙන් ගොඩගැසෙන සියලු ම සුණු කසළ ඉවත් කරන ලෙස සහ අස් කරන ලෙස සහ ඒ සම්බන්ධයෙන් මහජන ආරක්ෂාව සඳහා නිසි පූර්වාරක්ෂක විධිවිධාන සලස්වන ලෙස ප්‍රවර්ධකයන්ට නියම කිරීම :

(ඉ) මේ වගන්තිය යටතේ වූ යම් රීතියක් මගින් බලය දී ඇති යම් වැඩවලට අවහිර කිරීම හෝ ඊට බාධා කිරීම තහනම් කිරීම.

(2) සභාව වෙත සපයා කොට නොමැති යම් ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට, එම ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරුවන්ගේ සහ පදිංචිකරුවන්ගේ කැමැත්ත පළමුවෙන් ලබා නොගෙන මොනා යම් ඇතුළු වීමකට හෝ එහි යම් ද්‍රව්‍යයක් හෝ යන්ත්‍රයක් ඉදි කිරීමට හෝ තැන්පත් කිරීමට හෝ යම් වැඩක් කිරීමට· මේ වගන්තිය යටතේ වූ කිසි ම රීතියක් මගින් බලය නොපැවරිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ මහා නගර සභාවක් විසින් සාදන ලද යම් රීතියක් කලින් කළ සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිවර්තනය කිරීම ඒ සභාව විසින් කළ හැකි ය.

86. (1) යම් මහා නගර සභාවක පාලනය යටතේ ඇති යම් වීථියක අධික බරක් ගෙන යැමෙන් හෝ අසාමාන්‍ය රථ වාහන පැදවීමෙන් සිදු වන හෝ සිදු වීමට ඉඩ ඇති අලාභ හේතු කොටගෙන එම වීථිය නඩත්තු කිරීමෙහි ලා සභාව විසින් අති මහත් වියදමක් දරා ඇති බව, අවට ප්‍රදේශයේ වීථි නඩත්තු කිරීමේ සාමාන්‍ය වියදම් සැලකීමට ගැනීමේ දී එම සභාවට පෙනී ගිය අවස්ථාවක දී, ඒ බර හෝ ඒ රථවාහන ගෙන ගියේ හෝ පැදවූයේ යම් තැනැත්තකුගේ නියමයකින් ද එසේ නැතහොත් යම් තැනැත්තකුගේ නියමයක ප්‍රතිඵලයක් වශයෙන් ද ඒ තැනැත්තාගෙන් හෝ, ඒ අධික බර හෝ අසාමාන්‍ය රථවාහන ගමනාගමනය සම්බන්ධයෙන් එක් තැනැත්තකුට වැඩි තැනැත්තන් ගණනක් වගකිව යුතු අවස්ථාවක දී අධික බර හෝ අසාමාන්‍ය රථවාහන ධාවනය නිසා සිදු වූ හෝ සිදු වීමට ඉඩ තිබූ හානිය හේතු කොට ගෙන සභාව විසින් දරන ලද බවට තිබූ බලය ඇති අධිකරණයක් සෑහීමට පත් වන පරිදි ඔප්පු කළ හැකි වියදම් ප්‍රමාණය, අදාළ අධිකරණයේ මතය අනුව එක් එක් තැනැත්තාට සාධාරණව නියම කළ හැකිනාක් ප්‍රමාණානුකූල ව එසේ දරන ලද වියදමේ සමානුපාතික කොටසක් සභාව විසින් ඒ එක් එක් තැනැත්තාගෙන් අය කර ගත හැකි ය.

අසාමාන්‍ය රථ වාහන ධාවනය නිසා දරන්නට සිදු වන වියදම්.

(2) මේ වගන්තිය යටතේ මහා නගර සභාවක් විසින් වියදම් අය කර ගන්නේ හෝ අය කර ගත හැකි වන්නේ යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තා විසින් එබඳු බර හෝ රථවාහන සම්බන්ධයෙන් ණය සමථය කිරීමක් වශයෙන් සභාවට මුදල් ගෙවීම සඳහා එම සභාව සමග එකඟ වීමකට එළඹිය හැකි අතර එකී එකඟ වීම අනුව මුදල් ගෙවන ලද අවස්ථාවක දී ඒ තැනැත්තාට විරුද්ධ ව මේ වගන්තිය යටතේ නඩු පැවරීම හෝ නීති කෘත්‍යයක් පවත්වාගෙන යෑම නොකළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වියදම් හිමිවක් අය කර ගැනීම සඳහා වූ නීති කෘත්‍යය ඒ වියදම් දරන ලද කාලයේ සිට මාස දොළහක් ඇතුළත ආරම්භ කළ යුතු අතර, යම් වියදමක් දරන ලද්දේ දීර්ඝ කාල සීමාවක් මුළුල්ලේ වූ යම් විශේෂ ගිවිසුමක හෝ වැඩක ප්‍රතිඵලයක් වශයෙන් වූ අවස්ථාවකදී ඒ නීති කෘත්‍යය ඒ ගිවිසුම හෝ වැඩය අවසාන වීමෙන් පසු මාස හයක් ගත වීමට පෙර ආරම්භ කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සභාවට ගෙවන ලද හෝ සභාව විසින් අය කර ගන්නා ලද සියලු මුදල් සභාව විසින් මහා නගර සභා අරමුදලට ගෙවිය යුතු ය.

## නිලධරයන් ආදීන්ගේ බලතල, කාර්ය සහ වගකීම්

පොදු වැඩ භාරව සිටින නිලධරයන් වෙත පවරනු ලබන බලතල ක්‍රියාත්මක කළ හැක්කේ කවුරුන් විසින් ද යන වග.

89. මහා නගරයක සීමා ඇතුළත ඇති සියලු වීථි සම්බන්ධයෙන්, මේ කොටස අදාළ වන්නා වූ වැඩ භාරව සිටින නිලධරයන් වෙත මේ කොටසින් පවරනු ලබන වෙන් වෙන් බලතල සහ අධිකාර සභාවේ නගරාධිපතිවරයා විසින් සහ ඒ වෙනුවෙන් ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද සියලු තැනැත්තන් විසින් ම හෝ ඔවුන්ගේ සේවකයන්, වැඩකරුවන් සහ කම්කරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සහ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

නිසි නිලධරයා විසින් කරනු ලබන මැනිම තිරණාත්මක සාක්ෂිය විය යුතු බව.

90. මහා නගර සභාව විසින් හෝ සභාවේ විධානයෙන් හෝ සභාවේ නගරාධිපති විසින් හෝ ඔහුගේ විධානයෙන් හෝ සභාව අනුප්‍රාප්තිකයා වන යම් අධිකාරයක් විසින් හෝ එහි විධානයෙන් හෝ සාදන ලද යම් පිඹුරක් හෝ මැනීමක්, මේ කොටස යටතේ වූ යම් නීති කෘත්‍යයක දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබුව හොත්, සභාවේ හිමිකම් පෑමට සම්බන්ධ වන ප්‍රමාණයට ඒ පිඹුර හෝ මැනීම, එහි දක්වා ඇති කරුණු පිළිබඳ ව, එම හිමිකම් පෑම ගැන විවාද කරන පාර්ශ්වය විසින් ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස තීරණාත්මක සාක්ෂිය ලෙස සැලකිය යුතුවාක් මෙන් ම එලෙසින් ම පිළිගත යුතු ය.

බලය ලත් නිලධරයන් විසින් දේපළ වලට හානි කිරීම සඳහා වන්දි.

91. මේ කොටස අදාල වන වැඩ භාරව සිටින නිලධරයන් වෙත මේ කොටසින් පවරනු ලැබ ඇති බලතල හෝ අධිකාර කිසිවක් යම් සභාවක නගරාධිපතිවරයා විසින් හෝ නගරාධිපතිවරයාගේ බලය පිට ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා යම් පාඩුවක් හෝ අලාභයක් විඳින සෑම තැනැත්තකුට ම (ඒ පාඩුව හෝ අලාභය ඒ තැනැත්තාගේ ක්‍රියාවක්, පැහැර හැරීමක් හෝ නොසැලකිල්ලක් නිසා සිදු වූ අවස්ථාවක දී හැර) වන්දිය සඳහා හිමිකම ඇති වීමෙන් පසු ව මාස තුනක් ගත වීමට පෙර යම් වේලාවක ඔහු විසින් වන්දි සඳහා සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කළහොත්, එකී පාඩුව හෝ අලාභය සඳහා වන්දි ලැබීමට ඔහු හිමිකම ලැබිය යුතු ය. ඉහත කී කාල සීමාව ඇතුළත එබඳු ඉල්ලීමක් ඉදිරිපත් කිරීම එකී යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක දී, සිදු වී යැයි කියන පාඩුව හෝ අලාභය සඳහා වන්දි වෙනුවෙන් ඔහුගේ හිමිකම් පෑමට ඉඩ නොදිය යුතු අතර ඔහු ඒ වන්දි ලබා ගැනීමෙන් වළක්වාලිය යුතු ය.

බේරුම් කිරීම.

92. යම් හේතුවක් නිසා 91 වන වගන්තිය යටතේ ගෙවිය යුතු යම් වන්දියක ප්‍රමාණය ගැන, මහා නගර සභාව සහ හිමිකම් පාන්නා අතර එකඟත්වයක් ඇති නොවූ අවස්ථාවකදී සභාව විසින් නම් කළ යුතු එක් තැනැත්තකු ද හිමිකම්පාන්නා විසින් නම් කළ යුතු තවත් තැනැත්තකු ද වශයෙන් වූ බේරුම් කරුවන් දෙදෙනෙකු විසින් එකී වන්දි ප්‍රමාණය තීරණය කළ යුතු ය. බේරුම්කරුවන් දෙදෙනාට එකඟත්වයකට එළඹිය නොහැකි වුවහොත් ඔවුන් විසින් තීරකයකු පත් කළ යුතු අතර සභාව සහ හිමිකම් පාන්නා

විධාන් එකඟ වන ලද නියමයක් අනුව, අවස්ථාවෝචිත පරිදි, බේරුම්කරුවන් හෝ තීරක විසින් දෙන ලද තීරණය අවසානාත්මක විය යුතු ය.

93. යම් වීථියක යම් වැඩක් භාරව සිටින මහා නගර සභාවක යම් නිලධරයකු විසින් හෝ එකී යම් සභාවක් සමග වූ යම් ගිවිසුමක් අනුව යම් වීථියක කටයුතුවල යෙදී සිටින යම් තැනැත්තකු විසින් එම වීථිය මත යම් ගල් ගොඩක්, බොරලු ගොඩක්, කුණු ගොඩක් හෝ කවර හෝ වෙනත් ද්‍රව්‍ය ගොඩක් දැමුවහොත් හෝ දැමීමට සැලැස්වුවහොත් සහ එම වීථිය ඔස්සේ ගමන් කරන යම් තැනැත්තකුට අනතුරක් වන පරිදි හෝ පෞද්ගලික අලාභ හානියක් වන පරිදි ඒ ගොඩ (එ බඳු අනතුරක් හෝ අලාභ හානියක් සිදු වීම වැළැක්වීම පිණිස ඔහු විසින් සියලු නිසි සහ සෑහෙන පූර්වාරක්ෂක විධිවිධාන සැලැස්වා නොමැති ව) රාත්‍රි කාලයේ දී එහි රැඳී තිබීමට ඉඩ හැරියහොත් එකී නිලධරයා හෝ තැනැත්තා වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

රාත්‍රි කාලයේදී විථි මත ගල් ආදිය දමා යන නිලධරයන් හා කොන්ත්‍රාත් කරුවෝ.

[1986 අංක 39§12]

94. 93 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, යම් වීථියක යම් වැඩක් භාරව සිටින මහා නගර සභාවේ යම් නිලධරයකු හෝ සභාව යටතේ වූ යම් කොන්ත්‍රාත්කරුවකු, ඒ නිලධරයාගේ තනතුරේ කාර්ය ඉටු කිරීමෙහි ලා ඒ නිලධරයා විසින් කරන ලද හෝ ඒ කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඒ කොන්ත්‍රාත්කරු විසින් කරන ලද යම් ක්‍රියාවක් සඳහා යම් නඩු පැවරීමකට හෝ යම් දඩයකට මේ කොටසේ සඳහන් කිසිවක් නිසා යටත් නොවිය යුතු ය.

ඇතැම් අවස්ථා වල දී හැර මාර්ග නිලධරයකු හෝ මාර්ග කොන්ත්‍රාත් කරුවකු දඩයට යටත් නොවන බව.

95. තමන් පත් කරනු ලැබ සිටින ප්‍රදේශය ඇතුළත මේ කොටසට පටහැනිව කෙරෙන සියලු වැරදි වැළැක්වීමෙහිලා ආධාර හා උපකාර කිරීම පොලිස් හමුදාවේ සියලු නිලධරයන්ගේ කාර්යය විය යුතු ය.

පොලිස් නිලධරයන් මේ කොටසේ විධි විධාන බලාත්මක කළ යුතු බව.

---

## VI වන කොටස

## මහජන සෞඛ්‍යය පිළිබඳ බලතල සහ යුතුකම්

### මහජන සෞඛ්‍යය

96. එක් එක් මහා නගරයක මහා නගර සභා වෙත යම් බල ධරයකු වෙත නීතියෙන් පැවරී ඇති බලතලවලට සහ වගකීම්වලට යටත් ව, ඒ මහා නගරය ඇතුළත මහජන සෞඛ්‍යය ප්‍රරෝහණය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යයන් සඳහා වූ පොදු පරිපාලන අධිකාරිය විය යුතු අතර, මේ ආඥාපනතින්, කරදර පිළිබඳ ආඥා පනතින්, නිවාස සහ නගර සංවර්ධන ආඥා පනතින් සහ ඒ සඳහා තත් කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියකින් ඊට පවරා ඇති සියලු බලතල ඒ කාර්යය සඳහා ක්‍රියාත්මක කිරීමේ හිමිකම ඒ සභාවට තිබිය යුතු ය.

මහා නගර සභාව පොදු මහජන සෞඛ්‍ය අධිකාරිය විය යුතු බව.

## ජලාපවහනය

ආණ්ඩුව හෝ සභාව විසින් පොදු කාණු ඉදි කළ යුතු බව.

97. ආණ්ඩුව විසින් හෝ යම් මහා නගර සභාවක් විසින් මහා නගරයේ ඵලදායී ජලාපවහනය සඳහා අවශ්‍ය යැයි පෙනී යන ප්‍රධාන නළ හෝ වෙනත් කාණු, කසළ කාණු සහ ජල මාර්ග කලින් කල සෑදීම, වෙනස් කිරීම හෝ දීර්ඝ කිරීම කළ හැකි අතර, අවශ්‍ය වුව හොත් යම් වීථියක් හෝ වීථියක් ලෙස සැලසුම් කර ඇති හෝ අදහස් කර ඇති යම් ස්ථානයක් හෝ වීථියක් යටින් ඇති යම් උමං ගබඩාවක හෝ සුරක්ෂිතාගාරයක් මැදින්, හරහා හෝ යටින් සහ (තත් කාර්යය සඳහා ලියවිල්ලකින් සෑහෙන දැන්වීමක් කිරීමෙන් පසුව) සිදු වන අලාභ හැකි තාක් අඩු වන ලෙස ද, යම් අලාභයක් සිදු වුවහොත් ඒ වෙනුවෙන් සම්පූර්ණ වන්දි සලසමින් ද යම් කොටු කර ඇති ඉඩම් හෝ වෙනත් කවර අන්දමක හෝ ඉඩම් තුළට, ඒ මැදින් හෝ යටින් ද ඒවා ඇමිය හැකි ය.

කාණු අලුත් වැඩියා කිරීමට, වෙනස් කිරීමට සහ වසා දැමීමට සභාවට ඇති යුතුකම.

98. (1) සෑම මහා නගර සභාවක් විසින් ම පොදු කාණු, බෝක්කු, පීලි සහ ජල මාර්ග සියල්ල හෝ ඉන් කිසිවක් පවත්වා ගෙන යෑම ද කලින් කල අලුත්වැඩියා කිරීම ද සුදුසු යැයි ඒ සභාවට පෙනෙන ආකාරයට ඒවා විශාල කිරීම, වෙනස් කිරීම, උඩින් ආරුක්කු ඇමීම, හෝ වෙනත් ආකාරවලින් වැඩි දියුණු කිරීම ද කළ යුතු අතර ඒවායින් යමක් නිෂ්ප්‍රයෝජන හෝ අනවශ්‍ය බව සභාව විසින් අදහස් කරන විටක, කිසි ම කරදරයක් සිදු නො වන අන්දමින් එය වසා දැමීම, පිරවීම හෝ විනාශ කිරීම කළ හැකි ය.

(2) යම් කාණුවක්, බෝක්කුවක්, පිල්ලක් හෝ ජල මාර්ගයක් වසා දැමීමේ, පිරවීමේ, විනාශ කිරීමේ හෝ වෙනස් කිරීමේ හේතුව නිසා යම් තනැත්තකුට එහි නිත්‍යානුකූල පාවිච්චියට ඇති අයිතිය නැති වූ අවස්ථාවක දී, සභාව විසින් ඒ වෙනුවට වෙනත් ඵලදායී ආදේශික වැඩ පිළිවෙළක් අනලස්ව සැපයිය යුතු ය.

කාණු වලට වාතාශ්‍රය ලබා දීම සඳහා ගොඩනැගිලි වලට නළ සවි කිරීමේ බලය.

99. (1) පොදු කාණුවලට නිසි වාතාශ්‍රය ලබා දීම සඳහා අවශ්‍ය යැයි සභාව අදහස් කරන අන්දමේ නළ සහ සවි කිරීම් සභාව විසින් යම් ගොඩනැගිල්ලක පිට පැත්තේ සවි කිරීමට සැලැස්විය හැකි ය.

(2) එම නළ සහ සවි කිරීම් සෑදීම සහ සවි කිරීම ඒවායින් අවට ප්‍රදේශයේ සිදු වන අපහසුතාව අඩුව ම සිදු වන ආකාරයකට කළ යුතු ය. ඒ සෑම නළයක ම කට නළය සවි කර ඇති ගොඩනැගිල්ලේ පියසි කෙළවරට යටත් පිරිසෙයින් අඩි දෙකක්වත් උඩින් ද යම් ජනේලයකට යටත් පිරිසෙයින් අඩි දහයක්වත් දුරින් ද තිබිය යුතු ය.

**100.** (1) සෑම මහා නගර සභාවක් විසින් ම සියලු පොදු කාණු, බෝක්කු, පීලි සහ ජල මාර්ග කරදරයක් හෝ සෞඛ්‍යයට හානියක් නොවන ආකාරයට සෑදීමට, නඩත්තු කිරීමට සහ තබාගැනීමට ද ඒවා නිසි ලෙස ශුද්ධ කිරීමට, පිරිසිදු කිරීමට සහ හිස් කිරීමට ද සැලැස්විය යුතු ය; තව ද ඒවා නඩත්තු කිරීමේ, සෝදා හැරීමේ, භාරා ශුද්ධ කිරීමේ සහ හිස් කිරීමේ කාර්යය සඳහා සභාව විසින් අවශ්‍ය ජලාශ, සොරොව්, යන්ත්‍ර සහ වෙනත් පවිටල් පොළව උඩ හෝ යට සෑදීම සහ තැබීම කළ හැකි ය.

කාණු ශුද්ධ පවිත්‍ර කිරීම සහ හිස් කිරීම.

(2) සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ඒ කාණු, බෝක්කු, පීලි සහ ජල මාර්ග සියල්ල ම හෝ ඉන් කිසිවක් මුහුදට හෝ වෙනත් සුදුසු තැනකට සම්බන්ධ කිරීමට සහ හිස් කිරීමට සැලැස්විය හැකි ය; එසේ නැතහොත් ඒවායේ ඇති කසල එකී කසල නැත්පත් කිරීමට පහසු ම ස්ථානයකට නිසි මාර්ගයකින් යැවීමට සැලැස්වීම සහ එකී කසල යම් කෘෂිකාර්මික හෝ සභාව විසින් සුදුසුම යැයි අදහස් කරන වෙනත් කාර්යයන් සඳහා විකිණීම හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීම කළ හැකි ය. එහෙත් එය කළ යුතු වන්නේ එයින් කරදරයක් නොවන ආකාරයට ය.

**101.** වර්ෂා ජලය හෝ අපවහන ජලය ගලා බසින යම් ස්වාභාවික දිය පාරක්, ඇළක්, වැවක්, වගුරක් හෝ ඉන් යම් කොටසක් ඒ වර්ෂා ජලය හෝ අපවහන ජලය ඇතුළු වීම සඳහා විවෘත ව තිබිය යුතු යැයි මහා නගර සභාවක් විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරන ලද කවර අවස්ථාවක දී වුව ද ඒ යෝජනා සම්මතය පිළිබඳ ලිඛිත දැන්වීමක් සභාවෙන් ලැබීමෙන් පසු වර්ෂා ජලය හෝ අපවහන ජලය නිර්බාධිත ව ගලා යෑමට බාධා වන හෝ අවහිර වන අන්දමින් යම් දිය පාරක්, ඇළක්, වැවක් හෝ වගුරක් පුරවන හෝ පුරවා තිබීමට ඉඩ හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම් ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය:

වර්ෂා ජලය සහ අපවහන ජලය පිට කිරීමට බාධා කිරීම.

[1986 අංක 39§13]

එසේ වුව ද,

(අ) වර්ෂා ජලය හෝ අපවහන ජලය ඇතුළු වී ගලා ගෙන යෑමට නගරාධිපතිවරයාගේ මතය අනුව ප්‍රමාණවත් සහ සුදුසු වෙනත් ඇළක් හෝ කාණුවක්, කලින් සපයනු ලැබුව හොත් එකී ස්වභාවික දිය පාර, ඇළ, වැව හෝ වගුර එහි අයිතිකරු විසින් පිරවිය හැකි ය;

(ආ) එබඳු වෙනත් ඇළක් හෝ කාණුවක් සැපයීමේ වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් සභාව විසින් ප්‍රදානය කළ හැකි ය.

කාණු වලට සහ දිය පාරවල් වලට අවහිර කිරීම.

102. (යම් පෞද්ගලික ස්ථානයක පිහිටි හෝ නොඑසේ වූ) යම් පොදු කාණුවක් හෝ දිය පාරක් පුරවා දමන හෝ එහි නිර්බාධික ප්‍රවාහයට අන් ලෙසකින් බාධා කරන හෝ අවහිර කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකටද ඒ වරද නොකඩවා කරගෙන යන අවස්ථාවක නම් ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකටද ඔහු යටත් විය යුතු ය.

[1986 අංක 39§14]

බලය රහිතව පෞද්ගලික කාණු පොදු කාණු වලට සම්බන්ධ කිරීම.

103. (1) සභාවේ එකඟත්වය ලිඛිතව කලින් ලබා නොගෙන පොදු කාණුවකට හෝ දිය පාරකට කෙලින් ම හෝ අන් ලෙසකින් සම්බන්ධවන අන්දමින් යම් කාණුවක් සාදන හෝ සෑදීමට සලස්වන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකටද ඒ වරද නොකඩවා කරගෙන යන අවස්ථාවක නම් ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

[1986 අංක 39§15]

(2) සභාවේ එකඟත්වය නොමැතිව හෝ මේ ආඥාපනතේ හෝ තත් කාලයේ බල පවත්නා යම් අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල නොවන ආකාරයකින් හෝ එකී යම් පොදු කාණුවකට හෝ දිය පාරකට සම්බන්ධ කර ඇති යම් කාණුවක් කඩා දැමීම, වෙනස් කිරීම හෝ වෙනත් ආකාරයකින් ඒ විධිවිධානවලට අනුකූල වන අන්දමට සකස් කිරීම සභාව විසින් කරවිය හැකි ය ; එහි ලා දරනු ලබන සියලු වියදම් ඒ කාණුව සම්බන්ධ කළ හෝ සම්බන්ධ කිරීමට සැලැස්වූ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර එසේ ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක එම වියදම් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කර ගත හැකි විය යුතු ය.

පොදු කාණු ආදිය උඩින් ගොඩනැගිලි ඉදිකිරීම.

104. (1) සභාවේ ලිඛිත එකඟත්වය කලින් ලබා නොගෙන යම් පොදු කාණුවක්, බෝක්කුවක්, පීල්ලක් හෝ දිය පාරක් උඩින් යම් ගොඩනැගිල්ලක් හෝ පවුරක් ගොඩනගන හෝ ඉදි කරන හෝ ගොඩ නැගීමට හෝ ඉදි කිරීමට සලස්වන සෑම තැනැත්තකුම වරද කට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකටද නොවැඩි දඩයකටද ඒ වරද නොකඩවා කරගෙන යන

[1986 අංක 39§16]

අවස්ථාවක් නම් ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසුවත් ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසීය පනහ කට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

(2) සභාවේ එකඟත්වය නොමැතිව හෝ මේ ආඥාපනතේ හෝ තත් කාලයේ බල පවත්නා යම් අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල නොවන ආකාරයකින් ගොඩනඟන ලද හෝ ඉදි කරන ලද (1) වන උපවගන්තියේ සඳහන් යම් ගොඩනැගිල්ලක් හෝ පවුරක් කඩා දැමීම, වෙනස් කිරීම හෝ ඒ විධිවිධානවලට අනුකූල වන අන්දමට වෙනත් ආකාරයකින් සකස් කිරීම සභාව විසින් කරවිය හැකි ය; එහි ලා දරනු ලබන සියලු වියදම් ඒ ගොඩනැගිල්ල හෝ පවුරලය ගොඩනැගූ හෝ ඉදි කළ හෝ ගොඩනැංවීමට හෝ ඉදි කිරීමට සැලැස්වූ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක එම වියදම් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කර ගත හැකි විය යුතු ය.

පෞද්ගලික කාණු සෑදීම ආදිය.

105. (1) (අ) යම් කාණුවක් හෝ ජලාපවහන උපකරණයක් සෑදීම, සවි කිරීම හෝ වෙනස් කිරීම පිළිබඳ ; හෝ

(ආ) යම් කාණුවක් යම් පොදු කාණුවකට සම්බන්ධ කිරීම පිළිබඳ

සියලු ම වැඩ සභාවේ නිලධරයකු විසින් හෝ ඒ සඳහා සභාව විසින් බලපත්‍ර දෙන ලද තැනැත්තකු විසින්, ජලාපවහනය කරනු ලබන ස්ථානවල අයිතිකරුවන්ගේ වියදමින් සහ වැය බරින් ද මේ ආඥාපනතේ හෝ තත් කාලයේ බල පවත්නා යම් අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ද කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන--

(i) යම් පොදු කාණුවක හෝ ඊට සම්බන්ධ යම් උපකරණයක් සම්බන්ධයෙන් ; හෝ

(ii) පෞද්ගලික ස්ථානගත මුළුමනින් ම පිහිටියා වූ ද පොළොව යට කාණුවක් හෝ පොළව යට කාණුවකට සම්බන්ධ කරන ලද කාණුවක් නොවන්නාවූද යම් කාණුවක් සම්බන්ධයෙන්

අදාළ නොවිය යුතු ය.

(2) සභාවේ නිලධරයකු නොවී හෝ සභාව විසින් බලපත්‍ර දෙන ලද තැනැත්තකු නොවී (1) වන උපවගන්තියේ සඳහන් යම් වැඩක් කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් වැඩක්, (සභාවේ නිලධරයකු හෝ සභාව විසින් බලපත්‍ර දෙන ලද තැනැත්තකු නොවන) යම් තැනැත්තකු විසින් හෝ මේ ආඥාපනතේ හෝ තත් කාලයේ බලපවත්නා යම් අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල නොවන ආකාරයකින් කරනු ලැබ ඇති අවස්ථාවක, එසේ සෑදූ දෙය කඩා දැමීමට, වෙනස් කිරීමට හෝ ඒ විධිවිධානවලට අනුකූල වන පරිදි අන්‍යාකාරයකින් සකස් කිරීමට සභාව විසින් සැලැස්විය හැකි අතර, එම වැඩය සභාවේ නිලධරයකු විසින් කරන ලද අවස්ථාවක දී හැර, ඒ වැඩය සඳහා ගිය වියදම් ඒ වැඩය කළ ස්ථානයේ අයිතිකරු විසින් ගෙවිය යුතුය. ඒ වියදම් එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක දී ඒ වියදම් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කර ගත හැකි විය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන යටතේ කරන ලද යම් වැඩක් සියලු සාධාරණ වේලාවන් තුළ දී සභාවේ නිලධරයන් විසින් පරීක්ෂා කරනු ලැබීමට ඉඩ තිබිය යුතු ය.

අලුත් ගොඩනැගිලි වල කාණු.

**106.** (1) යම් අලුත් ගොඩනැගිල්ලක් ඉදි කරන හෝ ඉදි කිරීමට සලස්වන හෝ යම් ගොඩනැගිල්ලක් යළි ඉදි කරන හෝ යළි ඉදි කිරීමට සලස්වන සෑම තැනැත්තකු ම, එම ගොඩනැගිල්ලේ ජලාපවහනය සඳහා ද මේ පනතේ හෝ තත් කාලයේ බලපවත්නා යම් අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුව ඒ ගොඩනැගිල්ලෙන් යම් අපවිත්‍ර ද්‍රව්‍ය, අපවිත්‍ර ද්‍රව, වැසි ජලය හෝ මලමූත්‍රාදිය එකතු වී ඉවත් වීම සඳහා ද අවශ්‍ය යැයි සභාව විසින් අදහස් කරනු ලබන අන්දමේ කාණු සහ උපකරණ එම ගොඩනැගිල්ලට සැපයීමට සැලැස්විය යුතු ය.

[1986 අංක 39 § 18]

(2) ඉහත කී කාණු සහ උපකරණ සැපයීම පැහැර හරින හෝ අතපසු කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

පොදු කාණු වලට අඩි සියයක් ඇතුළත ඇති ස්ථානවල ජලාපවහනය.

**107.** (1) යම් ස්ථානයක්, පොදු කාණුවකට හෝ කාණු නිත්‍යානුකූලව හිස් කිරීමට සුදුසු වෙනත් යම් ස්ථානයකට අඩි සියයක් ඇතුළත ඇති අවස්ථාවක, සභාව විසින් ඒ ස්ථානයේ අයිතිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කාලයක් ඇතුළත ඒ ස්ථානයේ ජලාපවහන ඵලදායී ලෙස සිදුවීම සඳහා අවශ්‍ය යැයි සභාව විසින් සලකනු ලබන පහත සඳහන් වැඩ සියල්ල ම හෝ ඉන් කිසිවක්, සභාව සෑහීමට පත්වන පරිදි ද තත් කාලයේ බල පවත්නා යම් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ද සපයන ලෙස සහ කරන ලෙස නියම කළ හැකි ය :—

(අ) අපවිත්‍ර ද්‍රව්‍ය, අපවිත්‍ර ද්‍රව සහ වැසි ජලය ඒ කාණුවට හෝ වෙනත් සුදුසු ස්ථානයකට ඉවත් කොට ගෙන යෑම සඳහා අවශ්‍ය ඇලවල්, කාණු, කාණු වළවල්, කාණු කපාට සහ උපකරණ සැපයීම හා සෑදීම ;

(ආ) සැපෙන ජල සැපයුමක් තිබෙන අවස්ථාවක ප්‍රමාණවත් සහ සුදුසු දිය වැසිකිළි හෝ අතිරේක දිය වැසිකිළි, කාණු හා ඊට සම්බන්ධ වෙනත් උපකරණ සැපයීම හා සැදීම සහ යම් වළ වැසිකිළියක්, වැසිකිළි කොටුවක්, වැසිකිළි වළක්, කොටු වැසිකිළියක් හෝ වෙනත් වැසිකිළියක්, දිය වැසිකිළියක් බවට හැරවීම හෝ එසින් යම් වල වැසිකිළියක්, වැසිකිළි කොටුවක්, වැසිකිළි වළක්, කොටු වැසිකිළියක් හෝ වෙනත් වැසිකිළියක් අහෝසි කිරීම;

(ඇ) (එම ස්ථානයේ ජලාපවහන ක්‍රමය අනුව ජලාපවහනය සඳහා සභාවේ එකඟත්වය ඇතිව සාදන ලද යම් කාණුවක් හෝ උපකරණයක් හැර) සභාවේ මතය පරිදි අනවශ්‍ය හෝ සෞඛ්‍යයට අහිතකරව එවකට පවතින යම් කාණුවක් හෝ උපකරණයක් නැවත සෑදීම, මතු කිරීම සහ ඉවත් කිරීම හෝ පිරවීම.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද දැන්වීමක නියමයන්, එම දැන්වීමේ සඳහන් කාල සීමාව ඇතුළත පිළිපැදීම පැහැර හරින හෝ අතපසු කරන සෑම අයිතිකරුවකු ම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39 § 19]

108. (1) යම් ස්ථානයක පොදු කාණුවකට හෝ කාණු නීත්‍යානුකූලව හිස් කිරීමට සුදුසු වෙනත් යම් ස්ථානයකට අඩි සියයකට වඩා දුරින් නමුත් අඩි දෙසීයයක් ඇතුළත ඇති අවස්ථාවක සභාව විසින්, ඒ ස්ථානයේ අයිතිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත 107 වන වගන්තියේ සඳහන් වැඩ සියල්ලම හෝ ඉන් යමක් තත් කාලයේ බල පවත්නා යම් අතුරු ව්‍යවස්ථාවලට අනුකූල ව සපයන ලෙස සහ කරන ලෙස නියම කළ හැකිය. වෙනත් අවස්ථා වල ස්ථාන වල ජලාපවහනය.

(2) එම ස්ථානයේ සිට සාධාරණ දුරක් ඇතුළත පොදු කාණුවක් හෝ කාණු නීත්‍යනුකූල ව හිස් කිරීමට සුදුසු වෙනත් යම් ස්ථානයක් නැති බව සභාවේ මතය වන අවස්ථාවක, සභාව විසින්, එම ස්ථානයේ අයිතිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත, ඒ ස්ථානයේ අපවිත්‍ර ද්‍රව්‍ය සහ අපවිත්‍ර ද්‍රව එකතු කර ඉවත් කිරීමට සහ මල මූත්‍රාදිය ඒ ස්ථානයෙන් ඉවත් කිරීමටත් ඉතාම සුදුසු හෝ අවශ්‍ය ලෙස සභාව විසින් අදහස් කරනු ලබන වෙනත් වැඩ සපයන ලෙස සහ කරන ලෙස නියම කළ හැකි ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද දැන්වීමක නියමයන් ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත පිළිපැදීම පැහැර හරින හෝ අතපසු කරන සෑම අයිතිකරුවකු ම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය. [1980 අංක 39§20]

ඒකාබද්ධව ජලාපවහනය සැලැස්වීම.

109. (1) එකට යාව හෝ වෙන් වෙන් ව පිහිටි ස්ථාන සමූහයක ජලාපවහනය වෙන වෙනම සලස්වනවාට වඩා සමස්තයක් වශයෙන් ගෙන ජලාපවහනය සැලැස්වීම වියදම් අතින් අඩු බව හෝ වෙනත් අන්දමකින් වාසි සහගත බව සභාවට පෙනී යන අවස්ථාවක, ඒ ස්ථාන සමූහයේ ජලාපවහනය සඳහා පහත සඳහන් විධිවිධානවලට අනුකූලව වූ යෝජනා ක්‍රමයක් සභාව විසින් සකස් කරවිය හැකි ය:—

(2) ඒ සෑම අවස්ථාවක දී ම—

(අ) එම ක්‍රමයට ඇතුළත් වන ස්ථාන සහ අවශ්‍ය වැඩවල ස්වභාවය හා ප්‍රමාණය දැක්වෙන පිඹුරු;

(ආ) ස්ථාන සහ සොයා දැන ගත හැකි පමණට එම ස්ථානවල අයිතිකරුවන්ගේ නම් දැක්වෙන උපලේඛනයක්;

(ඇ) එම ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ මතය අනුව අවශ්‍ය වන ඒ වැඩවල වියදම් පිළිබඳ ඇස්තමේන්තුවක්;

(ඈ) එසේ භාර ගනු ලබන යම් වැඩකින් ඒ ඒ ස්ථානවල අයිතිකරුවන්ට සිදුවන ප්‍රයෝජනයේ අඩුවැඩිකම සැලකිල්ලට ගනිමින් ඉතා ම සාධාරණ යැයි සභාවට පෙනී යන ආකාරයකට එම වියදම ඒ ස්ථානවල අයිතිකරුවන් අතරේ කොටස් කිරීමේ තාවකාලික සටහනක්

සභාව විසින් සකස් කරවිය යුතු ය.

(3) යෝජිත වැඩ මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කිරීමේ අදහස ගැන සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් වූ ලිඛිත දැන්වීම්, ජලාපවහනය සලසනු ලබන සියලු ස්ථානවල අයිතිකරුවන්ට පෞද්ගලිකව භාර දීමෙන් හෝ ඔවුනොවුන්ගේ වාසස්ථානවල හෝ ව්‍යාපාර ස්ථානවල තැබීමෙන් හෝ ඔවුන්ට ඒ වාසස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානවලට යොමු කරන ලද ලියාපදිංචි ලිපි තැපැල් කිරීමෙන් හෝ භාර දීමට සභාව විසින් සැලැස්විය යුතු ය.

(4) එම දැන්වීම භාර දීමෙන් පසු මාසයක් ගත වන තුරු ඉහත සඳහන් විස්තර හෝ එහි සහතික පිටපත් මහා නගර සභා කාර්යාලයේ තැන්පත් කර තැබිය යුතු අතර එය සියලු සාධාරණ වේලාවන් තුළ දී පරීක්ෂා කර බැලීමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

(5) එසින් යම් ස්ථානයක අයිතිකරු විසින් එකී මාසය ඇතුළත සභාව වෙත භාර දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් පහත සඳහන් හේතු අතුරින් යම් හේතුවක් උඩ ඒ යෝජනාවලට විරෝධය දැක්විය හැකි ය:—

(අ) යෝජිත වැඩ ප්‍රමාණවත් නොවීම හෝ අනවශ්‍ය වීම හෝ මේ ආඥාපනත අනුව නියමිත නොවීම;

(ආ) වැඩය සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම් අධික වීම ;

(ඇ) එකී වියදමේ තාවකාලික කොටස් කිරීම, විරෝධතාවේ සඳහන් කළ යුතු යම් සිද්ධිමය කරුණක් සම්බන්ධයෙන් සාවද්‍ය වීම ;

(ඈ) යම් ස්ථානයක් යෝජනාවලින් ඉවත් කළ යුතු වීම හෝ ඊට ඇතුළත් කළ යුතු වීම ;

(ඉ) දැන්වීම්, පිඹුරු හෝ ඇස්තමේන්තු සම්බන්ධයෙන් යම් මූලික විධි විරෝධතාවක්, දෝෂයක් හෝ වැරැද්දක් තිබීම ;

(ඊ) ගෙවීමට ඇති යම් වන්දියක් අධික වීම හෝ ප්‍රමාණවත් නොවීම.

(6) සභාව විසින් විරෝධතා සලකා බලා ඒ ගැන තීරණය කළ යුතු අතර ඒ පිළිබඳ සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(7) එබඳු විරෝධතා දක්වා නොමැති යම් අවස්ථාවක දී හෝ විරෝධතා දක්වනු ලැබ ඒවා ගැන සභාව විසින් තීරණය කරනු ලැබ ඇති යම් අවස්ථාවක දී, යෝජනා ක්‍රමයට අනුකූලව ස්ථානයේ ජලාපවහනය සැලැස්වීමට සභාව විසින් නියම කළ හැකි අතර සුදුසු යයි සභාව විසින් සලකනු ලබන්නේ නම්, සභාව විසින්—

(අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වැඩ සියල්ල ම හෝ ඉන් කිසිවක් කොන්ත්‍රාත් ක්‍රමයෙන් හෝ වෙනත් ක්‍රමයකින් කිරීමට කටයුතු කළ හැකි ය ; නැතහොත්

(ආ) ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත, ස්ථානය තුළ හෝ ස්ථානයේ ජලාපවහනය සඳහා පමණක් ම හෝ අවශ්‍ය වැඩ සියල්ල ම හෝ ඉන් යමක් සපයන සහ ක්‍රියාත්මක කරන ලෙස අයිතිකරුවන් සියලු දෙනාට ම හෝ ඉන් කිසිවකුට නියම කළ හැකි ය ;

(8) මේ වගන්තිය යටතේ සකස් කරන ලද යම් යෝජනා ක්‍රමයක ඇතුළත් ස්ථාන සියල්ලේ ම හෝ ඉන් යමක අයිතිකරුවන්ගෙන් මිනුම් සහ පිඹුරු සකස් කිරීමේ වියදම් වශයෙන් සාධාරණ මුදලක් සමානුපාතික ව සභාව විසින් අය කර ගත හැකි ය.

(9) මේ වගන්තිය යටතේ වූ වැඩ පිළිවෙළින් කිසිවක් සභාව විසින් කර අවසාන වී එහි වියදම් සොයා දැන ගෙන ඇති අවස්ථාවක, කොටස් කිරීමේ තාවකාලික සටහන සකස් කළ ආකාරයෙන් ම කොටස් කිරීමේ අවසාන සටහනක් සකස් කර මෙහි විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට ඒ වියදම් අය කර ගත යුතු ය.

(10) ඒ යෝජනා ක්‍රමය යටතේ ඉහත කී පරිදි සාදන ලද ජලාපවහන ක්‍රමය නඩත්තු කිරීමේ වියදම ඒ යෝජනා ක්‍රමයෙන් ප්‍රයෝජන ලබන ස්ථානවල අයිතිකැරුවන් විසින් සම සේ දැරිය යුතු ය.

(11) (7) (ආ) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද යම් දැන්වීමක නියමයන්ට අනුකූල ව එම දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ක්‍රියා කිරීම පැහැර හරින හෝ අතපසු කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39§21]

වෙනත් තැනැත්තන්ට අයත් ඉඩම මැදින් කාණු දැමීමට ඇති අයිතිවාසිකම.

**110.** (1) යම් ස්ථානයක ජලාපවහනය සඳහා අවශ්‍ය කාණුවක් යම් කාණුවකට හෝ කාණු නීත්‍යනුකූල ව හිස් කිරීමට සුදුසු වෙනත් ස්ථානයකට හිස් කිරීමට ඇති එක ම හෝ හොඳ ම ප්‍රායෝගික ක්‍රමය එම කාණුව එකී ස්ථානයේ අයිතිකරු නොවන තැනැත්තකුට අයිති යම් ඉඩමකට, ඉඩමක් මැදින් හෝ ඉඩමක් යටින් දැමීම බව සභාවට පෙනී ගිය කල්හි, සභාව විසින්, යම් විරෝධතාවක් ඇත්නම් එය ඉදිරිපත් කිරීමේ සාධාරණ අවස්ථාවක් එකී ඉඩමේ අයිතිකරුට දීමෙන් පසු, විරෝධතාවක් ඉදිරිපත් කරනු නොලැබුවේ නම් හෝ එසේ නැතහොත් ඉදිරිපත් කරනු ලැබූ යම් විරෝධතාවක් නිර්බල හෝ අප්‍රමාණවත් බව සභාවට පෙනී ගිය හොත්, ලියවිල්ලකින් වූ නියමයක් මගින්, සභාව විසින් ඉඩ දීම සුදුසු යැයි අදහස් කරන ආකාරයකට එකී ඉඩමට, ඉඩම මැදින් හෝ ඉඩම යටින් ඒ කාණුව දැමීමට එකී ස්ථානයේ අයිතිකරුට බලය දිය හැකි ය.

(2) නගරාධිපතිවරයාගේ අත්සන දරන ඒ සෑම නියමයක් ම, එම නියමයෙන් අනුග්‍රහය ලත් තැනැත්තාට හෝ එම තැනැත්තා විසින් තත් කාර්යය සඳහා යොදවා ගන්නා යම් අනුයෝජිතයකුට හෝ තැනැත්තකුට, ඔහුගේ අධ්‍යාශය පිළිබඳ ව සාධාරණ කාලයක් ලිඛිත දැන්වීමක් එකී ඉඩමේ අයිතිකරුට දීමෙන් පසු, ඉර උදාවත් ඉර බැසීමත් අතර යම් වෙලාවක සහයකයන් සහ කම්කරුවන් සමග එකී ඉඩමට ඇතුළු වීමෙන් අවශ්‍ය වැඩ කිරීමටත් පූර්ණ අධිකාරයක් වන්නේ ය.

(3) මේ ආඥාපනතේ විධිවිධානවලට යටත් ව, යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් යොදවා ගනු ලැබූ යම් අනුයෝජිතයකු හෝ තැනැත්තකු විසින්, ඒ ස්ථානයේ ජලාපවහනය සඳහා එවිකටත් කාණුවක් නීත්‍යනුකූලව සාදා ඇති යම් ඉඩමක අයිතිකරුට, තම අධ්‍යාශය පිළිබඳව සාධාරණ කාලයක ලිඛිත දැන්වීමක් දීමෙන් පසු, සහායකයන් සහ කම්කරුවන් සමග, ඉර උදාවත් ඉර බැසීමත් අතර යම් වේලාවක එකී කාණුව අලුත්වැඩියා කිරීමේ හෝ ශුද්ධ කිරීමේ කාර්යය සඳහා එකී ඉඩමට ඇතුළු විය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ යම් වැඩක් කිරීමේ දී, එයින් සිදු වන අලාභය හැකි තරම් අඩු වන ආකාරයට කළ යුතු ය; තව ද එම වැඩය කරනු ලබන්නේ යම් ස්ථානයක යහපත සඳහා ද, ඒ ස්ථානයේ අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින්—

(අ) යම් ප්‍රමාදයක් වේ නම් ඒ ප්‍රමාදය හැකි තාක් අඩු වන ආකාරයට ඒ වැඩය කිරීමට සැලැස්විය යුතු ය;

(ආ) එකී වැඩය කිරීමේ කාර්යය සඳහා කණින ලද බිම් තමාගේ වියදමින් පිරවීම, යථා තත්ත්වයට පැමිණවීම හා නැවත සකස් කිරීම කළ යුතු ය; තව ද

(ඇ) එකී වැඩය කිරීම නිසා අලාභයක් සිදු වූ යම් තැනැත්තකුට වන්දි ගෙවිය යුතුය.

(5) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව වූ යම් වැඩක් කිරීමට ඉඩ දීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ ඒ වැඩය කිරීම සාධාරණ හේතුවක් නොමැති ව වළක්වන සෑම ඉඩම් අයිතිකරුවකු ම වරදකට වරදකරු විය යුතු [1986 අංක 39
අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි § 22 (අ)]
දඩයකට යටත් විය යුතු ය; තව ද ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසුව ද එසේ නොකඩව ප්‍රතික්ෂේප කරන හෝ ඒ වැඩය කිරීම නොකඩව ම වළක්වන ඒ සෑම අයිතිකරුවකු ම නො කන්මා කරන වරදකට වරදකරු වන අතර ඔහු ඊට වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කර ගෙන ගිය එක් එක් දිනය 1986 අංක 39
සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය 22 (අ)]
යුතු ය.

(6) ගොඩනැගිලි තනා නැති ඉඩමකට හෝ ඉඩමක් මැදින් හෝ ඉඩමක් යටින් කාණුවක් තනා ඇති අවස්ථාවක, එම ඉඩමෙහි ගොඩනැගිල්ලක් තැනීමට එහි අයිතිකරුට පසුව වුවමනා වූ විටක එම කාණුව තනනු ලැබ තිබුනේ යම් ස්ථානයක යහපත සඳහා ද ඒ ස්ථානයේ අයිතිකරුට හෝ ඒ ස්ථානයේ පදිංචිකරුට ඒ කාණුව සභාව විසින් අනුමත කරනු ලබන ආකාරයකට වැසීමට, ඉවත් කිරීමට, හැරවීමට යළි ගොඩනැගීමට හෝ ආරක්ෂා කිරීමට ද ඒ ඉඩම පිරවීමට, නැවත සකස් කිරීමට සහ යථා තත්ත්වයට පැමිණවීමට ද සභාව විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතු ය,

එසේ වුවද යෝජිත ගොඩනැගිල්ලට ඉඩ ගැනීමට හෝ එය ආරක්ෂා සහිතව ප්‍රයෝජනයට ගැනීමට නම් කාණුව වැසීම, ඉවත් කිරීම, හැරවීම යළි ගොඩනැගීම හෝ ආරක්ෂා කිරීම අවශ්‍ය හෝ යෝග්‍ය බව සභාවේ අදහස වන්නේ නම් මිස ඒ කිසි ම නියමයක් නොකළ යුතු ය.

(7) (6) වන උප වගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව සාධාරණ කාලයක් ඇතුළත ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරන සෑම අයිතිකරුවකු ම හෝ පදිංචිකරුවකු ම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

[1986 අංක 39 §22(ආ)]

කාණු හවුලේ පාවිච්චි කිරිමට අයිතිකරුවන්ට ඇති අයිතිවාසිකම.

**111.** (1) යම් ස්ථානයක ජලාපවහනය සඳහා අවශ්‍ය කාණුවක්, යම් කාණුවකට හෝ කාණු නීත්‍යනුකූලව හිස් කිරීමට සුදුසු වෙනත් ස්ථානයකට හිස් කිරීමට ඇති එකම හෝ හොඳම ප්‍රායෝගික ක්‍රමය එකී ස්ථානයේ අයිතිකරු නොවන තැනැත්තකුට හෝ තැනැත්තන්ට අයිති කාණුවක් මගින් බව සභාවට පෙනී ගිය අවස්ථාවක, සභාව විසින්, යම් විරෝධතාවක් ඇත්නම් එය ඉදිරිපත් කිරීමේ සාධාරණ අවස්ථාවක් එකී තැනැත්තාට හෝ තැනැත්තන්ට දීමෙන් පසු විරෝධතාවක් ඉදිරිපත් කරනු නොලැබුවේ නම් ද එසේ නැත හොත් ඉදිරිපත් කරනු ලැබූ යම් විරෝධතාවක් නිර්බල හෝ අප්‍රමාණවත් බව සභාවට පෙනී ගිය හොත් ද, ලියවිල්ලකින් වූ නියමයන් මගින්, කුලිය හෝ වන්දි ගෙවීම පිළිබඳව ද එකී ස්ථාන යේ කාණුව එකී වෙනත් කාණුවට සම්බන්ධ කිරීම පිළිබඳව ද ඒ පසුව කී කාණුව නඩත්තු කිරීම, සෝදා හැරීම, සුද්ද කිරීම සහ හිස් කිරීම සම්බන්ධ ඒ ඒ අයිතිකරුවන්ගේ වගකීම් පිළිබඳව ද එසේ නැතහොත් වෙනත් කරුණු පිළිබඳව ද සාධාරණ යැයි සභාව අදහස් කරන කොන්දේසි පිට ඒ ස්ථානයේ අයිතිකරුට පසුව කී කාණුව ප්‍රයෝජනයට ගැනීමට බලය දීම හෝ ඔහු එකී කාණුවේ හවුල් අයිතිකරු හෝ හවුල් අයිතිකරුවන් ගෙන් එක් හවුල් අයිතිකරුවකු ලෙස ප්‍රකාශයට පත් කිරීම සභාව විසින් කළ හැකි ය.

(2) නගරාධිපතිවරයාගේ අත්සන දරන සෑම නියමයක්ම, එම නියමයෙන් අනුග්‍රහ ලත් තැනැත්තාට හෝ එම තැනැත්තා විසින් තත් කාර්යය සඳහා යොදවා ගන්නා යම් අනුයෝජිතයකුට, හෝ තැනැත්තකුට එකී නියමයේ කොන්දේසි සපුරාලීමෙන් පසුව සහ ඔහුගේ අධ්‍යාශය පිළිබඳව සාධාරණ කාලයක ලිඛිත දැන්වීමක් එකී කාණුවේ අයිතිකරුට හෝ අයිතිකරුවන්ට දීමෙන් පසු, ඉර උදාවත් ඉර බැසීමත් අතර යම් වේලාවක දී සහායකයන් සහ කම්කරුවන් සමඟ, එකී කාණුව පිහිටි ඉඩමට ඇතුළු වීමටත් පහත සඳහන් කටයුතු සඳහා අවශ්‍ය සියලු දේ මේ පනතේ විධිවිධානවලට යටත් ව කිරීමටත් පූර්ණ අධිකාරයක් වන්නේ ය :—

(අ) කාණු දෙක සම්බන්ධ කිරීම ;

(ආ) සම්බන්ධකය අලුත් කිරීම, වෙනස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම ; සහ

(ඈ) සභාවේ නියමයෙන් අනුග්‍රහ ලත් තැනැත්තාට කාණුව හෝ එහි යම් කොටසක් නඩත්තු කිරීම, සෝදා හැරීම, ශුද්ධ කිරීම සම්බන්ධයෙන් පැවරුණු යම් වගකීමක් ඉටු කිරීම.

(3) මේ වගන්තිය යටතේ යම් වැඩක් කිරීමේ දී එයින් සිදු වන අලාභ හැකි තාක් අඩු වන ආකාරයට කළ යුතු අතර සභාවේ නියමයෙන් අනුග්‍රහ ලත් තැනැත්තා විසින්—

(අ) යම් ප්‍රමාදයක් වේ නම් ඒ ප්‍රමාදය හැකි තාක් අඩු වන ආකාරයට ඒ වැඩය කිරීමට සැලැස්විය යුතු ය;

(ආ) එකී වැඩය කිරීමේ දී හෑරූ හෝ කෙටූ බිම පිරවීම, නැවත සකස් කිරීම හා යථා තත්ත්වයට පැමිණ වීම හෝ ගොඩනැගිලිවලට සිදු වූ යම් කැඩුම් බිඳුම් ආදියක් අලුත්වැඩියා කිරීම හෝ එය යථා තත්ත්වයට පැමිණවීම තමාගේ වියදමින් කළ යුතු ය; තව ද,

(ඇ) එකී වැඩය කිරීම නිසා අලාභයක් සිදු වූ යම් තැනැත්තකුට වන්දි ගෙවිය යුතුය.

(4) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූල වූ යම් වැඩක් කිරීමට ඉඩ දීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ ඒ වැඩය කිරීම සාධාරණ හේතුවක් නොමැතිව වළක්වන යම් ස්ථානයක සෑම අයිතිකරුවකු ම හෝ පදිංචිකරුවකු ම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය; තවද ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසුවද එසේ දිගට ම ප්‍රතික්ෂේප කරන හෝ ඒ වැඩය කිරීම දිගට ම වළක්වන ඒ සෑම අයිතිකරුවකුම හෝ පදිංචි කරුවකුම නොනවත්වා කරන වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩවා කර ගෙන ගිය එක්එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ද ඔහු යටත් විය යුතුය.

[1986 අංක 30§23]
[1986 අංක 39§23]

**112.** (1) සෑම කාණුවක් ම සහ ඊට සම්බන්ධ සෑම තිරවුරක් සහ උපකරණයක්ම එම කාණුව පිහිටි ස්ථානයේ අයිතිකරු හෝ පදිංචි කරු විසින් කලින් කල අලුත්වැඩියා කිරීම, සෝදා හැරීම, පිරිසිදු කිරීම සහ ශුද්ධ කිරීම කළ යුතුය.

කාණු ආදිය නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.

(2) ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ඒ කාණුව, තීරවුර හෝ උපකරණය අලුත්වැඩියා කරන ලෙස, සෝදා හරින ලෙස, පිරිසිදු කරන ලෙස හෝ ශුද්ධ කරන ලෙස ඒ අයිතිකරුට සභාව විසින් නියම කළ හැකිය.

(3) ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කරනු නොලැබුව හොත් හෝ එකී අයිතිකරු හෝ පදිංචිකරු විසින් සභාවෙන් ඉල්ලීමක් කරනු ලැබුවහොත් හෝ වහා ක්‍රියා කිරීම අවශ්‍ය යැයි සභාව විසින් සලකනු ලැබුවහොත්, එම කාණුව, නිරවුර හෝ උප කරණය සභාව විසින් අලුත්වැඩියා කිරීම, සෝදා හැරීම, පිරිසිදු කිරීම හෝ ශුද්ධ කිරීම කළ හැකි අතර ඒ සඳහා ගිය වියදම ඒ අයිතිකරු හෝ එකී පදිංචිකරු විසින් ගෙවිය යුතුය. ඒ වියදම ගෙවීම පැහැර හරිනු ලැබූ විටකදී ඒ වියදම මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කර ගත යුතුය.

(4) ස්ථානයේ පදිංචිකරුවන්ගේ පොදු ප්‍රයෝජනය සඳහා කාණු, නිරවුරු හෝ ඊට සම්බන්ධ උපකරණ සපයා ඇති යම් ස්ථානයක අයිතිකරු විසින්, ඒ කාණු, නිරවුරු සහ උපකරණ නිධි සෞඛ්‍යානුකූල තත්ත්වයකින් පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීමද ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමද කළ යුතුය. සභාව විසින් සුදුසු යැයි සලකන ඒ ප්‍රතිපාදන සැලැස්වීම හෝ ඒ කටයුතු කිරීම, ඒ පිළිබඳව නිසි දැන්වීමක් සභාව විසින් දීමෙන් පසුව, පැහැර හරින ඒ සෑම අයිතිකරුවකුම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය. [1986 අංක 39 § 24 (අ)]

(5) මහා නගර සභාව වෙත සතු කරන ලද කාණුවක් නොවන යම් කාණුවක් හෝ යම් නිරවුරක් හෝ උපකරණයක් එක් ස්ථාන යකට වඩා වැඩි ස්ථාන ගණනක ප්‍රයෝජනය සඳහා සපයා ඇති අවස්ථාවක, සභාව විසින් මේ වගන්තියේ විධිවිධාන අනුව ලිය විල්ලකින්වූ දැන්වීමක් මගින්, දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ඉහත කී වැඩ සියල්ලම හෝ ඉන් කිසිවක් කරන ලෙස ඒ ස්ථාන වල අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට නියම කළ හැකි අතර, දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවකදී හෝ අවශ්‍ය යැයි සභාව අදහස් කරන්නේ නම් එවැනි දැන්වීමක් නොකර හෝ ඒ වැඩ සියල්ල ම හෝ ඉන් යමක් සභාව විසින් කරනු ලැබ, එසේ කිරීමේ වියදම එකී අයිතිකරුවන්ගෙන් හෝ පදිංචිකරුවන්ගෙන් සභාව විසින් යුක්ති සහගත යැයි අදහස් කරන අනුපාතයකට අනුව අය කර ගත හැකිය.

(6) (2) වන උපවගන්තිය හෝ (5) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද දැන්වීමක සඳහන් කාලය ඇතුළත ඒ දැන්වීමේ නියමයන්ට අනුකූල ව ක්‍රියා කිරීම පැහැර හරින හෝ අතපසු කරන සෑම අයිතිකරුවකු ම හෝ පදිංචිකරුවකු ම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියය කට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39 § 24 (ආ)]

**දෝෂ සහිත කාණු සහ උපකරණ ප්‍රතිසංස්කරණය කිරීම.**

113. (1) (අ) යම් ස්ථානයක ජලාපවහනය සඳහා ඇති යම් කාණු හෝ ඊට සම්බන්ධ යම් තීරවුරු සහ උපකරණ දෝෂ සහිත බව හෝ ඒවා සෞඛ්‍යයට අහිතකර තත්ත්වයක පවතින බව;

(ආ) එයින් යම් කාණු හෝ උපකරණ යම් පොදු කාණුවකට හෝ වෙනත් කාණුවකට අනිසි ලෙස සම්බන්ධ කර ඇති බව; හෝ

(ඇ) එයින් යම් කාණුවලට නිසි සහ ප්‍රමාණවත් තරම් කොටු, කාණු වලවල්, හුලං කපොලු, පරීක්ෂණ කවුළු හෝ එවැනි වෙනත් උපකරණ සපයා නැති බව

සභාවේ මතය වන අවස්ථාවක, ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ඒ දෝෂ සහිත හෝ නොනිසි කාණු, සම්බන්ධක, තීරවුරු සහ උපකරණ, නැවත දමන ලෙස, ප්‍රතිසංස්කරණය කරන ලෙස, යථා තත්ත්වයට පත් කරන ලෙස, වෙන් කරන ලෙස හෝ අහෝසි කරන ලෙස ද ආඥාපනතේ විධිවිධානවලටත් ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවලටත් අනුකූල වන ලෙස ප්‍රමාණවත් සහ නිසි කාණු, සම්බන්ධක, තීරවුරු සහ උපකරණ සපයන ලෙස ද ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට සභාව විසින් නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ක්‍රියා කිරීම පැහැර හරින හෝ අතපසු කරන සෑම අයිතිකරුවකු සහ පදිංචිකරුවකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39 § 25]

(3) එයින් යම් කාණු, සම්බන්ධක, තීරවුරු හෝ උපකරණ දෝෂ සහිත ද නැතහොත් සෞඛ්‍යයට අහිතකර තත්ත්වයක පවතින්නේ ද යන්න හෝ යම් පොදු හෝ වෙනත් කාණුවකට අනිසි ලෙස සම්බන්ධකර තිබේ ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා, යම් සාධාරණ වේලාවක ස්ථානය පරීක්ෂා කරන ලෙස සභාව විසින් නියම කළ හැකි අතර (පදිංචිකරුට නිසි දැන්වීමක් දීමෙන් පසු ව) පරීක්ෂා කරන නිලධරයා විසින් යම් සාධාරණ වේලාවක දී ඒ ස්ථානයට ඇතුළු විය හැකි ය. තව ද ඒ පරීක්ෂණයේ කාර්යය සඳහා අවශ්‍ය වේ නම් ඔහු විසින් සුදුසු යැයි අදහස් කරන කවර

ස්ථානයක හෝ පොළව කැණවිය හැකි ය. මෙසේ පොළව කැණී මේදී ඉන් සිදු වන අලාභය හැකි තාක් අඩු වන ආකාරයට එය කළ යුතු ය. තව ද ඒ කාණු, සම්බන්ධක, තිරවුරු හෝ උපකරණ සතුටු දායක තත්ත්වයක පවතින බව දැනගත් අවස්ථාවක, ඒවා නැවත නොපමාව ම යථා තත්ත්වයට පත් කළ යුතු අතර සභාවේ වියදමින් පොළොව නැවත සකස් කළ යුතු ය.

විථිවල කනන කාණු සහ උපකරණ.

**114.** යම් ස්ථානයක ජලාපවහනය සඳහා මේ ආඥාපනත අනුව අවශ්‍ය යම් කාණුවක්, කාණු කවාටයක්, පරීක්ෂණ කවුළුවක්, කාණු වළක් හෝ හුළං කපොල්ලක් හෝ එවැනි උපකරණයක් යම් වීථියකට හෝ පොදු ස්ථානයකට ඉහළින්, ඒ හරහා හෝ ඊට යටින් සෑදීමට, දැමීමට හෝ සවි කිරීමට සභාව විසින් අවසර දිය හැකි ය :

එසේ වුව ද, ඒ අවසරය නිසා එකී වීථිය හෝ පොදු ස්ථානය කෙරෙහි වූ කවර අන්දමක හෝ විශේෂ අයිතිවාසිකමක් ඒ ස්ථාන යේ අයිතිකරුට පැවරෙතැයි නොසැලකිය යුතු ය. තවද අවශ්‍ය යැයි සභාව අදහස් කරන ආකාරයට කවර හෝ වේලාවක ඒ කාණුවේ හෝ උපකරණයේ යම් කොටසක් සභාව විසින් වෙනස් කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම කළ හැකි ය.

ස්ථාන වලට ඇතුළු වීම.

**115.** (1) යම් කාණුවක්, කාණු කවාටයක්, පරීක්ෂණ කවුළුවක්, කාණු වළක්, හුළං කපොල්ලක් හෝ ඊට සම්බන්ධ වෙනත් උපකරණයක් පරීක්ෂා කිරීමේ, සෝදා හැරීමේ, ශුද්ධ කිරීමේ, අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා ඒ සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් යම් ස්ථානයක පදිංචිකරුට යථා පරිදි වූ දැන්වීමක් දීමෙන් පසු ඒ ස්ථානයට උදේ අට සහ සවස පහ අතර යම් වේලාවක ඇතුළු විය හැකි ය :

එසේ වුව ද, යම් පොදු කාණුවක් පරීක්ෂා කිරීමේ, සෝදා හැරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා හෝ යම් කරදරයක ප්‍රභවය බව ඉහත කී බලය ලත් තැනැත්තා විසින් සිතීමට හේතු ඇති යම් කාණුවක් හෝ ඉහත කී වෙන යම් උපකරණයක් පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා ඇතුළු වීම සඳහා යම් අවස්ථාවක ඒ කිසි ම දැන්වීමක් දීම අවශ්‍ය නොවන්නේ ය.

(2) ඉහත කී පරිදි බලය ලත් තැනැත්තා යම් ස්ථානයකට ඇතුළු වීම වළක්වන හෝ වැළැක්වීමට තැත් කරන හෝ ඔහුට එහි ඇතුළු වීමට අවසර නොදෙන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර

[1986 අංක 39§26] වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය ; තව ද ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසුව ද එසේ ඇතුළු වීම දිගට ම වළක්වාගෙන යන හෝ එසේ දිගට

ම අවසර නොදෙන සෑම තැනැත්තකු ම නොකඩවා ම කෙරෙන වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ පසුත් ඒ වරද නොකඩවා කර ගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39§26]

අලුත් කාණු අවසර නොමැතිව පාවිච්චි නොකළ යුතු බව.

**116.** (1) මේ ආඥාපනත අනුව සපයන ලද යම් අලුත් කාණුවක්, කාණු වළක්, නාන කාමරයක්, දිය වැසිකිළියක්, වැසිකිළි කොටුවක්, මුත්‍රා ස්ථානයක් හෝ වෙනත් සනීපාරක්ෂක උපකරණයක් සභාවේ ලිඛිත අවසරය නොමැතිව හෝ ඒ කාණුව, කාණු වළ, නාන කාමරය, දිය වැසිකිළිය, වැසිකිළි කොටුව, මුත්‍රා ස්ථානය හෝ වෙනත් සනීපාරක්ෂක උපකරණය මේ ආඥාපනතේ ද ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල ද විධිවිධානවලට සර්වාකාරයෙන් ම අනුකූලවන බවට සභාව විසින් සහතිකයක් දෙන තෙක් හෝ පාවිච්චි කරන හෝ පාවිච්චි කිරීමට සලස්වන හෝ ඉඩ දෙන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය ; තව ද ඒ වරදට [1986 අංක 39§27] වරදකරු කරනු ලැබීමෙන් පසුවත් ඒ සහතිකය හෝ අවසරය නොලබා ඉහත කී යම් සනීපාරක්ෂක උපකරණයක් පාවිච්චි කරන හෝ පාවිච්චි කිරීමට සලස්වන හෝ ඉඩ දෙන සෑම තැනැත්තකු ම නොකඩවා කෙරෙන වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට වරද නොකඩවා කර ගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් [19 86 අංක 39 §27[ දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(2) එසේ අලුතෙන් යම් දෙයක් සාදන හෝ සවි කරන යම් තැනැත්තකු ඒ සහතිකය සඳහා සභාවට ලිඛිත ඉල්ලීමක් කළ යුතු අතර, සභාවට එය ලැබුණු විට, අවශ්‍ය යැයි සභාව විසින් සලකනු ලබන විභාගයකින් පසුව ද ඉල්ලීම ලැබී දින දහහතරක් ඇතුළත ද, සහතිකය නිකුත් කිරීම හෝ සහතිකය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වමින් ඒ ප්‍රතික්ෂේප කිරීම ගැන ඉල්ලුම්කරුට දැනුම් දීම හෝ කළ යුතු ය.

වැරදි.

**117.** (1) යම් අපවිත්‍ර ද්‍රව්‍ය. අපවිත්‍ර ද්‍රව හෝ මල මුත්‍රාදිය ඒවා පිට කිරීමට නුසුදුසු හෝ ඒවා පිට කිරීම සඳහා අදහස් නොකරන ලද හෝ යම් කාණුවකට හෝ වෙනත් ස්ථානයකට හෝ එයින් කරදරයක් සිදු වන ආකාරයකට යම් ඉඩමකට හෝ ස්ථානයකට, සභාවේ ලිඛිත එකඟත්වය නොමැතිව, පිට කිරීම හෝ පිට කිරීමට සැලැස්වීම හෝ ඉඩ දීම හෝ අපවිත්‍ර ජලය ගලා යැම සඳහා අදහස් කරන ලද යම් කාණුවකට වර්ෂා ජලය ඕනෑකමින්ම පිට කිරීමට සැලැස්වීම හෝ කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(2) උණු වතුර හෝ වාෂ්ප කිසිවක් හෝ කාණුව කෙරෙහි හෝ කාණුවේ මල හෝ ජලය ගලා යෑම හෝ බැහැර යෑම කෙරෙහි හානි කරව බලපෑ හැකි හෝ එහි ස්වභාවය, උෂ්ණත්වය හෝ වෙනත් දෙයක් නිසා පීඩාවක් ඇති විය හැකි යම් ද්‍රව්‍යයක් යම් කාණුවකට පිට කිරීම හෝ පිට කිරීමට සැලැස්වීම හෝ ඉඩ දීම කිසි ම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(3) යම් කාණුවකට ගඩොල්, ගල්, පස් හෝ අළු කිසිවක් හෝ ඒ කාණුවට දැමීම උචිත යැයි අදහස් නොකරන ලද ද්‍රව්‍යයක් හෝ දෙයක් හෝ ඒ ද්‍රව්‍යයේ හෝ දෙයෙහි ප්‍රමාණය හා ස්වභාවය නිසා ඒ කාණුව හෝ ඒ කාණුව සම්බන්ධ වෙනත් යම් කාණුවක් අවහිර වීමට ඉඩ ඇති යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් හෝ යම් කාණුවක් කෙරෙහි හෝ එය තුළ ජලය ගලා ගෙන යාම කෙරෙහි හෝ හානි කරව බලපෑ හැකි හෝ කරදරයක් ඇති වීමට ඉඩ ඇති හෝ යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් දැමීම, යැවීම හෝ එහි තැබීම හෝ දැමීමට, යැවීමට හෝ එහි තැබීමට සැලැස්වීම හෝ ඉඩ දීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(4) සභාවේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තකු විසින් යම් කාණුවක්, සංවාතන නලයක්, කෝෂ්ඨයක් හෝ ඊට සම්බන්ධ වෙනත් යම් උප මෙවලමක් හෝ උපකරණයක් සවි කිරීම, එහි ස්වභාවය හෝ පිහිටීම කවර ආකාරයකින් හෝ වෙනස් කිරීම හෝ ඊට බාධා කිරීම, ඉවත් කිරීම, නැවැත්වීම හෝ වෙනස් කිරීම නොකළ යුතුය.

(5) යම් ගොඩනැගිල්ලක හෝ එම ස්ථානයේ ම ඇති වෙනත් ගොඩනැගිල්ලක ප්‍රයෝජනය සඳහා ඇති යම් කාණුවක්, කෝෂ්ඨයක් හෝ උපකරණයක් මේ ආඥාපනතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ විධිවිධාන උල්ලංඝනය වන ආකාරයට යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම, නැවත ඉදි කිරීම හෝ වෙනස් කිරීම කිසි ම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(6) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලින් කිසිවක් උල්ලං
ඝනය කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු
[1986 අංක 39§28] කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත්
විය යුතු ය; තව ද ඒ වරදට වරදකරු කරනු ලැබූ පසු ද දිගට ම
එකී විධිවිධාන උල්ලංඝනය කර ගෙන යන සෑම තැනැත්තකු ම
නොකඩව කෙරෙන වරදක් කරන අතර ඊට වරදකරු කරනු ලැබූ
විට, වරද නොකඩව කර ගෙන ගිය එක් එක් දිනය සඳහා රුපියල්
.1986 අංක 39§28] දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

## වැසිකිළි

**118.** (1) යම් ගෙයක් හෝ ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් සඳහා යම් වැසිකිළියක්, දිය වැසිකිළියක් හෝ නාන කාමරයක් හෝ යම් අතිරේක වැසිකිළියක්, දිය වැසිකිළියක් හෝ නාන කාමරයක් අනුබද්ධ කිරීම හෝ සැපයීම කළ යුතු යැයි සභාව අදහස් කරන යම් විටක, එම ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරු වෙත භාර දෙනු ලබන දැන්වීමක් මගින්, ඒ දැන්වීම භාර දෙනු ලැබීමෙන් පසු දවස් තිහක් ඇතුළත ඒ දැන්වීමේ ඇතුළත් ඉල්ලීමට අනුකූල ව ඒ වැසිකිළිය, දිය වැසිකිළිය හෝ නාන කාමරය තනවන ලෙස සභාව විසින් නියම කළ හැකි ය. අතිරේක වැසිකිළි තැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද දැන්වීමක නියමයන්ට අනුකූල ව එකී දවස් තිහක කාලය ඇතුළත ක්‍රියා කිරීම පැහැර හරින හෝ අතපසු කරන සෑම අයිතිකරුවකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. 1986 අංක 39§29]

**119.** (1) වැඩකරුවන් හෝ කම්කරුවන් විශාල සංඛ්‍යාවක් සේවයේ යොදවා ගෙන සිටින යම් තැනැත්තකු වෙත භාර දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින්,— වැසිකිළි සැපයීමට කම්කරුවන්ගේ සේවා යෝජක යන්ට ඇති යුතුකම.

(අ) අවශ්‍ය යැයි සභාව අදහස් කරන වැසිකිළි, දිය වැසිකිළි සහ මුත්‍රා ස්ථාන ගණනක් ද, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම තැනැත්තන් සේවයේ යොදවා ඇති හෝ සේවයේ යෙද වීමට අදහස් කරන හෝ පැමිණෙන අවස්ථාවක, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය සඳහා වෙන වෙන ම පහසුකම් ද දැන් වීමේ සඳහන් කාලය ඇතුළත සපයන ලෙස ; සහ

(ආ) ඒවා සෞඛ්‍යයට හිතකර තත්ත්වයක සහ නිසි පිළිවෙළට පවත්වා ගෙන යන ලෙස

සභාව විසින් ඒ තැනැත්තාට නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තකු, ඒ වැසිකිළි, දිය වැසිකිළි හෝ මුත්‍රා ස්ථාන නඩත්තු කිරීම හෝ ඒවා සෞඛ්‍යයට හිතකර තත්ත්වයකින් හෝ නිසි ආකාරයෙන් පවත්වා ගෙන යැම පැහැර හරින හෝ අතපසු කරන අවස්ථාවක, සභාව විසින් ඒ වැසිකිළි, දිය වැසිකිළි හෝ මුත්‍රා ස්ථාන තැනීමට හෝ සෞඛ්‍යයට හිතකර සහ නිසි ආකාරයෙන් ඒවා පවත්වා ගෙන යැමට සැලැස්විය හැකි අතර ඒ වෙනුවෙන් සභාවට දරන්නට සිදු වූ වියදම් ඉහත කී තැනැත්තා විසින් ගෙවිය යුතු ය ; ඒ වියදම් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට ඒ වියදම් අය කර ගත හැකි වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දෙනු ලැබූ යම් දැන්වීමක නියමයන්ට අනුකූල ව එම දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ක්‍රියා කිරීම පැහැර හරින හෝ අතපසු කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39§30]

වසුරු වළක් වැසීම අතපසු කිරීම.

**120.** (1) ස්ථානයේ වසුරු වළක් ඇති යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීම භාර දීමේ දිනයෙන් පසු දවස් තිහක් ඇතුළත ඒ වසුරු වළ වසා දමා ඒ වෙනුවට වැසිකිළියක් හෝ දිය වැසිකිළියක් ආදේශ කරන ලෙස ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට සභාව විසින් නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දෙනු ලැබූ දැන්වීමක නියමයන්ට අනුකූල ව, එකී දවස් තිහක කාලය ඇතුළත ක්‍රියා කිරීම පැහැර හරින හෝ අතපසු කරන සෑම අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39§31]

වැරදි.

**121.** (1) වෙන් වෙන් ව පිහිටි ගෙවල් දෙකක හෝ ඊට වැඩි ගණනක පදිංචිකරුවන් විසින් හෝ වෙන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන යම් වැසිකිළියකට, දිය වැසිකිළියකට, මුත්‍රා ස්ථානයකට හෝ ඊට ළඟා වන මාර්ගයකට හානි කිරීම හෝ එය නොනිසි ලෙස අපිරිසිදු කිරීම හෝ නිසි ලෙස ශුද්ධ නොකර හැරීමෙන් අපිරිසිදු තත්ත්වයකට පත් වන්නට ඉඩ හැරීම කිසි ම තැනැත්තකු විසින් නොකළ යුතු ය. මේ උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු හෝ ඒ වැසිකිළිය හෝ මුත්‍රා ස්ථානය හෝ ඊට ළඟා වන මාර්ගය පොදුවේ පාවිච්චි කරන තැනැත්තන් අතුරින් පැහැර හැරීම සිදු කර ඇත්තේ කවුරුන් විසින් ද යන්න ඔප්පු විමට සෑහෙන සාක්ෂි අධිකරණය ඉදිරියේ නොමැති අවස්ථාවක ඒ තැනැත්තන් අතුරින් එක් එක් තැනැත්තා, මේ උපවගන්තියේ විධිවිධාන කඩ කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අතුරින් කිසිවක් කඩ කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය ; තවද ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ කඩ කිරීම දිගට ම කර ගෙන යන සෑම තැනැත්තකු ම නොකඩ ව කෙරෙන වරදක් කරන අතර වරදකරු කරනු ලැබීමෙන් පසුත් ඒ වරද නොකඩ ව කර ගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39§32[ [1986 අංක 39§32]

## සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි

සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි සම්බන්ධයෙන් සභාවේ කාර්යය.

**122.** මහා නගරය තුළ ඇති ගෙවල් සහ ගොඩනැගිලි මේ ආඥා පනතේ හෝ වෙන යම් ප්‍රඥප්තියක විධිවිධානවලින් නියමිත අන්දමේ සනීපාරක්ෂක තත්ත්වයක පවත්වා ගෙන යන බව සැක හැර දැන ගැනීමේ අදහසින් මහා නගරයේ සෑම කොටසක ම කලින් කල පරීක්ෂණයක් පැවැත්වීමට සැලැස්වීම ද ඒ විධිවිධාන මහා නගරය ඇතුළත බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ද සභාවේ කාර්යය විය යුතු ය.

පවත්නා ගොඩනැගිලි සම්බන්ධයෙන් සභාවේ කාර්යය.

**123.** (1) සභාව සංස්ථාපනය කරනු ලැබූ දිනයේ පැවතිසේ වුව ද එසේ නැතහොත් පසුව ඉදි කරනු ලැබුවේ වුව ද යම් ගොඩනැගිලි හෝ ගොඩනැගිලි කට්ටි, වසංගතයක් ඇති වීමේ හේතුව නිසා හෝ ඒ ගොඩනැගිලි එකිනෙකට ළංව ඇති ආකාරය නිසා හෝ ජලාපවහනය නොමැති වීම නිසා හෝ කසළ ශෝධනය කළ නොහැකි වීම නිසා හෝ, එහි හෝ ඒ අවට ප්‍රදේශයේ නිවැසියන්ගේ සෞඛ්‍යයට අවදානමක් බවට පත් වී ඇති බවට සභාව සෑහීමට පත් වූ කවර අවස්ථාවක දී වුව ද, ඒ ගොඩනැගිල්ල වෙනස් කිරීම ඇතුළුව ඒ අවදානම දුරලීම සඳහා අවශ්‍ය යැයි සභාව සලකන අන්දමේ ක්‍රියා, දැන්වීමේ සඳහන් කාලය ඇතුළත කරන ලෙසට වූ දැන්වීමක් එහි අයිතිකරුවන් වෙත හෝ පදිංචිකරුවන් වෙත හෝ සභාවේ අභිමතය පරිදි එම ගොඩනැගිලි තනා ඇති ඉඩමේ අයිතිකරු වෙත හෝ සභාව විසින් භාර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් භාර දෙනු ලැබූ අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ඒ ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කළ හෝ අතපසු කළ යම් අවස්ථාවක, ඒ ගොඩනැගිලි කඩා දැමීමට සැලැස්වීම හෝ අවදානම දුරලීම සඳහා අවශ්‍ය යැයි සභාව සලකන අන්දමට ඒ ගොඩනැගිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සැලැස්වීම, සභාව විසින් ඒ වෙනුවෙන් බලය දෙන ලද යම් නිලධරයකු විසින් කළ හැකි ය.

(3) ගොඩනැගිලි කිසිවක් (2) වන උපවගන්තිය යටතේ කඩා දමන ලද අවස්ථාවක, එක් එක් ගොඩනැගිල්ලේ ද්‍රව්‍ය විකිණිය හැකි නම්, වෙන වෙන ම විකිණීමට සභාව විසින් හෝ බලය ලත් නිලධරයා විසින් සැලැස්විය යුතු අතර ඉන් ලැබෙන මුදල් ගොඩනැගිල්ලේ අයිතිකරුට ගෙවිය යුතු ය. අයිතිකරු කවුරුන් දැයි නොදන්නේ නම් හෝ හිමිකම් පිළිබඳ ආරවුලක් ඇත්නම්, ඒ මුදල ගෙවනු ලැබීම සඳහා ඊට හිමිකම් ඇති තැනැත්තා විසින් නිසි බලය ඇති අධිකරණයකින් ආඥාවක් ලබා ගන්නා තෙක් සභාව විසින් ඒ මුදල තැන්පත් කර තබා ගත යුතු ය.

නිවාස තුළ තදබදය.

**124.** යම් ගෙයක් එහි පදිංචිකරුවන්ගේ හෝ අසල්වාසීන්ගේ සෞඛ්‍යයට අන්තරායදායක හෝ හානිකර වන තරමට ජනයාගෙන් තදබද වී ඇති බව සභාවට පෙනී යන්නා වූ ද පදිංචිකරුවන් එක පවුලකට වඩා වැඩි ගණනකින් යුක්ත වන්නා වූ ද කවර හෝ අවස්ථාවක දී, ඒ තදබදය නැති කිරීම සඳහා සභාව විසින් මහෙස්ත්‍රාත්වරයකු හෝ නාගරික මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු පැවරිය යුතු අතර, එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යැයි සලකනු ලබන ආඥාවක් ඔහු විසින් කළ යුතු ය; ඒ තදබදයට ඉඩ දෙන එක් එක් තැනැත්තා වරදක් කරන අතර ඊට වරදකරු කරනු ලැබූ විට ඒ ආඥාවෙන් අනතුරුව ඒ තදබදය දිගට ම පැවති එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

[1986 අංක 39§33]

ගෙවල් පරීක්ෂා කිරීමට සහ ඒවායේ හුණු ගෑමට සභාවට ඇති බලය.

**125.** සභාව විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තතු, ඉර උදාවත් ඉර බැසීමත් අතර යම් වේලාවක යම් ගෙයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම ද, එහි මුලුමනින් ම හෝ එහි යම් කොටසක ඇතුළත හා පිටත හුණු ගාන ලෙස හෝ එය හෝ ඒ කොටස වෙනත් අයුරකින් පිරිසිදු කරන ලෙස ලියවිල්ලකින් වූ නියමයකින් විධාන කිරීම ද නීත්‍යනුකූල වන්නේ ය; තව ද ඒ ගෙයි හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු හෝ පදිංචිකරු එම නියමය තමා වෙත භාර දෙනු ලැබීමෙන් දවස් හතක් ඇතුළත ඒ විධානයට අනුකූල ව ක්‍රියා කිරීම අතපසු කළ හොත්, සභාව විසින් එම වැඩය කරවිය හැකි අතර ඒ සඳහා දරනු ලැබූ වියදම් අයිතිකරු විසින් ගෙවිය යුතු ය. ඒ වියදම් ගෙවීම පැහැර හැරීමක් සිදු වූ අවස්ථාවක දී ඒ වියදම් මෙහි මින් මතු විධි විධාන සල්සවනු ලබන ආකාරයට අය කර ගත හැකි වන්නේ ය.

අවසර නොමැතිව ගෙවල් හෝ පැලවල් පොල්අතු වලින් සෑදීම හෝ සෙවිළි කිරීම නොකළ යුතු බව.

**126.** (1) සභාවේ අවසරය පළමුවෙන් ලබා නොගෙන යම් තැනැත්තකු විසින් යම් මහා නගරයක් ඇතුළත (වාසය සඳහා හෝ සතුන් ගාල් කිරීම සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා පාවිච්චි කිරීමට වුවද) පිටිවහලය හෝ බිත්ති තණකොළවලින්, කොළවලින් ,සෙවිලි අතුවලින්, පොල් අතුවලින්, පැදුරුවලින් හෝ වෙනත් එවැනි යම් දැවෙන සුලු ද්‍රව්‍යයකින් යුක්ත ව, යම් ගෙයක්, පැලක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ සෑදීම නීත්‍යනුකූල නොවන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සභාව විසින් අවසරය දෙන සෑම අවස්ථාවකදීම එම අවසරය, නිශ්චිත කාල සීමාවකටද, අවසරය අදාළ වන ගොඩනැගිල්ලේ වහළට සහ බිත්තිවලට පාවිච්චි කරන ලද ඒ දැවෙන සුලු ද්‍රව්‍ය වෙනුවට සභාව විසින් අනුමත කරනු ලබන නොදැවෙන සුලු හෝ කල් පවත්නා ද්‍රව්‍ය හැකි ඉක්මනින් යොදන බව නිසැක කර ගැනීමේ කාර්යය සඳහා ලිඛිතව නියම කරනු ලබන කොන්දේසිවලට යටත්වද දිය යුතුය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වර්ගයට අයත් වන යම් ගෙයක්, පැලක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් එම උපවගන්තියෙන් නියමිත අවසරය නොමැතිව තනනු ලැබුවහොත්, එම ගෙයි, පැලේ, මඩුවේ හෝ වෙනත් ගොඩනැගිල්ලේ ප්‍රකටව පෙනෙන කොටසක දැන්වීමක් ඇලවීමෙන් නොපමාවම හෝ සභාව විසින් දැන්වීමේ සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත ඒ ගොඩනැගිල්ල කඩා ඉවත් කරන ලෙස එහි අයිතිකරුට හෝ ඒ ගොඩනැගිල්ල ඉදිකර හෝ තනා ඇති හෝ තනන භූමියේ අයිතිකරුට සභාව විසින් දැන්වීමක් දිය යුතුය.

(4) යම් ගෙයක්, පැලක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් නොපමාවම හෝ (3) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත කඩා ඉවත් කරනු නොලැබුවහොත්, සභාව විසින් ඒ ගොඩනැගිල්ල කඩා ඉවත් කරවිය යුතු අතර එසේ කිරීම සඳහා සභාව විසින් දරන ලද වියදම් ගොඩනැගිල්ලේ හෝ එය තනා ඇති භූමියේ අයිතිකරු විසින් ගෙවිය යුතුය. තවද ඒ වියදම් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක ඒ වියදම් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කර ගත හැකි වන්නේය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් මේ ආඥාපනත ආරම්භ වීමේ දිනයට පෙර ඉදි කරන ලද හෝ ගොඩනගන ලද යම් ගෙයකට, පැලකට, මඩුවකට හෝ වෙනත් ගොඩනැගිල්ලකට අදාළ නොවන්නේය: එහෙත් යම් ගෙයක්, පැලක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් තණකොළවලින්, කොළ වලින්, සෙවිලි අතුවලින්, පොල් අතුවලින්, පැදුරු වලින් හෝ වෙනත් දැවෙනසුලු ද්‍රව්‍ය වලින් තනන ලද පිට වහළයකින් හෝ බිත්ති වලින් යුක්ත අවස්ථාවක, ඒ ගෙයි, පැලේ, මඩුවේ හෝ වෙනත් ගොඩනැගිල්ලේ ප්‍රකටව පෙනෙන ස්ථානයක දැන්වීමක් ඇලවීමෙන්, නොපමාවම හෝ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ගොඩනැගිල්ල කඩා ඉවත් කරන ලෙස එහි අයිතිකරුට හෝ ඒ ගොඩනැගිල්ල තනා ඇති භූමියේ අයිතිකරුට සභාව විසින් දැන්වීමක් දිය යුතුය; ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ඒ ගොඩනැගිල්ල කඩා ඉවත් කරනු නොලැබුවහොත් (4) වන උපවගන්තියේ විධිවිධාන ඊට අදාළ වන්නේය.

## ගොඩනැගිලි නැතිම

ගොඩනැගිලි අතුරු ව්‍යවස්ථාවලට අනුකූලතා සහතිකය.

127. (1) ඉදි කිරීම, ජලපවහනය සහ වෙනත් අංගවලින් ගොඩනැගිල්ල මේ ආඥාපනතේ සහ එය යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන වලට අනුකූල වන බවට සභාව විසින් සහතිකයක් දෙනු ලබන තෙක්, මේ ආඥාපනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව ගොඩනගන ලද කිසිම ගොඩනැගිල්ලක්, මුරකරුවකු විසින් හැර, පදිංචියට නොගත යුතුය.

(2) ගොඩනැගිල්ලක් ඉදි කළ යම් තැනැත්තකු විසින් ඒ සහතිකය සඳහා වූ ඉල්ලීමක් ලියවිල්ලක් මගින් සභාව වෙත ඉදිරිපත් කළ හැකිය. එවිට සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරීක්ෂණයක් කර, ඉල්ලීම ලැබුණු දින සිට දවස් විසි එකක් ඇතුළත, එම සහතිකය නිකුත් කළ යුතුය; නැතහොත් ප්‍රතික්ෂේප කිරීමට හේතු සහිතව, ඒ සහතිකය නිකුත් කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කළ බව, දැනුම් දිය යුතුය.

(3) මේ වගන්තිය උල්ලංඝණය වන පරිදි යම් ගොඩනැගිල්ලක පදිංචි වන නැතහොත් පදිංචි වීමට ඉඩ හරින සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට එම උල්ලංඝණය කිරීම නොකඩව කරගෙන ගිය එක් එක් දිනය වෙනුවෙන් රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට, ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39§34]

අලුත් ගොඩනැගිලි වල පොළෝ මට්ටම.

**128.** (1) යම් මහා නගරයක් ඇතුළත කිසිම ගොඩනැගිල්ලක්, එහි බිම් මාලය ඒ ස්ථානයේ වාර්තා වී ඇති ඉහළම ගංවතුර මට්ටමට අඩියකින් වැඩි මට්ටමකට වඩා පහළින් සිටින ආකාරයට හෝ ස්ථානයේ අපවහන ජලය එවකට පවතින හෝ ඉන් පසුව සෑදීමට ඇති පොදු කාණුවකට හෝ කාණු සිස් කරලීමට සභාවට බලය ඇති වෙනත් යම් සුදුසු ස්ථානයකට ගලා යෑමට ඉඩ ලැබෙන මට්ටමක් බව සභාව අදහස් කරන මට්ටමකට වඩා පහළින් සිටින සේ මින් පසු ඉදි නොකළ යුතු ය.

(2) මේ වගන්තිය උල්ලංඝණය කරමින් යම් ගොඩනැගිල්ලක් ඉදි කරන සෑම තැනැත්තෙක් ම වරදක් කරන්නේ ය. සභාව විසින් ඒ ගොඩනැගිල්ල වෙනස් කිරීම, කඩා දැමීම හෝ සභාවට නිසි යැයි පෙනෙන ආකාරයකට ඒ ගොඩනැගිල්ල ගැන ක්‍රියා කිරීම සභාව විසින් කරවිය හැකි අතර ඒ සඳහා දරන ලද වියදම් ගොඩනැගිල්ලේ අයිතිකරුගෙන් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයකට අය කර ගත හැකි වන්නේ ය.

## මලාපවහනය සහ කසළ ශෝධනය

මලාපවහනය සහ කසළ ශෝධනය සම්බන්ධයෙන් සභාවේ කාර්යය.

**129.** මහා නගරයේ සෑම කොටසක ම පහත සඳහන් කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර හැකි තාක් දුරට ගැනීමේ සභාවේ කාර්යය විය යුතු ය:—

(අ) අධි පාරවල් ද ඇතුළුව වීථි නිසි පරිදි අතුගා පවිත්‍ර කිරීම සඳහා සහ වීථිවලට ඇති කසල එකතු කර ඉවත් කිරීම;

(ආ) සියලු ම ගෙවල්වල කසළ නිසි කාල සීමා තුළ දී විධිමත් ලෙස ඉවත් කිරීම සහ සියලු වැසිකිළි සහ වැසිකිළි වළවල් නිසි කාල සීමා තුළ දී විධිමත් ලෙස පවිත්‍ර කිරීම; සහ

(ඇ) වීථිවල ඇති කසළ, ගෙවල්වල කසළ සහ මල නිසි පරිදි බැහැර කිරීම.

**130.** මේ කොටසේ විධිවිධාන යටතේ මහා නගරයක් තුළ එකතු කරනු ලබන සියලුම වීථි කසළ, නිවාස කසළ, මල හෝ එවැනි වෙනත් ද්‍රව්‍ය සභාවේ දේපළ විය යුතු අතර, ඒ සියලු ද්‍රව්‍ය විකිණීම හෝ බැහැර කිරීම සඳහා සභාවට පූර්ණ බලය තිබිය යුතු ය. ඉන් ලැබෙන මුදල් මහා නගර සභා අරමුදලේ බැරට ගෙවිය යුතු ය.

එකතු කරනු ලබන සියලුම කසළ සභාවේ දේපළ වියයුතු බව.

**131.** මේ කොටසේ විධිවිධාන අනුව ඉවත් කරනු ලැබූ වීථි කසළ, නිවාස කසළ, මල සහ එවැනි ද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීමට ද එම කාර්යය හෝ මේ ආඥාපනතේ වෙනත් කාර්ය අතුරින් යමක් සඳහා අවශ්‍ය වන සියලුම වාහන, සතුන්, උපකරණ සහ වෙනත් දේ තැබීමට ද පහසු ස්ථාන සභාව විසින් කලින් කල සැපයිය යුතු අතර, මේ කොටසේ විධිවිධාන අනුව ඉවත් කරනු ලබන එකී කසළ, මල හෝ එවැනි වෙනත් ද්‍රව්‍ය, කරදරයක් සිදු වන අන්දමින් බැහැර නොකරන බවට වගබලා ගැනීමට අවශ්‍ය සියලු වැඩ පිළිවෙළවල් සහ පූර්වාරක්ෂක විධිවිධාන සභාව විසින් සැලැස්විය යුතු ය.

කසළ බැහැර කිරීම සඳහා සහ උපකරණ තැබීම සඳහා ස්ථාන.

## කරදර

**132.** මේ ආඥාපනතින් හෝ වෙන යම් ප්‍රඥප්තියකින් පැවරී ඇති බලතල යටතේ නතර කිරීමට උචිත කරදර කවරේ දැයි නිශ්චය කර ගැනීමේ සහ ඒ කරදර නතර කිරීම පිණිස මේ ආඥාපනතේ හෝ ඒ වෙනත් ප්‍රඥප්තියේ හෝ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අභිප්‍රායෙන් කලින් කල මහා නගරය තුළ පරීක්ෂණයක් කිරීමට සැලැස්වීම සභාවේ කාර්යය විය යුතු ය.

කරදර පරීක්ෂා කිරීම.

**133.** (1) යම් මහා නගරයක් තුළ යම් පෞද්ගලික ඉඩමක පිහිටා තිබෙන යම් පෞද්ගලික ජලාශයක් හෝ පහත් වගුරු බිමක් හෝ යම් අපවිත්‍ර හෝ ගලා නොබසින ජලයත් සෞඛ්‍යයට අහිතකර බව හෝ අසල්වාසීන්ට අප්‍රසන්න බව සභාවට පෙනී ගිය අවස්ථාවක දී, එම ජලාශය හෝ වගුරු බිම ශුද්ධ පවිත්‍ර කරන ලෙස හෝ පූරවන ලෙස හෝ එම අපවිත්‍ර හෝ ගලා නොබසින ජලය බස්වා හරින ලෙස හෝ ඉවත් කරන ලෙස හෝ සභාව විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් එම ඉඩමේ අයිතිකරුට නියම කළ යුතු ය.

පෞද්ගලික ස්ථානවල තිබෙන අහිතකර ජලාශ පූරවා දැමීමේ බලය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙන ලද යම් අයිතිකරුවකු එම දැන්වීමේ සඳහන් කාලය ඇතුළත එම දැන්වීමට අනුකූල ව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ අතපසු කළ හොත්, නගරාධිපතිවරයා විසින් හෝ සභාවේ නිලධරයන් සහ වැඩ කරුවන් විසින් එම ඉඩමට ඇතුළු වී (1) වන උපවගන්තියේ සඳහන් කාර්යයන් සියල්ල සඳහා හෝ ඉන් කිසිවක් සඳහා හෝ අවශ්‍ය සියලු ක්‍රියා කරනු ලැබිය හැකි ය. තව ද, ඒ සඳහා දරන ලද

වියදම්, ඉඩමේ අයිතිකරු විසින් ගෙවිය යුතු අතර ඒ වියදම් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක දී ඒ වියදම් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කර ගත හැකි වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ඉඩම එක් තැනැත්තකුට වඩා වැඩි දෙනකුට අයිතිව ඇති අවස්ථාවක දී, ඒ උපවගන්තියේ සඳහන් වියදම් සභාව විසින් නිශ්චය කරනු ලබන අනුපාතයකට අනුව ඒ වෙන් වෙන් අයිතිකරුවන් අතර කොටස් කර ඔවුන් ගෙන් අය කර ගත යුතු ය.

**ළමයින්ගෙන් සිදුවන කරදර.**

134. වයස අවුරුදු දොළහකට අඩු යම් ළමයකු යම් වීථියක හෝ යම් වීථියක් අසලදී කරදරයක් කිරීමෙන් වැළැක්වීම නොකර හරින්නා වූ ද ඒ ළමයාගේ භාරය හෝ රැකවරණය භාරව සිටින්නා වූ ද සෑම තැනැත්තකු ම වරදක් කරන අතර ඊට වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

[1986 අංක 39§35]

**පොදු ස්නාන ස්ථාන.**

135. (1) තත් කාර්යය සඳහා වෙන් නොකරන ලද යම් පොදු ස්ථානයක හෝ දැන්වීමේ සඳහන් වේලාවන් හැර වෙනත් වේලාවල දී හෝ, දැන්වීමේ සඳහන් තැනැත්තන් හැර වෙනත් තැනැත්තන් විසින් හෝ, නෑම නොහොත් සතුන් නෑවීම් හෝ රෙදි සේදීම ද පොදු ස්ථානවල ජලය ප්‍රයෝජනයට නුසුදුසු තත්ත්වයකට පත් කරන හෝ නාන හෝ සෝදන ස්ථාන භාවිතා කරන තැනැත්තන්ට අපහසු හෝ හිරිහැර තත්ත්වයක් ඇති කරන වෙනත් සියලු ක්‍රියාද සභාව විසින් ප්‍රසිද්ධ දැන්වීමක් මගින් තහනම් කළ හැකි ය. ඒ දැන්වීම ගැසට් පත්‍රයේ ද මහා නගරය තුළ සංසරණය වන ප්‍රවෘත්ති පත්‍ර වලින් යටත් පිරිසෙයින් දෙකක ද පළ කරනු ලැබිය යුතු ය.

(2) ඉහත කී තහනමට පටහැනිව නෑම, සේදීම හෝ වෙනත් යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර ඊට වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

**ජලාශවලට හෝ ජල කර්මාන්ත වලට ගලන ජල මාර්ග අපිරිසිදු කිරීම.**

136. යම් මහා නගර සභාවකට අයිති ජල කර්මාන්තයක කාර්ය යන් සඳහා භාවිතා කරනු ලබන යම් ජලාශයක හෝ එම ජලාශයට ගලන හෝ ජලය සපයන යම් දිය පහරක හෝ ජල මාර්ගයක නෑම, රෙදි හෝ වෙනත් ද්‍රව්‍ය සේදීම හෝ යම් දූවිලි, කුණු හෝ වෙනත් අපවිත්‍ර ද්‍රව්‍ය ඊට ගලා යෑමට සැලැස්වීම හෝ ඉඩ හැරීම හෝ වෙනත් ආකාරයකින් එය අපවිත්‍ර කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර ඊට වරදකරු කරනු

ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. තවද එම වරද දිගටම කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ වරදට අවධානය යොමු කරවමින් සභාව විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසු ඒ වරද කර ගෙන ගිය එක් එක් දිනයට රුපියල් එක් සියයකට නොවැඩි අතිරේක දඩයක වද ඔහු යටත් විය යුතුය. [1986 අංක 39§37] [1986 අංක 39§37]

136අ. (1) යම් තැනැත්තකු විසින්, යම් මහා නගර සභා පාලන සීමාවක් තුළ පිහිටි යම් කර්මාන්ත ශාලාවක්, එහි අවට පරිසරයේ සෞඛ්‍ය තත්ත්වයට අන්තරායක් නැතහොත් හානියක් සිදුවන පරිද්දෙන් පවත්වාගෙන යනු ලැබුවහොත් හෝ එසේ පවත්වාගෙන යෑමට සැලැස්වූවහොත්, ඒ තැනැත්තා වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු වන්නේ ය.

කර්මාන්ත ශාලා වලින් සිදුවන පරිසර දූෂණය. [1979 අංක 42 §2] 1986 අංක 39§38]

(2) ලඝු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී, ඒ කර්මාන්ත ශාලාවෙන් සිදුවූ පරිසර දූෂණයේ ප්‍රමාණය අනුව—

(අ) මේ ආඥාපනතේ විධිවිධාන නැතහොත් මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ඒ කර්මාන්ත ශාලාව පිහිටි ස්ථානය වෙනුවෙන් නිකුත් කරන ලද බල පත්‍රය සඳහා ගෙවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක දඩයක් ගෙවන ලෙස ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට ආඥා කළ යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වඩා යට කී දඩය වැඩි වුව ද ඒ නොතකා එකී දඩය නියම කළ යුතු ය. තවද එසේ අය කර ගනු ලබන දඩ මුදල සභාවේ අරමුදලට ගෙවිය යුතු ය; එසේ නැතහොත්

(ආ) ඒ කර්මාන්ත ශාලාව පවත්වා ගෙන යෑම නතර කරන ලෙස ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, "පරිසර දූෂණය" යන්නේ, පරිසරයෙන් ලැබෙන ප්‍රයෝජන කිසිවක් කෙරෙහි අහිතකර ලෙස බල පාන අන්දමට, නැතහොත් මහජනයාගේ සෞඛ්‍යයට, ආරක්

ෂාවට හෝ ශුභ සිද්ධියට හෝ සතුන්ට, පක්ෂීන්ට, වන සතුන්ට, මත්ස්‍යයන්ට, ජලජ ජීවීන්ට හෝ ශාකාවලට උපද්‍රව සහිත තත්වයක් නැතහොත් උපද්‍රවකාරී විය හැකි තත්ත්වයක් ඇති වන අන්දමට, අප ද්‍රව්‍ය පිට කිරීමෙන්, විමෝචනය කිරීමෙන් නැතහොත් තැන්පත් කිරීමෙන්, පරිසරයේ කවර වූ හෝ කොටසක පවත්නා භෞතික, තාප, රසායනික, ජෛව හෝ විකිරණශීලී ගුණ කිසිවක් කෙළින් ම නැතහොත් අන්‍යාකාරයකින් වෙනස් කිරීම අදහස් වේ.

තැනැත්තන්ගේ හෝ දේපලක ආරක්ෂාවට තර්ජනයක් වන ගස් හෝ ගස් වල අතු හෝ කඳන් හෝ ගෙඩි සම්බන්ධයෙන් නගරාධිපතිවරයාගේ බලතල [1986 අංක 39§39

136ආ. (1) යම් මහා නගර සභා ප්‍රදේශයක් තුළ වූ යම් ගසකින් හෝ ගසක යම් අත්තකින්, කඳකින්, ගෙඩියකින් හෝ වෙනත් කොටසකින් යම් ගොඩනැගිල්ලකට අලාභ හානියක් සිදුවන හෝ අලාභ හානි සිදුවීමට ඉඩ ඇති හෝ අවස්ථාවක නැතහොත් එය, යම් ගොඩනැගිල්ලක පදිංචිකරුවන්ට හෝ යම් ප්‍රසිද්ධ මහා මාර්ගයක ගමන් කරන්නන්ගේ ආරක්ෂාවට අනතුරුදායක තත්ත්වයක පවතින අවස්ථාවක, නගරාධිපතිවරයා විසින් ඒ ගස පිහිටියා වූ ඉඩමේ අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදීමෙන්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත ඒ ගස බැඳ තැබීමට සහ ආරක්ෂාවට අනතුරුදායක නොමැති ලෙස තැබීමට හෝ ඒ ගස හෝ ගසේ අත්ත, කඳ, ගෙඩි හෝ වෙනත් යම් කොටසක් කපා ඉවත් කිරීමට ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ සෑම තැනැත්තකුම, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරන ලද කාලය ඇතුළත ඒ දැන්වීමේ කර ඇති නියමයන් ඉටු කළ යුතු ය; ඒ කාලය ඇතුළත, ඒ තැනැත්තන් විසින් ඒ නියමයන් ඉටු කිරීම ප්‍රතික්ෂේප කර ඇති හෝ අතපසු කර ඇති විට, නගරාධිපතිවරයා හෝ නගරාධිපතිවරයා විසින් ලියවිල්ලකින් තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් නිලධරයෙක් හෝ කම්කරුවෙක් ඒ දැන්වීමේ සඳහන් ඉඩමට ඇතුල් වී, ඒ දැන්වීමෙන් ඒ තැනැත්තාට ඉටු කිරීමට නියම කරන ලද කටයුත්ත කරනු ලැබිය හැකි අතර, ඒ කටයුත්ත වෙනුවෙන් දරන ලද වියදම් සභාවට අයවිය යුතු ණයක් ලෙස ඒ තැනැත්තාගෙන් අය කර ගනු ලැබිය හැකි ය.

## ආසාදක රෝග සහ වසංගත

වෛද්‍යවරයන් ආසාදන රෝග රිපෝර්තු කල යුතු බව.

**137.** (1) පහත සඳහන් රෝගයකින්, එනම්, වසූරිය, කොලරාව තීව්‍ර පාචනය හෝ කොලරා පාචනය, මහාමාරිය, ටයිෆොයිඩ් හෝ ආන්ත්‍රික ජ්වරය, පුප්ඵුසක්ෂය, දින හතක් හෝ ඊට වැඩි කලක් නො බැස පවත්නා සරල උණ, පැපොල, සරම්ප, ආරක්තක උණ, ගලපටලය හෝ නිරෝධායක හා රෝග නිවාරණ ආඥාපනත යටතේ සාදන ලද නියෝග යටතේ කලින් කල ප්‍රකාශයට පත් කරනු ලබන වෙනත් රෝග අතුරින් යම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට ප්‍රතිකාර කරන සෑම වෛද්‍යවරයකු ම හෝ රෝගවලට ප්‍රතිකාර කරන්නෙකැයි කියාගන්නා සෑම තැනැත්තකු ම එසේ ප්‍රතිකාර කිරීමෙන් පසු පැය තුනක් ඇතුළත, රෝගියාගේ නම, ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස ද රෝගියා පදිංචි ස්ථානය ද රෝගයේ ස්වභාවය ද සඳහන් කරමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම්දීමක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් රෝගයකින් ආවේදිත යම් තැනැත්තකු සිටින යම් ගොඩනැගිල්ලක පදිංචිකරු විසින් නොපමාව ම සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාට ඒ බව දැනුම් දිය යුතු අතර ඒ දිනයට පෙරාතුව වූ දවස් දහහතර තුළ ආවේදිත තැනැත්තා රාත්‍රී කාලය ගත කළ සියලු ස්ථාන පිළිබඳ සම්පූර්ණ විස්තර ද ඇතුළු ආවේදිත තැනැත්තා පිළිබඳ ව ඒ නිලධරයා විසින් සාධාරණව ඉල්ලා සිටිය හැකි ඒ තැනැත්තා පිළිබඳ සියලු විස්තර, අදාළ ස්ථානයේ පදිංචිකරු සහ ඒ ආවේදිත තැනැත්තා විසින් ඒ නිලධරයාට සැපයිය යුතු ය.

(3) මේ වගන්තියේ නියමයන් අතුරින් යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම වරදක් කරන්නේ ය. වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. )1986අංක 39§40)

ස්ථාන සෝදිසි කිරීම සහ රෝග ග්‍රස්ත තැනැත්තන් වෙන් කර තැබීම.

**138.** (1) අසාදක රෝග වැළඳුණු අය සෙවීම සඳහා සභාව විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ ලිඛිත නියමය පිට ක්‍රියා කරන සනීපාරක්ෂක නිලධරයකු, ආසාදක රෝග වැළඳුනු අය සෙවීමේ කාර්යය සඳහා යම් වාසස්ථානයකට නොහොත් ස්ථානයකට, දැනුම් දීමක් නොමැතිව යම් වේලාවක ඇතුළු වීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) ඉහත කී පරිදි බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින්, නිරෝධායක හා රෝග නිවාරණ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග වල සඳහන් රෝගී තැනැත්තන් හෝ එහි සඳහන් යම් රෝගයකින් ආවේදිත යැයි සැක කරනු ලබන තැනැත්තන්—

(අ) භාණ්ඩ විකිණීම සඳහා තබා ඇති යම් ගෙයකින් හෝ ස්ථානයකින් ;

(ආ) මහජනයා ගැවසෙන තැනක් වූ යම් ගෙයකින් හෝ ස්ථානයකින් ;

(ඇ) ඒ තැනැත්තා අනෙකුත් නේවාසිකයන්ගෙන් වෙන් කර තැබීම සඳහා ඉඩ පහසුකම් නොමැති යම් ගොඩනැගිල්ලකින් ; හෝ

(ඈ) ඒ තැනැත්තා තබා ගැනීම අනෙකුත් අයට අන්තරාය දායක වීමට ඉඩ ඇති යම් ගොඩනැගිල්ලකින්

යම් පොදු රෝහලකට හෝ සභාව විසින් සපයන ලද යම් ස්ථානයකට හෝ ඒ තැනැත්තා විසින් තෝරා ගනු ලැබ, යෝග්‍ය යැයි ඉහත කී ලෙස බලය පවරනු ලැබූ තැනැත්තා විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ සලකනු ලබන, යම් ස්ථානයකට ඉවත් කිරීමට සැලැස්වීම නීත්‍යනුකූල වන්නේ ය.

(3) (2) (අ) වන උපවගන්තියේ සඳහන් යම් ගෙයක හෝ ස්ථානයක එකී යම් රෝගයකින් ආවේදිත තැනැත්තකු සිටින අවස්ථාවක ඒ ගෙයින් හෝ ස්ථානයෙන් භාණ්ඩ විකිණීම, ඉහත කී ලෙස බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ ලියවිල්ලකින් අවසර දෙන තුරු, නැවත නොඇරඹීමේ කොන්දේසිය මත ඒ ආවේදිත තැනැත්තාට එහි ම නැවතී සිටීමට, ඒ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ ඉඩ දෙනු ලැබිය හැකි ය.

(4) ඉහත කී ලෙස බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ යම් රෝග ග්‍රස්ත ප්‍රදේශයක සිට සොයා ගනු ලබන හෝ රෝග පවතින යම් ස්ථානයක සිට පැමිණ සිටින යම් තැනැත්තකු, එවැනි තැනැත්තන් පරීක්ෂාව යටතේ තැබීම සඳහා වෙන් වූ ස්ථානයකට ඉවත් කිරීමට හෝ එකී බලය පවරනු ලැබූ තැනැත්තා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විධාන කරන කාල සීමාවකට පරීක්ෂාව යටතේ තැබීමට හෝ සැලැස්විය හැකිය.

**139.** ආසාදනයට විවෘතව තිබිණි යැයි දැන ගැනීමට හේතු තිබිය දී යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා සෑහීමට පත් වන පරිදි විෂබීජ නැසීමෙන් පසුව මිස, දෙන, ණයට දෙන, විකුණන, යවන හෝ අන් ආකාරයකින් බැහැර කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය : [1986 අංක 39§41

ආසාදික හම බැහැර කිරීම සඳහා දණ්ඩනය

එසේ වුව ද, විෂබීජ නැසීම සඳහා සභාව විසින් අනුමත කර ඇති යම් ස්ථානයකට විෂබීජ නැසීමේ කාර්යය සඳහා යම් භාණ්ඩයක් හෝ දෙයක් නිසි ආරක්ෂක විධිවිධාන සහිත ව යවන තැනැත්තකුට මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන අදාළ වේ යැයි නොසැලකිය යුතු ය.

**140.** (1) ආසාදක රෝගයකින් පෙළෙමින් සිටිය දී ඒ රෝගය පැතිරීම වැළැක්වීම සඳහා නිසි ආරක්ෂක විධිවිධාන නොමැතිව පොදු වාහනයකින් තමා ගෙන යෑමට සලස්වන සෑම තැනැත්තකු ද එසේ ගෙන යනු ලබන රෝගියා භාර ව හෝ රෝගියා සමග යන සෑම තැනැත්තකු ද තමා ආසාදක රෝගයකින් පෙළෙන බව දැන දැන ම අයිතිකරු ට හෝ රියැදුරාට හෝ ඒ බව නොදන්වා පොදු වාහනයකට ඇතුළු වන සෑම තැනැත්තකු ද වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද ඒ වාහනයේ විෂබීජ නැසීම සඳහා ඒ වාහනයේ අයිතිකරුට හෝ රියැදුරාට දරන්නට සිදු වන පාඩුව සහ වියදම පියවීම සඳහා ප්‍රමාණවත් යැයි මහෙස්ත්‍රාත්වරයා හෝ නාගරික මහෙස්ත්‍රාත්වරයා සලකන අතිරේක දඩයකට ද යටත් විය යුතු ය. 1 986 අංක 39§42]

ආසාදිත තැනැත්තන් අනාවෘත කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන අතිරේක දඩ මුදල අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට යටත් ව මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ නාගරික මහෙස්ත්‍රාත්වරයා විසින් එම වාහනයේ අයිතිකරුට හෝ රියදුරාට ප්‍රදානය කළ යුතු ය.

(4) ආසාදක රෝගයකින් පෙළෙන තැනැත්තකු ගෙන ගිය සෑම කුලප්පත්තියක පටහැණි ව කුමක් සඳහන් ව තිබුණ ද කිසිම පොදු වාහනයක අයිතිකරුට හෝ රියදුරාට ඉහත කී පරිදි දරන්නට වන පාඩුව සහ වියදම් පියවීම සඳහා ප්‍රමාණවත් මුදලක් නොගෙවා, යම් ආසාදක රෝගයකින් පෙළෙන තැනැත්තකු ගෙන යන ලෙස එකී අයිතිකරුට හෝ රියදුරාට නියම නොකළ යුතු ය.

(4) ආසාදක රෝගයකින් පෙළෙන තැනැත්තකු ගෙන ගිය සෑම පොදු වාහනයක් ම, ඒ තැනැත්තා ගෙන යනු ලැබූ ස්ථානය භාර නිලධරයා විසින් වහා ම විෂ බීජ නාශනය කළ යුතු ය.

ආසාදිත කාමර කුලියට දීම සඳහා තහනම.

**141.** යම් තැනැත්තකු ආසාදක රෝගයකින් පෙළෙමින් සිටියේ යම් ගෙයක නොහොත් ගොඩනැගිල්ලක හෝ ගෙයක නොහොත් ගොඩනැගිල්ලක කොටසක ද ඒ ගෙය හෝ ගොඩනැගිල්ල හෝ එයින් කොටස සහ එහි ඇති ආසාදක විෂ බීජ තිබිය හැකි සියලු ම භාණ්ඩ, ලියාපදිංචි කරනු ලැබූ වෛද්‍යවරයකු සෑහීමට පත් වන පරිදි විෂ බීජ නාශක නොකර, දැන දැන ම කුලියට දෙන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය. හෝටලයක හෝ ලැගුම් නිවාසයක අමුත්තකු වශයෙන් භාර ගනු ලැබූ යම් තැනැත්තකුට එම හෝටලයේ හෝ ලැගුම් නිවාසයේ භාරකරු විසින් තම ගෙයින් කොටසක් කුලියට දෙන ලදැයි මේ වගන්තියේ කාර්යය සඳහා සැලකිය යුතු ය.

1986 අංක 39§43 ]

විශේෂ නිළධරයකු පත් කිරීම.

**142.** යම් මහා නගරයක් තුළ යම් වසංගතයක් පවත්නා අවස්ථාවක හෝ අසාමාන්‍ය මරණ සංඛ්‍යාවක් සිදුවී ඇති අවස්ථාවක එම වසංගතයට හෝ මරණ සිදුවීමට හේතු විමර්ශනය කිරීමේ කාර්යය සඳහාත් ගත යුතු සෞඛ්‍යාරක්ෂක පිළියම් පිළිබඳව සභාවට සහ අමාත්‍යවරයාට උපදෙස් දීමේ කාර්යය සඳහාත් අමාත්‍යවරයා විසින් විශේෂ නිලධරයකු පත් කළ හැකි ය.

විශේෂ නිළධර යාගේ වැටුප.

**143.** 142 වන වගන්තිය යටතේ පත් කරනු ලබන විශේෂ නිලධරයකු අවශ්‍ය යැයි අමාත්‍යවරයා සලකන පරිදි මාස දොළහක් නොඉක්මවන යම් කාල සීමාවක් සඳහා කලින් කළ පත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වැටුපක් මහා නගර සභා අරමුදලින් ඒ නිලධරයාට ගෙවනු ලැබිය යුතු ය.

විශේෂ නිළධර යාගේ බලතල.

**144.** ඇතුළු වීමට සහ පරීක්ෂා කිරීමට මේ ආඥාපනතින් සභාවට හෝ සභාවේ යම් නිලධරයකුට දී ඇති බලතල ම 142 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ සෑම විශේෂ නිලධරයකුට හෝ යම් සෞඛ්‍ය නිලධරයකුට ඔහුගේ සේවා නියුක්තිය තුළ දී තිබිය යුතු ය.

## අප්‍රසන්න හා අන්තරායදායක කර්මාන්ත

සතුන් මැරීමේ මඩු.

**145.** (1) මහා නගරයක් තුළ කිසි ම ස්ථානයක්, සතුන් මැරීමේ මඩුවක් වශයෙන් ඒ ස්ථානය පාවිච්චි කිරීම සඳහා ලිය විල්ලකින් වූ බල පත්‍රයක් සභාවෙන් ලබා ගෙන ඇත්නම් මිස, සතුන් මැරීමේ මඩුවක් ලෙස පාවිච්චි නොකළ යුතු ය. අවශ්‍ය යැයි සභාව සලකන පරිදි ස්වකීය අභිමතය අනුව කලින් කල බල පත්‍ර ප්‍රදානය කිරීමට ද ඒ බල පත්‍ර අත්හිටුවීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට ද සභාවට මෙයින් බලය පවරනු ලැබේ.

(2) මහා නගරය ඇතුළත සතුන් මැරීමේ මඩුවක් ලෙස බල පත්‍ර නොලත් යම් ස්ථානයක්, සතුන් මැරීමේ මඩුවක් වශයෙන් පාවිච්චි කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය; තව ද ඒ වරද නොකඩ ව කර ගෙන යනු ලබන අවස්ථාවක දී, ඒ ස්ථානය එසේ පාවිච්චි කිරීම නතර කරන ලෙස සභාව විසින් දැනුම්දෙනු ලැබීමෙන් පසු වරද නොකඩව කර ගෙන යන එක් එක් දවස සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතු ය. [1981 අංක 61 §5.] [1981 අංක 61 § 3.]

**146.** (1) 145 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද යම් බල පත්‍රයක් අත්හිටුවනු ලැබ ඇති කාලය ඇතුළත හෝ ඒ බල පත්‍රය ඉහත කී පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබීමෙන් පසුව, ඒ බල පත්‍රය අදාළ වන සතුන් මැරීමේ මඩුවෙහි යම් සතකු මරන හෝ යම් සතකු මැරීමට ඉඩ දෙන යම් තැනැත්තකු වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය. තවද එහි සතුන් මැරීම නතර කරන ලෙස සභාව විසින් දැනුම් දෙනු ලැබීමෙන් පසුත් එහි යම් සතකු මරන හෝ මැරීමට ඉඩ දෙන එක් එක් දවස සඳහා රුපියල් එක්දහසක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතුය. බල පත්‍ර අත්හිටවනු ලැබ හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ තිබිය දී සතුන් මැරීමේ මඩු පාවිච්චි කිරීම සඳහා දණ්ඩනය. [1981 අංක 61 §4.]

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "සතා" යන්නෙන් යම් ගොනෙක්, එළදෙනෙක්, වසු පැටියෙක්, ගවයෙක්, මී හරකෙක්, බැටළුවෙක්, එළුවෙක් හෝ ඌරෙක් අදහස් වේ.

**147.** (1) යම් මහා නගරයක් තුළ කිසි ම ස්ථානයක් මෙහි පහත දැක්වෙන කාර්ය කිසිවක් සඳහා, එනම්, අන්නශේෂ උණු කිරීම හෝ ලේ උණු කිරීම, සබන් සෑදීම, තෙල් උණු කිරීම, ඩයි කිරීම, සම් පදම් කිරීම සඳහා ගඩොල්, මැටි හෝ හුණු පෝරනු වක්, සව් නිෂ්පාදනාගාරයක්, වෙඩි බෙහෙත් නිෂ්පාදනාගාරයක්, රතිඤ්ඤා නිෂ්පාදනාගාරයක් හෝ අප්‍රසන්න හෝ පිළිකුල් සහගත ගඳක් නගින වෙනත් නිෂ්පාදනාගාරයක් හෝ ස්ථානයක් වශයෙන් හෝ ජීවිතවලට හානිකර වීමට තරම් වූ කාර්යයන් සඳහා හෝ වියලු ශේෂ, පිදුරු, ඇට, අඟුරු, කපු, ඇටකටු හෝ දැවෙන සුලු තෙල් අංගනයක් හෝ ගබඩාවක් සඳහා හෝ අප්‍රසන්න හෝ අන්තරායදායක කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් ලෙස සභාව විසින් මේ වගන්තියේ කාර්යය සඳහා අතුරු ව්‍යවස්ථා මගින් ප්‍රකාශයට පත් කළ හැකි වෙනත් යම් කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් සඳහා, සභාවෙන් ලබා ගත් බල පත්‍රයක් යටතේ මිස, ප්‍රයෝජනයට නොගත යුතු ය. සභාවට ස්වකීය අභිමතය අනුව කලින් කල, එවැනි බල පත්‍ර දීමට සහ අවස්ථානුකූල යයි සභාවට පෙනී යා හැකි නියමයන්, ඒ බල පත්‍රයෙහි ඇතුළත් කිරීමට මෙයින් බලය දෙනු ලැබේ. අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳ කර්මාන්ත හෝ ව්‍යාපාර ස්ථානවලට බල පත්‍ර දීම.

(2) සභාවේ පරිපාලන ප්‍රදේශ සීමා ඇතුළත (1) වන උපවගන්තියේ සඳහන් කවර හෝ කාර්යයන් සඳහා වූ කිසි ම බල පත්‍රයක් කරදර පිළිබඳ ආඥාපනතේ 5 වන උපවගන්තිය යටතේ නිකුත් නොකළ යුතු ය.

[1981 අංක 61 § 5.]

[1981 අංක 61 § 5.]

(3) ඉහත කී පරිදි වූ බල පත්‍රයක් නොමැති ව මහා නගරය ඇතුළත යම් ස්ථානයක් (1) වන උපවගන්තියේ සඳහන් යම් කාර්යයක් සඳහා පාවිච්චි කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය; තවද ඒ වරද තව දුරටත් කරගෙන යන අවස්ථාවක දී ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසුත් වරද කර ගෙන යන එක් එක් දවස සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතු ය.

බලපත්‍රයක් අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

148. (1) 147 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද යම් බල පත්‍රයක් අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම අවශ්‍ය යැයි සභාවට පෙනී ගියහොත් සභාව විසින් එය එසේ අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම නීත්‍යානුකූල වන්නේ ය:

එසේ වුව ද, බල පත්‍රය අත්හිටුවනු ලැබූ හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක, ඒ අත්හිටුවීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හේතු වූයේ එහි අයිතිකරු විසින් ඒ බල පත්‍රය හෝ එහි යම් නියමයක් උල්ලංඝනය කිරීම නොවී නම්, එකී අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හේතු කොට ගෙන අයිතිකරුට සිදු වූ පාඩුව වෙනුවෙන් අයිතිකරුට වන්දි ගෙවීමට සභාව බැඳී සිටින්නේ ය.

[1981 අංක 61 § 6.]

(2) තම බල පත්‍රය අත්හිටුවනු ලැබූ බව හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ බව දැනුම් දෙනු ලැබීමෙන් පසුව, 147 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් පාවිච්චි කරන හෝ පාවිච්චි කිරීමට ඉඩ දෙන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, එසේ දැනුම් දෙනු ලැබීමෙන් පසුවත් ඒ ස්ථානය එසේ පාවිච්චි කරන එක් එක් දවස සඳහා රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලබන වැසීමේ ආඥාව. [1981 අංක 61 § 7.]

148අ. (1) මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ නිකුත් කරන ලද බල පත්‍රයක් නොමැතිව තැනැත්තකු යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා යම් ස්ථානයක් පාවිච්චි කිරීමේ වරදට යම් අධිකරණයක් විසින් වරදකරු කරණු ලැබ, තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා ඒ ස්ථානය ම පාවිච්චි කිරීම නොකඩව කරගෙන යන අවස්ථාවක, නගරාධිපතිවරයා හෝ කොමසාරිස්වරයා හෝ අවස්ථාවෝචිත පරිදි තත් කාර්යය සඳහා ඒ නගරාධිපතිවරයා හෝ ඒ කොමසාරිස් වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් වැසීමේ

ආඥාවක් සඳහා කරන ලද ඉල්ලීමක් මත, ඒ තැනැත්තා සභාවෙන් බලපත්‍රයක් ලබා ගන්නා තුරු මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ ස්ථානයෙහි වූ ඒ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී නගරාධිපතිවරයා, කොමසාරිස්වරයා හෝ අවස්ථාවෝචිත පරිදි තත් කාර්යය සඳහා ඒ නගරාධිපතිවරයා හෝ ඒ කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් තැනැත්තා බල පත්‍රයක් නොමැතිව යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා ඒ ස්ථානය පාවිච්චි කිරීම නොකඩව කරගෙන යන බව දක්වමින් ඒ සහතිකයේ ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන්, බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වැසීමේ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන යම් අවස්ථාවක, ඒ ස්ථානයෙහි වූ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වසා දැමීමට නියම කෙරෙන හා බලය දෙන ආඥාවක් මහේස්ත්‍රාත්වරයා විසින් අධිකරණයේ පිස්කල්ට වහාම කරනු ලැබිය යුතු අතර, ඒ ආඥාවෙහි සඳහන්; ඒ ආඥාව නිකුත් කරන ලද දිනයේ සිට සම්පූර්ණ දින තුනකට කලින් වූ හෝ සම්පූර්ණ දින හතකට පසු දිනයක් නොවන දිනයකට පෙර ඒ පිස්කල් විසින් ඒ අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය. ඒ ස්ථානයෙහි වූ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වසා දැමීම සඳහා එකී පිස්කල් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් පොලිස් නිලධරයකු විසින් අවශ්‍ය යැයි සලකනු ලබන යම් සහායකයන් ද සමඟ ස්ථානයට ඇතුළු වීමට ඒ ආඥාව ඒ පිස්කල්ට හෝ ඒ නිලධරයාට ප්‍රමාණවත් අධිකාරයක් වන්නේ ය.

## විවිධ විධිවිධාන

**149.** (1) යම් අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු, මේ කොටසේ මීට ඉහතින් වූ යම් විධිවිධානයක් ප්‍රකාර තමා වෙත භාර දෙන ලද දැන්වීමක නියමයන් අනුව ඒ දැන්වීමේ නිශ්චිත කාලසීමාව ඇතුළත හෝ එවැනි කාල සීමාවක් නිශ්චිතව නැති නම් සාධාරණ කාලසීමාවක් ඇතුළත ක්‍රියා කිරීමට අපොහොසත් කරන අවස්ථාවක ඒම නියමිත වැඩය සභාව විසින් කරවිය හැකි අතර එහි වියදම එකී අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් මේ පනතේ විධිවිධාන පලස්වා ඇති පරිදි අය කර ගත යුතු ය. අයිතිකරුවන් හෝ පදිංචි කරුවන් විසින් කරනු ලබන පැහැර හැරීම.

(2) යම් තැනැත්තකු විසින් ඔහුගේ යම් ක්‍රියාවකින් හෝ යම් අකෘතයකින් මේ කොටසේ ඉහතින් වූ විධිවිධානවලින් කිසිවක් උල්ලංඝනය කරනු ලබන අවස්ථාවක, සභාව විසින්—

(අ) ඒ තැනැත්තාට, ලියවිල්ලකින් යවන දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් සාධාරණ කාල සීමාවක් ඇතුළත ඒ උල්ලංඝනය නතර කිරීමට අවශ්‍ය විය හැකි වැඩ කරන ලෙස නියම කළ හැකි ය; නැතහොත්

(ආ) අවශ්‍ය යැයි සභාව සලකන්නේ නම් එවැනි දැන්වීමක් නොමැති ව හෝ, සාධාරණ කාල සීමාවක් ඇතුළත එවැනි දැන්වීමක් අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා පැහැර හැරිය හොත්, ඒ වැඩ කරවා ඒවා කිරීමේ වියදම මේ පනතෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට එම තැනැත්තාගෙන් අය කර ගත හැකි ය.

(3) සභාව වෙත සතු කර තිබෙන කාණුවක් නොවන යම් කාණුවක් සහ ඊට සම්බන්ධ යම් නිරවුරක් හෝ උවාරණයක් එකකට වැඩි ස්ථාන සංඛ්‍යාවක ප්‍රයෝජනය සඳහා සම්පාදනය කර ඇති අවස්ථාවක, එම ස්ථානවල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන්, මෙම කොටසේ කාර්යය සඳහා ද යම් විශේෂිත කාරණයක් සම්බන්ධයෙන් යෝග්‍ය යැයි සභාව විසින් සලකනු ලබන තාක් දුරට ද එකී කාණුවේ, නිරවුරේ හෝ උවාරණයේ හවුල් අයිතිකරුවන් හෝ පාවිච්චි කරන්නන් ලෙසත් මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ද ඒ ප්‍රකාර සභාව විසින් නීත්‍යානුකූලව අය කරගත හැකි යම් වියදම් සඳහා ද එක් ව වගකිවයුත්තන් ලෙසත් සැලකිය යුතු අතර, සභාව විසින් එම වියදම්, යුක්ති සහගත යැයි සභාව සලකන අනුපාතයකට අනුව, අය කර ගත හැකි ය.

සභාව විසින් වැඩ කළ හැකි බව.

150. මේ පනත ප්‍රකාර යම් වැඩක් කිරීමට නියමිතව ඇති යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් අනුව, සුදුසු යැයි සභාව සලකන්නේ නම් සභාව විසින් නිශ්චය කළ හැකි කොන්දේසි මත, ඒ වැඩ සියල්ල ම හෝ ඉන් කිසිවක් කොන්ත්‍රාත් ක්‍රමයට හෝ අන්‍යාකාරයකින් සභාව විසින් කරවීම නීත්‍යානුකූල වන අතර, අවස්ථාවෝචිත පරිදි ඒ සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම් හෝ ඇත්ත වශයෙන් වූ වියදම් කල් මත්තෙන් හෝ අන්‍යාකාරයකින් මේ පනතෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් අය කර ගත හැකි ය.

වියදම්වලට වට්ටම් ද ඇතුළත් කිරීම.

151. යවන ලද දැනුම්දීමක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීමේ හේතුවෙන් වුව ද අන් හේතුවක් නිසා වුව ද යම් තැනැත්තකු වෙනුවෙන් සභාව විසින් මේ කොටසේ මීට ඉහතින් වූ විධිවිධාන ප්‍රකාර යම් වැඩක් කර ඇත්තා වූ ද ඒ සඳහා වූ වියදම් එම තැනැත්තාගෙන් අය කරගත යුතුව ඇත්තා වූ ද අවස්ථාවක, මැනුම්, සැලසුම්, අධීක්ෂණ සහ ආයතන වියදම් සඳහා සාධාරණ වට්ටමක් සභාව විසින් මුලින් කී වියදම්වලට ඇතුළත් කළ හැකි ය.

**152.** (1) යම් ස්ථානයක ජලාපවහන ක්‍රමයක් පිහිටුවීම හෝ වැඩි දියුණු කිරීම හෝ සම්බන්ධයෙන් අවශ්‍ය යම් යම් වැඩ, මේ කොටසේ මීට ඉහතින් වූ විධිවිධාන ප්‍රකාර සභාව විසින් කොන්ත්‍රාත් ක්‍රමයට හෝ අන් ආකාරයකින් කරවා ඇත්තා වූ ද ඒ සඳහා වූ වියදම් ප්‍රමාණය ඒ ස්ථානයෙහි අයිතිකරුගෙන් අය කර ගත යුතු ව ඇත්තා වූ ද අවස්ථාවක, සභාව විසින් ඒ වියදම් මේ පනතෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට අය කර ගත හැකි ය: **වාරික මඟින් වියදම් අයකර ගැනීම.**

එසේ වුව ද, ඒ වැඩය සම්පූර්ණ කළ බව සභාව විසින් දැනුම් දීමෙන් දින දහහතරක් ඇතුළත එකී අයිතිකරු විසින් එකී වියදම් ත්‍රෛමාසික වාරිකවලින් ගෙවීමට අපේක්ෂා කරන බව ලියවිල්ලකින් දැනුම් දුනහොත්, සභාව විසින් කලින් කළ යෝජනා සම්මතයක් නිශ්චය කරනු ලැබිය හැකි යම් අනුපාතිකයක් අනුව වූ පොලියක් ද සමඟ මුළු මුදල අවුරුදු පහළොවකට නොවැඩි කාලසීමාවක් ඇතුළත ගෙවී අවසන් වීමට ප්‍රමාණවත් ත්‍රෛමාසික වාරිකවලින් සභාව විසින් අය කර ගත යුතු ය.

(2) යම් ස්ථානයක් සම්බන්ධයෙන් දරන ලද හෝ කරන ලද, මෙහි (1) වන උපවගන්තියේ සඳහන් වියදම, ඒ ස්ථානය සම්බන්ධයෙන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි වරිපනම් මෙන් ම, ඒ ස්ථානය කෙරෙහි ප්‍රථම වැය බරක් වන අතර, ඒ වියදම ඒ ස්ථානයේ අයිතිකරු විසින් සහ ඔහුගේ හිමිකමෙහි අනුප්‍රාප්තිකයක් විසින් සභාවට ගෙවිය යුතු වන්නේ ය. තව ද එම වාරික ගෙවිය යුතු වන දිනවල දී එම ස්ථානයේ වර්තමාන හෝ අනාගත අයිතිකරුගෙන් වරිපනම් හා බදු අය කර ගන්නා ආකාරයෙන් ඒ වාරික අය කර ගත යුතු නමුත්, ඒ ස්ථානයෙහි පදිංචියක් නොමැති වීමේ හේතුවෙන් එකී වාරිකවල හෝ ඉන් යම් කොටසක ලිහිල් කිරීමක් නොවිය යුතු ය. එය ගෙවීමේ ප්‍රථම වාරිකය ඒ වැඩය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එළඹෙන ත්‍රෛමාසිකයේ පළමුවන දිනයේ දි ගෙවිය යුතු වන සේ සැලකිය යුතු අතර එය ඒ දිනයේ දී ගෙවිය යුතු ය.

**153.** 152 වන වගන්තිය යටතේ දරනු ලැබ අය කර ගත යුතු වූ සියලු වියදම් දැක්වෙන නාම ලේඛනයක් සභාව විසින් සභා කාර්යාලයෙහි පවත්වාගෙන යා යුතු අතර එම නාම ලේඛනයෙහි, එසේ දරන ලද සහ අය කර ගත යුතු මුළු මුදල් ප්‍රමාණය ද ඒ මුදල් ගෙවිය යුතු වාරික ද තත් කාලයෙහි ගෙවීමට ඉතිරිව ඇති ශේෂය ද දක්වා තිබිය යුතු ය. ඒ නාම ලේඛනය අවේක්ෂණය කරන එක් වතාවකට ශත විසිපහක් බැගින් වන ගාස්තුවක් ගෙවීමෙන් කවර හෝ තැනැත්තකු විසින් ඒ නාම ලේඛනය ආවේක්ෂණය කිරීම සඳහා සෑම සාධාරණ වේලාවක ම එය ලබා ගැනීමට ඉඩ තිබිය යුතු ය. **වියදම් නාම ලේඛණය.**

පෞද්ගලික වැඩ සඳහා ණය ගැනීම.

**154.** 152 වන වගන්තිය යටතේ වියදම් අය කර ගත යුතු වූ ද අය කර ගත හැකි වූ ද යම් වැඩක් කිරීම, මහා නගර සභාවක් විසින් 191 වන වගන්තිය යටතේ මුදල් ණයට ගත හැකි කාර්ය යක් ලෙස සැලකිය යුතු අතර X වන කොටසේ විධිවිධාන ද ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක විධිවිධාන ද ඒ අනුව අදාළ වන්නේ ය:

එසේ වුව ද, එසේ ණයට ගනු ලබන යම් මුදලක් 192 වන වගන්තිය අදාළ කිරීමේ කාර්යය සඳහා ගණන් නොගත යුතු ය.

දිරි ගැන්වීමේ දීමනා ගෙවීම. [1981 අංක 61 § 8.]

**154අ.** (1) නිවාස ස්ථාන නඩත්තු කිරීම පිළිබඳව යෝජනා ක්‍රමයක් සකස් කිරීමේ කාර්යය සඳහා සහ දිරිගැන්වීමේ දීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලබන ඒ ස්ථානවල පදිංචිකරුවන්ට එවැනි ගෙවීම් කිරීම පිණිස නිර්දේශ කිරීම සඳහා සභිකයන් සයදෙනකුට නොඅඩු ගණනකින් සමන්විත වූ කමිටුවක් මහා නගර සභාවක් විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යෝජනා ක්‍රමයක් සකස් කිරීමේ දී සහ යම් නිවාස ස්ථානයක පදිංචිකරුවකුට දිරි ගැන්වීමේ දීමනාවක් ගෙවීම සඳහා යම් නිර්දේශයක් කිරීමේ දී කමිටුව විසින් පහත දැක්වෙන දේ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:—

(අ) නිවාස ස්ථාන හොඳින් නඩත්තු කර, ශක්ති සම්පන්න, පවිත්‍රව හා සෞඛ්‍යයට හිතකර තත්ත්වයකින් පවත්නා බව ; සහ

(ආ) පදික වේදිකාව ඇතුළු වීථිය සහ ඒ ස්ථානය ඉදිරිපස හා ඒ ස්ථානයට යා වූ සියලු මතුපිට කාණු පිරිසිදුව හා යම් අපද්‍රව්‍යයකින් තොරව තබා ඇති බව.

(3) කමිටුව විසින්, ස්වකීය නිර්දේශ කිරීමේ කාර්යය සඳහා දවසේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී පදිංචිකරුගේ කැමැත්ත ඇතිව යම් නිවාස ස්ථානයකට ඇතුළු වීම සහ පරීක්ෂා කිරීම ද ඒ ස්ථානයේ පදිංචිකරුගෙන් යම් තොරතුරක් නිසැකව දැන ගැනීම ද කරනු ලැබිය හැකි ය

## VII වන කොටස

### වෙළඳ පොළවල් සහ භාණ්ඩ විකිණීම

**155.** අවශ්‍ය වන පරිදි කලින් කල මහා නගර සභාව විසින්, පොදු වෙළෙඳ පොළවල් වශයෙන් යොදා ගැනීමේ කාර්යය සඳහා මහා නගරය ඇතුළත ස්ථාන සැපයිය හැකි අතර ඒ වෙළෙඳ පොළවල් පාවිච්චි කිරීම වෙනුවෙන් ද විකිණීම පිණිස එහි බඩු තබාගෙන කිරීමේ අයිතිය වෙනුවෙන් ද එහි ඇති සාප්පු, කඩපිල්, මඩු, කොටු සහ තට්ටු පාවිච්චිය වෙනුවෙන් ද සුදුසු යැයි මහා නගර සභාවට පෙනී යන කුලී, රේන්ද සහ ගාස්තු අය කළ හැකි ය. ඒ සියලු කුලී, රේන්ද සහ ගාස්තු, එහි මුදල මේ ආඥාපනත යටතේ වූ බදු වූවක් මෙන්, ඒවා ගෙවීමට යටත් තැනැත්තන්ගෙන් කොමසාරිස්වරයා විසින් අය කර ගත හැකි ය.

වෙළෙඳ පොළවල් සැපයීම සහ කුලී සහ ගාස්තු අය කිරීම.

1971 අංක 48§7 .]

**156.** සභාව විසින් පහත සඳහන් ක්‍රියා කළ හැකි ය :—

අතුරු ව්‍යවස්ථා කඩ කරන තැනැත්තන් පිට කිරීම සහ බද්ද අවසාන කිරීම.

(අ) මේ ආඥාපනත යටතේ වෙළෙඳ පොළවල් සම්බන්ධයෙන් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු හෝ සේවකයකු වරදකරු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා යම් පොදු වෙළෙඳ පොළකින් පිට කිරීම හෝ පිට කිරීමට සැලැස්වීම ;

(ආ) ඒ තැනැත්තා තමා විසින් ම හෝ තමාගේ සේවකයන් මගින්, ඒ වෙළෙඳ පොළෙහි යම් කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් තව දුරටත් කරගෙන යෑම හෝ එහි යම් කඩපිලක්, සාප්පුවක් හෝ වෙනත් ස්ථානයක් තව දුරටත් පරිහරණය කිරීම වැළැක්වීම ;

(ඇ) වෙළෙඳ පොළ තුළ යම් කඩපිලක්, සාප්පුවක් හෝ වෙනත් ස්ථානයක් සම්බන්ධයෙන් එවැනි තැනැත්තකුට ඇති යම් බද්දක් හෝ අයිතියක් අවසාන කිරීම.

**157.** 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, මහා නගර සභාවක් විසින් යම් පොදු වෙළෙඳ පොළක් හෝ එහි යම් කොටසක්, මහා නගර සභාව විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන කොන්දේසි මත විකිණීම, බද්දක් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් කුලී බදුකරුවන්ට කුලියට දීම හෝ එයින් යම් වෙළෙඳ පොළක් හෝ එහි යම් කොටසක් වසා දැමීම කළ හැකි ය.

වෙළෙඳ පොළවල් විකිණීම, බදු දීම සහ වසා දැමීම.

අවසර නොමැති ව වෙළෙඳපොළ තුළ වෙළෙඳාම් කිරීම සඳහා දණ්ඩනය.
1986 අංක 39 § 44]

**158.** සභාවේ අවසරය නොමැති ව යම් පොදු වෙළෙඳ පොළක යම් භාණ්ඩයක් වෙළෙඳාම් කරන හෝ වෙළෙඳාම සඳහා තබන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

වීථියෙහි වෙළෙඳාම.

**159.** යම් නිශ්චිත පොදු වීථියක හෝ එහි යම් කොටසක යම් භාණ්ඩයක් වෙළෙඳාම් කිරීම හෝ වෙළෙඳාම සඳහා තැබීම, ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින්, සභාව විසින් කලින් කළ තහනම් කළ හැකි අතර, ඒ තහනම අවලංගු කිරීම, අත්හිටුවීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම ද ඒ ආකාරයෙන් ම කළ හැකි ය. ඒ නිවේදනයෙන් පසු ව එවැනි යම් වීථියක, ඒ නිවේදනය කඩ කර මින් යම් භාණ්ඩයක් වෙළෙඳාම් කරන හෝ වෙළඳාම සඳහා තබන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

1986 අංක 39 § 45[

අපථ්‍ය ආහාරපාන

**160.** (1) මනුෂ්‍ය ආහාර පාන වෙළඳාම සඳහා පාවිච්චි කරන හෝ වෙළෙඳාම සඳහා වන එවැනි ද්‍රව්‍ය කිසිවක් තැබීම හෝ ගබඩා කිරීම සඳහා පාවිච්චි කරන කවර හෝ ස්ථානයකට සෑම යුක්ති සහගත වේලාවක ම ඇතුළු වී ඒ ස්ථානය පරීක්ෂා කිරීම ද එහි ඇති එකී ද්‍රව්‍ය කිසිවක් පරීක්ෂා කිරීම ද සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ ඒ කාර්යය සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් කළ හැකි ය.

(2) ඒ පරීක්ෂණයේ දී මනුෂ්‍ය ආහාර පාන සඳහා අයෝග්‍ය යැයි ඒ නිලධරයාට හෝ ඒ තැනැත්තාට පෙනී යන යම් ද්‍රව්‍යයක් ඔහු විසින් තහනමට ගත හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් ද්‍රව්‍යයක් තහනමට ගන්නා සෑම නිලධරයකු හෝ තැනැත්තකු විසින් ම ඒ ද්‍රව්‍ය මහෙස්ත්‍රාත්වරයකු වෙත නොපමාව ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

(4) එසේ තහනමට ගනු ලැබූ ද්‍රව්‍යය මනුෂ්‍ය ආහාර පාන සඳහා අයෝග්‍ය බව ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, එය විනාශ කරන ලෙස හෝ එය වෙළෙඳාම සඳහා තැබීම හෝ ආහාර පාන වශයෙන් ප්‍රයෝජනයට ගැනීම වැළැක් වෙන පරිදි බැහැර කරන ලෙස හෝ ඔහු විසින් ආඥා කළ යුතු අතර, එහි අයිතිකරු හෝ, එය සොයා ගන්නා ලද්දේ යම් තැනැත් තකුගේ සන්තකයේ තිබිය දී ද ඒ තැනැත්තා, දණ්ඩ නීති සංග්‍රහයේ 266 වන වගන්තිය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබීමට යටත් විය යුතු ය.

(5) එසේ තහනමට ගන්නා ලද ද්‍රව්‍ය මනුෂ්‍ය ආහාර පාන සඳහා යෝග්‍ය යැයි මහේස්ත්‍රාත්වරයා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, එම ද්‍රව්‍යය හෝ මනා තත්ත්වයෙන් ඇති ඉන් කොටස එහි අයිතිකරුට හෝ එය සොයා ගන්නා ලද්දේ යම් තැනැත්තකුගේ සන්තකයේ තිබී ද ඒ තැනැත්තාට ආපසු දෙන ලෙස ද එය එසේ තහනමට ගැනීමේ හේතුවෙන් සිදු වූ පාඩුවට හෝ අගය අඩු වීමට වන්දි වශයෙන් සාධාරණ යැයි මහේස්ත්‍රාත්වරයා සලකන යම් මුදල් ප්‍රමාණයක් එකී අයිතිකරුට හෝ ඒ තැනැත්තාට ගෙවන ලෙස ද මහේස්ත්‍රාත්වරයා විසින් සභාවට අණ කළ හැකි ය.

---

## VIII වන කොටස

## නිලධරයන් සහ සේවකයෝ

### නාගරික මහේස්ත්‍රාත්වරයා

නාගරික මහේස් ත්‍රාත්වරයා පත් කිරීම.

**161.** එක් එක් මහා නගරය සඳහා නාගරික මහේස්ත්‍රාත්වරයකු පත් කරනු ලැබිය යුතු අතර, මහා නගරය තුළ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා, ඔහුගේම කාර්ය වලට අතිරේකව, නාගරික මහේස්ත්‍රාත්වරයා වශයෙන් පත් කරනු ලැබිය හැකිය.

නාගරික මහේස් ත්‍රාත්වරයා අතිරේක මහේස්ත්‍රාත්වරයකු වශයෙන් පත් කළ හැකි බව.

**162.** යම් මහා නගරයක් සඳහා ඒ මහා නගරය තුළ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා නොවන නාගරික මහේස්ත්‍රාත්වරයකු පත් කරනු ලැබූ විට, ඒ නාගරික මහේස්ත්‍රාත්වරයා, ඔහුගේම කාර්ය වලට අතිරේකව, අතිරේක මහේස්ත්‍රාත්වරයකු වශයෙන් පත් කරනු ලැබිය හැකිය.

නාගරික මහේස් ත්‍රාත්වරයාගේ අධිකරණ බල සීමාව.

**163.** (1) මහා නගරය තුළ කරනු ලබන මෙම ආඥාපනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථා, රීති හෝ නියෝග යටතේ වූ වැරදි ද මෙහි පහත දැක්වෙන වගුගත ප්‍රකාශයේ පළමුවන තීරයෙහි සඳහන් ප්‍රඥප්ති අතුරෙන් යම් ප්‍රඥප්තියක් යටතේ වූ හා නාගරික මහේස්ත්‍රාත්වරයකු විසින් විභාග කළ හැකි වැරදි වශයෙන් එකී ප්‍රකාශයේ දෙවන තීරයෙහි දක්වා ඇත්තා වූ වැරදි ද ඇසීම, විභාග කිරීම සහ නිශ්චය කිරීම නාගරික මහේස්ත්‍රාත්වරයකු විසින් කළ යුතු අතර, නීතියෙන් බලය දී ඇති දඬුවමක් වරදකරුට නියම කිරීමේ අධිකරණ බලය ඔහුට ඇත්තේ ය.

නාගරික මහේස්ත්‍රාත්වරයන් විසින් විභාග කළ හැකි වැරදි

| ප්‍රඥප්තියේ ලුහුඬු නාමය | නාගරික මහේස්ත්‍රාත්වරයන් විසින් විභාග කළ හැකි වැරදි |
|---|---|
| වෙන්දේසිකරුවන් සහ බ්‍රෝකර්වරුන් පිළිබඳ ආඥාපනත ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| බෝට්ටු ආඥාපනත ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| ගණිකා නිවාස ආඥාපනත ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |

| ප්‍රඥප්තියේ පුහුබු නාමය | | නාගරික මහේස්ත්‍රාත්වරයා විසින් විභාග කළ හැකි වැරදි |
|---|---|---|
| පාන් ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| ගෝසාතක ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| සුසාන භූමි හා භූමිදාන ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| ජනලේඛන ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| සංස්පර්ශක රෝග ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| සංස්පර්ශක රෝග (සත්ව) ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| සුරා බදු ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| සූදු ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| ගෑස් මීටර ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| මෝටර් වාහන ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| කරදර පිළිබඳ ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| දණ්ඩ නීති සංග්‍රහය | ... | 257 වන, 258 වන සහ 259 වන වගන්ති යටතේ වූ යම් වරදක් |
| පොලිස් ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| සත්ව හිංසා වැළැක්වීමේ ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| ගල්වලවල් පිළිබඳ ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| ජලභීතිකා රෝග ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| රජයේ ඉඩම් ආඥාපනත | ... | ආඥාපනතේ VIII වන කොටස යටතේ වූ යම් වරදක් |
| මිනින්දෝරු ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| මංමාවත් ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| රේන්ද ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| එන්නත් කිරීමේ ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| අයාල ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| වාහන ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| පඩි සහ මිමි ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| ළිං සහ වළවල් පිළිබඳ ආඥාපනත | ... | ආඥාපනත යටතේ වූ යම් වරදක් |
| ආහාර පනත | ... | පනත යටතේ වූ යම් වරදක් |
| වෛද්‍ය ආඥාපනත | ... | ආඥාපනතේ 54 වන වගන්තිය යටතේ වූ වැරදි. |

(2) කලින් කල ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නාගරික මහේස්ත්‍රාත්වරයන්ගේ අධිකරණ බලය ඉහත දැක්වුණු ප්‍රකාශයෙහි ඇතුළත් නොවූ වැරදි කෙරෙහි ව්‍යාප්ති කරනු ලැබිය හැකි ය.

අතිරේක නාගරික මහෙස්ත්‍රාත්වරයා.

**164.** යම් මහා නගරයක් සඳහා කලින් කල අතිරේක නාගරික මහෙස්ත්‍රාත්වරයකු පත් කරනු ලැබිය හැකිය; මහා නගරය තුළ කරනු ලබන වැරදි සම්බන්ධයෙන්, සෑම අතිරේක නාගරික මහෙස්ත්‍රාත්වරයකුටම, නාගරික මහෙස්ත්‍රාත්වරයකුට ඇති බලතලම සහ අධිකරණ බලය ම ඇත්තේය.

මහේස්ත්‍රාත්වරයකු ඔහුගේ ම කාර්ය යන්ට අතිරේක ව නාගරික මහේස් ත්‍රාත්වරයා වශයෙන් පත් කරනු ලැබූ විට ඔහුගේ සේවා සඳහා ගෙවීම.

**165.** යම් මහා නගරයක් තුළ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා ඔහුගේම කාර්යයන්ට අතිරේකව එම මහා නගරය සඳහා නාගරික මහෙස්ත්‍රාත්වරයා වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, නාගරික මහෙස්ත්‍රාත්වරයා වශයෙන් වූ එකී මහෙස්ත්‍රාත්වරයාගේ සේවය වෙනුවෙන්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන මුදලක් මහා නගර සභාව විසින් මහා නගර සභා අරමුදලින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට ගෙවිය යුතුය.

නාගරික මහේස් ත්‍රාත්වරයාගේ දීමනා, තත්ත්වය, අයිතිවාසිකම්, වැටුප් හා විශ්‍රාම වැටුප් සහ වියදම් ගෙවීම.

**166.** (1) මහා නගරයක් පිහිටි යම් ප්‍රදේශයක් තුළ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා නොවන යම් තැනැත්තකු ඒ මහා නගරය සඳහා නාගරික මහෙස්ත්‍රාත්වරයා වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක හෝ නාගරික මහෙස්ත්‍රාත්වරයා වශයෙන් තාවකාලිකව ක්‍රියා කිරීමට යම් තැනැත්තකු පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ නාගරික මහෙස්ත්‍රාත්වරයා—

(අ) ඔහු එසේ පත් කරනු ලැබීමේ හේතුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ නිලධරයකු වන අතර වැන්දඹු සහ අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ කාර්යයක් සඳහා සහ වෙනත් සියලු කාර්යයන් සඳහා රජයේ නිලධරයකු වශයෙන් සලකනු ලැබිය යුතුය; තවද

(ආ) ඔහුට ගෙවීම සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන වැටුපද එම වැටුප් ප්‍රමාණය ලබන ශ්‍රී ලංකා ආණ්ඩුවේ නිලධරයකුට සාමාන්‍යයෙන් ගෙවිය යුතු වන ගමන් ගාස්තු සහ වෙනත් දීමනා ද භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් ඔහුට ගෙවිය යුතුය.

තවද, එම මහා නගර සභාව විසින්—

(i) ඒ නාගරික මහෙස්ත්‍රාත්වරයාගේ වැටුප් සහ දීමනා වශයෙන් ඔහුට හෝ ඔහු සම්බන්ධයෙන් කරන ලද සියලු වියපැහැදම් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ආපසු ගෙවිය යුතුය; තවද

(ii) ඒ නාගරික මහෙස්ත්‍රාත්වරයා විශ්‍රාම ගැනීමේදී හෝ වෙනත් ආකාරයකින් හෝ ඔහුට විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂික යක් හෝ ප්‍රදානය කරන ලද නම් හෝ ඔහු මිය ගිය විට ශ්‍රී ලංකා ආණ්ඩුවේ නිලධරයකු වශයෙන් වූ ඔහුගේ සේවය සම්බන්ධයෙන් ඔහුගේ යැපෙන්නන් කිසිවකුට පාරි

තෝෂිකයක් ප්‍රදානය කරන ලද නම්, එම විශ්‍රාම වැටුපෙහි හෝ පාරිතෝෂිකයෙහි මුළු මුදලම හෝ ඒ නාගරික මහෙස්ත්‍රාත්වරයා වශයෙන් වූ ඔහුගේ සේවය වෙනුවෙන් ගෙවන ලද බව්ට භාණ්ඩාගාරයේ ලේකම් විසින් සහතික කරනු ලබන කොටස භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට ගෙවිය යුතුය.

(2) (අ) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් නාගරික මහෙස්ත්‍රාත්වරයකුට නොපැමිණීමේ නිවාඩු දෙන ලද අවස්ථාවක ඔහුගේ නොපැමිණීමේ කාලය තුළ ඔහු වෙනුවට නාගරික මහෙස්ත්‍රාත්වරයා ලෙස තාවකාලිකව වැඩ බැලීම පිණිස නිලධරයකු පත් කරනු ලැබිය හැකිය.

(ආ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන වැටුපක් සහ දීමනා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් ඒ වැඩ බලන නිලධරයාට ගෙවිය යුතු අතර, එසේ ඒ නිලධරයාගේ පත්වීමට අයත් කාලසීමාව තුළ ඔහුගේ වැටුප හෝ දීමනා හෝ වශයෙන් කරන ලද සියලු වියදම්, (1) (ආ) වන උපවගන්තිය යටතේ ගෙවීමට මහා නගර සභාව බැඳී ඇති මුදලට අතිරේකව, මහා නගර සභාව විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට ආපසු ගෙවිය යුතුය :

එසේ වුවද, මහා නගර සභාව එසේ ආපසු ගෙවීමට බැඳී සිටියයුතු සම්පූර්ණ මුදල එම කාලසීමාව තුළ (1) (ආ) (1) වන උප වගන්තිය යටතේ මහා නගර සභාව ගෙවීමට බැඳී සිටින මුදලට වැඩි නොවිය යුතුය.

(3) (1) වන උප වගන්තියෙහි සඳහන් නාගරික මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ පිහිටුවීම සහ පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් දරන ලද වියදම් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර මහා නගර සභාව විසින් ඒවා ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවනු ලැබිය යුතුය.

නාගරික මහෙස්ත්‍රාත්කයා දිවුරුම් දිය වර බව

**167.** ස්වකීය ධුරයේ කාර්යයන් භාර ගැනීමට පෙර සෑම නාගරික මහෙස්ත්‍රාත්වරයකුම විසින්, පළමුවන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියෙහි දැක්වෙන පක්ෂපාතීත්ව හා ධුරයේ දිවුරුම දී ඊට අත්සන් කළ යුතු අතර, එම දිවුරුම එම නාගරික මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණයෙහි ලේඛනාරූඪ කොට, ඒ ලේඛනාරූඪ කිරීමේ පිටපත, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කොට තබනු පිණිස, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත නොපමාව යැවිය යුතුය.

168. නාගරික මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන සියලු නඩු කටයුතු මහෙස්ත්‍රාත් අධිකරණ සඳහා නියමිත හා එම අධිකරණ විසින් පිළිපදිනු ලබන රීති, විධි සහ කාර්ය පටිපාටි අනුව පැවැත්විය යුතුය. තවද මේ ආඥාපනතේ විධිවිධාන වලට යටත්ව, මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු තීන්දුවකට හෝ ආඥාවකට හෝ විරුද්ධව අභියාචනා කිරීම සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් හෝ තත් කාලයේ බල පවත්නා වෙනත් යම් නීතියකින් හෝ විධිවිධාන සලස්වා තිබෙන පරිදි හැර, නාගරික මහෙස්ත්‍රාත් වරයකුගේ නඩු තීන්දුවකට හෝ ආඥාවකට හෝ විරුද්ධව කිසිදු අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි විය යුතුය. — නාගරික මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්ය පටිපාටිය.

169. මහෙස්ත්‍රාත් අධිකරණයන්හි නඩු කටයුතු සඳහා අය කළ යුතු මුද්දර ගාස්තු සම්බන්ධයෙන් තත් කාලයෙහි බල පවත්නා යම් ආඥාපනතක විධිවිධාන නාගරික මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණයෙහි පැවැත්වෙන නඩු කටයුතු සම්බන්ධයෙන් අදාල වන්නේ ය. — නාගරික මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු වලදී මුද්දර ගාස්තු.

### සභාවේ නිලධරයන් සහ සේවකයෝ

170. (1) එක් එක් මහා නගර සභාව සඳහා නාගරික කොමසාරිස්වරයකු විය යුතුය. නගරාධිපතිවරයා ළඟට නාගරික කොමසාරිස්වරයා සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, සෙසු සියලු නිලධරයන් සහ සේවකයන් ඔහු යටතේ විය යුතුය. — නාගරික කොමසාරිස්වරයා.

(2) මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ එය යටතේ හෝ තමා වෙත පවරා ඇති හෝ තමාට නියම කර ඇති හෝ තමා සතු කර ඇති හෝ තමාට පවරා දෙන ලද හෝ සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කොමසාරිස්වරයා විසින් කළ යුතු ය.

(3) මේ පනත යටතේ තමාට පවරන ලද බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී කොමසාරිස්වරයා සභාවේ විශේෂ රැස්වීමක් කැඳවීමට තරම් කාලයක් නැති ඉතාමත් හදිසි අවස්ථාවලදී ලියවිල්ලකින් ලබා ගත් නගරාධිපතිවරයාගේ අවසරය ඇතිව මිස, සභාවේ යම් යෝජනා සම්මතයකට, තීරණයකට, විධානයකට හෝ නියමයකට පටහැනි වන ආකාරයෙන් හෝ එය උල්ලංඝනය වන ආකාරයෙන් ක්‍රියා නොකළ යුතු ය.

(4) මරණය නිසා හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ධුරයෙන් පහ කරනු ලැබීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා හෝ නගරාධිපති ධුරය හා නියෝජ්‍ය නගරාධිපති ධුරය යන ධුර දෙකම හිස් වූවහොත් එවිට නියෝජ්‍ය නගරාධිපති ධුරය හිස් වීමත් නව නගරාධිපතිවරයකු තෝරා පත් කර ගැනීමත් අතර කාල සීමාව — [1977 අංක 24 § 104.]

තුළ, මේ ආඥාපනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් නගරාධිපතිවරයා වෙත පවරා ඇති හෝ පිරිනමා ඇති හෝ නියම වී ඇති සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කටයුතු සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කොමසාරිස්වරයා විසින් කළ හැකි ය.

කොමසාරිස්වරයාගේ බලතල පවරා දීම.

**171.** (1) මෙම ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් කොමසාරිස්වරයා වශයෙන් තමා වෙත පවරා ඇති හෝ නියම කර ඇති හෝ තමා සතු කර ඇති හෝ තමාට පවරා දෙන ලද හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් කොමසාරිස්වරයා විසින් සභාවේ කැමැත්ත ඇති ව, ලියවිල්ලකින් වූ විශේෂ නියමයකින් සභාවේ යම් නිලධරයකුට පවරා දිය හැකි ය.

(2) කොමසාරිස්වරයාගේ නියමයකින් සභාවේ නිලධරයකු වෙත පවරා දෙන යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් එකී නිලධරයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම එම නියමයෙහි නිශ්චය වශයෙන් සඳහන් විය හැකි කොන්දේසිවලට හා සීමා කිරීම්වලට යටත් ව කළ යුතු අතර එහි සඳහන් වන කාර්යයට හෝ කාර්යයන්ට සීමා විය යුතු ය. තව ද ඒ පවරා දීම ඒ කොමසාරිස්වරයාගේ නියමයකින් යම් විටක වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

පොත්පත් ආදියෙහි භාරය කොමසාරිස්වරයා දැරිය යුතු බව.

**172.** සභාවේ සියලු ම පොත්වල, ඔප්පුවල, ගිවිසුම්වල, ගිණුම්වල, වවුචර්වල සහ ලේඛනවල සහ ලියවිලිවල භාරය සම්බන්ධයෙන් සභාවේ කොමසාරිස්වරයා වගකිව යුතු අතර යම් සභිකයකුට මහා නගර කාර්යාලයේ දී ඒවා පරීක්ෂා කිරීමට හෝ කියවා බැලීමට හෝ ඔහු විසින් ඉඩ දිය යුතු ය.

බලතල සීමා කිරීම.

**173.** සභාවේ යෝජනා සම්බන්ධයෙන් සභාවේ යම් නිලධරයකුට පවරාදෙන ලද යම් බලයක්, කාර්යයක්, හෝ කර්තව්‍යයක් එම නිලධරයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම එම යෝජනා සම්මතයෙහි නිශ්චය වශයෙන් සඳහන් විය හැකි කොන්දේසිවලට හා සීමාකිරීම්වලට යටත් ව කළ යුතු අතර, එහි සඳහන් වන කාර්යයට හෝ කාර්යවලට සීමා විය යුතු ය. තව ද ඒ පවරා දීම සභාවේ යෝජනා සම්මතයකින් යම් විටක වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

පූර්ණ කොමසාරිස්වරයා.

**174.** (1) මහා නගර සභාවක් විසින් යම් වේලාවක දී යෝජනා සම්මතයක් මගින් සභාවේ පූර්ණ කොමසාරිස් ධූරය ඇති කළ හැකි ය.

(2) පුණ්‍ය කොමසාරිස්වරයාගේ කාර්ය, සභාව විසින් නිශ්චය කළ හැකි අතර, ඊට වෙනත් කාර්යවලට අමතරව, පහත සඳහන් කාර්ය ඇතුළත් විය හැකි ය :—

(අ) තත් කාලයේ පවත්නා පුණ්‍ය සමිතිවල සහ ආයතනවල උත්සාහය අපතේ යෑම වැළැක්වීමේ සහ ඒ සමිතිවල සහ ආයතනවල කටයුතු ව්‍යාප්ත කිරීමේ කාර්යය සඳහා සහ සාමාන්‍යයෙන් වෙනත් අවශ්‍ය කාර්ය සඳහා ඒ සමිතිවලට සහ ආයතනවලට සහාය වීම සහ උපදෙස් දීම ;

(ආ) එකී සමිති සහ ආයතන කිසිවකට සභාවෙන් දෙන ලද ආධාර මුදල් වියදම් කල ආකාරය පිළිබඳව සභාවට වාර්තා ඉදිරිපත් කිරීම ;

(ඇ) දුප්පත්කම, ව්‍යසන හා රක්ෂා වියුක්තිය පිළිබඳ ක්‍රමානුකූල අධ්‍යයන කිරීම සහ ඒ තත්ත්වය වළක්වාගත හැකි මාර්ග පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීම ;

(ඈ) සහන සඳහා වූ ඉල්ලීම් සලකා බැලීම සහ ඉල්ලුම්කරුවන් වඩාත් නිසි සමිතිය හෝ ආයතනය වෙත යොමු කිරීම ; සහ

(ඉ) සහන සඳහා ඉල්ලුම් කරන්නන් සහ රක්ෂා බලාපොරොත්තු වන තැනැත්තන් සම්බන්ධයෙන් වාර්තා හෝ නාම ලේඛන තබා ගැනීම.

175. (1) සභාවේ තනතුරු සහ ධුර අතුරින්, විධායක තනතුරු ලෙස සළකනු ලැබිය යුතු ඒවා මහා නගර සභාවක් විසින් යෝජනා සම්මතයක් මගින් ප්‍රකාශ කළ හැකි ය. තත් කාලයෙහි සභාවේ එම ධුර දරන තැනැත්තන් ද පුණ්‍ය කොමසාරිස්වරයකු සිටී නම් ඔහු ද නාගරික කොමසාරිස්වරයා ද සභාවේ විධායක නිලධරයන් ලෙස සැලකිය යුතු ය. විධායක තනතුරු සහ විධායක නිළධරයෝ.

(2) මේ ආඥාපනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ තමන් වෙත පවරා ඇති හෝ තමන්ට නියම කර ඇති හෝ තමන් සතු කර ඇති හෝ තමන්ට පවරා දෙන ලද හෝ බලතල, කාර්ය සහ කර්තව්‍ය සියල්ල ම ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සභාවේ විධායක නිලධරයන් විසින් කළ යුතු ය.

විධායක නිළධර යන් වශයෙන් නියුක්ත කරනු ලැබූ රජයේ සේව කයෝ.

**176.** සභාවේ සේවයෙහි තාවකාලිකව යොදා ගැනීමට රජය විසින් දෙන ලද නිලධරයකු වූ, සභාවක යම් නිලධරයකුගේ වැටුප, දීමනා සහ සේවා කොන්දේසි සභාව විමසීමෙන් පසුව, අමාත්‍ය වරයා විසින් නිශ්චය කළ යුතු අතර, එසේ නිශ්චය කරනු ලබන වැටුප සහ දීමනා සභාව විසින් එම නිලධරයාට ගෙවිය යුතු ය. තව ද, එම නිලධරයා සභාවේ සේවයේ නියුක්ත කරනු නොලැබ සිටියේ නම් ඔහුට අයත් විය යුතු ව තිබුණු විශ්‍රාම වැටුප්, නිවාඩු, පඩි සහ වරප්‍රසාද වෙනුවෙන් ගෙවන ලෙස රජය විසින් නියම කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණය ද සභාව විසින් රජයට ගෙවිය යුතු ය.

පත්වීම සහ උසස් වීම දීමට කොම සාරිස්වරයාට ඇති බලය.

**177.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, සභාව විසින් කොමසාරිස්වරයාට බලය දෙනු ලැබුවහොත්, එසේ බලය පැවරෙන සභාවේ යෝජනා සම්මතයේ නිශ්චිතව සඳහන් වන ගණනක් නොඉක්මවන මූලික වැටුපක් සහිත සභාවේ සේවයේ (පළාත් පාලන සේවයේ* තනතුරක් නොවන) යම් තනතුරකට හෝ ධුරයකට කලින් කල යම් තැනැත්තකු පත් කිරීම හෝ උසස් කිරීම කොමසාරිස්වරයා විසින් කළ හැකි ය.

වැඩ බැලීමේ පත්වීම්.

**178.** සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙනුවට, ඒ නිලධරයා හෝ සේවකයා නොපැමිණ සිටින කාලසීමාවක් හෝ ඔහුගේ යම් තාවකාලික අබලතාවක් පවතින කාලසීමාවක් තුළ හෝ යම් පුරප්පාඩුවක් පවතින කාලසීමාවක් තුළ වැඩ බැලීම සඳහා පත් කරනු ලබන සෑම තැනැත්තකු ම, ඒ නිලධරයා හෝ සේවකයා වෙත පවරා ඇති හෝ ඔහුට නියම ව ඇති හෝ ඔහු සතු කර ඇති හෝ ඔහුට පවරා දෙන ලද හෝ බලතල, කාර්ය සහ කර්තව්‍ය සියල්ල ම කළ යුතු සහ ඉටු කළ යුතු අතර එකී නිලධරයා හෝ සේවකයා යටත් වන වගකීම්වලට සීමා කිරීම්වලට සහ සේවා කොන්දේසිවලට ම යටත් විය යුතු ය. එම වැඩ බැලීමේ පත්වීම් මේ ආඥාපනතින් පැවරී ඇති බලතල අනුව කර ඇති අවස්ථාවක දී, සභාව විසින් නිශ්චය කරනු ලබන වැටුප් සහ දීමනා එම තැනැත්තාට ලැබිය යුතු ය.

සභාවේ සේවයේ යම් ධුරයකට හෝ තනතුරකට පත්වීමට ඇති නුසුදුසුකම්.

**179**. සභාවේ සේවයේ යම් ධුරයකට හෝ තනතුරකට—

(අ) මහා නගර සභාවක් සමග ඇති කර ගත් යම් ගිවිසුමක හෝ එම සභාව සඳහා ඉටු කළ යම් වැඩක යම් ස්වාර්ථයක් හෝ සම්බන්ධතාවක් කෙළින් ම හෝ අන් අයුරකින් ඇත්තා වූ හෝ එකී යම් ස්වාර්ථයක් හෝ සම්බන්ධතාවයක් ඇති බද්ධ ව්‍යාපාර වස්තු සමාගමක කොටස් කරුවකු, අධ්‍යක්ෂ වරයෙකු, ලේකම් වරයකු, කළමණාකරුවකු හෝ වෙනත් නිලධරයකු වන්නා වූ කිසි ම තැනැත්තකු ; හෝ

* පළාත් පාලන සේවා (ජාතික රාජ්‍ය සභාවේ) පනතද බලන්න

(ආ) එකී යම් ස්වාර්ථයක් හෝ සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු වෙනුවෙන් යම් කාරණයක් සම්බන්ධයෙන් වෘත්තීය වශයෙන් ක්‍රියා කරන කිසි ම තැනැත්තකු

පත් කරනු නොලැබිය යුතු ය.

නිලධරයන්ට සහ සේවකයන්ට සභාවේ ගිවිසුම්වල සම්බන්ධතාවක් නොතිබිය යුතුබව.

**180.** මහා නගර සභාවක් සමඟ ඇති කරගත් ගිවිසුමක හෝ ඒ සභාව සඳහා ඉටු කළ යම් වැඩක කෙළින් ම හෝ අන් අයුරකින් යම් ස්වාර්ථයක් හෝ සම්බන්ධතාවක් ඇති එම සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු ස්වකීය ධුරයෙන් හෝ සේවා නියුක්තියෙන් පහ කරනු ලැබීමට යටත් විය යුතු ය; තව ද ඔහුගේ ස්වාර්ථය හෝ සම්බන්ධතාව බද්ධ ව්‍යාපාර වස්තු සමාගමක කොටස්කරුවකු වශයෙන් හැර වෙනත් අයුරකින් ඇති ස්වාර්ථයක් හෝ සම්බන්ධතාවක් වුවහොත් ඔහු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. [1986 අංක 39§46]

නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවය අත්හිටුවීම, ඔවුන්ට දඬුවම් දීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම.

**181.** දෙපාර්තමේන්තු රීති හෝ විනය කඩ කිරීම, නොසැලකිලිමත් භාවය, අකාර්යක්ෂමතාව, සේවය අතපසු කිරීම හෝ වෙනත් විෂමාචාරයක් හේතු කොට ගෙන, (පළාත් පාලන සේවයේ සාමාජිකයකු නොවන) මහා නගර සභාවක යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ සේවය අත්හිටුවීම හෝ ඔහු සේවයෙන් පහ කිරීම හෝ ඔහුට දඩ ගැසීම හෝ ඔහු තත්ත්වයෙන් පහත හෙළීම හෝ යම් නිශ්චිත කාලසීමාවකට ඔහුගේ යම් වැටුප් වැඩිවීමක් අත්හිටුවීම—

(අ) එම නිලධරයා හෝ සේවකයා මාසයකට රුපියල් සියයකට වැඩි වැටුපක් ලබන්නේ නම් සභාව විසින් ද,

(ආ) එම නිලධරයා හෝ සේවකයා මාසයකට රුපියල් සියයකට නොවැඩි වැටුපක් ලබන්නේ නම් නගරාධිපතිවරයා විසින් ද

කළ හැකිය.

නොපැමිණ සිටීමේ නිවාඩු.

**182.** (1) (පළාත් පාලන සේවයේ සාමාජිකයකු නොවන) මහා නගර සභාවක යම් නිලධරයකුට හෝ සේවකයකුට, සේවයට නොපැමිණ සිටීම සඳහා නිවාඩු දීම මේ ආඥාපනතේ 272 වන වගන්තිය යටතේ ඒ කාර්ය සඳහා සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුකූල ව, මෙම වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, කළ හැකි ය.

(2) මහා නගර සභාවක නිලධරයකු හෝ සේවකයකු සභාවේ සේවයෙහි තාවකාලික ව යොදා ගැනීමට රජය විසින් දෙන ලද නිලධරයකු හෝ සේවකයකු වන අවස්ථාවක, සභාව විමසා, අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, ආණ්ඩුවේ මුදල් රෙගුලාසි යටතේ එම නිලධරයාට හෝ සේවකයාට නොපැමිණ සිටීමේ නිවාඩු දෙන කොන්දේසි හා නියමයන් යටතේ ම, එම නිලධරයාට හෝ සේවකයාට නොපැමිණ සිටීමේ නිවාඩු දිය හැකි ය.

අර්ථසාධක අරමුදල.

**183.** (1) පළාත් පාලන සේවයේ සාමාජිකයන් නොවන සභාවේ සේවකයන් කිසිවකුගේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අර මුදලක් පිහිටුවීම හා පවත්වාගෙන යෑම ද එම අරමුදලට මහා නගර සභා අරමුදලින් දායක මුදල් ගෙවීම ද ඒ අර්ථසාධක අරමුදලේ කළමනාකරණය සහ එහි ආයෝජනය විධිමත් කිරීම ද එකී සේවකයන් විසින් ඊට ගෙවිය යුතු දායක මුදල් හා එකී සේවකයන්ට ඉන් ගෙවිය යුතු මුදල් නියම කිරීම ද ඒ වෙනුවෙන් අවශ්‍ය විය හැකි සියලු අතුරු ව්‍යවස්ථා සෑදීම ද මහා නගර සභාවක් විසින් කරනු ලැබිය හැකි ය.

(2) සභාවේ නිලධරයන්ට හෝ සේවකයන්ට හෝ එකී යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ වැන්දඹුවන්ට, දරුවන්ට, ළඟ ම ඥාතියාට හා යැපෙන්නන්ට විශ්‍රාම වැටුප්, පාරිතෝෂික හෝ විශ්‍රාම දීමනා ප්‍රදානය කිරීමට හෝ ඒ සඳහා රීති සෑදීමට මහා නගර සභාවකට මේ වගන්තියෙන් බලය නොලැබුණ ද, ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ ඉහත කී කාරණා සම්බන්ධයෙන් සභාව විසින් සාදනු ලැබ ඇති රීති කිසිවක් පළාත් පාලන සේවා ආඥාපනතේ *57 වන සහ 58 වන වගන්ති අදාළ කිරීමේ කාර්යයන් සඳහා තව දුරටත් බල පැවැත්විය යුතු ය; එම රීති ඉන් බාහිර වෙනත් කාර්යයන් සඳහා බල නොපැවැත්විය යුතු ය.

විශ්‍රාම වැටුප් වාර්ෂිකය, පාරිතෝෂිකය හෝ විශ්‍රාම දීමනාව කරුණාසහගතව ගෙවීම.
[1957 අංක 15§3]
[1958 අංක 39 § 2]

**184.** (1) රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව මහා නගර සභාවක් විසින් මහා නගර සභා අරමුදලින්—

(අ) ඒ සභාවේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් සේව යෙන් විශ්‍රාම ගන්නා හෝ විශ්‍රාම ගෙන සිටින යම් තනැත්තකුට ; සහ

(ආ) ශ්‍රී ලංකාවේ නතරව සිටීමට ආගාමික හා විගාමික පනත යටතේ අවසර දෙන ලද කාල පරිච්ඡේදය අවසන් වීම නිසා ශ්‍රී ලංකාවේ තව දුරටත් නතර වී සිටීමට නොහැකි වීමේ හේතුවෙන් සභාවේ නිලධරයකුව හෝ සේවකයකුව සිටීම අවසන් වන හෝ අවසන් වී ඇති, ශ්‍රී ලංකාවේ පුර වැසියකු නොවන යම් තැනැත්තකුට,

* 1974 අංක 16 දරණ (ජාතික රාජ්‍ය සභාවේ) පනත මගින් ඉවත් කරන ලද 1969 අංක 18 දරන පනත මගින් ඉවත් කරන ලදී.

එම සභාවේ අතුරු ව්‍යවස්ථා හෝ රීති කිසිවක් යටතේ හෝ පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන යම් විශ්‍රාම වැටුප් ක්‍රමයක් යටතේ හෝ කිසිදු විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම දීමනාවක් හෝ යම් ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම දීමනාවක් ගෙවිය යුතුව නැත්තා වූ එම සේවයේ සහ ඒ තැනැත්තා සභාවේ නිලධරයකු හෝ සේවකයකු වීමට පෙර සභාව විසින් පවරා ගන්නා ලද යම් වෙළෙඳ ව්‍යාපාරයක හෝ ව්‍යාපාරයක සේවයේ යම් කාල පරිච්ඡේදයක් වෙනුවෙන්, විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

මෙම උපවගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කරනු ලබන එකී යම් නිලධරයකුට හෝ සේවකයකුට, ඔහුට එම විශ්‍රාම වැටුප ප්‍රදානය කිරීමෙන් මාස තුනක් ඇතුළත දී තීරණය කළ යුතු ඔහුගේ මනාපය අනුව, එම විශ්‍රාම වැටුප වෙනුවට, එම විශ්‍රාම වැටුපෙන් හතරෙන් තුන් පංගුවක් බැගින් වූ විශ්‍රාම වැටුපක්, එකී විශ්‍රාම වැටුපෙන් එසේ අඩු කළ මුදලේ වාර්ෂික වටිනාකම මෙන් දස ගුණයකට සමාන පාරිතෝෂිකයක් ද සමග ගෙවනු ලැබිය හැකි ය. [1957 අංක 15 § 3.]

(1අ) ඒ සභාවේ යම් නැසීගිය නිලධරයකුගේ හෝ සේවකයකුගේ හෝ වැන්දඹුවට, දරුවන්ට, ළඟ ම ඥතියාට හෝ යැපෙන්නන්ට එම සභාවේ අතුරු ව්‍යවස්ථා හෝ රීති කිසිවක් යටතේ හෝ පළාත් පාලන ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් යෝජනා ක්‍රමයක් හෝ අරමුදලක් යටතේ කිසිදු විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක් හෝ පාරිතෝෂිකයක් හෝ යම් ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක් හෝ පාරිතෝෂිකයක් හෝ ගෙවිය යුතුව නැත්තා වූ අවස්ථාවක දී, රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව, මහා නගර සභා අරමුදලින් එකී වැන්දඹුවට, දරුවන්ට, ළඟ ම ඥතියාට හෝ යැපෙන්නන්ට විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක් හෝ පාරිතෝෂිකයක් සභාව විසින් ප්‍රදානය කළ හැකි ය. [1957 ,

(2) (1) වන උපවගන්තියෙහි හෝ (1අ) වන උපවගන්තියෙහි වූ කිසිවකින් කිසිම තැනැත්තකුට මේ උපවගන්ති දෙකෙන් එකකුදු යටතේ වූ යම් විශ්‍රාම වැටුපකට, වාර්ෂිකයකට, පාරිතෝෂිකයකට හෝ විශ්‍රාම දීමනාවකට අයිතිවාසිකමක් පිරිනැමෙතැයි නොසැලකිය යුතු ය ; නැතහොත් එසේ වෙතැයි තේරුම් නොගත යුතු ය. 1957 අංක 15 § 3.]

පාරිතෝෂික ක්‍රම ඇති කිරීම එ ඇති බලය.
[1957 අංක 15 § 4.]

184අ. (1) මහා නගර සභාවක තාවකාලික නිලධරයන්ගේ සහ සේවකයන්ගේ එම සභාවේ සේවය නතර කරනු ලැබූ විට ඔවුන්ට පාරිතෝෂික ගෙවීම සඳහා වූ ක්‍රමයක් ඇති කිරීම පිණිස විධිවිධාන සලස්වමින්, රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව දෙනු ලබන අමාත්‍යවරයාගේ අනුමතය ඇති ව අතුරු ව්‍යවස්ථා සෑදීම ද එම අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එම ක්‍රමය ඇති කිරීම ද සභාවක් විසින් කරනු ලැබිය හැකි ය.

(2) මහා නගර සභාවක් විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති, එම රීති ක්‍රියාත්මක වීමට පෙර සේවය නතර කරනු ලැබූ එම සභාවේ තාවකාලික නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ වන ආකාරයට සාදනු ලැබිය හැකි ය.

විශ්‍රාම වැටුප් පරිවර්තනයට මනාපය පළ කර ඇති පළාත් පාලන සේවයේ සාමාජික යන්ට සහ වෙනත් තැනැත්තන්ට සම්පූර්ණ විශ්‍රාම වැටුප් දීමේ බලය.
[1975 අංක 5 § 2.]
[1979 අංක 18 § 2.]

184ආ. මහා නගර සභාවක් විසින් සේවයේ නියුක්ත කර ගනු ලැබූ පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ එම සේවයේ සාමාජිකයකු නොවන වෙනත් යම් තැනැත්තකු එම සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ විශ්‍රාම ගෙන ඇත්තා වූ සහ තම විශ්‍රාම වැටුප් පරිවර්තනය කරනු ලැබීමට මනාපය පළ කරන හෝ පළ කර ඇත්තා වූ විටක, ඔහු විශ්‍රාම ගත් දිනයේ සිට අවුරුදු දහයක කාල සීමාවක් ඉකුත් වූ දිනය හෝ 1977 පෙබරවාරි මස 1 වන දිනය යන මින් පසුව යෙදෙන දිනයේ සිට, ඒ මනාපය ඔහු විසින් පළ නොකරනු ලැබිණි නම් ඔහුට ගෙවිය හැකිව තිබුණු පූර්ණ විශ්‍රාම වැටුප එම සභාව විසින් ඔහුට ගෙවනු ලැබිය හැකි ය:

[1979 අංක 18 § 2.]

එසේ වුව ද, දස අවුරුදු කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එන දිනය මාසයක පළමුවන දිනයෙන් පසු දිනයක් වූ අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප ආරම්භ වීමේ දිනය ඊළඟ මාසයේ පළමුවන දිනය වන්නේ ය.

මේ වගන්තියෙහි "පළාත් පාලන සේවයේ සාමාජිකයා" යන්නෙන්—

(අ) (264 වන අධිකාරය වූ) පළාත් පාලන සේවා ආඥා පනතින්* ; හෝ

(ආ) 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනතින්† ; හෝ

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතින්

පිහිටුවන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයෙක් අදහස් වේ.

* 1969 අංක 18 දරන පනත මගින් ඉවත් කරන ලදී.
† 1974 අංක 16 දරන (ජාතික රාජ්‍ය සභාවේ) පනත මගින් ඉවත් කරන ලදී.

## IX වන කොටස

### මහා නගර සභා අරමුදල

**185.** (1) සෑම මහ නගර සභාවක්ම ස්වකීය සාමාන්‍ය මුදල් කටයුතු සඳහා මහා නගර සභා අරමුදලක් පිහිටුවිය යුතුය.

මහා නගර සභා අරමුදල සහ එහි සංයුතිය.

(2) මහා නගර සභා අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතුය :—

(අ) මේ ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාර සභාව විසින් අය කර ගනු ලබන සියලු වරිපනම්, බදු, තීරු බදු, ගාස්තු හා වෙනත් අයකිරීම් ;

(ආ) මේ ආඥාපනතේ බලය යටතේ හෝ 163 වන වගන්තියේ ඇති චක්‍රගත ප්‍රකාශයේ සඳහන් ප්‍රඥප්ති කිසිවක් යටතේ හෝ ජනාධිපතිවරයා විසින් නාගරික මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ බලය ව්‍යාප්ත කරනු ලැබ ඇත්තේ යම් වැරදිවලට ද එකින් යම් වරදක් සම්බන්ධයෙන් හෝ අය කළ සියලු දඩ මුදල් සහ අය කර ගත් සියලු දණ්ඩන මුදල් ;

(ඇ) දෙවන උපලේඛනයෙහි දක්වා ඇති සියලු මුද්දර ගාස්තු වල හා ගාස්තුවල මුදල් ;

(ඇ) සභාව විසින් කරන ලද විකිණීම්, බදුදීම් හෝ වෙනත් ගනු දෙනු වලින් ලැබුණු සියලු මුදල් ;

(ඉ) සභාව වෙත සතු කරන ලද යම් දේපළකින් හෝ යම් මහජන සේවයක් සිටීමෙන් හෝ ලැබෙන සියලු ආදායම් ;

(ඊ) පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයකින් හෝ වෙනත් ආකාරයකින් හෝ සභාවට කලින් කල විසර්ජනය කරනු ලබන හෝ පවරා දෙනු ලබන සියළු මුදල් හා සියළු ආදායම් ද්‍රහව ;

(උ) අමාත්‍යවරයා විසින් කරනු ලබන යම් විශේෂ විසර්ජනයකට යටත්ව අමාත්‍යවරයා විසින් සභාවට වෙන් කර දෙනු ලබන සියලු දීමනා ;

(ඌ) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේදී හා කාර්ය ඉටු කිරීමේ දී වෙනත් ආකාරවලින් සභාවට උපචිත වන සියලු මුදල්.

**186.** මහා නගර සභාවකට ලැබී මහා නගර සභා අරමුදලට ගෙවිය යුතුව ඇත්තාවූ සියලු ම මුදල් අනුමත කළ බැංකුවක තැන්පත් කළ යුතු අතර, එම මුදල් "මහා නගර සභා අරමුදල" යන නමින් හඳුන්වනු ලබන ගිණුමකට බැර කළ යුතුය.

සභාවට ලැබෙන මුදල් බැංකුවෙහි තැන්පත් කළ යුතු බව.

මේ වගන්තියේ "අනුමත කළ බැංකුව" යන්නෙන්, යම් මහ නගර සභාවක, නගර සභාවක හෝ සුළු නගර සභාවක මුදල් තැන් පත් කරනු ලැබිය හැකි බැංකුවක් වශයෙන්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින්, අමාත්‍යවරයා විසින් නිශ්චය කර ඇත් වන ලද බැංකුවක් අදහස් වේ.

මහා නගර සභා අරමුදලේ යම් කොටසක් ආයෝජනය කිරීමට ඇති බලය.

187. මහා නගර සභාවක් විසින් මහා නගර සභා අරමුදලේ යම් කොටසක් පහත සඳහන් සුරැකුම් පත් අතුරින් යම් එකක හෝ ඊට වැඩි ගණනක ආයෝජනය කළ හැකි අතර ඉන් බාහිර වෙනත් සුරැකුම් පත්වල එය ආයෝජනය නොකළ යුතුය:—

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ ස්කන්ධ හෝ වෙනත් සුරැකුම්පත් ;

(ආ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් නිකුත් කරන ලද ණයකර ;

(ඇ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සහතික කරන ලද වෙනත් යම් සුරැකුම් පත්.

මහා නගර සභා අරමුදල ප්‍රයෝජනයට ගැනීම.

188. (1) එක් එක් මහා නගර සභාව විසින් පිහිටුවන ලද මහා නගර සභා අරමුදලින් පහත දැක්වෙන ගෙවීම් කළ යුතුය:—

(අ) කම්කරු වන්දි ආඥාපනත යටතේ වූ යම් බැඳීමක් සම්බන්ධයෙන් සභාව විසින් ගෙවිය යුතු වන සියලු මුදල් ;

(ආ) සභාවට අයිති හෝ සභාව වෙත සතු කරනු ලැබූ හෝ යම් දේපළක් රක්ෂණය කිරීම සඳහා වූ හෝ කම්කරු වන්දි ආඥාපනත යටතේ සභාවට ඇරීමට සිදු වන යම් බැඳීමකට සම්බන්ධව රක්ෂණය සඳහා වූ වාරික වශයෙන් සභාව විසින් ගෙවිය යුතු වන සියලු මුදල් ;

(ඇ) ආපසු ගෙවීමට මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ මේ ආඥාපනත හෝ ඒ වෙනත් ලිඛිත නීතියක් යටතේ සභාවට බලය දී ඇති හෝ නියම වී ඇති සියලු මුදල් ;

(ඇ) වීථි, පාලම්, දිය මංකඩවල් ආදිය තැනීම, නඩත්තු කිරීම, දීර්ඝ කිරීම සහ වෙනස් කිරීම ; මෙකී යම් කාර්යයක් සඳහා අවශ්‍ය ඉඩම් අත්කර ගැනීම, පොදු වීථිවලට, ස්ථානවලට සහ ගොඩනැගිලිවලට ආලෝකය සැපයීම ; වාහන ගමනා ගමනය විධිමත් කිරීම, පොදු වීථිවල සහ ස්ථානවල බාධක වැළැක්වීම සහ ඉවත් කිරීම ; වීථි නම් කිරීම, ගෙවල් වලට අංක යෙදීම, වීථිවල ගස් සිටුවීම සහ බස් මගීන්ගේ ප්‍රයෝජනය සඳහා වීථිවල මගී ආවරණ තැනීම හා නඩත්තු

කිරීම; ගොඩනැගිලි ඉදි කිරීම විධිමත් කිරීම, අනිසි තෙරුම් ඉවත් කිරීම සහ අන්තරායදායක ස්ථාන, ගොඩනැගිලි, කර්මාන්ත හා ක්‍රියා පාලනය කිරීම, අධීක්ෂණය කිරීම හා ඉවත් කිරීම සම්බන්ධයෙන් සභාව විසින් දරන ලද සියලු වියදම්;

(ඉ) වෙළෙඳ පොළවල්, නාන සහ රෙදි සෝදන ස්ථාන, නිරෝධායන සහ විෂ බීජ නාශක ස්ථාන, වෙන් කර තැබීමේ කඳවුරු, ආරෝග්‍ය ශාලා, ගවහල් සහ ගෝඝාතක ස්ථාන, වැසිකිළි, කැසිකිළි, මුත්‍රා ස්ථාන, කාණු සහ කසළ කාණු, ජලාපවහන කර්මාන්ත සහ ඊට සම්බන්ධ වෙනත් වැඩ, ට්‍රෑම් රථ මාර්ග ඇතුළුව කවර හෝ ආකාරයක මහජන ගමනාගමන සේවයක්; ජල කර්මාන්ත, බොන දිය උල්පත්. වැ.වි. ලිං, පිට්ටනි සහ උද්‍යාන තැනීම, නඩත්තු කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන්; සෞඛ්‍යයට අහිතකර ප්‍රදේශ සංස්කරණය කිරීම සහ එවැනි ස්ථානයක වෙනත් සෞඛ්‍යාරක්ෂක පියවරවල් ගැනීම සම්බන්ධයෙන් සහ ඉහත සඳහන් යම් කාර්යයන් කිසිවක් සඳහා අවශ්‍ය ඉඩම් අත් කර ගැනීම සම්බන්ධයෙන් සභාව විසින් දරන ලද සියලු වියදම්;

(ඉඉ) සභාවේ යම් රැස්වීමකට හෝ සභාවේ යම් කමිටුවකට සහභාගි වන්නාවූ සභාවේ සභිකයන්ට, නිලධරයන්ට හා සේවකයන්ට සංග්‍රහ කිරීමේ වියදම් ගෙවීම සඳහා සභාව විසින් සම්මත කරනු ලබන සියලු මුදල්; 1957 අංක 15 § 3]

(ඊ) සාමාන්‍යයෙන් නිවාස යෝජනා ක්‍රම ආරම්භ කිරීම හා පවත්වාගෙන යැමද විශේෂයෙන් කම්කරු පන්තිවල ප්‍රයෝජනය සඳහා වාසස්ථාන සහ ඒ වාසස්ථානවල වාසය කරන්නන්ගේ ප්‍රයෝජනය හෝ සැප පහසුව පිණිස යම් ගොඩනැගිල්ලක් අත් කර ගැනීම, තැනීම, නඩත්තු කිරීම, විශාල කිරීම, වැඩි දියුණු කිරීම, වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම, මෙහෙයවීම, තැනීම, කළමනාකරණය කිරීම හා කුලියට දීම සහ එයින් යම් ව්‍යාපාරයක් පහසුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෙ සුදුසු යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම සහ එකී යම් කාර්යයක් සඳහා ඉඩම් හෝ ගොඩනැගිලි අත් කර ගැනීම සම්බන්ධයෙන් සභාව විසින් දරන ලද සියලු වියදම්;

(උ) වීථි සහ කාණු පිරිසිදු කිරීම සහ ඒවාට දිය ගෙදීම; කසළ ඉවත් කිරීම; වසුරු සහ අනවශ්‍ය හෝ අහිතකර වෘක්ෂලතා ඉවත් කිරීම සහ සාමාන්‍යයෙන් සියලු කරදර නතර කිරීම සම්බන්ධයෙන් සභාව විසින් දරන ලද සියලු වියදම්;

(ඌ) පාසැල් පවත්වා ගෙන යැම සඳහා සභාව විසින් ගෙවිය යුතු සියලු මුදල්;

(එ) නාගරික සේවා ඇති කිරීම සහ පවත්වා ගෙන යෑම, මේ පනතේ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු ගොඩනැගිලි ඉදි කිරීම, මිලදී ගැනීම සහ නඩත්තු කිරීම, ගෙවල් සහ ඉඩම් මැනීම සහ මහජන ආරක්ෂාව, සෞඛ්‍යය හෝ සැප පහසුව සඳහා අවශ්‍ය හෝ ඉවහල් වන වෙනත් සියලු වැඩ, දේ සහ සේවා සම්බන්ධයෙන් සභාව විසින් දරන ලද සියලු වියදම් ;

[1987 අංක 19 § 3 අ]

(ඒ) මාතෘ සහ ආරක්ෂාභිවෘද්ධි සේවා ඇති කිරීම සහ පවත්වා ගෙන යාම, සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම, මූලික සෞඛ්‍ය ආරක්ෂක මධ්‍යස්ථාන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති පවත්වාගෙන යාම, සභාව විසින් පිහිටුවන ලද යම් මාතෘ සේවයක කාර්ය සඳහා වින්නඹු මාතාවන් පුහුණු කිරීම, සහ වැස්සෙන්, ජල ගැලීම්වලින්, ගින්නෙන්, භූමිකම්පා වලින්, සුළි සුළඟින්, සාගතවලින් හෝ වසංගත වලින් ඇති වූ ආපදාවන්ට සහන සැලසීම සඳහා වූ පුණ්‍යාධාර හෝ වියවර විෂයෙහිලා සභාව විසින් දරන ලද සියලු වියදම් ;

[1987 අංක 19 § 3 ආ[

(ඒඒ) ආගමික චාරිත්‍රවිධි සහ උත්සව සංවිධානය කිරීම, දහම් පාසල් සහ ශාසන ආරක්ෂක මණ්ඩල පවත්වාගෙන යාම, සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, සාහිත්‍ය සහ සංස්කෘතික උත්සව සංවිධානය කිරීම, සාහිත්‍ය සහ සංස්කෘතික වටිනාකමින් යුත් පොත් ප්‍රකාශනය කිරීම සහ කලාකරුවන්ට, ග්‍රන්ථ කර්තෘවරුන්ට සහ ශිල්පීන්ට ත්‍යාග ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වියදම් සඳහා වූ ආධාර මුදල් ඇතුළු ව ආගම සහ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා සභාව විසින් සම්මත කරන ලද සියලු ආධාර මුදල් ;

[1987 අංක 19 § 3 ඇ]

(ඔ) මහා නගරය තුළ ක්‍රීඩා හෝ විනෝද කටයුතුවල කාර්ය සඳහා හෝ මහා නගරය තුළ පිහිටුවන ලද යම් නීති පුස්තකාලයකට ආධාර සඳහා හෝ දිළින්දන්ට සහනය සඳහා අනාථ තැනැත්තන් හෝ ශාරීරික, මානසික හෝ සාමාජීක වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ රැකවරණය සඳහා පුණ්‍ය හෝ ශුභ සාධක සමිතියකට හෝ ආයතනයකට ආධාර සඳහා හෝ සභාවේ නිලධරයන් හෝ සේවකයන් රෝගාතුර වූ විට, ණයගැති වූ විට හෝ ආපදාවලට මුහුණ පෑ විට ඔවුන්ට සහන සැලැස්වීම සහ සහාය වීම පිණිස සංස්ථාපනය කරන ලද හෝ පිහිටුවන ලද යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් සඳහා සභාව විසින් සම්මත කරන ලද සියලු ආධාර මුදල් ;

[1986 අංක 39 § 47 අ]

(ඕ) පොදු උත්සව පැවැත්වීමේ වියදම් උදෙසා සභාව විසින් සම්මත කරනු ලබන, එක් වර්ෂයකට එකතුව රුපියල් දසදහසක් නොඉක්මවන ආධාර මුදල් සහ අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය ඇතිව සභාව විසින් වෙන යම් උත්සවයක වියදම් උදෙසා සම්මත කරනු ලබන වෙනත් ආධාර මුදල් ;

(ක) ප්‍රජා පිළිගැනීම් සම්බන්ධයෙන් හෝ පොදු වැදගත්කමකින් යුත් යම් සිද්ධියක් හෝ අවස්ථාවක් පිළිබඳ උත්සව පැවැත්වීම සම්බන්ධයෙන් නගරාධිපතිවරයාගේ අභිමතය පරිදි වියදම් කිරීම සඳහා සභාව විසින් නගරාධිපතිවරයාට වෙන් කර දෙන සියලු මුදල්;

(කක) 289 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ගෙවීම් ප්‍රමාණ අනුව නගරාධිපතිවරයාට, නියෝජ්‍ය නගරාධිපතිවරයාට සහ සභිකයන්ට ගෙවිය යුතු සියලු දීමනා; [1977 අංක 24§105]

(ග) ගිනි නිවන හමුදාවක් පවත්වාගෙන යෑමෙහි ලා හා ජීවිත හා දේපළ ගින්නෙන් ආරක්ෂා කිරීමෙහි ලා සභාව විසින් දරනු ලබන සියලු වියදම්;

(ගග) සභිකයන්ගේ නිවාසස්ථානවලට නිල දුරකථන පහසුකම් සවි කිරීම හා නඩත්තු කිරීම පිණිස සභාව විසින් දරනු ලබන සියලු වියදම්; [1986අංක39§47අ]

(ච) ඇති කිරීමට හා පවත්වාගෙන යෑමට හෝ නැවැත්වීමට මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ මේ ආඥාපනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ සභාවට බලය ලැබී ඇති යම් ආකාරයක මහජන සේවයක් ඇති කිරීමෙහි ලා හා පවත්වා ගෙන යෑමෙහි ලා සභාව විසින් දරනු ලබන සියලු වියදම්;

(ජ) මහා නගරය ඇතුළත මහජන පුස්තකාල පිහිටුවීම හා පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් සභාව විසින් දරන ලද වියදම්; [1981 අංක 61§97]

(ජජ) 154අ වන වගන්තිය යටතේ ස්ථානවල පදිංචිකරුවන් වෙත දිරිගැන්වීමේ දීමනා වශයෙන් ගෙවීම සඳහා සභාව විසින් වෙන් කරනු ලබන සියලු ම මුදල්;

(ට) ඛණිජ තෙල් ආඥාපනත යටතේ ප්‍රාදේශික බලධරයකු වශයෙන් නාගරික කොමසාරිස්වරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය ඉටු කිරීමේ දී නාගරික කොමසාරිස්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් දරන ලද සියලු වියදම්;

(ඩ) මේ ආඥාපනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් යටතේ හෝ, ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ සභාව විසින් හෝ සභාව වෙනුවෙන් නගරාධිපතිවරයා, කොමසාරිස්වරයා හෝ සභාවේ යම් නිලධරයකු විසින්, දරන ලද සියලු වියදම්; සහ [1971 අංක 48 § 8.]

(ණ) මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ හෝ අරමුදලින් ගෙවීමට නියමිත හෝ බලය ලැබී ඇති සියලු මුදල්.

(2) (1) වන උපවගන්තියේ (ඔ) ඡේදයේ විධිවිධානවලට අනුව වියදම් කිරීමට බලය නොමැති වූ ද එම ඡේදයේ විධිවිධානවලට අනුකූල ව වියදම් කරනු ලැබෙතැයි යන අදහසින් වැරදීමකින් හෝ ප්‍රමාද දෝෂයකින් කර තිබිය හැකි හෝ කරනු ලැබිය හැකි වූ ද යම් වියදමක් අමාත්‍යවරයා විසින් අනුමත කළ හැකි ය.

(3) කොළඹ මහා නගර සභාව විසින් වාර්ෂිකව මහා නගර සභා අරමුදලින් රුපියල් එක් දහස් පන් සියයක මුදලක් කොළඹ නීති පුස්තකාලයේ කම්ටුවට ගෙවිය යුතු ය.

අරමුදලින් මුදල් ගෙවීම සඳහා වූ ඇණවුම්, චෙක් පත් ආදිය.

**189.** මහා නගර සභා අරමුදලින් මුදල් ගෙවීම සඳහා වූ සියලු ඇණවුම් සහ චෙක් පත්, තත් කාර්යය සඳහා සභාව විසින් විශේෂ යෙන් බලය දෙන ලද නිලධරයන් දෙදෙනකු විසින් අත්සන් කළ යුතු අතර, එකී අරමුදල පිහිටුවා ඇත්තේ යම් බැංකුවක ද ඒ බැංකුව විසින් එකී අරමුදලෙන් එසේ අත්සන් කරන ලද ඇණවුම් හෝ චෙක් පත්වල මුදල් ගෙවිය හැකි ය.

අරමුදලේ ගිණුම සම්බන්ධ යෙන් වූ ලැබීම් සහ වියපැහැදම් ආදිය පිළිබඳ ප්‍රකාශය.

**190.** මහා නගර සභාවක සෑම සාමාන්‍ය රැස්වීමක දී ම, කලින් වූ වර්ෂයේ අවසානයේ සිට රැස්වීම පවත්වන මාසයට කලින් වූ මාසයේ අවසානය දක්වා මහා නගර සභා අරමුදල සම්බන්ධයෙන් වූ ලැබීම් සහ වියපැහැදම් පිළිබඳ ප්‍රකාශයක් නගරාධිපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කළ යුතු ය. රැස්වීමේ කටයුතු වාර්තාවක් සමග එකී ප්‍රකාශය නොපමාව ම පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කොට ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

---

## X වන කොටස

### ණය

මුදල් ණයට ගත හැකි වන්නේ කවර කාර්ය සඳහා ද යන වග.

**191.** 192 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, මහා නගර සභාවක් විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇති ව, පහත දැක් වෙන යම් කාර්යයක් සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණ කිසිවක් ණයට ගත හැකි ය :—

(අ) මේ ආඥාපනතේ හෝ ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක හෝ විධිවිධාන යටතේ ඉටු කිරීමට භාර ගන්නා ලද ස්ථිර ස්ව භාවයක වූ යම් වැඩක් කර ගෙන යෑම ;

(ආ) ඉහත කී පරිදි ඉටු කිරීමට භාර ගන්නා ලද යම් පොදු සේව යක් පිහිටුවීම, සම්පූර්ණ කිරීම, වැඩි දියුණු කිරීම හෝ වර්ධනය කිරීම ;

(ඇ) එකී යම් වැඩක හෝ පොදු සේවයක කාර්ය සඳහා හෝ ඒ හා සම්බන්ධ ව අවශ්‍ය යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත් කර ගැනීම ;

(ඈ) එකී යම් පොදු සේවයක කාර්ය සඳහා අවශ්‍ය යන්ත්‍ර, පිරියත හෝ උපකරණ :

එසේ වුව ද, ඒ සභාව විසින් ඒ දක්වා ලබා ගන්නා ලද සියලු ණය වෙනුවෙන් ගෙවීමට ඉතිරි ව ඇති මුදල, ණය ලබා ගැනීමට අදහස් කරන්නේ යම් වර්ෂයක් තුළ දී ද ඊට ඉහතින් වූ වර්ෂ තුන තුළ සභාව ලත් මුළු ආදායම නොඉක්මවන්නේ නම්, එකී යම් මුදලක් ණයට ගැනීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය අවශ්‍ය නොවන්නේ ය.

192. යම් මහා නගර සභාවක් විසින් මේ කොටසේ බලය යටතේ ලබා ගන්නා ලද සියලු ණය වෙනුවෙන් යම් අවස්ථාවක දී ගෙවීමට ඉතිරිව ඇති මුදලේ එකතුව, සියලු වරිපනම්, බදු, දේපළ සහ වෙනත් ආදායම් මාර්ගවලින් ඊට ඉහතින් වූ අවුරුදු පහ තුළ සභාව ලැබූ සාමාන්‍ය වාර්ෂික ආදායම මෙන් දස ගුණයක් හෝ අවුරුදු පහක කාලයක් නොපැවති යම් මහා නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, අමාත්‍යවරයාගේ අනුමතයට යටත් ව, සභාව විසින් තක්සේරු කරන ලද පරිදි එක් අවුරුද්දක් සඳහා සභාවේ ආදායම මෙන් දස ගුණයක් හෝ නොඉක්මවිය යුතු ය: ණය ගැනීමේ බලය සීමා කිරීම.

එසේ වුව ද, යම් මහා නගර සභාවක ණය සම්බන්ධයෙන් ඇති බැදීම් සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව සමග වන යම් විටක, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ නියමයේ සඳහන් යම් ප්‍රමාණයක් දක්වා මේ වගන්තියෙන් නියමිත සීමාව ඉක්මවීමට බලය දිය හැකි ය.

193. මුදල් ණයට ගැනීමට මේ කොටසෙන් හෝ මේ කොටස යටතේ හෝ මහා නගර සභාවකට බලය දී ඇති අවස්ථාවක, මේ කොටසේ විධිවිධානවලට යටත් ව, සභාව විසින්, ණය ලබා ගත හැකි ක්‍රම.

(අ) උකස් මගින්; හෝ

(ආ) අමාත්‍යවරයාගේ කැමැත්ත ඇති ව, මේ පනත යටතේ නිකුත් කරන ණයකර මගින්; හෝ

(ඇ) මුදල් ලබා ගන්නේ නිවාස යෝජනා ක්‍රමයක් සඳහා වන යම් විටක, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇති ව, මේ ආඥා පනත යටතේ නිකුත් කරනු ලබන නිවාස බැඳුම්කර මගින්

ඒ ණය මුදල ලබා ගත හැකි ය.

194. (1) මහා නගර සභාවක් විසින් මේ කොටස යටතේ ණයට ලබා ගන්නා සියලු මුදල් කිසිදු විශේෂයක් නොමැතිව සභාවේ සියලු වරිපනම්, බදු, දේපළ හා ආදායම් කෙරෙහි වැය බර කළ යුතු ය. ණය සඳහා ඇප සහ ඒ ඇපවල ප්‍රමුඛත්වය.

(2) මේ කොටස යටතේ සභාවක් විසින් තබන ලද සියලු ඇප මේ වගන්තියේ විධිවිධානවලට යටත් ව, කිසිදු ප්‍රමුඛත්වයක් නොමැතිව එක හා සමාන ලෙස සැලකිය යුතු ය.

(3) මේ වගන්තියේ ඇතුළත් කිසිවක්—

(අ) තාවකාලික ණයක් හෝ අයිරාවක් වශයෙන් ඇපයක් නොමැතිව මේ කොටස යටතේ ණයට ගත් යම් මුදලකට අදාළ නොවිය යුතු ය; නැතහොත්

(ආ) මේ ආඥාපනත ආරම්භ වන දිනයට පෙර පැවති ප්‍රමුඛත්ව යක් කෙරෙහි හෝ එම දිනයට පෙර ඇති කරන ලද ඇප ප්‍රමුඛත්වයක් සඳහා පැවරෙන අයිතිවාසිකමක් කෙරෙහි බල නොපෑ යුතු ය.

### ණය පිළිබඳ පොදු විධිවිධාන

ණයට ගත් මුදල් ආපසු ගෙවීමේ කාල සීමාව.

**195.** (1) මේ කොටස යටතේ මහා නගර සභාවක් විසින් ණයට ගත් සෑම මුදලක් ම, අමාත්‍යවරයාගේ අනුමතය ඇති ව සභාව විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවක් ඇතුළත ආපසු ගෙවිය යුතු ය.

(2) ආදායම් උපදවන ස්වභාවයක වූ යම් ව්‍යාපාරයක කොටසක් වන හෝ කොටසක් වීම සඳහා හෝ යම් කර්මාන්තයක් අලුතෙන් ඉදි කිරීමට හෝ පවත්නා යම් කර්මාන්තයක් පුළුල් කිරීමට නොහොත් එහි වෙනසක් කිරීමට සිදු වන වියදම් දැරීමේ කාර්යය සඳහා මහා නගර සභාවක් විසින් මේ කොටස යටතේ යම් මුදලක් ණයට ලබා ගත් අවස්ථාවක, එසේ ණයට ගත් මුදල ආපසු ගෙවීම සඳහා සභාව විසින් සැලැස්වීමට නියමිත යම් වාර්ෂික ප්‍රතිපාදන, අමාත්‍යවරයා විසින් නිශ්චය කළ හැකි (ඒ වියදම අර්ථදායි නොවී පවතින කාල සීමාව හෝ ඒ වියදම දැරීම ආරම්භ වූ මුදල් වර්ෂයට පසුව ඊළඟට යෙදෙන මුදල් වර්ෂය ආරම්භයේ සිට අවුරුදු පහක කාලසීමාව යන මෙයින් වඩා කෙටි කාලසීමාවට වැඩි නොවන) යම් කාලසීමාමවකට, ඔහු විසින් ම නිශ්චය කළ හැකි කොන්දේසිවලට යටත්ව තාවකාලික ව අත් හිටුවීම නීත්‍යනුකූල විය යුතු ය.

අමාත්‍යවරයා වෙත යවන වාර වාර්තාව.

**196.** (1) මේ කොටස යටතේ සභාව ණයට ගෙන ඇති මුදල් ආපසු ගෙවීම සඳහා සභාව සලස්වා ඇති ප්‍රතිපාදන දැක්වෙන වාර වාර්තාවක් එවන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිනු ලැබීමෙන් පසු මාසයක් ඇතුළත, මහා නගර සභාවක නගරාධිපතිවරයා විසින් එම වාර්තාව අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය.

(2) එම වාර්තාවෙහි අමාත්‍යවරයා නියම කරන විස්තර දක්වා තිබිය යුතු ය. එය අමාත්‍යවරයා නියම කරන දිනයක් දක්වා වූ වාර්තාවක් විය යුතු ය. එසේ ම අමාත්‍යවරයා නියම කරන ආකෘති යක විය යුතු ය. සභාවේ ගිණුම් තැබීම යම් නිලධරයකුගේ කාර්යය වේ ද ඒ නිලධරයා විසින් ඒ වාර්තාව සහතික කර තිබිය යුතු ය.

(3) සභාව විසින්—

(අ) ගෙවිය යුතු යම් වාරිකයක් හෝ වාර්ෂික වාරිකයක් ගෙවීම පැහැර හැර ඇති බව; හෝ

(ආ) යම් ණයක් නිදහස් කිරීම සඳහා ප්‍රතිපාදනය කළ යුතු යම් මුදලක් එසේ ප්‍රතිපාදනය කිරීම පැහැර හැර ඇති බව; හෝ

(ඇ) නිදන් අරමුදලක් සඳහා වෙන් කළ යුතු යම් මුදලක් වෙන් කිරීම පැහැර හැර ඇති බව; හෝ

(ඈ) නිදන් අරමුදලක් යෙදවීමට මේ කොටසින් හෝ මේ කොටස යටතේ සාදන ලද නියෝගයකින් හෝ බලය දී ඇති කාර්යයක් නොවන කාර්යයක් සඳහා නිදන් අරමුදලක යම් කොටසක් යොදවා ඇති බව

මේ වගන්තිය යටතේ සපයන ලද යම් වාර වාර්තාවකින් හෝ අන් ආකාරයකින් අමාත්‍යවරයාට පෙනී ගියහොත්, අමාත්‍යවරයා විසින්, නියමයක් මගින්, ඒ නියමයෙහි නිශ්චිත ව සඳහන් විය යුතු වූ ද පැහැර හැරීම සිදු කර ඇත්තේ යම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධ බව ද ඒ මුදල් ප්‍රමාණය කොපමණ වන්නා වූ ද මුදලක් ඒ නියම යෙහි සඳහන් ආකාරයට ගෙවිය යුතු යැයි හෝ යෙදවිය යුතු යැයි විධාන කළ හැකි ය. ඒ නියමයට අනුකූල ව කටයුතු කළ විගස ම සභාව විසින් අමාත්‍යවරයාට ඒ බව දැන්විය යුතුය. එකී නියමයකට අනුකූල ව ක්‍රියා කිරීමේ කාර්යය සඳහා මහා නගර සභා අරමුදලින් මුදල් ගෙවීම අවශ්‍ය වුවහොත් සභාව විසින් එසේ ගෙවිය යුතු ය.

(4) ඉහතින් අන්තිමට වූ උපවගන්තිය යටතේ කරන ලද නියමයක් අමාත්‍යවරයාගේ වුවමනාව පිට, මැන්ඩාමුස් ආඥාවක් මගින් බලාත්මක කළ හැකි ය.

(5) මේ වගන්තිය යටතේ සැපයීමට නියමිත වාර වාර්තාවක් සපයනු නොලැබුවහොත්, පැහැර හැරීම සිදු කළ තැනැත්තා, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතුය. තව ද එවැනි යම් දඩයක් අර කර ගනු ලැබුව ද එම වාර්තාව සැපයීම, අමාත්‍යවරයාගේ වුවමනාව පිට මැන්ඩාමුස් ආඥාවක් මගින් බලාත්මක කළ හැකි ය. [1986 අංක 39§48]

197. මහා නගර සභාවක් විසින් මේ කොටස යටතේ ණයට ගන්නා ලද යම් මුදලකින්, ණය ලබා ගන්නා ලද කාර්යය සඳහා අවශ්‍ය නො වූ යම් ශේෂයක්, මේ කොටස යටතේ මුදල් ණයට ගත හැකි වෙනත් යම් කාර්යයක් සඳහා, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇති ව සහ ඔහු විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් ව යෙදවිය හැකි ය: වැය නොවූ මුදල් ශේෂය.

එසේ වුව ද, ඒ මුදල් 191 වන වගන්තියේ අතුරු වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව ණයට ගන්නා ලද මුදලක් නම් එකී කැමැත්ත සහ කොන්දේසි අවශ්‍ය නොවන්නේ ය.

ණය දෙන්නා ඇතැම් විමසීම් වලින් නිදහස් කිරීම.

198. මේ කොටස යටතේ මහා නගර සභාවකට මුදල් ණයට දෙන තැනැත්තකු, සභාව ඒ මුදල් ණයට ගැනීම නීත්‍යනුකූල ද යන වග හෝ නීත්‍යනුකූල වී ද යන වග හෝ විධිමත් ද යන වග හෝ විධිමත් වී ද යන වග හෝ ඒ මුදල් නිසි පරිදි යොදවන ලද ද යන වග හෝ විමසීමට බැඳී නොසිටිය යුතු අතර, ඉහත කී කරුණු සම්බන්ධයෙන් වූ යම් නීති විරෝධතාවක් හෝ විධි විරෝධතාවක් හෝ ඒ මුදල් කිසිවක් අනිසි ලෙස යෙදවීමක් හෝ යොදවා නොතිබීමක් හෝ නිසා ඔහුට හානියක් නොවිය යුතු ය.

## ණයකර සහ නිවාස බැඳුම්කර පිළිබඳ විධිවිධාන

ණයකර සහ නිවාස බැඳුම්කර ඇති කිරීම ආදිය.

199. මේ කොටස යටතේ ණයකර හෝ නිවාස බැඳුම්කර නිකුත් කිරීමෙන් යම් ණය ලබා ගැනීමක කාර්යය සඳහා මහා නගර සභාවක් විසින් ණයකර හෝ නිවාස බැඳුම්කර ඇති කිරීම, නිකුත් කිරීම, අන් සතු කිරීම, ගණුදෙනු කිරීම සහ නිදහස් කිරීම, නියම කරනු ලබන ආකාරයකට කළ හැකි ය.

## උකස්කර පිළිබඳ විධිවිධාන

උකස්කරයේ ආකෘතිය.

200. මේ කොටස යටතේ ඇති කරනු ලබන උකසක්, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියක හෝ ඒ ඵලයම ලැබෙන සේ සකස් කළ ආකෘතියක හෝ වූ ඔප්පුවකින් විය යුතුය.

උකස පැවරීම.

201. මහා නගර සභාවක් විසින් මේ කොටස යටතේ ඇති කරන ලද උකසකට හිමිකම් ඇති තැනැත්තකු විසින්, ඒ උකස, නියම කරනු ලබන ආකෘතියක හෝ ඒ ඵලයම ලැබෙන සේ සකස් කළ ආකෘතියක හෝ වූ ඔප්පුවකින් පැවරිය හැකි ය.

හවුල් හිමිකරුවන් සහ බාල වයස් කරුවන් වෙනුවෙන් වූ කුවිතාන්සි.

202 (1) මහා නගර සභාවක් විසින් මේ කොටස යටතේ ඇති කරන ලද උකසකට තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හවුල් හිමිකම් දරන අවස්ථාවක, ඒ උකස් වෙනුවෙන් යම් පොළියක් සඳහා එක් තැනැත්තකු විසින් කුවිතාන්සි නිකුත් නොකළ යුතු බවට අනෙක් හවුල්කාර තැනැත්තන්ගෙන් කෙනකු විසින් සභාවට ලිඛිත දැනුම්දීමක් කර ඇත්නම් මිස, ඉන් කවර තැනැත්තකු විසින් වුව ද ඒ සඳහා බල සහිත කුවිතාන්සියක් නිකුත් කළ හැකි ය.

(2) මහා නගර සභාවක් විසින් මේ කොටස යටතේ ඇති කරන ලද උකසක් වෙනුවෙන් බාලවයස්කරුවකුට ගෙවිය යුතු යම් මුදලක් සඳහා ඒ බාල වයස්කරුගේ දේපළ ආරක්ෂක විසින් නිකුත් කරන ලද කුවිතාන්සියක්, ඒ මුදල නිදහස් කිරීමක් වශයෙන් ඒ සභාවට ප්‍රමාණවත් වන්නේ ය.

උකස් මත ණයට හෝ මුදල් ආපසු ගෙවීම.

203. (1) මහා නගර සභාවක් විසින් මේ කොටස යටතේ උකස් මගින් ණයට ගන්නා ලද සෑම මුදලක් ම, මුල් මුදලේ හෝ මුල් මුදල සහ පොලිය ඒකාබද්ධ කළ මුදලේ සමාන වාර්ෂික හෝ අර්ධ වාර්ෂික වාරික මගින් හෝ නිදන් අරමුදලක් මගින් හෝ කොටසක් එකි එක් ක්‍රමයකින් සහ කොටසක් අන් ක්‍රමයකින් නොහොත් ක්‍රමවලින් ගෙවිය යුතු ය.

(2) 195 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, පළමුවන වාරිකය ගෙවීම හෝ නිදන් අරමුදලට පළමු ගෙවීම, නියම කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් සියලු වාරික, මහා නගර සභාව විසින් මහා නගර සභා අරමුදලින්, ගෙවිය හැකි ය.

නිදන් අරමුදල.

204. (1) මේ කොටස යටතේ උකස් මගින් ණයට ගන්නා ලද මුදල් කිසිවක් නිදන් අරමුදලක් මගින් ආපසු ගෙවීමට මහා නගර සභාවක් තීරණය කළහොත්, නිදන් අරමුදල—

(අ) ඒ අරමුදල පිහිටවනු ලබන්නේ යම් මුදල් ආපසු ගෙවීමට ද ඒ මුදල් නියමිත කාල සීමාව තුළ ආපසු ගෙවා අවසන් කිරීම සඳහා ප්‍රමාණවත් විය හැකි සමාන වාර්ෂික කොටස් මුදල්, එකී නියමිත කාල සීමාව මුලුල්ලේ ම නිදන් අරමුදලට මහා නගර සභා අරමුදලින් ගෙවීමෙන් ; හෝ

(ආ) ඒ අරමුදල පිහිටුවනු ලබන්නේ යම් මුදල් ආපසු ගෙවීමට ද ඒ මුදල් නියමිත කාල සීමාවක් තුළ ආපසු ගෙවා අවසන් කිරීමට නියම කරනු ලබන ප්‍රමාණයක් නොඉක්ම වන ප්‍රමාණයක් අනුව හෝ යම් විශේෂිත අවස්ථාවක් සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් ප්‍රමාණයක් අනුව වූ සමුච්චයක් සමග ප්‍රමාණවත් විය හැකි සමාන වාර්ෂික කොටස් මුදල්, එකී නියමිත කාල සීමාව මුලුල්ලේ ම නිදන් අරමුදලට මහා නගර සභා අරමුදලින් ගෙවීමෙන්

පිහිටුවා පවත්වා ගෙන යා යුතු ය.

මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ පිහිටුවනු ලබන නිදන් අරමුදලක් "සමුච්චය නොවන නිදන් අරමුදලක්" යනුවෙන් සඳහන් කරනු ලබන අතර එහි (ආ) ඡේදය යටතේ පිහිටුවනු ලබන නිදන් අරමුදලක් "සමුච්චය වන නිදන් අරමුදලක්" යනුවෙන් මේ කොටසෙහි සඳහන් කරනු ලැබේ.

(2) නිදන් අරමුදලට ගෙවනු ලැබූ සෑම මුදල් ප්‍රමාණයක් ම, නිදන් අරමුදල පිහිටුවන ලද්දේ යම් මුදල් ආපසු ගෙවීම සඳහා ද ඒ මුදල් ආපසු ගෙවීමේ කාර්යය සඳහා යොදාගනු ලැබුවහොත් මිස, මුදලෙන් සමන්විත භාර දේපළ ආයෝජනය සඳහා භාර ආඥා පනතේ 20 වන වගන්තියෙහි නියමිත සුරැකුම්පත්වල, අමාත්‍ය වරයාගේ අනුමතය ඇතිව, ආයෝජනය කළ යුතු ය.

(3) සමුච්චය වන නිදන් අරමුදලක් සම්බන්ධයෙන් වන විට, නිදන් අරමුදලේ කාර්ය සඳහා වෙන් කරන ලද මුදල් ආයෝජනයෙන් යම් වර්ෂයක ලැබුණු පොළිය, මහා නගර සභා අරමුදලට ගෙවිය යුතු ය; එහෙත් ඒ වර්ෂයෙහි මහා නගර සභා අරමුදලින් නිදන් අරමුදලට ගෙවිය යුතු දායක මුදල්, නිදන් අරමුදලට කරන වාර්ෂික ගෙවීම් පදනම් වී ඇති වාර්ෂික ප්‍රතිශතකය මත පොළිය සමුච්චය කරන ලද නම් ඒ වර්ෂය තුළ නිදන් අරමුදලට උපචිත විය හැකි ව තිබුණු පොළිය හා සමාන මුදල් ප්‍රමාණයකින් වැඩි කළ යුතු ය.

(4) නිදන් අරමුදලක් පිහිටුවන ලද්දේ යම් මුදලක් ආපසු ගෙවීම සඳහා ද ඒ මුදල ගෙවා නිදහස් කිරීමට හෝ ගෙවා නිදහස් කිරීම අරභයා හෝ ඒ නිදන් අරමුදල සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ මහා නගර සභාවක් විසින් කවර අවස්ථාවක වුව ද යොදාගත හැකි ය:

එසේ වුව ද, සමුච්චය වන නිදන් අරමුදලක් සම්බන්ධයෙන් වන විට, ඒ නිදන් අරමුදල හෝ ඉගත කී පරිදි යොදා ගන්නා ලද එහි කොටස, නිදන් අරමුදලට කරන වාර්ෂික ගෙවීම් පදනම් වී ඇති වාර්ෂික ප්‍රතිශතකය මත ආයෝජනය කරන ලද නම් ඉන් උපදවා ගත හැකි ව තිබුණු පොළියට සමාන මුදලක්, මහා නගර සභා අරමුදලින් නිදන් අරමුදලට ගෙවීම ද නියමිත කාල සීමාවෙන් ශේෂව ඇති කාල සීමාව තුළ සමුච්චය කිරීම ද මහා නගර සභාව විසින් කළ යුතු ය.

(5) යම් නිදන් අරමුදලක් පිහිටුවන ලද්දේ යම් මුදලක් ආපසු ගෙවීම සඳහා ද ඒ මුළු මුදල ගෙවා නිදහස් කිරීමෙන් පසු වැඩිපුර ඉතිරි කොටසක් ඇත්නම්, ඒ කොටස, සභාව විසින් අමාත්‍යවරයාගේ ද කැමැත්ත ඇති ව නිශ්චය කරනු ලබන කාර්යයන් සඳහා යෙදවිය හැකි ය.

නිදන් අරමුදලේ ගළපාලීම.

**205.** (1) නිදන් අරමුදලක ඇති මුදල මේ කොටසේ විධිවිධාන අනුව ඊට ගෙවන මුදල් ද සමුච්චය වන නිදන් අරමුදලක් සම්බන්ධයෙන් වන විට ඒ මත සමුච්චය වන මුදල ද සමග ගත් කල්හි, නිදන් අරමුදල පිහිටුවන ලද්දේ යම් මුදලක් ආපසු ගෙවීමට ද ඒ මුදල නියමිත කාලය තුළ ආපසු ගෙවීමට ප්‍රමාණවත් නොවන බව යම් අවස්ථාවක මහා නගර සභාවකට පෙනී ගියහොත්, එම කාර්යය සඳහා නිදන් අරමුදල ප්‍රමාණවත් කිරීම සඳහා අවශ්‍ය යම් වැඩි මුදල් ප්‍රමාණයක්, ස්ථිරව හෝ තාවකාලික ව හෝ සභාව විසින් මහා නගර සභා අරමුදලින් නිදන් අරමුදලට ගෙවිය යුතුය; තව ද එසේ වැඩි කිරීම් අවශ්‍ය බව අමාත්‍යවරයාට පෙනී ගියහොත්, මහා නගර සභා අරමුදලින් කරන ගෙවීම් අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන ප්‍රමාණයකින්, සභාව විසින් වැඩි කළ යුතු ය.

(2) උකසක් මගින් මේ කොටස යටතේ ණයට ලබා ගන්නා ලද මුදල් කිසිවක් ආපසු ගෙවීම කඩිනම් කිරීම සභාවේ අභිමතය වන්නේ නම්, සභාව විසින් මහා නගර සභා අරමුදලින් නිදන් අරමුදලට ගෙවන මුදල් ප්‍රමාණය වැඩි කළ හැකි ය.

(3) නිදන් අරමුදලක ඇති මුදල, මේ කොටසේ විධිවිධාන අනුව ඊට ගෙවන මුදල් ද සමුච්චය වන නිදන් අරමුදලක් සම්බන්ධයෙන් වන විට ඒ මත සමුච්චය වන මුදල ද සමග ගත් කල්හි, නිදන් අරමුදල පිහිටුවන ලද්දේ යම් මුදලක් ආපසු ගෙවීම සඳහා ද ඒ මුදල නියමිත කාල සීමාව තුළ ආපසු ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩි බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, නිදන් අරමුදලට කරන ගෙවීම්, නිදන් අරමුදල පිහිටුවන ලද්දේ යම් මුදලක් ආපසු ගෙවීම සඳහා ද ඒ මුදල නියමිත කාල සීමාව තුළ ආපසු ගෙවීමට අමාත්‍යවරයාගේ මතය අනුව ප්‍රමාණවත් වන මුදලක් දක්වා, සභාව විසින් තාවකාලිකව හෝ ස්ථිරව අඩු කළ හැකි ය.

(4) යම් අවස්ථාවක නිදන් අරමුදලෙහි ඇති මුදල, සමුච්චය වන නිදන් අරමුදලක් සම්බන්ධයෙන් වන විට ඒ මත සමුච්චය වන මුදල් ද සමග ගත් කල්හි, නිදන් අරමුදල පිහිටුවන ලද්දේ යම් මුදලක් ආපසු ගෙවීම සඳහා ද ඒ මුදල නියමිත කාල සීමාව තුළ ආපසු ගෙවීමට අමාත්‍යවරයාගේ මතය අනුව ප්‍රමාණවත් වන්නේ

නම්, මහා නගර සභා අරමුදලින් නිදන් අරමුදලට කරන වාර්ෂික ගෙවීම්, අමාත්‍යවරයා විසින් අන්‍යාකාර විධානයක් කරන තුරු අත්හිටුවීමට අමාත්‍යවරයා විසින් සභාවට බලය දිය හැකි ය.

### පරිපූරක ණය ගැනීමේ බලය

තාවකාලික ණය ආදිය.

206. (1) 192 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, මහා නගර සභාවක් විසින් අමාත්‍යවරයාගේ කැමැත්ත ඇති ව බැංකුවකින් හෝ අන්‍යාකාරයකින් තාවකාලික ණයක් හෝ අයිරාවක් වශයෙන්—

(අ) යම් කාලසීමාවක් සඳහා සභාව විසින් සාදන ලද ඇස්තමේන්තුවල අය කළ යුතුව ඇති හා ගණන් ගන්නා ලද වියදම්, ඒ කාල සීමාව වෙනුවෙන් සභාවට ලැබිය යුතු මුදල් ලැබෙන තෙක්, පියවීමේ කාර්යය සඳහා ; සහ

(ආ) මේ කොටස යටතේ ලබා ගැනීමට සභාවට බලය ඇති ණයක් ලබා ගන්නා තෙක්, ඒ ණයෙන් පියවීමට අදහස් කරන වියදම් පියවීම සඳහා

සභාවට තාවකාලික ව අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් ණයට ගත හැකි ය :

එසේ වුව ද, ඒ සභාව විසින් ඒ වන විට ලබා ගෙන ඇති සියලු ණය වෙනුවෙන් ගෙවීමට ඉතිරි ව ඇති මුදල, ණය ලබා ගැනීමට අදහස් කරන්නේ යම් වර්ෂයක් තුළ දී ද ඊට ඉහතින් අන්තිමට වූ වර්ෂ තුන තුළ සභාව ලත් මුළු ආදායම නොඉක්මවන්නේ නම්, එකී යම් මුදලක් ණයට ගැනීම සඳහා අමාත්‍යවරයාගේ කැමැත්ත අවශ්‍ය නොවන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර මුදල් ණයට ගෙන ඉන් ඉක්බිති ව ඒ ඡේදයෙහි සඳහන් පරිදි වූ ණයක් ලබා ගත් අවස්ථාවක, ඒ ණය ආපසු ගෙවීම විධිමත් කරන මේ කොටසේ ඇති විධිවිධානවල කාර්යය සඳහා, ඒ ණය, එකී ඡේදය යටතේ ණයට ගත් මුදලේ ප්‍රමාණයට, ඒ ඡේදය යටතේ මුදල් ණයට ගත් වේලාවේ දී ලබා ගත් ණයක් සේ සැලකිය යුතු ය.

නැවත මුදල් ණයට ගැනීමේ බලය.

207. (1) 192 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, මහා නගර සභාවක් විසින්, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇති ව—

(අ) මේ කොටස යටතේ සභාව විසින් කලින් ණයට ගන්නා ලද්දා වූ ද නොපමාව ආපසු ගෙවීමට අදහස් කර ඇත්තා වූ ද යම් මුදල් ආපසු ගෙවීමේ කාර්යය සඳහා ; හෝ

(ආ) කලින් ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීම සඳහා ඊට කලින් වූ මාස දොළහ තුළ සභාවේ වෙනත් මුදල් වලින් තාවකාලිකව යොදා ගන්නා ලද්දා වූ ද එම ආපසු ගෙවීම් කරන අවස්ථාවේ දී, ණයට ගන්නා මුදල් වලින් ප්‍රතියෝජනය කිරීමට අදහස් කරන ලද්දා වූ ද මුදල් ප්‍රතියෝජනය කිරීමේ කාර්යය සඳහා

මුදල් ණයට ලබා ගත හැකි ය:

එසේ වුව ද, ඒ සභාව විසින් ඒ වන විට ලබා ගෙන ඇති සියලු ණය වෙනුවෙන් ගෙවීමට ඉතිරිව ඇති මුදල, ණයට ලබා ගැනීමට අදහස් කරන්නේ යම් වර්ෂයක් තුළ ද ඊට ඉහතින් අන්තිමට වූ වර්ෂ තුන තුළ සභාව ලත් මුළු ආදායම නොඉක්මවන්නේ නම්, මේ උපවගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධාන යටතේ යම් මුදලක් ණයට ගැනීම සඳහා අමාත්‍යවරයාගේ කැමැත්ත අවශ්‍ය නොවන්නේ ය;

එසේ ම තවදුරටත්, මේ වගන්තිය යටතේ—

(අ) නිදන් අරමුදලට යම් ගෙවීමක් කිරීමේ කාර්යය සඳහා හෝ ණයට ගත් මුදල් වෙනුවෙන් ගෙවිය යුතු විය හැකි හෝ ගෙවිය යුතු වාරිකයක් ගෙවීමේ හෝ වාර්ෂික ගෙවීමක් කිරීමේ කාර්යය සඳහා; හෝ

(ආ) කලින් ණයට ගන්නා ලදුව—

(i) වාරිකවලින් හෝ වාර්ෂික ගෙවීම් මගින් ආපසු ගෙවන ලද;

(ii) නිදන් අරමුදලක් මගින් ආපසු ගෙවන ලද;

(iii) ඉඩම් විකිණීමෙන් ලැබුණ මුදල්වලින් ආපසු ගෙවන ලද;

(iv) ණය ආපසු ගෙවීම සඳහා යථා පරිදි යොදා ගත හැකි, ඒ කාර්යය සඳහා ණයට ගන්නා ලද මුදල් නොවන, ප්‍රාග්ධන මුදලින් ආපසු ගෙවන ලද මුදල් කිසිවක් ප්‍රතියෝජනය කිරීමේ කාර්යය සඳහා

මුදල් ණයට ගැනීමට සභාවට බලය නොමැත්තේ ය.

(2) මේ වගන්තිය යටතේ ණයට ගන්නා ලද මුදල්, ඒ මුදල් ආපසු ගෙවීමේ කාර්යය සඳහා, මුල් ණයෙහි ම කොටසක් ලෙස සැලකිය යුතු අතර, නියමිත කාලසීමාවෙන් නොගෙවී ඉතිරිව ඇති

කාලසීමාව තුළ ආපසු ගෙවිය යුතු ය ; තව ද තත් කාලයෙහි මුල් ණය කෙරෙහි අදාළ වන විධිවිධාන, මේ වගන්තිය යටතේ ණයට ගන්නා ලද මුදල් කෙරෙහි ද අදාළ වන්නේ ය :

එසේ වුව ද, කාලය දීර්ඝ කරවා ගැනීම සඳහා තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් අනුව, මේ වගන්තිය යටතේ ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීමේ කාලය, යෝග්‍ය යැයි තමා සලකන දිනයක දී ඉකුත් වන පරිදි, අමාත්‍යවරයා විසින්, දීර්ඝ කළ හැකි ය.

ණය ලබා ගැනීම සම්බන්ධයෙන් වූ සභාවේ බලතල නගරාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ හැකි අවස්ථා. [1977 අංක 24 §106.]

**207අ.** මහා නගර සභාවට නියම වී ඇති යම් යුතුකමක් සපුරාලීමේ කාර්යය සඳහා හෝ අවශ්‍ය යැයි නගරාධිපතිවරයා සලකන යම් වැඩක් කිරීමේ කාර්යය සඳහා ණයක් ලබා ගැනීම අනුමත කිරීම සභාව විසින් පැහැර හරිනු ලැබුවහොත්, නගරාධිපතිවරයා විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, එම ණය ලබා ගත හැකි අතර, මේ කොටසේ විධිවිධාන යටතේ සභාව වෙත පැවරී ඇති සියලු බලතල, ඒ බලතල නගරාධිපතිවරයා වෙත මේ කොටසින් පැවරී ඇත්තාක් සේ නගරාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ හැකි ය.

## නියෝග

නියෝග.

**208.** (1) මේ කොටසේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) විශේෂිතව ම හා (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැති ව, අමාත්‍යවරයා විසින්, නියම කරනු ලැබීමට ප්‍රකාශිත හෝ නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය ; තව ද මේ කොටස යටතේ ණයකර හෝ නිවාස බැඳුම්කර නිකුත් කිරීමෙන් ලබා ගන්නා ලද ණය සම්බන්ධයෙන් වූ විට පහත සඳහන් අතිරේක කාරණා සඳහා හෝ පිළිබඳව ද අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය :—

(අ) ඒ ණය නිකුත් කිරීමට අදාළ නියමයන් ;

(ආ) ඒ ණය ගෙවා නිදහස් කිරීම ;

(ඇ) ඒ ණය සඳහා ඇප ;

(ඈ) ඒ ණය ගෙවා නිදහස් කළ හැකි කාලසීමාව දීර්ඝ කිරීම හෝ වෙනස් කිරීම ;

(ඉ) අශක්නුතාවකට යටත් අයිතිකරුවන්ගේ කැමැත්ත ;

(ඊ) මුද්දර ගාස්තු හා චෙක් පත් පිළිබඳ වූ ප්‍රඥප්ති අදාළ කර ගැනීම ;

(උ) හිමිකම් නොපාන ලද ලාභාංශ බැහැර කිරීම.

(3) අමාත්‍යවරයා විසින් මේ කොටස යටතේ සාදනු ලබන කිසි ම නියෝගයක් එය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තුරු බල සහිත නොවිය යුතු ය.

(4) ඒ අනුමතය පිළිබඳ නිවේදනය කරනු ලැබූ විට සෑම නියෝගයක් ම එය මෙහි ලා පැනවූවාක් මෙන් වලංගු සහ බල සහිත විය යුතු ය.

### ව්‍යාවර්තන

**209.** මේ කොටසේ විධිවිධානවල ඇතුළත් කිසිවක්, මේ පනතේ වෙනත් කොටසක් යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ මහා නගර සභාවක් විසින් ලබා ගන්නා ලද ණය කෙරෙහි අදාළ වන බවට මේ පනතෙහි නිශ්චිත විධිවිධාන ඇත්නම් මිස, එකී ණයක් කෙරෙහි අදාළ නොවිය යුතු ය; තව ද ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ මහා නගර සභාවක් විසින් ලබා ගන්නා ලද ණයක් සම්බන්ධයෙන් වන විට, ණය සම්බන්ධ ව ඒ ඉවත් කරන ලද ප්‍රඥප්තියේ ඇති විධිවිධාන, එය ඉවත් නොකරන ලද නම් ඒ ණය කෙරෙහි අදාළ විය හැකි ව තිබුණු ආකාරයට හා ප්‍රමාණයට ම, ඒ ඉවත් කිරීම නොතකා අදාළ වන්නේ ය. ව්‍යාවර්තන.

### අර්ථ නිරූපණය

**210.** මේ කොටස යටතේ ණයට ගත් මුදල් සම්බන්ධයෙන් යෙදුණු විට "නියමිත කාල සීමාව" යන්නෙන්, ඒ මුදල ආපසු ගෙවිය යුතු කාල සීමාව වශයෙන් 195 (1) වන වගන්තිය යටතේ මුලින් නිශ්චය කරන ලද කාල සීමාව, මේ කොටසේ කාර්ය සඳහා, අදහස් වේ. අර්ථ නිරූපණය.

---

## XI වන කොටස

### අය වැය ලේඛනය. ඇස්තමේන්තු, ගිණුම් සහ ගිවිසුම්

### අය වැය ලේඛනය

**211.** එක් එක් මහා නගර සභාවේ නගරාධිපතිවරයා විසින්, එක් එක් වර්ෂයෙහි, ඔහු විසින් නියම කරනු ලබන දිනයක දී, ලබන්නා වූ මුදල් වර්ෂයෙහි මහා නගර සභාවෙහි ආදායම පිළිබඳ ඇස්තමේන්තුවක් සහ යෝජිත වියදම් පිළිබඳ විස්තර ඇතුළත් අය වැය ලේඛනයක්, ඒ ඒ ස්ථාවර කමිටු විමසා පිළියෙළ කොට, සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. අය වැය ලේඛනය.

*අය වැය ලේඛනය සභිකයන් අතර බෙදදිය යුතු බව හා එය පරීක්ෂා කර බැලීම සඳහා ඉඩකඩ සලස්වා තිබිය යුතු බව.*

**212.** මහා නගර සභාවක සෑම අය වැය ලේඛනයක් ම—

(අ) 211 වන වගන්තියේ සඳහන් දිනයට යටත් පිරිසෙයින් දවස් හතකට පෙරාතුව, සභිකයන් අතර බෙදා හැරිය යුතු ය ; තව ද

(ආ) එකී දිනයට පෙරාතුව දවස් හතක් තුළ මහා නගර සභා කාර්යාලයේ දී හෝ නගරාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ස්ථානයක දී පරීක්ෂා කර බැලීම සඳහා ඉඩකඩ සලස්වා තිබිය යුතු අතර ගැසට් පත්‍රය මගින් ද මහා නගරය තුළ සංසරණය වන ප්‍රවෘත්ති පත්‍ර දෙකක් හෝ ඊට වැඩි ගණනක් මගින් ද නගරාධිපතිවරයා ඒ ගැන දැන්වීමක් කළ යුතු ය.

*අය වැය ලේඛනය අවසාන වශයෙන් ලසකා බැලීම.*

**213.** මුදල් වර්ෂයේ අවසාන මාසයේ දී කැඳවිය යුතු විශේෂ රැස්වීමක දී සෑම මහා නගර සභාවක් විසින් ම අය වැය ලේඛනය අවසාන වශයෙන් සලකා බැලිය යුතු ය.

*පරිපූරක අය වැය ලේඛනය.*

**214.** (1) නගරාධිපතිවරයා විසින් කවර අවස්ථාවක වුව ද පරිපූරක අය වැය ලේඛනයක් පිළියෙළ කොට එය සභාව ඉදිරියෙහි තැබිය හැකි ය.

(2) සෑම පරිපූරක අය වැය ලේඛනයක් ම—

(අ) එය සභාව ඉදිරියේ තබනු ලබන්නේ සභාවේ යම් රැස්වීමක දීද ඒ රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් දවස් හතකට කලින්, සභිකයන් අතර බෙදාහැරිය යුතුය ; තවද

(ආ) එකී රැස්වීමේ දිනයට පෙරාතුව දවස් හතක් තුළ මහා නගර සභා කාර්යාලයේ දී හෝ නගරාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ස්ථානයක දී මහජනයාට පරීක්ෂා කර බැලීමට ඉඩ සලස්වා තිබිය යුතු අතර ගැසට් පත්‍රය මගින් ද මහා නගරය තුළ සංසරණය වන ප්‍රවෘත්ති පත්‍ර දෙකක් හෝ ඊට වැඩි ගණනක් මගින් ද නගරාධිපතිවරයා ඒ ගැන දැන්වීමක් කළ යුතුය.

*අය වැය ලේඛනය සහ පරිපූරක අය වැය ලේඛනය සම්බන්ධයෙන් සභාවේ බලතල.*

**215.** යම් අය වැය ලේඛනයක හෝ පරිපූරක අය වැය ලේඛනයක සියලු ම විෂයයන් හෝ එම විෂයයන් අතුරින් යම් විෂයයක් සම්මත කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ කවර හෝ විෂයයක් එකතු කිරීම මහා නගර සභාවක අභිමතය අනුව කළ හැකිය.

**215අ.** යම් අය වැය ලේඛනයක හෝ පරිපූරක අය වැය ලේඛනයක සියලුම විෂයයන් හෝ ඉන් යම් විෂයයක් හෝ සභාව විසින් පුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ඊට යම් විෂයයක් එක් කරනු ලැබුවහොත්, සභාවේ එවැනි යම් තීරණයකට නගරාධිපතිවරයා එකඟ නොවන්නේ නම්, ඔහු විසින් එම අය වැය ලේඛනය තව දුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතුය. අය වැය ලේඛනය හෝ පරිපූරක අය වැය ලේඛනය නැවතත් සභාවට ඉදිරිපත් කරනු ලැබ එය එසේ නැවත ඉදිරිපත් කරනු ලැබීමෙන් සති දෙකක් ඇතුළත සම්මත කරනු නොලැබූ අවස්ථාවක, එම අය වැය ලේඛනය හෝ පරිපූරක අය වැය ලේඛනය එය සභාව විසින් සම්මත කරනු නොලැබීම නොතකා, සභාවේ යථා පරිදි පිළිගන්නා ලද අය වැය ලේඛනය හෝ පරිපූරක අය වැය ලේඛනය ලෙස සැලකිය යුතුය.

අය වැය ලේඛනය සම්බන්ධයෙන් නගරාධිපතිවරයාගේ බලතල [1977 අංක 24 §107.]

**216.** අවශ්‍යතාවක් ඇති වූ විටක කවර වර්ෂයක දී වුවද නගරාධිපතිවරයා විසින් අය වැය ලේඛනයේ හෝ පරිපූරක අය වැය ලේඛනයේ කවර ශීර්ෂයක් යටතේ වුවද වියදම අඩු කිරීම හෝ වැඩි කිරීමද එක් ශීර්ෂයක් යටතේ වෙන් කර ඇති මුදල් වෙනත් ශීර්ෂයක් යටතට මාරු කිරීම ද කළ හැකිය ;

එසේ වුවද, සභාව විසින් සම්මත කර ඇති අය වැය ලේඛනයක හෝ පරිපූරක අය වැය ලේඛනයක අනුමත කර ඇති මුළු වියදම් ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

වියදම අඩු කිරීම හෝ වැඩි කිරීම. [1977 අංක 24 § 108.]

**217.** මහා සභාවක් විසින් සම්මත කරන ලද අය වැය ලේඛනයකින් හෝ පරිපූරක අය වැය ලේඛනයකින් හෝ යථා පරිදි පිළිගන්නා ලදැයි සැලකෙන ඒ සභාවේ අය වැය ලේඛනයකින් නැතහොත් පරිපූරක අය වැය ලේඛනයකින් හෝ වියදම් දැරීම සඳහා දෙනු ලබන බලය එම අය වැය ලේඛනය අදාල වන මුදල් වර්ෂය අවසානයේදී අතික්‍රාන්ත වන්නේය.

අය වැය ලේඛනවලින් අනුමත කර ඇති වියදම් සඳහා වූ බලය අතික්‍රාන්ත වීම [1977 අංක 24 §109.]

## ගිණුම්

**218.** නගරාධිපතිවරයා විසින් එක් එක් මුදල් වර්ෂය තුළ දී ඔහුගේ පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක්, ඒ වර්ෂය තුළ දී මහා නගර සභා අරමුදලට එකතු වූ ලැබීම්වල සහ එම අරමුදලින් කළ ගෙවීම්වල ස්වභාවය හා ප්‍රමාණය දැක්වෙන ප්‍රකාශයක් ද සහිත ව, ඒ මුදල් වර්ෂය අවසාන වූ පසු හැකිතාක් ඉක්මණින් පිළියෙල කළ යුතුය. එම වාර්තාව සහ ප්‍රකාශය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. තවද ඒ සම්බන්ධයෙන් සභාව විසින් සම්මත කරනු ලැබූ යෝජනා කිසිවක් වේ නම් ඒවා ද සමග එම වාර්තාව හා ප්‍රකාශය, එය පළමුවෙන් සභාව වෙත ඉදිරිපත් කළ දින සිට සති හයක් ඇතුළතදී, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

වාර්ෂික පරිපාලන වාර්තාව.

**ගිණුම් විගණනය කිරීම.**

**219.** සෑම මහා නගර සභාවකම ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයන් විසින් විගණනය කරනු ලැබිය යුතු අතර එම ගිණුම් පිළිබඳ අඛණ්ඩ විගණනයක් ඔහු හෝ ඔවුන් විසින් පවත්වාගත යුතුය.

**විගණකවරයන්ගේ බලතල.**

**220.** මේ ආඥාපනත යටතේ ගිණුම් විගණනය කිරීමේත් පරීක්ෂා කිරීමේත් කාර්යය සඳහා තමන්ට අවශ්‍ය යැයි 219 වන වගන්තියෙන් හෝ ඒ යටතේ පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් අවශ්‍ය යැයි සලකනු ලබන සියලු පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර හා වෙනත් ලේඛන සහ ලියකියවිලි තමන් වෙත ඉදිරිපත් කරන ලෙස ඒ විගණකවරයා හෝ විගණකවරයන් විසින් ලිඛිත කැඳවීම් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි අතර, ඒ පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර, ලේඛන හෝ ලියකියවිලි කිසිවක් තබාගෙන සිටින නැතහොත් ඊට වගකීවයුතු ඕනෑම තැනැත්තකුට එකී විගණනයේ දී සහ පරීක්ෂා කිරීමේ දී, හෝ අදාලව කල් තබනු ලැබූ එකී විගණනයේ දී සහ පරීක්ෂාකිරීමේදී ඒ විගණකවරයා හෝ විගණකවරයන් ඉදිරියට පැමිණ එකී පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර, ලේඛන හෝ ලියකියවිලි සම්බන්ධයෙන් ප්‍රකාශයක් කොට එම ප්‍රකාශය අත්සන් කරන ලෙස ද නියම කරනු ලැබිය හැකිය.

**දණ්ඩනය.**

**221.** 220 වන වගන්තිය යටතේ ඉදිරිපත් කිරීමට නියම කරන ලද පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර, ලේඛන හෝ ලියකියවිලි කිසිවක් එසේ ඉදිරිපත් කිරීම හෝ නියම කළ පරිදි ප්‍රකාශයක් කිරීම හෝ ප්‍රකාශයක් අත්සන් කිරීම හෝ යම් තැනැත්තකු විසින් නොසලකා හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්, ඔහු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසකට නොවැඩි දඩයකට ද ඒ වරද සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ නොසලකා හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ තවදුරටත් කරගෙන යනු ලබන එක් එක් දිනයට රුපියල් පන්සියයකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය.

[1986 අංක 39§ 49]

**විගණන වාර්තාව.**

**222.** විගණකවරයා හෝ විගණකවරයන් විසින් තම විගණනය පිළිබඳ මාසික වාර්තාවක් සභාවට ඉදිරිපත් කළ යුතු අතර, මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු හැකි පමණ ඉක්මනින්, ඒ විගණනය පිළිබඳ වාර්ෂික වාර්තාවක් සභාව වෙත ද ඒ වාර්ෂික වාර්තාවේ අනු පිටපතක් අමාත්‍යවරයා වෙත ද ඉදිරිපත් කළ යුතුය.

**ගිණුම්වල අක්‍රමිකතා.**

**223.** (1) සභාව විසින් මුදල් වැය කිරීමේ දී හෝ එම සභාවට අය විය යුතු මුදල් අය කර ගැනීමේ දී හෝ මහා නගර සභා ගිණුම් සම්බන්ධයෙන් හෝ සිදු වී ඇති යම් සැලකිය යුතු දෝෂයක්, අයෝග්‍යතාවක් නොහොත් අක්‍රමිකතාවක් කෙරෙහි සභාවේ අව

ධනය යොමු කරවන ලෙස, 219 වන වගන්තියෙන් හෝ ඒ යටතේ පත් කරන ලද මහා නගර සභා ගිණුම් විගණකවරයාට හෝ විගණක වරයන්ට අමාත්‍යවරයා විසින් ලිඛිත නියමයක් මගින් විධාන කළ හැකිය.

(2) එකී යම් දෝෂයක්, අයෝග්‍යතාවක් හෝ අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් සභාව විසින් ගන්නා ලද නොහොත් ගැනීමට අද හස් කරන ක්‍රියා මාර්ග කවරේදැයි, හැකිතාක් ඉක්මණින් සභාව විසින් අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතුය.

(3) ඒ වාර්තාව සම්බන්ධයෙන් සුදුසු යැයි අමාත්‍යවරයා අදහස් කරන නියමයන් ඔහු විසින් නිකුත් කළ හැකිය. ඒ නියමය අව සානාත්මක වන අතර සභාව විසින් සහ අනෙක් සියලු තැනැත් තන් විසින් ඒ නියමය පිළිපැදිය යුතුය.

224. යම් විගණනයක විෂය සීමාව, ක්‍රමය හෝ ප්‍රගතිය සම්බන්ධ යෙන් තොරතුරු සපයන ලෙස හෝ යම් විශේෂ විගණනයක් කරන ලෙස මහා නගර සභාවක් විසින් එහි ගිණුම් විගණකවරයාට හෝ විගණකවරුන්ට කලින් කල නියම කළ හැකිය. විගණකවරයන් සම්බන්ධයෙන් සභාවේ බලතල.

225. මහා නගර සභා ගිණුම් විගණකවරයන්ගේ සේවය සඳහා සාධාරණ යැයි මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන මුදල් ප්‍රමාණ, සෑම මහා නගර සභාවක් විසින් ම එහි ගිණුම් විගණකවරයාගේ හෝ විගණකවරයන්ගේ පාරිශ්‍රමික වශයෙන් මහා නගර සභා අරමුදලින් කලින් කල භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතුය. විගණකවරුන්ගේ පාරිශ්‍රමික.

226. (1) මේ ආඥාපනත මගින් හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් මගින් හෝ තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ක්‍රියා කරන්නා වූ, මහා නගර සභාවක සෑම මහා නගර සභා ගිණුම් විගණකවරයකු ම, මහා නගර සභා ගිණුම්වල එන, නීතියට පටහැනි යම් විෂයයක් සඳහා ඉඩ දීම ප්‍රතික්ෂේප කළ යුතු අතර, ඒ නීති විරෝධී ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තාට විරුද්ධව හෝ ඒ නීති විරෝධී ගෙවීම් කළ නොහොත් ඊට බලය දුන් තැනැත්තාට විරුද්ධ ව ඒ ගෙවීම අධිභාර කිරීමට ඔහු විසින් නියම කළ හැකිය. තව ද යම් තැනැත්තකුගේ නොසැළකිල්ල හෝ විෂමාචාරය හේතු කොට ගෙන ඇති වූ අඩුවක් නොහොත් පාඩුවක් ඒ තැනැත්තාගෙන් අය කර ගැනීමටත් ඒ තැනැත්තා විසින් ගණන් පෙන්විය යුතු ව තිබුණු, එහෙත් එසේ ගණන් පෙන්වා නැති, යම් මුදලක් ඔහුගෙන් අය කර ගැනීමටත් ඒ විගණකවරයා විසින් නියම කළ යුතු අතර, ඒ එක් එක් අවස්ථාවේ දී ඒ තැනැත්තාගෙන් අය විය යුතු මුදල් ප්‍රමාණය කොතෙක් දැයි විගණකවරයා විසින් සහතික කර තම තීරණය ඒ තැනැත්තා වෙත නගරාධිපතිවරයා මගින් ලියවිල්ලකින් දැන්විය යුතුය. අධිභාර කිරීම හා ඊට විරුද්ධව කරනු ලබන අභියාචනා.

[1957 අංක 15 §6.]

එසේ වුවද, සභාව විසින් වැය කරන ලද යම් මුදලක් සඳහා අමාත්‍යවරයා විසින් මේ ආඥාපනතේ යම් විධි විධානයකින් තමාට ඒ සඳහා පැවරී ඇති බලතල ප්‍රකාර අනුමතය දී තිබේ නම්, ඒ වියදම් සඳහා ඉඩ දීම විගණකවරයා විසින් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

(2) විගණකවරයා විසින්, යම් තැනැත්තකුට විරුද්ධව යම් කරුණක් සම්බන්ධයෙන් ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ අධිභාර කිරීමක් කිරීමට ප්‍රථම සුදුසු යැයි ඔහු සිතන පරිදි, ඒ කරුණ සම්බන්ධයෙන් නිදහසට කරුණු කියා සිටීමට හෝ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ඒ තැනැත්තාට සලස්වා දිය යුතු අතර, එකී ප්‍රතික්ෂේප කිරීමට හෝ අධිභාර කිරීමට තීරණය කළහොත් ඒ ප්‍රතික්ෂේප කිරීම් හෝ අධිභාර කිරීමේ තීරණයට හේතු සපයන ලෙස විගණකවරයාගෙන් ඉල්ලා සිටි විටක දී ඔහු විසින් ඒ තැනැත්තාට එම හේතු ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

(3) එකී යම් ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ අධිභාර කිරීමක් සම්බන්ධයෙන් අකෘප්තියට පත් යම් තැනැත්තකු විසින් තමාට විගණකවරයාගේ තීරණය දැනුම් දෙනු ලැබීමෙන් පසු දවස් දහ ගතරක් ඇතුළත, එම තීරණයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය :

එසේ වුවද, එකී ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ අධිභාර කිරීමේ කාරණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට විගණකවරයා විසින් (2) වන උපවගන්තියේ විධිවිධාන අනුව අවස්ථාවක් දීමෙන් පසු අභියාචක විසින් එසේ කරුණු ඉදිරිපත් කිරීම පැහැර හැර හෝ අතපසු කර ඇති කවර හෝ අවස්ථාවක දී එවැනි කිසිම අභියාචනයක් භාර නොගත යුතුය.

(4) එකී යම් අභියාචනයක් කරන ලද විටක දී විසඳීමට ඇති ප්‍රශ්ණය එහිම කුශලතා අනුව සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් තීරණයක් කළ යුතු අතර, උචිත යැයි අමාත්‍යවරයා අදහස් කරන්නේ නම්, ඉඩ දීම ප්‍රතික්ෂේප කර ඇති හෝ අධිභාර කර ඇති මුළු මුදල ම හෝ ඉන් යම් කොටසක් අභියාචකගෙන් අය කර ගන්නා ලෙස නියමයක් මගින් අමාත්‍යවරයා විසින් විධාන කළ හැකිය :

තව ද යම් ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ අධිභාර කිරීමක් කර ඇත්තේ නීත්‍යානුකූල ව නමුත් ඊට අදාළ වියදම කර ඇත්තේ සාධාරණ වූත් යුක්ති සහගත වූත් කරුණු හේතු කොට ගෙන බවත් එම නිසා ඒ ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම හෝ අධිභාර කිරීම අත් හැරිය යුතු බවත් අමාත්‍යවරයාට පෙනී ගියහොත්, ඒ ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම හෝ අධිභාර කිරීම හෝ අත් හරින ලෙස අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කළ හැකි ය. එහෙත්

ඒ ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම හෝ අධිහාර කිරීම ක්‍රියාත්මක කිරී මෙහි ලා විගණකවරයා විසින් වැය කරන ලද ගාස්තු හා වියදම් ප්‍රමාණය හෝ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි ඉන් යම් කොටසක් හෝ ඒ තැන්තාගෙන් අය කර ගනු ලැබිය යුතු ලෙසත් අමාත්‍යවරයා විසින් එම නියමයෙන් විධාන කළ හැකි ය.

(5) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියම යක් මගින් යම් තැනැත්තකුගෙන් අයකර ගැනීමට විධාන කරන ලද යම් මුදල් ප්‍රමාණයක් වේ ද එය අයවිය යුතු මුදලක් බවට විගණකවරයා විසින් සහතික කරන ලද යම් මුදල් ප්‍රමාණයක් මේ වගන්තියේ විධිවිධාන යටතේ අය කර ගනු ලබන ආකාරයෙන් ම, කොමසාරිස්වරයා විසින් නොපමාව ම අය කර ගත හැකි ය.

(6) යම් තැනැත්තකුගෙන් අය විය යුතු බවට ඉහත සඳහන් පරිදි විගණකවරයා විසින් සහතික කරන ලද සෑම මුදල් ප්‍රමාණයක් ම, විගණකවරයාගේ තීරණයට විරුද්ධ ව අභියාචනයක් ඉදිරිපත් කර තිබේ නම් මිස, විගණකවරයාගේ තීරණය ඒ තැනැත්තා වෙත දැනුම් දීමෙන් පසු දවස් දහ හතරක් ඇතුළත දී ඒ තැනැත්තා විසින් කොමසාරිස්වරයාට ගෙවිය යුතු ය ; එම මුදල් ප්‍රමාණය ගෙවා නැත්නම් සහ එවැනි අභියාචනයක් ඉදිරිපත් කර නැත්නම් ද ඒ මුදල ඒ තැනැත්තාගෙන් අය කර ගැනීම කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය ; තව ද, ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කළ විට, එසේ සහතික කරන ලද යම් මුදල් ප්‍රමාණයක්, එය එම මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන දඩයක් වූ ආකාරයෙන්, එය බලාත්මක කිරීමේ සියලු ගාස්තු සහ වියදම් ද සමඟ, අය කර ගත හැකි ය.

### ශිවිසුම්

227. ඇස්තමේන්තු කළ වියදම් රුපියල් පහළොස් දහස නොඉක්මවන්නා වූ ද යම් වැඩක් කිරීම හෝ සේවාවක් ඉටු කිරීම හෝ සඳහා, එසේ නැතහොත් භාණ්ඩ හෝ ද්‍රව්‍ය හෝ කිසිවක් සැපයීම සඳහා වූ ද යම් ගිවිසුමකට කොමසාරිස්වරයා විසින් සභාව වෙනුවෙන් ඇතුළත් විය හැකි ය. එහෙත් ඔහුට එසේ බලය ඇත්තේ ඒ ගිවිසුම අනුව ගිවිස ගත් කටයුතු කිරීමට ගත වන හෝ ගත වේ යැයි අපේක්ෂා කරනු ලබන හෝ කාලය වර්ෂයකට වැඩි නොවන්නේ නම් ද ඒ කටයුතු සඳහා අවශ්‍ය මුදල් අනුමත කළ අය වැය ලේඛනයක් මගින් හෝ පරිපූරක අය වැය ලේඛනයක් මගින් හෝ වෙන් කර තිබේ නම් ද පමණකි.

[1986 අංක 39 § 50 (අ)]
රුපියල් එක් දහස් පන් සියයක් නොඉක්මවන වියදම් දැරීමට හේතු වන ගිවිසුම.

[1986 අංක 36 § 50 (ආ)]

**රුපියල් පහලොස් දහස ඉකමවන වියදම් දරීමට හේතු වන ගිවිසුම්.**
**[1986 අංක 39 § 51 (අ)]**
**[1986 අංක 39 § 51 (ආ)]**

**228.** මහා නගර සභාවක් සඳහා යම් වැඩක් කිරීම හෝ යම් සේවයක් ඉටු කිරීම හෝ භාණ්ඩ නොහොත් ද්‍රව්‍ය කිසිවක් සැපයීම සඳහා වූ ද අදාළ ඇස්තමේන්තු කළ වියදම රුපියල් පහලොස් දහස ඉක්මවන්නා වූ ද ගිවිසුමක් හෝ ගිවිස ගත් කාර්ය ඉටු කිරීමට ගත වන කාලය වර්ෂයකට වැඩි වන නොහොත් වර්ෂයකට වැඩි වේ යැයි බලාපොරොත්තු වන ගිවිසුමක් ශ්‍රී ලංකාවේ දී ඇති කර ගනු ලැබුවක් වන විට, එය ලියා තැබිය යුතු අතර, සභාව වෙනුවෙන් නගරාධිපති විසින් මෙන් ම කොමසාරිස්වරයා විසින් ද එය අත්සන් කොට එහි සභාවේ පොදු මුද්‍රාවෙන් මුද්‍රා තැබිය යුතු ය. තව ද එකී යම් ගිවිසුමක ඇතුළත් කිරීමට අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් කාරණාවලට අමතර ව, පහත දැක්වෙන කාරණා එහි නිශ්චිත ව සඳහන් විය යුතු ය:—

(අ) කිරීමට ඇති වැඩය හෝ ඉටු කිරීමට ඇති සේවය හෝ සැපයීමට ඇති භාණ්ඩ නොහොත් ද්‍රව්‍ය කවරේ ද යන්න;

(ආ) ඒ වැඩය, සේවය, භාණ්ඩ හෝ ද්‍රව්‍ය සඳහා ගෙවීමට ඇති මිල හෝ මුදල් ප්‍රමාණය කොතෙක් ද යන්න;

(ඇ) ඒ වැඩය හෝ සේවය හෝ සම්පූර්ණ කළ යුතු වන්නේ, නැතහොත් භාණ්ඩ හෝ ද්‍රව්‍ය හෝ සැපයිය යුතු වන්නේ, කවර කාලයක් හෝ කවර කාල තුළ දී ද යන්න; සහ

(ඈ) ගිවිසුම් කඩ කළහොත් පැනවෙන දඩය හෝ දණ්ඩන කවරේද යන්න.

**ටෙන්ඩර්.**

**229.** (1) 228 වන වගන්තියේ සඳහන් යම් ගිවිසුමකට එළඹීමට පෙර—

(අ) ගිවිසුම යථා පරිදි ඉටු කරනු ලැබීම සඳහා ප්‍රමාණවත් ඇපයක් ලබා ගන්නා ලෙස සභාව විසින් විධාන කළහොත් කොමසාරිස්වරයා විසින් එම ඇපය ලබා ගත යුතු ය;

(ආ) අන්‍යාකාරයකින් ටෙන්ඩර් කැඳවීමට සභාවේ විශේෂ යෝජනා සම්මතයකින් බලය දී ඇති විශේෂිත අවස්ථාවක දී හැර, ටෙන්ඩර් කැඳවීම කොමසාරිස්වරයා විසින් දැන්වීම් ප්‍රචාරය මගින් කළ යුතු ය;

(ඇ) ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් සහ ටෙන්ඩර් කිසිවක් වේ නම් ඒවා නොහොත් ඒවායේ පිටපත්, සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, සභාව විසින් ඒ ටෙන්ඩර් අතුරින් එකක් පිළිගත යුතු ය. එසේ නැතහොත් ඒ සියල්ල ප්‍රතික්ෂේප කළ යුතු ය; තව ද

(ඈ) තත් කාර්යය සඳහා අවශ්‍ය මුදල්, සම්මත කළ අය වැය ලේඛනයක් හෝ පරිපූරක අය වැය ලේඛනයක් මඟින් වෙන් කර ඇති බවට සභාව සෑහීමට පත් වූ පසු, සභාව විසින් ගිවිසුම අනුමත කළ යුතු ය.

(2) සභාව ඉදිරියෙහි තබන ලද සියලු ටෙන්ඩර් හෝ ඉන් යම් ටෙන්ඩරයක් හෝ සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ (1) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම අනුමත කිරීම සභාව විසින් පැහැර හරිනු ලැබුවහොත්, මේ වගන්තියේ (1) වන උප වගන්තියෙහි (ඇ) සහ (ඈ) ඡේදවල කවර විධිවිධානයක් තිබුණ ද, නගරාධිපතිවරයා විසින් අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව, එම ගිවිසුමට ඇතුළු විය හැකි ය. [1977 අංක 24 §110]

---

## XII වන කොටස

### වරිපනම් බදු සහ බදු

230*. (1) මෙහි මින් මතු සඳහන් කරනු ලබන විධිවිධානවලට යටත් ව, සෑම මහා නගර සභාවක් විසින් ම, කලින් කළ, එකී මහා නගර සභාව විසින් අවශ්‍ය යැයි කල්පනා කරන අවස්ථාවල දී, අමාත්‍යවරයාගේ අනුමතය ඇති ව, මහා නගරය තුළ පිහිටි සෑම වර්ගයකට ම අයත් සියලු ම ගෙවල්වල හා ගොඩනැගිලිවල ද සියලු ම ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල ද වාර්ෂික වටිනාකම මත යම් වරිපනම් බද්දක් හෝ වරිපනම් බදු සැකසීම හා තක්සේරු කිරීම කළ යුතු ය. දේපළ තක්සේරු කිරීම.

(1අ) මහා නගර සභාවක (1) වන උපවගන්තිය යටතේ වූ බල තල අනු ව, අමාත්‍යවරයාගේ අනුමතය ඇති ව යම් සභාවක් විසින්, මහා නගරයේ වෙන් වෙන් ප්‍රදේශ හෝ කොටස් සඳහා, ඒ එක් එක් ප්‍රදේශයට හෝ කොටසට ඒ සභාව විසින් සලස්වා ඇති සේව යන් අනුව, වෙන් වෙන් වරිපනම් බදු ප්‍රමාණයක් පැනවිය හැකි ය. [1967 අංක 8§2.]

(1අඅ) වෙළෙඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් සඳහා වැඩි වරිපනම් බදු ප්‍රමාණයක්, (1) වන උප වගන්තිය යටතේ වූ බලතල ප්‍රකාර සභාව විසින් පැනවිය හැකි ය. [1981 අංක 10§2 ]

(1අආ) (අ) සභාව (ආ) ඡේදය යටතේ තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයක් නොඉක්මවන වාර්ෂික වටිනාකමක් ඇති සියලු නේවාසික ස්ථාන, සභාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, වරිපනම් ගෙවීමෙන් නිදහස් කළ හැකි ය.

---

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාල කිරීම ලිහිල් කරන ලදී. එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

(ආ) නිදහස් කරනු ලැබිය හැකි නේවාසික ස්ථානවල වාර්ෂික වටිනාකමේ ප්‍රමාණය තීරණය කිරීමේ දී සභාව විසින්—

(i) මහා නාගරිකයේ සංවර්ධන තත්ත්වය ;

(ii) වඩා අඩු වාර්ෂික වටිනාකමක් ඇති නේවාසික ස්ථානවලට සභාව මගින් සලසන සේවාවල හා පහසුකම්වල ස්වභාවය ;

(iii) යම් නිදහස් කිරීමක් දීමේ හේතුවෙන් සිදු විය හැකි ආදායම අඩු වීම හා ඒ අඩුව පියවා ගැනීම සඳහා සභාව විසින් යෝජනා කරනු ලබන ක්‍රියා මාර්ග

සැලකිල්ලට ගත යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ විධිවිධාන යටතේ යම් නේවාසික ස්ථානයක් නිදහස් කරනු ලැබූ විට, එකී නිදහස් කරනු ලැබීමේ වාසිය එහි පදිංචිකරුට උපචිත විය යුතු ය.

[1979 අංක 57§2.] (1ආ) යම් පසුගිය වර්ෂයක් තුළ මේ වගන්තිය යටතේ සභාව විසින් නියම කරන ලද වරිපනම් බදු—

(අ) ප්‍රමාණවත් සේවා නොසලස්වා නියම කර ලැබ තිබෙන බව අමාත්‍යවරයාගේ මතය වන්නා වූ ද ; නැතහොත්

(ආ) සම්පූර්ණයෙන් ම හෝ ඒ වරිපනම් බදුවලින් යම් කොටසක් සහ ඒ වරිපනම් බදු අය කර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත්හැරීම සියලු අවස්ථානුගත කරුණු අනුව යුක්තිසහගත හා සාධාරණ බව ආණ්ඩුවේ අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නාවූද

අවස්ථාවක, ඒ වරිපනම් බදු සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් බදු අය කර ගැනීමේ කාර්යය සඳහා දරන ලද ගාස්තු කිසිවක් අත්හැරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය.

[1979 අංක 57§2.] (1ඇ) නියම කරනු ලැබූ යම් වරිපනම් බද්දක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් සහ දරන ලද යම් ගාස්තු ද අත්හැරීමට (1ආ) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ වරිපනම් බදු සහ දරන ලද යම් ගාස්තු ද ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, අත්හරිනු ලැබූ වරිපනම් බදුවල සහ ගාස්තුවල මුදල් ප්‍රමාණය ඒ වරිපනම් බදු ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අය විය යුතු වරිපනම් බදු වෙනුවට හිලව් කිරීම ; හෝ

(ආ) ඒ වරිපනම් බදු සහ දරන ලද යම් ගාස්තු ද ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී ඒ වරිපනම් බදුවල සහ දරන ලද ගාස්තුවල මුදල් ප්‍රමාණය අත්හැරීම

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසි ම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.

(2) ඒ වරිපනම් බද්ද හෝ වරිපනම් බදු—

(අ) මාස දොළහක් නොඉක්මවන යම් කාලසීමාවක් පැවතිය යුතු ය,

(ආ) අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලබන උපරිම වරිපනම් බද්දේ හෝ වරිපනම් බදුවල එකතුව නොඉක්මවිය යුතු ය,

(ඇ) සභාවේ අනුමතය ඇති ව, නගරාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි වාරිකවලින් හා වේලාවන්හි දී ගෙවිය යුතු ය,

(ඈ) මෙම ආඥාපනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින් හෝ විධිවිධාන සලස්වා ඇති ආකාරයට තක්සේරු කොට අය කර ගත යුතු ය :

එසේ වුව ද—

(i) ඒ වරිපනම් බද්ද හෝ වරිපනම් බදු වෙනුවෙන් කිසි ම ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් සඳහා අවුරුද්දකට රුපියලකට අඩුවෙන් නොගෙවිය යුතු ය ;

(ii) මහා නගර සභාව විසින් සලස්වා ඇති කසළ ශෝධන සේව යෙන් ප්‍රයෝජන නොලබන ප්‍රදේශයක් ඇතුළත පිහිටා ඇති සියලු ගෙවල්, ගොඩනැගිලි, ඉඩම් හෝ ගෙපත්, සේවය සැලැස්වීම සඳහා අය කළ යුතු යැයි මහා නගර සභාවේ යෝජනා සම්මතයකින් නියම කර ඇති වරිපනම් බද්දේ හෝ වරිපනම් බදුවල යම් කොටසකින් නිදහස් කළ යුතු ය ; තව ද

(iii) සියලු පාසැල් ගොඩනැගිලි, ආගමික කාර්යයන් සඳහා මුළුමනින් ම හෝ ප්‍රධාන වශයෙන් පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි, මහජන පුස්තකාල, භූමදානය හා ආදාහන භූමි හා යුද්ධ හමුදා මුර භටයන් භාරයේ පවත්නා ගොඩ නැගිලි ඒ වරිපනම් බද්දෙන් හෝ වරිපනම් බදු වලින් නිදහස් කළ යුතු ය.

(3) උප වගන්තිය අත්හරින ලදී.— [1986 අංක 39§52]

[85 අංක 20§2.]

(4) තම වරිපනම් බදු කලින් ගෙවන වරිපනම් බදු ගෙවන්නන්ට හිමිකම් ලැබිය හැකි වට්ටම් ප්‍රමාණය නිශ්චය කරමින් අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සාදනු ලැබිය හැකි ය.

රජයේ දේපළ තක්සේරු කිරීම.

231.* මහා නගරය ඇතුළත ඇති රජයට අයත් හා රජය විසින් යම් තැනැත්තකුට බද්දට හෝ කුලියට දී ඇති සියලු ම ගෙවල්, ගොඩනැගිලි, ඉඩම් හා ගෙපත්, 230 වන වගන්තිය යටතේ අය කර ගත යුතු වරිපනම් බද්ද හෝ වරිපනම් බදු සඳහා තක්සේරු කිරීමට යටත් විය යුතු ය; එකී යම් ස්ථානයක සෑම බදුකරුවකු හෝ පදිංචිකරුවකු, තමා එසේ දරමින් හෝ පදිංචිව සිටින ගෙය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත වෙනුවෙන් ගෙවිය යුතු ව ඇති වරිපනම් බද්ද හෝ වරිපනම් බදු ගෙවීමට යටත් වන අතර, ඔහු විසින් මහා නගර සභාවට එකී ගෙවීම් කළ යුතු ය.

රජයේ දේපළ තහනමට ගැනීමට හා විකිණීමට යටත් නොවන

232.* රජයේ දේපළ වන යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් ප්‍රකාශිත හෝ ව්‍යාපිත යන දෙයාකාරයෙන් එක් ආකාරයකින් රජය සමඟ ඇති කර ගත් හෝ රජයෙන් ලැබුණු යම් එකඟ වීමක්, ගිවිසුමක් හෝ අවසරයක් පිට දරන්නා වූ, පදිංචිව සිටින්නා වූ හෝ භුක්ති විඳින්නා වූ යම් තැනැත්තකුගෙන් අය විය යුතු ව ඇති යම් වරිපනම් බද්දක් හෝ වරිපනම් බදු අය කර ගැනීම සඳහා චංචල වූ හෝ නිශ්චල වූ කවර හෝ ආකාරයක රජයේ දේපළක් තහනමට ගැනීමට හෝ විකිණීමට යටත් නොවිය යුතු ය.

තක්සේරු කිරීම සඳහා දේපළ බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම.

233.† (1) සභාව විසින් අවශ්‍ය යැයි කල්පනා කරනු ලබන සියලු අවස්ථාවල දී, තක්සේරු කිරීමේ කාර්යය සඳහා, මහා නගරය ඇතුළත පිහිටි කවර හෝ යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් බෙදා වෙන් කිරීම සහ වෙන් වෙන් ව වූ ගෙවල්, ගොඩනැගිලි, ඉඩම් හෝ ගෙපත් ඒකාබද්ධ කිරීම ද, මෙම ආඥාපනත යටතේ අය කර ගත හැකි යම් වරිපනම් බද්දක් හෝ

---

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය කින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලිහිල් කරන ලදී. එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

† වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය කින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බල සහිත නොවිය යුතු ය. එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

වරිපනම් බදු සඳහා එසේ බෙදා වෙන් කළ එක් එක් කොටසක් වෙන් වෙන්වත් එසේ ඒකාබද්ධ කළ එක් එක් ස්ථානයක් සමස්තයක් ලෙසත් තක්සේරු කිරීම ද සභාව විසින් කලින් කල කළ හැකි ය:

එසේ වුව ද, එකී යම් ඒකාබද්ධ කිරීමක දී, ඒකාබද්ධ කරන ලද ස්ථානය තක්සේරු කළ යුතු වන්නේ ඒ ස්ථානයට අඩංගු වූ වෙන් වෙන් ගෙවල්වල, ගොඩනැගිලිවල, ඉඩම්වල හෝ ගෙපත්වල වාර්ෂික වටිනාකමෙහි එකතුව අනුව විය යුතු ය.

(2) ඒ එක් එක් ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ සෑම පදිංචිකරුවකු ම, එම පදිංචිකරු, අයිතිකරු, හවුල් අයිතිකරු හෝ කුලී නිවැසියකු වූයේ වී නමුත්, ඒ බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ දැන්වීමක් මහා නගර සභාව විසින් භාර දීමට සැලැස්විය යුතු ය.

(3) මෙම වගන්තියෙහි සඳහන් කිසිවක්, තක්සේරු දැන්වීම් භාර දීම සම්බන්ධයෙන් වූ 235 වන වගන්තියේ නියමයක් කෙරෙහි බල පාන සේ නොසැලකිය යුතු ය.

(4) එසේ කටයුතු කරනු ලැබූ යම් ස්ථානයක තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම, ඒ බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම හේතුකොටගෙන, ඒ බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම කරනු ලැබූ වර්ෂය සඳහා, වැඩි කිරීම හෝ අඩුකිරීම නොකළ යුතු ය.

234.* (1) වරිපනම් බදු පැනවීමට යටත් යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට මහා නගර සභාවකට හැකි වනු සඳහා, ඒ ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම පිළිබඳ වාර වාර්තා සපයන ලෙස ඒ සභාව විසින් නියම කළ හැකි ය. තව ද, මහා නගර සභාව විසින්, තත් කාර්ය සඳහා බලය පවරන ලද යම් තැනැත්තකු ඒ කාර්යය සඳහා ඉරු නැගීමේ සිට ඉරු බැසීම තෙක් වූ කාලය අතරතුර යම් වේලාවක එකී යම් ගෙයකට, ගොඩනැගිල්ලකට, ඉඩමකට හෝ ගෙපතකට ඇතුළු වීම ද, එය පරීක්ෂා කිරීම හා මැනීම ද නීත්‍යානුකූල විය යුතු ය. තක්සේරු කිරීමේ කාර්යයන් සඳහා වූ වාර වාර්තා.

(2) පදිංචිය පිණිස අදහස් කරනු ලැබූ යම් ගොඩනැගිල්ලක් හෝ පවත්නා යම් ගොඩනැගිල්ලකට යම් එකතු කිරීමක් ඉදි කිරීම

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය. එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

සම්පූර්ණ වූ බව, මහා නගර සභාව වෙත ලියවිල්ලකින් දැනුම් දීම, යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක අයිතිකරුගේ යුතුකම විය යුතු ය.

(3) (අ) මෙහි නිශ්චිත ව සඳහන් වාර වාර්තාව සපයන ලෙස නියම කරනු ලැබූ දින සිට දවස් හතක් ඇතුළත එම වාර වාර්තාව සැපයීම පැහැර හරින හෝ නොසලකා හරින ; හෝ

(ආ) දැනුවත්ව ම අසත්‍ය හෝ සාවද්‍ය වාර වාර්තාවක් සපයන ; හෝ

(ඇ) ඉහත සඳහන් පරිදි බලය පවරන ලද යම් තැනැත්තකුට එකී යම් ගෙයකට, ගොඩනැගිල්ලක, ඉඩමකට හෝ ගෙපතකට ඇතුළු වීමට හෝ පරීක්ෂා කිරීමට හෝ අවශ්‍ය වූයේ නම් මැනීමට අවහිර කරන, බාධා කරන හෝ ඔහු වළක්වන ; හෝ

(ඈ) යම් අලුත් ගොඩනැගිල්ලක් හෝ පවත්නා යම් ගොඩනැගිල්ලකට යම් එකතු කිරීමක් ඉදිකිරීම සම්පූර්ණ වූ බව ඒ සම්පූර්ණ කිරීමේ දිනයෙන් පසු දවස් දහහතරක ඇතුළත නිවේදනය කිරීම පැහැර හරින

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

[1986 අංක 39 §53]

දේපළ තක්සේරු කිරීම.

235.* (1) මහා නගරය ඇතුළත වූ එක් එක් ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ සෑම අවුරුද්දක ම වාර්ෂික වටිනාකම ඇතුළත් කර තිබිය යුතු "තක්සේරු පොත" නමින් හඳුන්වනු ලබන පොතේ තබා ගැනීමට සභාව විසින් ක්‍රියා කළ යුතු අතර, එම පොත පිළිබඳව් හා තක්සේරු පොත පරීක්ෂා කර බැලීම සඳහා තබා තිබෙන ස්ථානය පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් කළ යුතු ය.

(2) යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක සෑම අයිතිකරුවකුට හෝ පදිංචිකරුවකුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකුට, සිය ස්ථානයකට අදාළ වන එකී තක්සේරු පොතේ යම් කොටසක් අය කිරීමකින් තොරව පරීක්ෂා කර බැලීමට අවසර දිය යුතු ය.

---

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය කින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය. එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

(3) තක්සේරු කරන ලද ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක පදිංචිකරු එම ස්ථානයේ අයිතිකරු, හවුල් අයිතිකරු හෝ කුලී නිවැසියා වුවත්, එකී සෑම පදිංචිකරුවකුහට ම සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් වූ තක්සේරු දැන්වීමක් භාර දීමට හෝ එම ස්ථානයේ තැබීමට මහා නගර සභාව විසින් සැලැස්විය යුතු ය. එකී දැන්වීම තුන් වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර, අය කර ගත යුතුව ඇති වරිපනම් බදු මුදල හෝ වරිපනම් බදු මුදල් සාධාරණ යැයි සභාව විසින් සලකනු ලබන කාල සීමා හා ප්‍රමාණ අනුව මහා නගර සභාවට ගෙවන ලෙස ඉල්ලා සිටින නිවේදනයක් ද එම දැන්වීමට අනුබද්ධ කොට තිබිය යුතු ය.

(4) තක්සේරුවට විරුද්ධව කෙරෙන ලිඛිත විරෝධතා, දැන්වීම භාර දුන් දිනයේ සිට මාසයක් ඇතුළත දී මහා නගර සභා කාර්යාලයට ලැබිය යුතු බව ඒ දැන්වීමෙහි තව දුරටත් සඳහන් ව තිබිය යුතු ය.

(5) මහා නගර සභාව විසින් "විරුද්ධතා පොත" නමින් හඳුන්වනු ලබන පොතක් තබා ගැනීමට සැලැස්විය යුතු අතර, එහි, තක්සේරුවකට වූ සෑම විරුද්ධතාවක් ම ලියාපදිංචි කළ යුතු ය. එක් එක් විරෝධකයකුගේ විරුද්ධතා විමර්ශනය කරනු ලබන දිනය, ස්ථානය හා වේලාව මහා නගර සභාව විසින්, ඒ විරෝධකයාට ලිය විල්ලකින් දැනුම් දිය යුතු ය.

(6) එසේ නියම කරන ලද වේලාවේ දී හා ස්ථානයේ දී මහා නගර සභාව විසින් එක් එක් විරෝධකයා හෝ ඔහුගේ ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිතයෙක් පැමිණ සිටින්නේ නම් එකී විරෝධකයා හෝ නියෝජිතයා ඉදිරියේ දී හෝ විරෝධකයා හෝ ඔහුගේ නියෝජිතයා පැමිණ නොසිටින්නේ නම් ඔහුගේ අනතිමුඛයේ දී විරුද්ධතා විමර්ශනය කිරීමට සැලැස්වි ය යුතු ය. සාධාරණ හේතුවක් උඩ ඒ විමර්ශනය වරින් වර අඩාලව කල් තැබිය හැකි ය.

(7) තක්සේරුවක් කෙරෙහි වූ යම් විරුද්ධතාවක් පිළිබඳ කට යුතු කළ කල්හි, ඒ පිළිබඳ තීරණය විරෝධකයාට දැනුම් දීමට සැලැස්වීම ද එම තීරණය විරුද්ධතා පොතෙහි සටහන් කිරීම ද වරිපනම් පොතෙහි යම් අවශ්‍ය සංශෝධනයක් කිරීම ද සභාව විසින් කළ යුතු ය.

(8) කිසි ම විරුද්ධතා දැන්වීමක් නොකරන ලද සෑම තක්සේරුවක් ම ඒ වර්ෂය සඳහා අවසානාත්මක විය යුතු ය.

තක්සේරුව කෙරෙහි විරුද්ධතාව දැක්වූ අවස්ථාවෙදී ක්‍රියාමාර්ග ආදිය.

236.* (1) යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක තක්සේරුව සම්බන්ධයෙන් 235 වන වගන්තිය යටතේ වූ තීරණයෙන් අතෘප්ත සෑම තැනැත්තකු විසින් ම, තීරණය පිළිබඳ නිවේදනය ලැබී දවස් තිහක් ඇතුළත දී, ඒ ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ හෝ, ඒකාබද්ධ කරනු ලැබූ අවස්ථාවක නම් එසේ ඒකාබද්ධ කරන ලද ඒ ගෙවල්වල, ගොඩනැගිලිවල, ඉඩම්වල හෝ ගෙපත්වල වාර්ෂික වටිනාකම මත වූ වරිපනම් බද්දේ හෝ වරිපනම් බදුවල ප්‍රමාණය රුපියල් එක් දහස් පන්සියය නොඉක්මවන විට ඒ ගෙය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති ප්‍රාථමික අධිකරණයෙහි හෝ ඒ මුදල් ප්‍රමාණය රුපියල් එක් දහස් පන්සියය ඉක්මවන විට ඒ අධිකරණ බලය ඇති දිසා අධිකරණයෙහි ඒ තීරණයට විරුද්ධව නඩුවක් පැවරිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ යම් නඩුවක් විභාග කිරීමේ දී, පැමිණිලිකරු විසින් තක්සේරුවට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ ලිඛිත විරුද්ධතාවෙහි සඳහන් නොවුණු යම් විරුද්ධතා හේතුවක් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමට පැමිණිලිකරුට ඉඩ නොදිය යුතු ය.

(3) ඒ සෑම අධිකරණයක් විසින් ම එය හමුවට පමුණුවනු ලබන නඩු විභාග කිරීම හා තීරණය කිරීම විධිමත් කරමින් තත් කාලයෙහි බල පවත්නා නීතියෙන් ඒ අධිකරණය උදෙසා නියමිත ව ඇති කාර්ය පටිපාටිය අනුව ඒ නඩුව විභාග කොට තීරණය කළ යුතු ය. තව ද, ඒ සෑම විට ම ඒ අධිකරණයේ තීරණය අභියාචනාධිකරණය වෙත අභියාචනය කිරීමට යටත් විය යුතු ය.

(4) ඒ සෑම අභියාචනයක් ම සිවිල් නඩු විධාන සංග්‍රහයේ LVIII වන පරිච්ඡේදයේ විධිවිධාන වලින් හෝ ප්‍රාථමික අධිකරණයක නොහොත් දිසා අධිකරණයක යම් නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට හෝ ආඥාවකට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනය කිරීම විධිමත් කිරීම සඳහා මින් මතු පනවනු ලැබිය හැකි යම් ප්‍රඥප්තියකින් පාලනය විය යුතු ය.

(5) ඒ නඩුව පවරා තිබීම හෝ එහි යම් අභියාචනයක් කර තිබීම හේතුකොට ගෙන ඒ වරිපනම් බදු මුදල හෝ වරිපනම් බදු මුදල් මුළුමණින්ම හෝ එහි යම් කොටසක් අය කර ගැනීම නතර නොකළ යුතු අතර, අය කර ගනු ලැබූ මුදලෙහි යම් අතිරික්තයක් වේ නම් එම අතිරික්තය අභියාචනයක් නොමැති නම් ඒ ප්‍රාථමික අධිකරණයේ හෝ දිසා අධිකරණයේ තීරණය අනුව හෝ අභියාචනයක් වී නම් අභියාචනාධිකරණයේ තීරණය අනුව, ආපසු ගෙවිය යුතුය.

*වරිපනම හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය. එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

වාර්ෂික වටිනාකමට බලපාන සේ දේපළ වෙනස් කිරීම නිසා තක්සේරුව ප්‍රතිශෝධනය කිරීම.

**237.*** (1) යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක යම් වර්ෂයක් සඳහා වූ තක්සේරුව ඉහතින් වූ වගන්ති ප්‍රකාර අවසාන වීමෙන් පසු එකී ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ වාර්ෂික වටිනාකමට බල පාන ලෙස එහි භෞතික වෙනස් කිරීම් කරන ලද අවස්ථාවක, එකී වගන්තිවලට පටහැනිව කුමක් සඳහන් වුවද, මහා නගර සභාවක් විසින් ඕනෑම අවස්ථාවක ඒ ස්ථානය සඳහා අලුත් තක්සේරුවක් පිළියෙල කළ හැකිය.

(2) ඒ සෑම අලුත් තක්සේරුවක් ම, එය වරිපනම් පොතෙහි ඇතුළත් කිරීමට යෙදුණු මාසයට පසුව එළඹෙන මාසයේ පළමුවන දින සිට බල පැවැත්විය යුතුය:

එසේ වුවද, ඒ අලුත් තක්සේරුව හැකිතාක් දුරට ඉහතින් වූ වගන්තිවලින් නියම කර ඇති ආකාරයට කළ යුතු අතර, එහි සඳහන් විරුද්ධතාවලට, විමර්ශනවලට, නඩුවලට හා අභියාචනාවලට යටත් විය යුතුය.

වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීම. [1979 අංක 57§3]

**238*.** (1) අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් විධානය කරනු ලැබූ විට පමණක් මහා නගර සභාවක් විසින් අලුත් තක්සේරුවක් සකස් කළ යුතුය. යම් මහා නගර සභා ප්‍රදේශයක, ඒ මහා නගර සභා ප්‍රදේශයේ අලුත් සේවාවන් සැලසීම හෝ දැනට පවත්නා සේවාවන් වැඩි දියුණු කිරීම සැලකිල්ලට ගෙන, යම් පන්තියකට හෝ වර්ගයකට අයත් නිශ්චල දේපළ හෝ සියලු නිශ්චල දේපළ සම්බන්ධයෙන් අලුත් තක්සේරුවක් සකස් කිරීමට අමාත්‍යවරයා විසින් විධානය කළ හැකිය. අමාත්‍යවරයාගේ විධාන මත අලුත් තක්සේරුවක් කර ගෙන යනු ලබන විට හැර, විශේෂ අවස්ථාවල දී අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් වෙනස් කිරීම් සමග ඉහතින් වූ වර්ෂය සඳහා අගැයුම් හෝ තක්සේරුව, පසුව එළඹෙන වර්ෂය සඳහා අගැයුම් හෝ තක්සේරුව වශයෙන්, සභාව විසින් සම්මත කළ යුතුය:

එසේ වුවද, සෑම විටම ඒ අගැයුම සහ තක්සේරුව පිළිබඳ දැන්වීම නියමිත ආකාරයෙන් දෙනු ලැබිය යුතුය.

(2) අමාත්‍යවරයා වෙත කරනු ලැබූ කරුණු ඉදිරිපත් කිරීම් හේතුවෙන් හෝ අමාත්‍යවරයාගේ ම කැමැත්ත අනුව හෝ සුදුසු යැයි ඔහු විසින් සලකනු ලැබිය හැකි ආකාරයකින්, යම් පසු ගිය වර්ෂයක් සම්බන්ධයෙන් තත් කාලයේ දී සලසා තිබූ සේවාවන් සැලකිල්ලට ගෙන, වාර්ෂික වටිනාකම් තක්සේරුව ප්‍රතිශෝධනය කිරීම ඔහු විසින් විධානය කළ හැකිය.

---

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය. එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ විධානයක් අනුව තක්සේරු ප්‍රතිශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් දේපළක් සම්බන්ධයෙන් වරිපනම් අඩු කිරීමක් සිදු වී ඇති විටෙක—

(අ) ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අය විය යුතු වරිපනම් වෙනුවට එසේ අඩු කරනු ලැබූ වරිපනම් සහ ඒ වරිපනම් අය කර ගැනීමේ කාර්යය සඳහා දරන ලද ගාස්තු ද හිලව් කිරීම ; හෝ

(ආ) ඒ වරිපනම් ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී ඒ වරිපනම් සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය අත් හැරීම

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.

ඇතැම් අවස්ථාවලදී තක්සේරු ප්‍රතිශෝධනය කිරීම හා වරිපනම් බදු මුදල් අඩු කිරීම.

**239*.** සුදුසු යැයි සභාවට පෙනී යන පරිදි යම් තක්සේරුවක් යම් වේලාවක දී වැඩි කරමින් හෝ අඩු කරමින් එය ප්‍රතිශෝධනය කිරීමට හා ප්‍රතිශෝධිත තක්සේරුව බල පවත්වන දිනය නියම කිරීමට සභාවට බලය හා අධිකාරය තිබිය යුතුය.

නැතැතියාව නොමැති අවස්ථාවලදී වරිපනම් බදු මුදල් අඩු කිරීම.

**240*.** (1) ගෘහ භාණ්ඩ තබා ඇති ගොඩනැගිල්ලක් නොවන යම් ගොඩනැගිල්ලක් තැනැතියාව නොමැති ව තිබෙන්නේ නම් හෝ පවතින්නේ නම්, ඒ ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවිය යුතු වරිපනම් බදුවලින් සහ බදුවලින්, ඒ ගොඩනැගිල්ල තැනැතියාව නොමැති ව තිබෙන හෝ පවතින කාල සීමාව සඳහා, සමානුපාතික අඩු කිරීමක් සඳහා ඉඩ දිය හැකි ය.

(2) ගෘහ භාණ්ඩ තබා ඇත්තා වූ ද ගෘහ භාණ්ඩ සහිත ව කුලියට දීමට අදහස් කරනු ලබන ගොඩනැගිල්ලක් ලෙස සභාවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද යම් ගොඩනැගිල්ලක් තැනැතියාව නොමැති ව තිබෙන්නේ නම් හෝ පවතින්නේ නම්, ඒ ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවිය යුතු වරිපනම් බදුවල සහ බදුවල එක් අර්ධයකින්, එසේ ගොඩනැගිල්ල තැනැතියාව නොමැති ව තිබෙන හෝ පවතින කාල සීමාව සඳහා සමානුපාතික අඩු කිරීමක් සඳහා ඉඩ දිය හැකි ය.

---

*වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය. එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

(3) යම් ගොඩනැගිල්ලක් වෙනුවෙන්, (1) වන හා (2) වන උපවගන්ති යටතේ අඩු කිරීමක් සඳහා ඉඩ දෙනු ලබන කාල සීමාව එම ගොඩනැගිල්ල නැනැතියාව නොමැති ව පවතින බවට වූ ලිඛිත දැන්වීමක් මහා නගර සභාවට ලැබුණු දිනයෙන් ආරම්භ ව එය නැවත පදිංචියට ගත් දිනයෙන් අවසන් විය යුතු ය:

එසේ වුව ද, නැවත පදිංචියට ගැනීමෙන් පසු දවස් තුනක් ඇතුළත ඒ පිළිබඳ දැන්වීම සභාවට නොදෙනු ලැබී නම්, එකී කාල සීමාව, ඒ ගොඩනැගිල්ල නැවත පදිංචියට ගත් දිනයට මාසයකට කලින් වූ දිනයේ දී අවසන් විය යුතු ය.

මේ උපවගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් සම්බන්ධයෙන් පැනනැගිය හැකි සියලු ලියකියවිලි තැපැල් කර යැවිය හැකි වන ලිපිනයක්, එකී සෑම දැන්වීමක ම ඇතුළත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ අඩු කිරීමක් සඳහා වන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් යම් ගොඩනැගිල්ලක් නැනැතියාව නොමැති ව තිබෙන හෝ පවතින කාල සීමාව පිළිබඳ ව ආරවුලක් පැනනැගුනු කල්හි, ඒ ගැන සභාවේ තීරණය පිළිබඳ ලිඛිත දැන්වීමක් (3) වන උපවගන්තිය යටතේ දෙන ලද ලිපිනය අතුරින් අන්තිමට වූ ලිපිනයට තැපැල් මගින් යැවිය යුතු ය. තව ද, ඒ දැන්වීම තැපැල් මගින් යවන ලද දිනයේ සිට දවස් හතක් ඇතුළත එම තීරණය පුනිශෝධනය කිරීම සඳහා ලිඛිත ඉල්ලීමක් සභාවට ඉදිරිපත් නොකළහොත් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් සභාව විසින් ඒ තීරණය ප්‍රතිශෝධනය නොකළහොත්, ඒ තීරණය, අවසානාත්මක විය යුතු ය.

241.* යම් ත්‍රෛමාසිකයක් අවසන් වී නම් එම ත්‍රෛමාසිකය සඳහා වූ යම් වරිපනම් බද්දක් හෝ වරිපනම් බදු ගෙවීමට යටත් වන යම් තැනැත්තකු මහා නගරයෙන් පිට වී යැමට සූදානම් වන බව ඒ ත්‍රෛමාසිකය තුළ දී විශ්වාස කිරීමට සභාවට හේතු ඇත් නම්, එම ත්‍රෛමාසිකයේ ආරම්භයේ සිට ප්‍රකාශයට පත් කරනු ලබන දිනය දක්වා වූ වරිපනම් බද්දක් හෝ වරිපනම් බදු වහා ම ගෙවීමට ඒ තැනැත්තා යටත් වන බවට සභාව විසින් ප්‍රකාශයක් කළ හැකි ය. තව ද එසේ අය වීමට ඇතැයි ප්‍රකාශයට පත් කරන ලද ඒ වරිපනම් බද්ද හෝ වරිපනම් බදු, සාමාන්‍ය අවස්ථාවල දී ඒ වරිපනම් බද්ද හෝ වරිපනම් බදු අය කර ගන්නා ආකාරයට හා සෑම අතින් ම ඊට සමාන වූ ආකාරයට නොපමාව අය කර ගත හැකි විය යුතු ය. මහ නගරයෙන් පිටවී යන තැනැත්තන්ගේ බැඳීම.

*වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය කින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය.—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

වංචල දේපල තහනම් කිරීම.

242.* මේ ආඥාපනත යටතේ යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් වෙනුවෙන් යම් වරිපනම් බද්දක් හෝ වරිපනම් බදු අය විය යුතු ව ඇති විටෙක, ඒ ගෙය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත තුළ හෝ ඒ මත ඇති කිසිම වංචල දේපලක්, ඒ දේපල තහනමට ගන්නා අවස්ථාව පූර්වයෙන් වූ ත්‍රෛමාසික දෙකට එපිට ත්‍රෛමාසික සඳහා හිඟ මුදල උපචිත වූ හා අය විය යුතු ව තුබූ වේලාවේ දී එකී ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ අයිතිකරුට හෝ සම අයිතිකරුට අයත් ව ඇත්තේ නම් හෝ එකී අන්තිමට සඳහන් හිඟ මුදල උපචිත වූ හා අය විය යුතු ව තුබූ වේලාවේ දී එකී ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ පදිංචිව සිටි යම් තැනැත්තකුට ඒ වංචල දේපළ අයත් ව ඇත්තේ නම් මිස, ඒ හිඟ වරිපනම් බද්ද හෝ වරිපනම් බදු අය වීමට ඇත්තේ ඒ දේපල තහනමට ගන්නා අවස්ථාවට පූර්වයෙන් වූ ත්‍රෛමාසික දෙකට එපිට ත්‍රෛමාසික සඳහා නොවේ නම්, සභාව විසින් තහනම් නොකළ යුතු ය.

බදු කරු විසින් ගෙවන ලද වරිපනම් බදු කුලියෙන් අඩුකිරීම.

243.* යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක අයිතිකරු හෝ සම අයිතිකරු නොවන්නා වූ පදිංචිකරුවකුගේ දේපළ ඉහත කී ලෙස තහනම් කරනු ලැබ ඇති විට හෝ තහනම් කිරීම වළක්වාලීම පිණිස හෝ, තහනම් කිරීමෙන් පසු ඒ දේපළ විකිණීම වළක්වාලීම පිණිස, ඒ ගෙය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත වෙනුවෙන් අය විය යුතුව ඇති වරිපනම් බද්දේ හෝ වරිපනම් බදු වල මුදල හා ගාස්තු ඒ පදිංචිකරු විසින් ගෙවනු ලැබූ විට, ඔහු විසින් එසේ ගෙවන ලද මුදල එකී ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ කුලිය වශයෙන් එහි අයිතිකරුට හෝ අයිතිකරුවන්ට ඔහුගෙන් අය විය යුතු මුදලින් අඩු කර ගත හැකි ය. එසේ ගෙවන ලද මුදල සඳහා නගරාධිපතිවරයා විසින් දෙන ලද කුවිතාන්සිය ඒ හා සමාන මුදලක් කුලී වශයෙන් ගෙවීමට සම්පූර්ණයෙන් ම සමාන සේ සැලකිය යුතු ය:

එසේ වුව ද, යම් පදිංචිකරුවකු තමා බැඳී සිටින බදුකරයක හෝ ගිවිසුමක නියමයන් අනුව ඒ වරිපනම් බද්දක් හෝ වරිපනම් බදු ගෙවීමට තමා ම යටත් ව සිටින විට, එම පදිංචිකරු විසින් කුලියෙන් එවැනි යම් අඩු කිරීමක් කිරීම සඳහා මෙහි සඳහන් කිසිවකින් බලය නොලැබිය යුතු ය.

*වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය කින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය.—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

244.* වරිපනම් බද්ද හෝ බදු ගෙවීමට යටත් යම් තැනැත්තකුගේ නමෙහි හෝ වරිපනම් බද්දට හෝ බදු වලට යටත් යම් දේපලක හෝ දෙයක විස්තරයෙහි වූ වරදක් නිසා, හෝ, තක්සේරු මුදලේ හෝ තහනම් කිරීම හා විකිණීම පිළිබඳ ක්‍රමයේ වරදක් තිබීමේ හේතුව නිසා, කිසි ම තක්සේරුවක් හෝ අගැයුමක් හා මෙම ආඥාපනතේ අධිකාරය යටතේ වූ වරිපනම් බද්දක් හෝ බදු අය කිරීමක් හෝ ඉල්ලීමක් ද කිසිම තහනම් කිරීමක් හා විකිණීමක් ද දෝෂාභියෝගයට හෝ බල පැමකට යටත් නොවිය යුතු ය; තව ද මෙම ආඥාපනතේ හෝ මෙම ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන සාරානුකූල ව හා ඵලදායි ලෙස සපුරාලීමට යෙදී ඇත්නම්, මේ ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා යටතේ වූ කිසිම නීති කෘත්‍යයක් එය විධිමත් නොවීම නිසා යම් අධිකරණයක් විසින් එම නීති කෘත්‍යය නිෂ්ප්‍රභ කිරීම හෝ ඉවතලීම නොකළ යුතු ය.

විධිමත් නොවීම නිසා තක්සේරුව ආදිය දෝෂාභියෝගයට භාජන නොකල යුතු බව.

245.* (1) හතරවන උපලේඛනයේ දැක්වෙන්නා වූ ද නම මහා නගර සභා ප්‍රදේශය තුළ තබා ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ ද සියලු වාහන සහ සතුන් වෙනුවෙන් ඒ උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයක වාර්ෂික බද්දක් සෑම මහා නගර සභාවක් ම විසින් අය කළ හැකි ය.

වාහන හා සතුන් පිළිබඳ බදු [1979 අංක 42 §4

(2) වාහන හා සතුන් සඳහා වූ බද්ද සභාව විසින් විධාන කළ හැකි කාලයන්හි දී ගෙවිය යුතු අතර, මෙහි මින්මතු සඳහන් කරනු ලබන ආකාරයට හෝ යම් අතුරු ව්‍යවස්ථා වලින් විධිවිධාන සලස්වනු ලබන ආකාරයට තක්සේරු කොට අය කර ගත යුතු ය. තව ද ඒ අතුරු ව්‍යවස්ථා සෑදීමට සභාවට මෙයින් බලය දෙනු ලැබේ.

(3) (අ) ජනාධිපතිවරයා විසින් හෝ ඔහුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය විසින් තබා ගනු ලබන හෝ ප්‍රයෝජනයට ගනු ලබන යම් වාහනයක් හෝ සතකු ; හෝ

(ආ) යම් කාල තුවක්කු ගැලක්, යුද්ධායුධ කරත්තයක් හෝ වැගන් රථයක් ; හෝ

(ඇ) යම් කාල තුවක්කු හමුදාවක හෝ අශ්වාරෝහක බල ඇණියක අශ්වයකු හෝ අශ්වාරෝහක පණිවිඩකරුවන්ගේ හෝ පොලීසියේ යම් අශ්වයකු ; හෝ

(ඈ) මහා නගරය තුළ, කාර්ය මණ්ඩල, රෙජිමේන්තු හෝ වෙනත් පොදු රාජකාර්යයෙහි යෙදෙන හමුදා නිලධරයන්ට අයත් බලය ලත් සංඛ්‍යාවකින් යුක්ත අශ්වයන් ; හෝ

(ඉ) රජයට අයත් වූ ද ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන් විසින් ප්‍රයෝජනයට ගනු ලබන්නා වූ ද යම් බයිසිකලයක්; හෝ

*වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය.—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

**(ඊ) අවසාන වාහන වෙළෙන්දකු විසින් විකිණීම සඳහා තබා ඇති යම් වාහනයක්**

සඳහා මෙම වගන්තිය යටතේ බද්දක් තක්සේරු කිරීම, පැනවීම හෝ අය කිරීම නොකළ යුතු ය.

වාහන හා සතුන් සඳහා වූ බද්ද කල් ඇතුව වාර්ෂිකව ගෙවිය යුතු බව.

**246.** (1) හතරවන උපලේඛනයේ නිශ්චිත ව සඳහන් වූ ද වාහන හා සතුන් සඳහා මෙම ආඥාපනත යටතේ අය කර ගත යුතු වූ ද වාර්ෂික බද්ද, බදු ගෙවීමට යටත් වන යම් වාහනයක් හෝ සතකු තම සන්තකයේ හෝ භාරයෙහි හෝ පාලනය යටතේ තබා ගන්නා එක් එක් තැනැත්තා විසින්, මහා නගරය ඇතුළත එකී වාහනය හෝ සතා තබා ගෙන සිටි හෝ ප්‍රයෝජනයට ගනු ලැබූ කාලය දවස් තිහක් වූ විගස ම, වාර්ෂික ව ගෙවිය යුතු ය. එහෙත්, යම් වර්ෂයක දවස් තිහකට අඩුවෙන් තම සන්තකයේ, භාරයේ හෝ පාලනය යටතේ වූ යම් වාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ විට, යම් තැනැත්තකු මෙම වගන්තියට යටත් නොවිය යුතු ය.

(2) අයිතිය පවරන ලද වර්ෂය වෙනුවෙන් බද්ද එවකටවත් ගෙවා ඇති යම් වාහනයක් හෝ සතෙකු සඳහා, අයිතිය පවරනු ලැබීමේ හේතුවෙන් බද්ද ගෙවීමට යම් තැනැත්තකු බැඳී නොසිටිය යුතු ය.

(3) යම් වාහනයක් හෝ සතෙකු යම් වර්ෂයක් තුළ මාස හයකට අඩුවෙන් තබා ගත් හෝ ප්‍රයෝජනයට ගත් බවට සභාවට සෑහීමට පත් වන සෑම අවස්ථාවක දී, එම වාහනය හෝ සතා සඳහා ගෙවනු ලැබූ බද්දෙන් භාගයක් ආපසු ගෙවිය යුතු ය.

ඇතැම් වරිපනම් බදු සඳහා අමාත්‍යවරයාගේ අනුමතය අවශ්‍ය නොවන බව.

**247.** මහා නගර සභාවක් විසින් යම් වර්ෂයක් තුළ මෙම ආඥාපනතේ විධිවිධාන යටතේ දේපළ මත යම් වරිපනම් බද්දක් සකස් කරන හා තක්සේරු කරන අවස්ථාවක දී, කලින් වර්ෂය ඇතුළත බල පැවැත්වුණු වරිපනම් බද්ද ම වෙනසක් නොමැති ව සකස් කිරීමට, තක්සේරු කිරීමට, පැනවීමට හෝ අය කිරීමට යෙදුණහොත්, ඒ වරිපනම් බද්ද සකස් කිරීම, තක්සේරු කිරීම, පැනවීම හෝ අය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය අවශ්‍ය නොවිය යුතු ය.

ඇතැම් බලපත්‍ර ගාස්තු අය කිරීමට සභාව සතු බලය

**247අ.** (1) මහා නගර සභාවක් විසින් නිකුත් කරනු ලබන බල පත්‍ර වෙනුවෙන් ගාස්තුවක් ඒ සභාව විසින් නියම කොට අය කර ගත හැකි ය.

[1979 අංක 42 §5

(2) මේ ආඥාපනතෙහි හෝ මේ ආඥාපනත යටතේ සාදනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක හෝ විස්තර කර ඇති කාර්ය සඳහා යම් ස්ථානයක් පාවිච්චි කිරීමට බලය දෙමින් සභාව විසින් නිකුත් කරන ලද යම් බල පත්‍රයක් වෙනුවෙන් (1) වන උපවගන්තිය

යටතේ නියම කරනු ලබන ගාස්තුව, එසේ බල පත්‍ර දෙනු ලැබූ ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුව සභාව විසින් නිශ්චය කළ යුතු ය. තවද, යම් කර්මාන්තයක කාර්ය සඳහා ඒ ස්ථානය පරිහරණය කිරීමට ඒ බල පත්‍රයෙන් බලය ලැබෙන අවස්ථාවක— [1985 අංක 20 §3]

(අ) ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම;

(ආ) ඒ කර්මාන්තයේ ව්‍යාපාර පිරිවැටුම;

(ඇ) ඒ කර්මාන්තයෙන් උපයනු ලැබිය හැකි ලාභය; සහ

(ඈ) ඒ කර්මාන්තය කරගෙන යෑමේ දී සපයනු ලබන බඩුවල හෝ සේවාවල අත්‍යවශ්‍ය ස්වභාවය සැලකිල්ලට ගත යුතු ය:

එසේ වුව ද, එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම මෙහි පහත දැක්වෙන I වන තීරයේ ඇතුළත් ප්‍රමාණයක් අතරට වැටෙන අවස්ථාවක, ඒ ස්ථානය වෙනුවෙන් අය කළ යුතු උපරිම බල පත්‍ර ගාස්තුව II වන තීරයේ ඊට අනුරූප යටහතේ දැක්වෙන මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය:—

| I වන තීරය | II වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම— | රු. |
| රු. 1,500 නොඉක්මවන විට ... ... | 2,000 |
| රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට ... | 3,000 |
| රු. 2,500 ඉක්මවන විට ... ... | 5,000; |

එසේ ම තව දුරටත්, ඒ ස්ථානය හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නා වූ ද ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක දී ඉහත සඳහන් පරිදි අය කළ යුතු බල පත්‍ර ගාස්තුව, ඒ බල පත්‍ර ගාස්තුව අය කරනු ලබන්නේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂය සඳහා ඒ හෝටලයෙහි, ආපන ශාලාවෙහි නැතහොත් නවාතැන් පොළෙහි ලැබීම්වලට අනුකූලව විය යුතු අතර, ඒ බල පත්‍ර ගාස්තුව එම ලැබීම් වලින් සියයට එකක් නොඉක්මවිය යුතු ය. [1985 අංක 20 §3] [1985 අංක 20 §3.]

එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ පවත්වා ගෙන යනු ලබන පළමු වන වර්ෂය එය වන අවස්ථාවක, ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව බල පත්‍ර ගාස්තුව තීරණය කොට අය කර ගනු ලැබිය යුතු ය.

මේ වගන්තියෙහි කාර්ය සඳහා හෝටලයකට, ආපන ශාලාවකට නැතහොත් නවාතැන් පොළකට අදාළව යෙදී ඇති විට, "ලැබීම්" යන්නෙන් ඒ හෝටලය, ආපන ශාලාව නැතහොත් නවාතැන් පොළ සම්බන්ධයෙන් එළඹ ගෙන ඇති ගනුදෙනුවලින් හෝ ඒ හෝටලය, ආපන ශාලාව නැතහොත් නවාතැන් පොළ පවත්වා ගෙන යෑමේ දී ඉටු කරන ලද සේවාවන් සඳහා හෝ ලැබුණු නැත හොත් ලැබීමට ඇති මුළු මුදල අදහස් වේ.

ඇතැම් කර්මාන්ත විෂයෙහි බදු නියම කිරීම.
[1979 අංක 42 §5.]

**247ආ.** (1) යම් මහා නගර සභාවක පාලන සීමා තුළ කර ගෙන යන යම් කර්මාන්තයක් වෙනුවෙන් බද්දක් නියම කොට අය කිරීම ඒ මහා නගර සභාව විසින් කළ හැකි ය.

(2) එසේ (1) වන උපවගන්තිය යටතේ අය කරනු ලබන බද්ද, ඒ කර්මාන්තය කර ගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව ඒ සභාව විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක වාර්ෂික බද්දක් විය යුතු ය :

එසේ වුව ද, එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම මෙහි පහත දැක්වෙන I වන තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතරට වැටෙන අවස්ථාවක, ඒ ස්ථානය වෙනුවෙන් අය කළ යුතු බද්ද II වන තීරයේ ඊට අනුරූප සටහනේ දැක්වෙන මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය :—

| I වන තීරය වාර්ෂික වටිනාකම | II වන තීරය රු. |
|---|---|
| රු. 1,500 නොඉක්මවන විට ... | ... 2,000 |
| රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට | ... 3,000 |
| රු. 2,500 ඉක්මවන විට ... | ... 5,000 : |

එසේ ම තව දුරටත්, යම් කර්මාන්තයක් වෙනුවෙන් මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ හෝ බල පත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම්, එවැනි කර්මාන්තයක් වෙනුවෙන් ඉහත සඳහන් බද්ද නියම කිරීම හෝ අය කිරීම හෝ නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අය කරනු ලබන බද්ද, සභාව විසින් නිශ්චය කරනු ලබන දිනයක දී හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කර ඇති දිනයක දී හෝ ඒ කර්මාන්තය කරගෙන යන තැනැත්තා විසින් ගෙවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් බද්දක් ගෙවන ලෙස, ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තකුගෙන් ඉල්ලා සිටි විට, එසේ ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් පසු දින හතක් ඇතුළත දී ඒ බද්ද ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත්, සභාව [1986 අංක 39§55] පිහිටි ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත, ඒ පැහැර හැරීම කොමසාරිස්වරයා විසින් වාර්තා [1986 අංක 39§55] කළ යුතු ය. මහේස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වඩා ඒ මුදල වැඩි වුව ද ඒ නොතකා, අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අය කර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය.

කර්මාන්ත කිහිපයක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක ගාස්තුව හෝ බද්ද නිරණය කිරීම.
[1985 අංක 20
[§4.]

247ආආ. මහා නගර සභාවක් විසින් 247අ වන වගන්තිය යටතේ බල පත්‍රයක් සම්බන්ධයෙන් ගාස්තුවක් හෝ 247ආ වන වගන්තිය යටතේ කර්මාන්තයක් සම්බන්ධයෙන් බද්දක් නියම කොට අය කිරීමට සම්මත කරනු ලබන හා පවත්වාගෙන යනු ලබන කර්මාන්තය එම ස්ථානයේ ම පවත්වා ගෙන යනු ලබන වෙනත් බොහෝ කර්මාන්ත අතුරින් එකක් වන අවස්ථාවක, සභාව විසින් ඒ කර්මාන්තයේ කාර්යය සඳහා යොදන ලද ස්ථානයේ බිම් ප්‍රමාණයේ කොටස් කළ වාර්ෂික වටිනාකම පදනම් කොට ඒ ගාස්තුව හෝ බද්ද නිරණය කරනු ලැබිය යුතු ය.

වෙළෙඳ ව්‍යාපාර සහ වෘත්තීන් සම්බන්ධයෙන් වූ බද්ද.
[1979 අංක 42
[§5.]
[1985 අංක 20
[§5.]

274ඇ. (1) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ හෝ බල පත්‍රයක් අවශ්‍ය නොවන යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැත හොත් 247 ආ වන වගන්තිය යටතේ කිසිම බද්දක් නොගෙවිය යුතු යම් වෙළෙඳ ව්‍යාපාරයක් හෝ යම් මහා නගර සභාවක පාලන සීමා තුළ යම් තැනැත්තකු විසින් කර ගෙන යනු ලබන අවස්ථාවක දී, ඒ සභාව විසින් යෝජනා සම්මතයක් මගින් ඒ තැනැත්තා විෂයයෙහි වාර්ෂික බද්දක් නියම කළ හැකි ය. බද්ද ගෙවිය යුතු වර්ෂයට

පූගතින් අන්තිමට වූ වර්ෂයේ දී ඒ වෙළෙඳ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් අනුව ඒ බද්ද නියම කල යුතු අතර, එහි බද්ද මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් නොඉක්ම විය යුතුය:—

| I වන තීරය<br>වෙළෙඳ ව්‍යාපාරයෙන් ගත වූ වර්ෂයේ දී ලත් ලැබීම් | | II වන තීරය<br>ගෙවිය යුතු බද්ද<br>රු. |
|---|---|---|
| (i) රු. 6,000 නොඉක්මවන විට | ... | නැත |
| (ii) රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | ... | 90 |
| (iii) රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | ... | 180 |
| (iv) රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | ... | 360 |
| (v) රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | ... | 1,200 |
| (vi) රු. 1,50,000 ඉක්මවන විට | ... | 3,000. |

එසේ වුව ද, ස්ථිර ස්ථානයක තම වෙළෙඳ ව්‍යාපාරය පවත්වා ගෙන නොයන්නා වූ හෝ තම ව්‍යාපාරයේ කටයුතු සඳහා පොදු මාර්ගවල නැතහොත් පොදු ස්ථානවල ස්ථාපනය නොවන්නා වූ හෝ චාරික වෙළඳුන්ට මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන අදාළ නොවිය යුතු ය.

[1985 අංක 20 §5.] (1අ) මහා නගර සභාවක පරිපාලන සීමාවන් තුළ යම් වෘත්තියක යෙදෙන සෑම තැනැත්තකුගෙන් ම ඒ සභාව විසින් නියම කළ හැකි හෝ අය කළ හැකි උපරිම බද්ද වශයෙන් අමාත්‍යවරයා විසින් නියෝගයක් මගින් නිශ්චය කර ඇති ප්‍රමාණයක් නොඉක්ම වන බද්දක් ඒ මහා නගර සභාව විසින් යෝජනා සම්මතයක් මගින් නියම කොට වාර්ෂිකව අය කර ගනු ලැබිය හැකි ය.

[1985 අංක 20 §5.] (2) (1) වන උපවගන්තිය හෝ (1අ) වන උපවගන්තිය හෝ යටතේ ගෙවිය යුතු බද්ද සභාව විසින් නියම කරනු ලබන හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කර ඇති හෝ දිනයක දී ගෙවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් බද්දක් ගෙවන ලෙස, ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තකුගෙන් ඉල්ලා සිටි විට, එසේ ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් පසු දින සතක් ඇතුළත දී ඒ බද්ද ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඒ සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත, ඒ පැහැර හැරීම ඒ සභාව විසින් වාර්තා කළ යුතු ය. එසේ අය විය යුතු මුදල් ප්‍රමාණය මහෙස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්මවා ගිය ද ඒ නොතකා, අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අය කර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය.

මේ වගන්තියෙහි කාර්ය සඳහා—

(අ) "වෙළෙඳ ව්‍යාපාරය" යන්නට, යම් කර්මාන්තයක් හෝ යම් නිෂ්පාදකයකුගේ හෝ තමා කරන යම් ගනුදෙනු වක් නැතහොත් සේවා සම්බන්ධයෙන් කොමිස් මුදලක් නැතහොත් ගාස්තුවක් අය කරන යම් තැනැත්තකුගේ හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් ද ස්වාධීන කොන්ත්‍රාත් කරුවකුගේ ව්‍යාපාරයක් ද ඇතුළත් වන නමුත්, පෞද් ගලික පොළක දී භාණ්ඩ, බඩු හෝ ද්‍රව්‍ය විකිණීමේ රක්ෂාව හෝ රජයෙන් ආධාර දීමනා ගෙවනු ලබන්නා වූ නැතහොත් කලින් එවැනි ආධාර දීමනා ගෙවනු ලැබුවා වූ ද දැනට එවැනි ආධාර දීමනා ගෙවනු නොලබන්නා වූ ද යම් අධ්‍යාපන ආයතනයක් හෝ පාඨශාලාවක් හෝ පවත්වාගෙන යෑමේ රක්ෂාවක් ඊට ඇතුළත් නොවේ: තවද

(ආ) "ලැබීම්" යන්න යම් වෙළෙඳ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ වෙළෙඳ ව්‍යාපාරය සම්බන්ධයෙන් එළඹ ගෙන ඇති ගනුදෙනුවලින් නැත හොත් ඒ ව්‍යාපාරය කරගෙන යෑමේ දී ඉටු කරනු ලබන සේවාවලින් ලැබුණු හෝ ලැබීමට ඇති හෝ මුළු මුදල් ප්‍රමාණය අදහස් වන අතර, පහත දැක්වෙන මුදල් ප්‍රමාණ ද ඊට ඇතුළත් වේ:—

(අ) මුදල් සපයන්නකු, මුදල් ණයට දෙන්නකු නැත හොත් උකස් බඩු ගන්නකු සම්බන්ධයෙන් වන විට, ඔහු විසින් ණයට දෙන ලද මුදල් ඒ ණය සම්බන්ධ යෙන් ඔහු ලබාගත් නැතහොත් ඔහුට ලැබීමට ඇති පොළිය සහ ඒ ණය සම්බන්ධයෙන් ගාස්තු නැත හොත් වෙනත් අයකිරීම් වශයෙන් ඔහුට ලැබුණු මුදල් ප්‍රමාණය;

(ආ) වෙන්දේසිකරුවකු සම්බන්ධයෙන් වන විට සහ (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, බ්‍රෝකර් කෙනකු නැතහොත් කොමිස් නියෝජිතයකු සම්බන්ධයෙන් වන විට—

(i) ඔහු විසින් විකුණන ලද ඉඩමක් නැතහොත් ඔහුගේ මූලිකත්වයෙන් විකුණන ලද ඉඩමක් සම්බන්ධයෙන් වන විට ඒ විකිණීමට අදාළ ව ඔහු විසින් කරන ලද ගනුදෙනු නැතහොත් ඔහු ඉටු කළ යම් සේවාවක් සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබීමට ඇති හෝ කොමිස් මුදල් නැතහොත් ගාස්තු ;

(ii) ඔහු විසින් විකුණන ලද නැතහොත් ඔහුගේ මූලිකත්වයෙන් විකුණන ලද යම් බඩු සම්බන්ධයෙන් වන විට, ඒ බඩු මිල දී ගත් තැනැත්තා විසින් ඒ බඩු සඳහා ගෙවන ලද හෝ ගෙවීමට ඇති හෝ මුළු මුදල ;

(ඇ) (කොටස් බ්‍රෝකර් කෙනකු හෝ නිෂ්පාදන බ්‍රෝකර් කෙනකු නොවන) යම් බ්‍රෝකර් කෙනකු හෝ කොමිස් නියෝජිතයකු හෝ සම්බන්ධයෙන් වන විට, ඔහු—

(i) ශ්‍රී ලංකාවේ පදිංචිව නොසිටින යම් තැනැත්තකුගේ බඩු ඒ තැනැත්තා වෙනුවෙන් විකුණන්නේ නම් හෝ විකිණීමේ මූලිකත්වය දරන්නේ නම්, හෝ

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බඩු කිසිවක් සම්බන්ධයෙන් යම් අපනයනකරුවකු වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, හෝ

(iii) ශ්‍රී ලංකාවේ වෙළෙඳ ව්‍යාපාර කරගෙන යන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඒ තැනැත්තාගේ බඩු කිසිවක් ශ්‍රී ලංකාවේ දී විකිණීමට මූලික වන්නේ නම් සහ ඒ බඩු විකිණීමෙන් ලැබෙන සම්පූර්ණ මුදල එකී වෙනත් තැනැත්තාගේ වෙළෙඳ ව්‍යාපාරයේ ලැබීම්වලට ඇතුළත් වන්නේ නම්,

එවැනි විකිණීමක දී, එවැනි ක්‍රියා කිරීමක දී නැතහොත් එවැනි විකිණීමකට මූලික වීමක දී ඒ බ්‍රෝකර් තැන හෝ කොමිස් නියෝජිතයා එසින් කරන ලද යම් ගනුදෙනුවක් නැතහොත් ඔහු විසින් ඉටු කරන ලද යම් සේවයක් සම්බන්ධයෙන් ඔහු විසින් ලබා ගන්නා ලද නැතහොත් ඔහුට ලැබීමට ඇති කොමිස් මුදල් හෝ ගාස්තු දළ කොටස් බ්‍රෝකර් කෙනෙකු හෝ නිෂ්පාදන බ්‍රෝකර් කෙනකු හෝ සම්බන්ධයෙන් වන විට, ඒ බ්‍රෝකර් හෝ කොමිස් නියෝජිතයා හෝ විසින් කරන ලද යම් ගනුදෙනුවක් නැතහොත් ඉටු කරන ලද යම් සේවයක් වෙනුවෙන් ඒ බ්‍රෝකර්ට හෝ කොමිස් නියෝජිතයාට ලැබුණු නැතහොත් ලැබීමට ඇති කොමිස් මුදල් හෝ ගාස්තු සහ

(ඇ) යම් අධ්‍යාපන ආයතනයක් හෝ පාඨශාලාවක් හෝ පවත්වාගෙන යන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ අධ්‍යාපන ආයතනය හෝ පාඨශාලාව හෝ සතු මුදල් ආයෝජනය කිරීමෙන් ලැබුණු ලාභ අතහැර, ඒ අධ්‍යාපන ආයතනය හෝ පාඨශාලාව හෝ පවත්වා ගෙන යැමෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදල් ප්‍රමාණය අදහස් වන නමුත් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබීමට ඇති යම් මුදල් ප්‍රමාණයක් ඊට ඇතුළත් නො වේ.

**247ඇ.** (1) මහා නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සුදුසු වන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ, ඒ සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක,— සංවර්ධනය නොකළ ඉඩම් වලින් බදු අය කිරීම. [1979 අංක 42 § 5.]

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) ඒ ඉඩමෙහි ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය, යෝජනා සම්මතයක් මගින් සභාව විසින් නියම කරනු ලැබූ නියමිත අනුපාතයට වඩා අඩු නම්, හෝ [1985 අංක 20 § 6.]

(ඇ) ස්ථාවර නැතහොත් නිතිපතා කැරෙන ගොවිතැනට ඒ ඉඩම යොදවා නැත්නම්,

ඒ ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක් නොඉක්මවන ප්‍රමාණයක බද්දක් ඒ සභාව විසින් ඒ ඉඩමේ අයිතිකරු විෂයෙහි වාර්ෂිකව නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉඩමක භූමියේ ප්‍රාග්ධන අගය තක්සේරු කරන සෑම අවස්ථාවක දී ම, ප්‍රධාන ප්‍රඥප්තියේ 235 වන සහ 236 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඊට අදාළ කරනු ලැබිය යුතුය.

මේ වගන්තියේ කාර්ය සඳහා "භූමියේ ප්‍රාග්ධන අගය" යන්න යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ ඉඩමේ ඇති ගොඩනැගිලි සියල්ලම අතහැර හා උකස්කර, බදුකර, අවහිර හෝ වෙනත් බැඳීම් සියල්ලෙන් තොරව ඒ ඉඩම පමණක් විවෘත වෙළෙඳ පෙළෙහි දී විකුණනු ලැබුවහොත් ඒ ඉඩම සඳහා ගෙවනු ලැබිය හැකි මිල ගණන ඉන් අදහස් වේ.

ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු නියම කිරීම.
[1979 අංක 42 §5.]

247ඉ. (1) මහා නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර්කෙනකු විසින් හෝ ඔහුගේ සේවකයකු නැතහොත් අනුයෝජිතයකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුව හොත්, ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සමාන බද්දක්, ඒ විකුණම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් එසේ ඒ ඉඩම විකුණා ලත් මුදලින්, ඒ සභාවට ගෙවිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද ගෙවන ලෙස ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් පසු දින දහහතරක් තුළ දී ඒ බද්ද නොගෙවනු ලැබුවහොත්, ඒ පැහැර හැරීම, ඒ සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය

[1986 අංක 39 §56

වෙත කොමසාරිස්වරයා විසින් වාර්තා කළ යුතුය. අය විය යුතු මුදල් ප්‍රමාණය මහේස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්මවා ගිය ද ඒ නොතකා අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අය කර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතුය.

රේන්දපළවල්.

248. (1) සෑම මහා නගර සභාවක් විසින්ම, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, රේන්දපළවල් පිහිටුවිය හැකි අතර, මහා නගරය ඇතුළත ගෙවිය යුතු සියලු ම රේන්ද ගැනීම හා ලබා ගැනීම කළ හැකිය. තව ද මහා නගරය තුළ වූ පාරවල් නිසි ලෙස නඩත්තු කිරීම සඳහා, නීත්‍යනුකූල ව පිහිටුවා ඇති හෝ පිහිටුවනු ලබන එවකටත් පවත්නා රේන්දපළවල් හෝ අනාගතයෙහි ඇති විය හැකි රේන්ද පළවල් හෝ, අමාත්‍යවරයා විසින් සුදුසු යැයි සලකනු ලබන පරිදි, එවැනි යම් රේන්දපළකින් කොටසක් හෝ අමාත්‍යවරයා විසින් සභාවට ලබා දීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) රේන්ද පළවල් පිහිටුවන ලද හෝ ඉහත සඳහන් කළ ආකාරයට රේන්ද පළවල් ලබා දෙන ලද සෑම මහා නගර සභාවකට ම රේන්දකරුවන් පත් කර ගැනීමට මෙයින් බලය පවරනු ලබන අතර, එසේ පිහිටුවන ලද හෝ ලබා දෙන ලද රේන්ද පළවල් සම්බන්ධයෙන්, මෙම ආඥා පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින් වෙනස් හෝ ලිහිල් කරනු ලැබී නම් මිස, රේන්ද ආඥා පනතේ විධිවිධාන අදාළ විය යුතුය.

(3) සභාව විසින් පිහිටුවන ලද හෝ ගනු ලැබූ හා ලබා ගනු ලැබූ හෝ මෙම ආඥා පනත යටතේ සභාවට ලබා දෙනු ලැබූ යම් තොටුපළක් සම්බන්ධයෙන් වූ යම් රේන්ද පළක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද යෝජනා සම්මතයක් මගින් සභාව විසින් පහත සඳහන් යම් පළාත් පාලන ආයතනයකට හෝ මණ්ඩලයකට, එනම්, වෙනත් යම් මහා නගර සභාවකට, යම් නගර සභාවකට, යම් සුළු නගර සභාවකට හෝ යම් ගම් සභාවකට ලබා දිය හැකිය.

249. කුලියට දීම සඳහා අශ්වයන් තබා ගන්නා අස්හල්කරුවන් හා කුලියට දීම සඳහා අශ්ව කරත්ත හා අශ්වයන් තබා ගන්නා හෝ ප්‍රයෝජනයට ගන්නා වෙනත් තැනැත්තන් සමග, එසේ තබා ගන්නා අශ්ව කරත්ත හා අශ්වයන් වෙනුවෙන් 245 වන වගන්තිය යටතේ අය කර ගත යුතු බද්ද වෙනුවට එක්තරා මුදලක් ගෙවීම සඳහා අවුරුද්දකට වැඩි නොවන යම් කාල සීමාවකට සභාව විසින් සමථයකට එළඹිය හැකිය. කුලියට දීම සඳහා අශ්වයන් තබා ගන්නා අස්හල කරුවන් හා අන්‍යයන් සමග සමථයකට එළඹීමේ බලය.

250. තත් කාර්යය සඳහා සභාව විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්, හිරු නැගීම හා හිරු බැසීම අතරතුර යම් වේලාවක, යම් අස්හලක හෝ රියහලක හෝ මෙම ආඥා පනත යටතේ බද්දක් ගෙවීමට යටත් වන යම් වාහනයක් හෝ සතකු ඇති බව විශ්වාස කිරීමට එකී තැනැත්තාට හේතු ඇති යම් ස්ථානයකට ඇතුළු වීම හා එය පරීක්ෂා කිරීම නීත්‍යනුකූල වන්නේය. තවද, ඒ බද්ද ගෙවීමට යම් තැනැත්තකු යටත් යැයි සභාවට විශ්වාස කිරීමට හේතු ඇති විට, එකී යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු කැඳවීමත්, එසේ බද්ද ගෙවීමට එම තැනැත්තා යටත් වන්නේ අශ්වයන් කීදෙනකු සහ කරත්ත කීයක් වෙනුවෙන් ද ඒ අශ්වයන්ගේ හා කරත්තවල සංඛ්‍යාව හා විස්තරය පිළිබඳ ව ඒ තැනැත්තාගෙන් ප්‍රශ්න කිරීමක් සභාව විසින් කළ හැකිය. අස්හල් ආදිය පරීක්ෂා කිරීමට හා බදු ගෙවීමට යටත් වන තැනැත්තන් කැඳවීමට ඇති බලය.

කැදවීම නියෝග යට අකීකරු වීම හා පරීක්ෂණයට අවහිර කිරීම සඳහා දණ්ඩනය.

**251.** (අ) 250 වන වගන්තිය යටතේ කැඳවනු ලැබ, ඒ කැඳවීම අනුව පෙනී සිටීම නීත්‍යනුකූල නිදහසට කරුණක් නොමැතිව පැහැර හරින ; හෝ

(ආ) ඉහත කී ලෙස බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට එකී යම් අස්හලකට, රිය හලකට හෝ ස්ථානයකට ඇතුළු වීමට හෝ එය පරීක්ෂා කිරීමට හෝ පිටව යෑමට අවහිර කරන හෝ බාධා කරන සෑම තැනැත්ත කුම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

[1986 අංක 39§57]

වරිපනම් බදු හා බදු අයකර ගැනීම සඳහාවූ බලපත්‍රය

**252.*** (1) මෙම ආඥාපනත යටතේ තක්සේරු කරන ලද යම් වරිපනම් බද්දක් හෝ ඒ යටතේ පනවන ලද යම් බද්දක්, සභාව විසින් විධාන කරනු ලැබිය හැකි කාල සීමාව ඇතුළත මහා නගර සභා කාර්යාලයට නොගෙවනු ලැබ් නම්,—

(අ) යම් වරිපනම් බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට ඒ වරිපනම් බද්ද අය විය යුතුව ඇති ස්ථානයේ අයිතිකරු ගේ හෝ සම අයිතිකරුගේ චංචල හෝ නිශ්චල සියලු ම හා සෑම දේපළක් ම සහ ඒ ස්ථානය තුළ හෝ ඒ මත ඇති කවර තැනැත්තකුට වුවද අයත් සියලු චංචල දේපළක් ම තහනම් කර විකිණීමෙන් එම වරිපනම් බද්ද හා අය කර ගැනීමේ ගාස්තු අය කර ගැනීම සඳහා ; සහ

(ආ) යම් බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට ඒ බද්ද අය වීමට ඇති දේපළ හා ගෙවීම පැහැර හැරි තැනැත්තාගේ චංචල හෝ නිශ්චල සියලු ම හා සෑම දේපළක් ම තහනම් කර විකිණීමෙන් ඒ බද්ද හා අය කර ගැනීමේ ගාස්තු අය කර ගැනීම සඳහා විධාන කරමින් තමා විසින් අත්සන් කරනු ලැබූ බල පත්‍රයක් එහි සඳහන් යම් බදු එකතු කරන්නකුට නිකුත් කිරීම කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතුය.

(1971 අංක 48 §9)

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයක්ම, අවස්ථානුකූලව අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, පස් වන උපලේඛනයෙහි ඇතුළත් ආකෘතියෙහි විය යුතුය.

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලිහිල් කරන ලදී—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

(3) අත්හැර දමනු ලබන මුදල නොසැලකිය යුතු තරම් වන බව හෝ අය කර ගත නොහැකි බව හෝ එම මුදල ගෙවීමට යටත් තැනැත්තාගේ දිළිඳු බව උඩ එම මුදල ලියා අත්හැරිය යුතු බව සභාවට පෙනී ගියහොත්, යම් වරිපනම් බද්දක් හෝ බද්දක් සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් හා එම වරිපනම් බද්ද හෝ බද්ද අය කර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් වියදමක් යෝජනා සම්මතයක් මගින් අත්හැර දැමීම මහා නගර සභාවක් විසින් කළ හැකිය. තවද, එකී යම් යෝජනාවක් සම්මත වූ යම් විටක (1) වන උපවගන්තිය යටතේ කිසිම බල පත්‍රයක් නිකුත් නොකළ යුතු අතර නිකුත් කරනු ලැබ ඇති එකී යම් බල පත්‍රයක් වේ නම් එය ප්‍රත්‍යාහරණය කළ යුතුය.

253. (1) මසකට රුපියල් තිහකට වැඩි නොවූ කුලියකට සභාව විසින් කුලියට දෙනු ලැබූ යම් ස්ථානයක කුලිය වශයෙන් අය විය යුතු මුදල, එම මුදල අය විය යුතුව තිබූ දිනයෙන් පසු දවස් දහ හතරක් ඇතුළත මහා නගර සභා කාර්යාලයට නොගෙවනු ලැබී නම්, මහා නගරය ඇතුළත පිහිටි හා ඒ කුලී නිවැසියාට අයත් වූ සියලු ම චංචල හා නිශ්චල දේපළ තහනම් කොට විකිණීමෙන් හා කුලිය අය විය යුතුව ඇති ස්ථානය තුළ හෝ ඒ මත පිහිටි කවරක හට වුවද අයත් සියලු ම චංචල දේපළ තහනම් කොට විකිණීමෙන් එම මුදල හා අය කර ගැනීමේ ගාස්තු අය කර ගැනීම සඳහා තමා විසින් අත්සන් කරනු ලබන බලපත්‍රයක් මගින් එහි නම් කරනු ලබන සභාවේ නිලධරයකුට බලය පැවරීම කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. [1971 අංක 48§ 10]

සභාවට ලැබිය යුතු කුලී අය කර ගැනීම සඳහා වූ බල පත්‍රය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයක්ම, අවස්ථානුකූල ව අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, හයවන උපලේඛනයෙහි ඇතුළත් ආකෘතියෙහි විය යුතු ය.

254* රජයට අයත් වූ හා යම් තැනැත්තකුට බද්දට දෙනු ලැබූ යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් සම්බන්ධයෙන් වූ යම් වරිපනම් බද්දක් අය කර ගැනීම සඳහා බල පත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, ඒ ගෙය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත හෝ එහි බදුකරුගේ හෝ පදිංචිකරුගේ බදු අයිතිය හෝ වෙනත් අයිතිවාසිකමක් තහනම් කිරීමට හා විකිණීමට ඒ බල පත්‍රයෙන් විධාන නොකළ යුතු අතර, ඒ බල පත්‍රය, ඒ බදුකරුගේ හෝ පදිංචි කරුගේ චංචල හෝ නිශ්චල දේපළ තහනම් කර විකිණීම ඒ විධාන කිරීමට සීමා විය යුතු ය.

රජයේ දේපළ බදුදී ඇති විට නිකුත් කරනු ලබන බලපත්‍ර.

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය කින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය. එකී ආඥාපනතේ 75 වන වගන්තිය බලන්න.

මහ නගර සභාවට අය විය යුතු ගෙවීම් අය කර ගැනීම.
[1971 අංක 48 § 28.]

254අ. (1) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝග යක් යටතේ යම් බද්දක්, දඩ මුදලක්, දණ්ඩන මුදලක්, දඬුවම් වශයෙන් වූ ගෙවීමක්, ගාස්තුවක් හෝ වෙනත් ගෙවීමක් මහා නගර සභාවට අය විය යුතුව තිබෙන අවස්ථාවක, එහි යම් විධිවිධානයක හෝ එකී යම් අතුරු ව්‍යවස්ථාවක, රීතියක හෝ නියෝගයක පට හැනිව කුමක් සඳහන් වුව ද, ඒ බද්ද, දඩ මුදල, දඬුවමක් වශයෙන් වූ ගෙවීම, ගාස්තුව හෝ වෙනත් ගෙවීම අය කරගෙන එය මහා නගර සභාවේ අරමුදල්වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(2) මේ ආඥාපනත හෝ ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් නොවන යම් ලිඛිත නීති යක් යටතේ යම් වරිපනම් බද්දක්, බද්දක්, කුලියක්, ගාස්තුවක්, අය බද්දක්, වේන්ද ගාස්තුවක්, දඩ මුදලක්, දඬුවමක් වශයෙන් වූ ගෙවීමක් හෝ වෙන යම් ගෙවීමක් මහා නගර සභාවට අය විය යුතුව තිබෙන අවස්ථාවක, ඉහත කී ලිඛිත නීතියෙහි පටහැනිව කුමක් සඳහන් වුවද, ඒ වරිපනම් බද්ද, බද්ද, කුලිය, ගාස්තුව, අය බද්ද, වේන්ද ගාස්තුව, දඩ මුදල, දඬුවමක් වශයෙන් වූ ගෙවීම හෝ වෙනත් ගෙවීම අය කරගෙන එය මහා නගර සභාවේ අරමුදල්වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම නාගරික කොමසාරිස් වරයාගේ කාර්යය විය යුතු ය.

ගාස්තු පරිමාණය

255*- මෙම කොටස යටතේ නිකුත් කරනු ලබන යම් බල **පත්‍රයක් යටතේ අය කර ගත හැකි** අය කර ගැනීමේ ගාස්තු පහත දැක්වෙන අය කිරීම් චක්‍රයට අනුව විය යුතු ය :—

[1979 අංක 42 § 6.]

(අ) බල පත්‍රයක් නිකුත් කිරීමේ වියදම සඳහා—

(i) ගෙවනු ලැබිය යුතු බද්දෙහි හෝ කුලියෙහි ප්‍රමාණයෙන් සියයට දහයක ;

(ii) මුඩු ඉඩම් සහ වාසස්ථාන වෙනුවෙන් ගෙවිනු ලැබිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහළොවක ; සහ

(iii) මුඩු ඉඩම් සහ වාසස්ථාන නොවන දේපළ වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට විස්සක

අය කිරීමක් :

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය කින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලිහිල් කරන ලදී.—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

(ආ) තහනම් කිරීම හා තහනම් කළ බඩු ඉවත් කිරීමක් සිදු වී නම් ඒ ඉවත් කිරීම සඳහා අය විය යුතු වරිපනම් බද්දේ හෝ බද්දේ හෝ කුලියේ සෑම ශත පනහක් සඳහා ශත පහක් නොඉක්මවන අයකිරීමක් ;

(ඇ) රඳවා ගැනීම සිදු වූ අවස්ථාවක නම්, තහනමට ගත් බඩු කිසිවක් ආරක්ෂිත භාරකාරත්වයේ තබා ගැනීම සඳහා දවසකට රුපියල් හැත්තෑ පහක් නොඉක්මවන අය කිරීමක් ; [1986 අංක 39 § 58 (අ)]

(ඈ) නිශ්චල දේපළ තහනම් කළ අවස්ථාවක හෝ තහනම් කළ බඩු ඉවත් නොකරන ලද අවස්ථාවක, ඒවා සන්තකව සිටීමට නැනැත්තකු තැබීම සඳහා දවසකට රුපියල් හැත්තෑ පහක් නොඉක්මවන අය කිරීමක් ; [1986 අංක 39 § 58 (ආ)]

(ඉ) යම් විකිණීමක් සිදු වන කල්හි, එහි වියදම සඳහා විකිණීමෙන් ලැබෙන ශුද්ධ මුදලෙහි සෑම රුපියල් දහයකට රුපියලක් නොඉක්මවන අය කිරීමක්. [1986 අංක 39 § 58 (ඇ)]

**තහනම් කළ දේපළ විකිණීම.** [1971 අංක 48 § 11] [1986 අංක 39 § 59]

256.* මෙම කොටස යටතේ නිකුත් කරන ලද බල පත්‍රයක් අනුව තහනම් කළ යම් දේපළක වටිනාකම රුපියල් දසදහස ඉක්මවන අවස්ථාවක දී ඒ තහනමේ දින සිට දවස් විසිහතරක් ද වෙනත් සියලු අවස්ථාවල දී දවස් අටක් ද ඉකුත් වූ පසු යම් වේලාවක දී, ඒ බල පත්‍රය යොමු කරනු ලැබූ නිලධරයා හෝ කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා පත් කරනු ලැබූ සභාවේ වෙනත් නිලධරයකු විසින්, (වටිනාකම රුපියල් දසදහස ඉක්මවන දේපළ සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් දවස් විසි එකක හා වෙනත් සියලු අවස්ථාවලදී යටත් පිරිසෙයින් දින හයක දැනුම්දීමක් ගැසට් පත්‍රයෙහි හා මහා නගරය ඇතුළත සංසරණය වන ප්‍රවෘත්ති පත්‍ර එකක හෝ එකකට වැඩි ගණනක කර), වරිපනම් බද්දෙහි හෝ වරිපනම් බදුවල හෝ බද්දෙහි හෝ බදුවල හෝ කුලියෙහි මුදල යන ඉහත කී ගාස්තු ඒ අතරතුර යථා පරිදි ගෙවනු ලැබී නම් මිස, එකී දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු ය. තව ද ඒ විකිණීමකින් එකතු වන මුදලින්, ඒ වරිපනම් බද්දෙන් හෝ වරිපනම් බදුවල හෝ කුලියේ මුදල හා ගාස්තු අඩු කර ගැනීමෙන් පසු යම් අතිරික්තයක් තිබේ නම් ඒ අතිරික්තය එසේ විකුණූ දේපළෙහි අයිතිකරුට හෝ සම අයිතිකරුට ආපසු දිය යුතු ය.

එසේ වුවද, යම් වරිපනම් බද්දක් හෝ බද්දක් හෝ කුලියක් ගෙවීම පැහැර හරින යම් තැනැත්තකුගේ දේපළ තහනම් කර විකිණීම අවශ්‍ය වූ කවර හෝ අවස්ථාවක දී, පොලිස් ආඥාපතිත් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් පත් කරනු ලබන වෙනත් යම් ප්‍රඥප්තිය

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන උපවගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලිහිල් කරන ලදී.—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

[1971 අංක 48 § 11.]

කිත් නියම කරනු ලබන අනුපිළිවෙළ සහ ක්‍රියා මාර්ගය, අදාල කරනු ලැබිය හැකි තාක් දුරට, අනුගමනය කිරීම ඉහත කී පරිදි කොමසාරිස්වරයාගේ බල පත්‍රය යටතේ ක්‍රියා කරන නිලධරයාගේ කාර්යය විය යුතු ය.

විකිණීමෙන් ලැබෙන මුදලෙහි අතිරික්තය.
[1971 අංක 48 § 12.]

**257.** 256 වන වගන්තිය අනුව කරන ලද විකිණීමකින් උපචිත වූ යම් අතිරික්තයක් සඳහා ඒ විකුණනු ලැබූ දේපලේ අයිතිකරු හෝ සම අයිතිකරු හෝ විසින්, ඒ විකිණීමේ දින සිට මාස දොළහක් ඇතුළත කිසි ම ඉල්ලීමක් කරනු නොලැබුවහොත්, කොමසාරිස්වරයා විසින් අතිරික්තයේ මුදල මහා නගර සභා අරමුදලේ බැරට ගෙවිය යුතු අතර, ඉන් පසුව කිසිදු තැනැත්තකු විසින් එම මුදල ඉල්ලා සිටීමට හෝ ලබා ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

ගෙවල් කඩා විවෘත කිරීමට ඇති බලය.

**258.** මෙම කොටස යටතේ බල පත්‍රයක් යොමු කරනු ලැබ ඇති තැනැත්තා විසින්, ඒ බල පත්‍රය අනුව දේපළ තහනම් කිරීමේ කාර්යය සඳහා දිවා කාලය තුළ යම් ගෙයක් හෝ ගොඩනැගිල්ලක් කඩා විවෘත කළ හැකි ය.

විකිණීමේ සහතිකය.
[1971 අංක 48 § 13.]

**259.*** මෙම කොටස යටතේ නිකුත් කරන ලද යම් බල පත්‍රයක් යටතේ ඉඩමක් හෝ වෙනත් නිශ්චල දේපළක් විකුණනු ලැබූ විට, හත්වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූල ව පිළියෙළ කොට කොමසාරිස්වරයා විසින් අත්සන් කරන ලද සහතිකයක් එම දේපළ මිලට ගත් තැනැත්තා වෙත සියලු ම බැඳීම්වලින් තොරව ඒ දේපළ සතු වීමට ප්‍රමාණවත් විය යුතු ය. ඒ සෑම සහතිකයක් ම, නිශ්චල දේපළ සමර්පණය කිරීමේ දී ගෙවිය යුතු මුද්දර ගාස්තුවට සහ නීතියෙන් බලය දී ඇති ලියාපදිංචි කිරීමේ හෝ වෙනත් අයකිරීම්වලට යටත් විය යුතු අතර, ගැනුම්කරු විසින් ඒ ගාස්තු හා අයකිරීම් ගෙවිය යුතු ය:

එසේ වුව ද, මෙම කොටස යටතේ නිකුත් කරන ලද යම් බල පත්‍රයක බලය ප්‍රකාර තහනම් කරන ලද යම් ඉඩමක හෝ වෙනත් නිශ්චල දේපළක උකස් හිමියා විසින්, ඒ බල පත්‍රය යටතේ හා එකී බලය ප්‍රකාර අය විය යුතු වරිපනම් මුදලේ හෝ බදු මුදලේ සහ ගාස්තුවල මුදල ගෙවා නිදහස් කිරීම නිත්‍යානුකූල විය යුතු ය.

උකස් හිමියාගේ අයිතිවාසිකම්.

**260.** 259 වන වගන්තිය යටතේ උකස් හිමියා විසින් යම් ගෙවීමක් හා නිදහස් කර ගැනීමක් කරනු ලැබූ විට, එසේ ගෙවා හා නිදහස් කර ගැනීමේ මුදල ඔහුගේ උකස්කරය මගින් හිමි විය යුතු මුදලට එකතු කිරීමට ඒ උකස් හිමියාට හිමිකම් තිබිය යුතු අතර, එසේ එකතු කළ මුදල ඒ උකස්කරයකින් ආරක්ෂණය කරන ලද ලෙස සැලකිය යුතු ය.

---

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය කිත් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලිහිල් කරන ලදී.—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

වරිපනම් බදු හෝ බදු නොගෙවීම නිසා විකුණන ලද ඉඩම මිලට ගැනීමට සභාවට ඇති බලය.
[1971 අංක 48 § 14.]

**261.*** වරිපනම් බදු හෝ බදු නොගෙවීම නිසා ඉඩමක් හෝ වෙනත් නිශ්චල දේපළක් තහනම් කර විකුණනු ලබන විට, කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ඒ ඉඩම හෝ වෙනත් දේපළ විකිණීමේ දී සභාව සඳහා සහ සභාව වෙනුවෙන් ලංසු තැබීම හා එය මිළට ගැනීම නීත්‍යනුකූල විය යුතු ය.

අය විය යුතු වරිපනම් බදු හෝ බදු සහ ගාස්තු ප්‍රමාණය සභාවට බැර කළ හැකි බව.

**262.*** වරිපනම් බදු හෝ බදුනොගෙවීම නිසා තහනම් කර විකුණන ලද යම් ඉඩමක් හෝ වෙනත් නිශ්චල දේපළක් මහා නගර සභාවක් විසින් මිලයට ගනු ලැබූ විට, සම්පූර්ණ ගැනුම් මිල ගෙවන ලෙස සභාවට නියම නොකළ යුතු ය. තව ද ඉහත කී බල පත්‍රය යටතේ හා ගාස්තු වශයෙන් අය විමට ඇති මුදල් ප්‍රමාණය බැර කර ගනු ලැබීමට සභාවට හිමිකම් තිබිය යුතු අතර, ඒ මුදල් ප්‍රමාණය අඩු කර ගැනීමෙන් පසු, යම් ඉතිරියක් වේ නම්, එම ඉතිරි මුදල පමණක් අයිතිකරුට හෝ විකුණන ලද දේපළට හිමිකම් ඇති තැනැත්තාට ගෙවන ලෙස සභාවට නියම කළ යුතු ය:

එසේ වුව ද, එකී යම් විකිණීමකින් ලත් මුදල, බල පත්‍රය යටතේ සභාවට අය විය යුතු මුදලට හා ඉහත කී ගාස්තුවලට වඩා අඩු වූ විට, ඒ විකිණීමෙන් ලැබුණු මුදල අඩු කිරීමෙන් පසු සභාවට අය විය යුතු ශේෂය මෙම ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව සභාව විසින් අය කර ගැනීම මෙහි සඳහන් කිසිවකින් නොවැළැක් විය යුතු ය.

සභාවට හිමි කර දීමේ ආකෘතිය.
[1971 අංක 48 § 15.]

**263.** 261 වන වගන්තියේ විධිවිධාන යටතේ මහා නගර සභාවක් විසින් ඉඩමක් හෝ වෙනත් නිශ්චල දේපළක් මිලට ගනු ලැබූ අවස්ථාවක, ආටවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූල වූ ද කොමසාරිස්වරයා විසින් අත්සන් කරන ලද්දා වූ ද සහතිකයකින්, ඒ විකුණනු ලැබූ දේපළ සියලු බැඳීම්වලින් තොර ව සභාවට නියත වශයෙන් සතු විය යුතු ය. තව ද ඒ සහතිකය ඒ ඉඩම හෝ වෙනත් නිශ්චල දේපළ කෙරෙහි සභාවට ඇති හිමිකම පිළිබඳ තීරණාත්මක සාක්ෂිය ලෙස සියලු අධිකරණයන්හි දී පිළිගත යුතු ය. සෑම සහතිකයක් ම නිශ්චල දේපළ, සමර්පණය කිරීමේ හිමිකර ඔප්පු මත අය විය යුතු මුද්දර ගාස්තුවට හා එය ලියාපදිංචි කිරීම සඳහා අය විය යුතු ගාස්තුවලට ද යටත් විය යුතු ය.

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලිහිල් කරන ලදී—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

සභාව වෙත සතු කර දෙන දේපළ ඒ දේපළෙහි හිමිකම සභාව වෙත සතු නොවී නම් ඒ දේපළට හිමිකම් ලැබිය හැකි ව සිටි තැනැත්තාට විකිණීම.
[1957 අංක 15 § 7.]

263අ. මහා නගර සභාවක් වෙත 263 වන වගන්තිය යටතේ සතු කර දෙන ලද යම් නිශ්චල දේපළක්, ඒ දේපළෙහි හිමිකම සභාව වෙත සතු නොවී නම් ඒ දේපළට හිමිකම් ලැබිය හැකි ව සිටි තැනැත්තාට එ දේපළ විකුණා හිමි කර දීම—

(අ) ඒ දේපළ සභාව වෙත සතු වූ දින සිට ගණන් බලනු ලබන මාස දොළහක් ඇතුළත ඒ තැනැත්තා විසින් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සභාව වෙත ඉදිරිපත් කළහොත්; සහ

(ආ) දේපළ මිලට ගැනීම සඳහා සභාව විසින් යෙවන ලද මිලට සහ සභාව විසින් 264 වන වගන්තිය යටතේ ඒ දේපළ විකුණා හිමි කර දෙනු ලැබී නම් ඒ වගන්තියෙහි සඳහන් අතිරික්තයෙන් සභාව විසින් ඒ වගන්තියේ දෙවන උපවගන්තිය යටතේ අඩු කර ගත හැකි ව තිබූ මුදල් වලට හා ගාස්තුවලට සමාන මුදලක් ඒ ඉල්ලීම ලැබීමේ දින සිට ගණන් බැලිය යුතු වූ ද සභාව විසින් නිරණය කරනු ලැබිය හැකි වූ ද ඒ තැනැත්තාට නිවේදනය කළ යුතු වූ ද කාලයක් ඇතුළත ඒ තැනැත්තා විසින් සභාවට ගෙවුවහොත්

ඒ සභාව විසින් කළ හැකි ය.

සභාවට සතු කර දෙන ලද දේපළ විකිණීමට ඇති බලය.
[1957 අංක 15 § 8.]

**264.** (1) 263 වන වගන්තිය යටතේ මහා නගර සභාවක් වෙත සතු කර දෙන ලද යම් ඉඩමක් හෝ වෙනත් නිශ්චල දේපළක්, 263අ වන වගන්තිය යටතේ ඒ සභාව විසින් එවකට විකුණා සමර්පණය කොට නොමැති නම් ඒ ඉඩම හෝ වෙනත් නිශ්චල දේපළ අගනා ප්‍රතිෂ්ඨාවක් මත ඒ සභාව විසින් යම් තැනැත්තකුට විකුණා සමර්පණය කළ හැකි ය.

(2) (5) වන වගන්තියෙහි නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණ හා ගාස්තු අඩු කර ගැනීමෙන් පසු (1933 අගෝස්තු මස 4 වන දිනට පෙර හෝ පසුව කර ඇති හා ලියා අත්සන් කර ඇති) එකී යම් විකිණීමකින් සහ හිමිකර දීමකින් උපචිත වන යම් අතිරික්තයක් ඒ ඉඩමට හෝ නිශ්චල දේපළට හිමිකම් ඇති තැනැත්තා විසින් ඉල්ලා සිටි විට එය ඔහුට ගෙවිය යුතු ය.

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලිහිල් කරන ලදී—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

(3) විකිණීමේ හා සමර්පණය කිරීමේ දින සිට අවුරුදු දහයක් ඇතුළත එකී ඉල්ලීම කරනු ලැබුවහොත් මිස, ඒ කිසි ම අතිරික්තයක් එසේ නොගෙවිය යුතු ය.

එසේ වුව ද, අතිරික්තය ගෙවිය යුතු වන්නේ එම දිනය වන විට සන්තකයට හිමිකම් නොමැත්තාවූ විත්ත කොටස් ලාභියාටූ හෝ එවකට බාලවයස් කරුවකු වූ තැනැත්තාට නම්, පිළිවෙළින් සන්තකයට හිමිකම් උපචිත මහාභූරු හෝ වයෝ පූර්ණත්වයට පත් වන තුරු එකී කාලසීමාව බල පැවැත්වීම ආරම්භ නොවිය යුතු ය.

(4) එකී අවුරුදු දහය ඇතුළත කිසි ම ඉල්ලීමක් කරනු නොලැබුව හොත්, සභාව විසින් ඒ අතිරික්තය මහා නගර සභා අරමුදලේ බැරට ගෙවිය යුතු ය. ඉනික්බිති ව කිසි ම තැනැත්තකු එම අතිරික්තය ඉල්ලා සිටීමට හෝ ලබා ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ අඩුකර ගත හැකි මුදල හා ගාස්තු මෙසේ ය :—

(අ) බල පත්‍රය නිකුත් කිරීමේ ගාස්තු ද ඇතුළු ව, ඉඩම හෝ දේපළ තහනම් කර විකිණීමට පෙරාතුව වූ කාලසීමාව වෙනුවෙන් නොගෙවා ඉතිරි වූ වරිපනම් බදුවල හෝ බදුවල මුදල ;

(ආ) ඉඩම හෝ දේපළ තහනම් කර විකිණීම නොකරනු ලැබී නම් ඒ විකිණීමේ හා සමර්පණය කිරීමේ දිනය වන විට අය විය යුතු හා ගෙවිය යුතු විය හැකි වූ වරිපනම් බදුවල හෝ බදුවල මුදල, එම මුදලින් සියයට දහයක අතිරේක දඩයක් ද සමඟ ; සහ

(ඇ) ඉඩම හෝ දේපළ තහනම් කිරීම, මිලට ගැනීම, මැනීම, සතු කිරීම, නඩත්තු කිරීම, වැඩි දියුණු කිරීම සහ විකිණීම හා සමර්පණය කිරීම සම්බන්ධව සභාව විසින් දරනු ලැබූ ගාස්තු.

(6) මෙම වගන්තියට අනුකූල ව යම් ගෙවීමක් කරනු ලැබීමෙන් පසු ඒ අතිරික්තය සම්බන්ධයෙන් කවර හෝ තැනැත්තකුගේ ඉල්ලීම අනුව සභාවට විරුද්ධ ව තව දුරටත් ඉල්ලීමක් කිරීමට ඉඩ නොදිය යුතු ය :

එසේ වුව ද, එකී යම් සම්පූර්ණ අතිරික්තයකට හෝ ඉන් කොටසකට නීත්‍යානුකූලව හිමිකම් ඇති තැනැත්තාට එය ගෙවීම කෙරෙහි එම සම්පූර්ණ අතිරික්තය හෝ ඒ කොටස ලබා ගත් යම් තැනැත්තකුගේ ඇති බැඳීමට, මෙහි ඇතුළත් කිසිවක් බල නොපෑ යුතු ය.

(7) මේ වගන්තියේ කාර්යයන් සඳහා " හිමිකම් ඇති තැනැත්තා " යන්නෙන්, විකුණු හා සමර්පණය කළ ඉඩමක හෝ නිශ්චල දේපළක හිමිකම 263 වන වගන්තිය යටතේ සභාවට සතු කර දීම නිසා නොවන්නට, එම ඉඩම හෝ දේපළ සම්බන්ධයෙන් එකී තත්ත්වය දැරිය යුතු ව සිටි තැනැත්තා අදහස් වේ.

**සභාව වෙත සතු කරන ලද දේපළ සභාවට ම තබා ගන්නා අවස්ථාවක කාර්ය පටිපාටිය.**

[1957 අංක 15 § 9.]

**264ඈ.** 263 වන වගන්තිය යටතේ මහා නගර සභාවක් වෙත සතු කරන ලද යම් නිශ්චල දේපළක් ඒ සභාවට ම තබා ගැනීමට ඒ සභාව තීරණය කරන අවස්ථාවක, ඒ දේපළ ඒ සභාව වෙත සතු කරන ලද වේලාවේ දී ඒ දේපළෙහි ඇති වටිනාකම ඒ සභාව විසින් තක්සේරු කළ යුතු ය. එවිට 264 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සිට (7) වන උපවගන්තිය දක්වා වූ ඒ උපවගන්ති දෙකම ඇතුළු උපවගන්තිවල විධිවිධාන, පහත දැක්වෙන මද වෙනස් කිරීම්වලට යටත් ව ඒ දේපළ විෂයෙහි අදාළ විය යුතු ය:—

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය, ඒ උපවගන්තියෙහි "(1933 අගෝස්තු යන්නෙහි සිට" යම් අතිරික්තයක්" යන්න දක්වා වූ සියලු ඉලක්කම් හා වචන වෙනුවට පහත දැක්වෙන පාඨය ආදේශ කරනු ලැබූ ලෙස බල පැවැත්විය යුතු ය:—

"264ඈ වන වගන්තිය යටතේ සභාව විසින් තක්සේරු කරන ලද යම් ඉඩමක හෝ වෙනත් නිශ්චල දේපළක වටිනාකම 262 වන වගන්තිය යටතේ සභාව විසින් ඒ ඉඩම හෝ වෙනත් නිශ්චල දේපළ සඳහා ගෙවන ලද මිල ඉක්මවන අවස්ථාවක (මින් මතු මේ වගන්තියෙහි "අතිරික්තය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ අතිරික්තය";

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය, ඒ උපවගන්තියෙහි "විකිණීමේ හා සමර්පණය කිරීමේ" යන වචන වෙනුවට "මහා නගර සභාව විසින් ඒ ඉඩමේ හෝ වෙනත් නිශ්චල දේපළෙහි වටිනාකම තක්සේරු කිරීමේ" යන වචන ආදේශ කරනු ලැබූ ලෙස බල පැවැත්විය යුතු ය.

(ඇ) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය—

(i) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කරනු ලැබූ ලෙස:—

"(ආආ) ඉඩම හෝ දේපළ සම්බන්ධයෙන් 262 වන වගන්තිය යටතේ සභාව විසින් ගෙවන ලද මුදල;" සහ

(ii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "වැඩි දියුණු කිරීම" යන වචනවල සිට "සමර්පණය කිරීම" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට "වැඩි දියුණු කිරීම, වටිනාකම තක්සේරු කිරීම සහ ඉඩම හෝ දේපළ සමර්පණය කිරීම" යන වචන ආදේශ කරනු ලැබූ ලෙස

බලපැවැත්විය යුතු ය; තව ද

(ඇ) ඒ වගන්තියේ (7) වන උපවගන්තිය, එහි "විකුණූ හා සමර්පණය කළ" යන වචන වෙනුවට "සභාව විසින් සභාවට ම තබා ගන්නා ලද" යන වචන ආදේශ කරනු ලැබූ ලෙස බල පැවැත්විය යුතු ය.

**265.*** (1) මහා නගරය ඇතුළත පිහිටි නිශ්චල දේපළවල උකස් කර හා ඒවායේ උකස් හිමියන්ගේ ලිපිනය ලියාපදිංචි කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා මගින් විධිවිධාන සැලැස්වීම එක් එක් මහා නගර සභාවේ යුතුකම විය යුතු ය.

උකස්කර ලියාපදිංචි කිරීම හා විකිණීම පිළිබඳ දන්වීම.

(2) මෙම වගන්තිය යටතේ යම් උකස්කරයක් ලියාපදිංචි කරන ලද්දේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළ, වරිපනම් බදු සහ බදු අයකර ගැනීම සඳහා විකිණීමට ඉදිරිපත් කිරීමට පෙර, යටත් පිරිසෙයින් විකිණීමේ දිනයට දවස් විසිඑකකට කලින්, ඒ විකිණීම පිළිබඳ දැන්වීමක් උකස් හිමියාගේ ලියාපදිංචි කළ ලිපිනයට තැපෑලෙන් යැවීමට සභාව විසින් සැලැස්විය යුතු ය.

**266.*** (1) කුලිය අය වීමට ඇති දිනය පසු වීමෙන් දින දහ හතරක් ඇතුළත එය ගෙවීම පැහැර හරින සභාවේ කුලී නිවැසියකුට, කුලී නිවැසියාව අවසන් කරමින් හා දැන්වීම භාර දුන් දින සිට එක් මාසයක් අවසානයේ දී හෝ ඊට ප්‍රථමයෙන් ඉවත් වී යන ලෙස නියම කරමින්, සභාව විසින් දැන්වීමක් භාරදීමට සැලැස් විය හැකි ය.

සභාවේ කුලී නිවැසියන්ගේ කුලී නිවැසියාව අවසන් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටත් වූ සෑම දැන්වීමක් ම අවස්ථානුකූල ව අවශ්‍ය වන වෙනස් කිරීම් සහිත ව නව වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දුන් දැන්වීමකට අනුකූල ව ඉවත් ව යෑම කුලී නිවැසියකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ කුලී නිවැසියා සහ ඔහු යටතේ හෝ ඔහුගේ අවසරය ඇතිව ඒ කුලියට දී ඇති ස්ථානයෙහි පදිංචි සියලු තැනැත්තන් ඉන් ඉවත් කිරීම සඳහා, බල පත්‍රයෙහි නම් කරනු ලැබූ සභාවේ නිලධරයකුට හා ඔහුගේ සහායකයන්ට බල පත්‍රයක් මගින් බලය පැවරීම සභාව විසින් කළ හැකි ය.

(4) 3 වන උපවගන්තිය යටතේ වූ සෑම බල පත්‍රයක් ම අවස්ථානුකූල ව අවශ්‍ය වන වෙනස් කිරීම් සහිත ව, දහවන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව විය යුතු ය.

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාල කිරීම ලිහිල් කරන ලදී. එකී ආඥාපනත් 76 වන වගන්තිය බලන්න.

(5) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ කුලී නිවැසියකු විසින්, ඒ දැන්වීම භාර දීමේ සිට දින දහයක් ඇතුළත, එම ස්ථානය පිහිටි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති ප්‍රාථමික අධිකරණය වෙත නෙරපීම නැවැත්වීමේ ආඥාවක් සඳහා පෙත්සමක් මගින් ඉල්ලීමක් කළ හැකි ය.

(6) ඒ ඉල්ලීම කරනු ලැබූ විට, ප්‍රාථමික අධිකරණය විසින්, සභාවට ඇහුම්දීමෙන් පසු, ලඝු විභාගයක් පැවැත්විය යුතු අතර, නෙරපීම සහමුලින් ම හෝ නියම කරන ලද කාල සීමාවකට නතර කරමින් හෝ අවස්ථානුකූල ව සුදුසු යැයි පෙනී යන්නේ නම්, නෙරපීම නැවැත්වීම ප්‍රතික්ෂේප කරමින් ආඥාවක් කළ යුතු ය. ඒ සෑම ආඥාවක් ම අවසානාත්මක හා නිරණාත්මක විය යුතු අතර, ඊට විරුද්ධව අභියාචනයක් නොකළ හැකි විය යුතු ය.

සභාවට අයවිය යුතු මුදල් අත් හැර දැමීම.

[1986 අංක 29 § 60]

266අ. අත් හැර දමනු ලබන මුදල නොසැලකිය යුතු තරම් වන බව හෝ අයකරගත නොහැකි බව හෝ එම මුදල ගෙවීමට යටත් තැනැත්තාගේ දිළිඳු බව උඩ එම මුදල ලියා අත්හැරිය යුතු බව සභාවට පෙනී ගියහොත් (252 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් අත් හැර දැමීම සඳහා විධිවිධාන සලස්වනු ලැබූ මුදලක් නොවන) සභාවට යම් පුද්ගලයකුගෙන් අයවිය යුතු යම් සම්පූර්ණ මුදලක හෝ ඒ මුදලින් යම් කොටසක් හෝ යෝජනා සම්මතයක් මගින් සභාව විසින් අත් හැර දමනු ලැබිය හැකි ය. රුපියල් එක් දහස ඉක්මවන මුදලක් අත් හැර දැමීමට අදාළ වන එවැනි සෑම යෝජනා සම්මතයක් ම අමාත්‍යවරයාගේ අනුමතයට යටත් විය යුතු ය.

---

## XIII වන කොටස

### අතුරු ව්‍යවස්ථා

අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය.

267. (1) මේ ආඥාපනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි පෙනී යන අතුරු ව්‍යවස්ථා කලින් කළ සෑදීම ද එසේ සෑදූ පසු ඒ අතුරු ව්‍යවස්ථා ප්‍රත්‍යාදිෂ්ඨ හෝ සංශෝධනය කිරීම ද සෑම මහා නගර සභාවක් විසින් ම කළ හැකි ය.

(2) මහා නගර සභාවක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක සෑම කඩ කිරීමක් ම මෙම ආඥාපනත යටතේ වූ වරදක් විය යුතු ය.

[1981 අංක 61 § 10.]

(3) අතුරු ව්‍යවස්ථා කඩකිරීම සම්බන්ධයෙන් ඒ අතුරු ව්‍යවස්ථා මගින් පහත දැක්වෙන දණ්ඩන සඳහා විධිවිධාන සලස්වනු ලැබේ :—

(අ) පළමුවන වරදක් සම්බන්ධයෙන් රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයක් ;

(ආ) දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයක් ; සහ

(ඇ) නොකඩව කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයක්.

අතුරු ව්‍යවස්ථා අනුමත කිරීම හා පළ කිරීම

268. (1) කිසි ම අතුරු ව්‍යවස්ථාවක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ පාර්ලිමේන්තුව විසින් ස්ථිර කරන තෙක් සහ ඒ ස්ථිර කිරීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක් බල නොපැවැත්විය යුතු ය.

(2) ඒ ස්ථිර කිරීම පිළිබඳ නිවේදනය කිරීමෙන් ඉක්බිති ව සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, එය මෙහි පනවනු ලැබුවක් මෙන් වලංගු සහ බලසහිත විය යුතු ය.

වැරදි සමථයකට පත්කිරීමේ බලය. [1981 අංක 61 § 11.]

268අ. (1) 272 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යම් තැනැත්තකු විසින් කඩ කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා 267 වන වගන්තිය යටතේ එයින් වරදකරු කරනු ලැබ නැත්නම්, වරද සමථයකට පත් කරන ලෙස ඒ වරදකරු ඉල්ලා සිටින්නේ නම්, නගරාධිපතිවරයා විසින්, 267 වන වගන්තිය යටතේ ඒ වරද සඳහා නියම කළ හැකි උපරිම දඩයෙන් හතරෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් සඳහා ඒ වරද සමථයකට පත් කරනු ලැබිය යුතු අතර එවැනි යම් වරදකරුවකුට විරුද්ධව නඩු පැවරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, නඩු තීන්දුව දීමට පෙර කවර වූ හෝ විටක නගරාධිපතිවරයා විසින් අධිකරණයේ අනුමැතිය ඇතිව ඒ වරද සමථයකට පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නගරාධිපතිවරයා විසින් පිළිගන්නා ලද යම් මුදල් ප්‍රමාණයක් නාගරික අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

අතුරු ව්‍යවස්ථාවල අතිරේක විධිවිධාන.

269. (1) දැන්වීම දීම පිළිබඳව ද යම් වීථියක්, ගොඩනැගිල්ලක්, කාණුවක් හෝ වෙනත් කර්මාන්තයක් සැලසුම් කිරීමට, තැනීමට හෝ වෙනස් කිරීමට අදහස් කරන තැනැත්තන් විසින් තැන්පත් කළ යුතු සැලසුම් හා හරස් කැපුම් පිළිබඳව ද, සභාවේ නිලධරයන් විසින් කළ යුතු පරීක්ෂා කිරීම් පිළිබඳව ද අතුරු ව්‍යවස්ථා කඩ කරමින් ආරම්භ කර ඇති හෝ කර ඇති යම් කර්මාන්තයක් (මේ ආඥාපනතේ විධිවිධානවලට යටත් ව) ඉවත් කිරීමට, වෙනස් කිරීමට හෝ බිඳ හෙළීමට ඒ නිලධරයන්ට ඇති බලය පිළිබඳව ද අවශ්‍ය යැයි සභාව විසින් කරනු ලබන විධිවිධාන අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් කර පැනවීමෙන් අතුරු ව්‍යවස්ථා කිසිවක් පිළිපැදීම සඳහා මහා නගර සභාවක් විසින් විධිවිධාන සැලැස්විය හැකි ය:

එසේ වුව ද, වීදි, ගොඩනැගිලි, කාණු හෝ වෙනත් කර්මාන්ත සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කිසිවක වූ නියමයන්, එහි ප්‍රකාශිතව ම පටහැනි ප්‍රකාශයක් ඇති අවස්ථාවලදී හැර, එම අතුරු ව්‍යවස්ථා බලසහිත වීමට පෙර අවස්ථාවෝචිත පරිදි එසේ තනන ලද හෝ වෙනස් කරන ලද එකී යම් කර්මාන්තයකට අදාළ නොවිය යුතු ය.

(2) මහා නගරයෙන් පිටත යම් නිශ්චිත තැනක් හෝ ස්ථානයක් හෝ එම තැනෙහි හෝ ස්ථානයෙහි පරිපාලනය හෝ කළමණාකරණය සභාවක් වෙත සතුවී ඇත් නම් ඒ සභාව විසින් එම තැනෙහි හෝ ස්ථානයෙහි බලපැවැත් විය යුතු අතුරු ව්‍යවස්ථා සෑදිය හැකිය.

මහා නාගරික කිරි පට්ටි හා රජක ස්ථාන ආඥා පනත අදාළ කිරීම.

270. යම් කාරණයක් විධිමත් කිරීම සම්බන්ධයෙන් මහා නාගරික කිරි පට්ටි හා රජක ස්ථාන ආඥාපනතේ දැනටමත් විධිවිධාන සලස්වා තිබේ ද එම කාරණය සම්බන්ධයෙන් ම අමාත්‍යවරයා සෑහීමට පත් වන පරිදි මහා නගර සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා සාදා ඇති අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින්, අමාත්‍යවරයා විසින්, එම නිවේදනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන ප්‍රමාණයකට ඒ ආඥාපනතේ විධිවිධාන ඒ මහා නගරය තුළ අදාළ නොවිය යුතු බව ප්‍රකාශ කළ හැකි ය.

අතුරු ව්‍යවස්ථා වල පිටපත් මහා නගර සභා කාර්යාලයෙහි තැබිය යුතු බව.

271. මහා නගර සභාවක් විසින් සාදන ලද සියලු ම අතුරු ව්‍යවස්ථාවල පිටපත් මහා නගර සභා කාර්යාලයෙහි තබා ගත යුතු අතර ඒවා මහජනයට විකිණීම සඳහා තිබිය යුතු ය.

අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි වන්නේ කවර කාරණා සම්බන්ධයෙන්ද යන වග.

272. විශේෂයෙන් ම ද ඉහතින් වූ වගන්තිවලින් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව ද පහත සඳහන් කාරණා සියල්ල ම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මහා නගර සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි ය :—

(1) පහත සඳහන් කාරණා ඇතුළුව, නිලධරයන්, සේවකයන් සහ කාර්ය පටිපාටිය :—

(අ) (නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, නාගරික කොමසාරිස්, ප්‍රධාන කොමසාරිස් සහ නාගරික මහේස්ත්‍රාත් යන තනතුරු සහ ධුර නොවන) තනතුරු සහ ධුර ඇති කිරීම ;

(ආ) පළාත් පාලන සේවයේ තනතුරු නොවන සභාවේ සේවයෙහි තනතුරුවලට හෝ ධුරවලට පත් කිරීම ;

(ඇ) පළාත් පාලන සේවයේ සාමාජිකයන් නොවන සභාවේ නිලධරයන්ට සහ සේවකයන්ට වැටුප්, දීමනා සහ පාරිශ්‍රමික ගෙවීම ;

(ඈ) (ඇ) අනුඡේදයේ සඳහන් නිලධරයන්ට සහ සේවකයන්ට සේවයට නොපැමිණ සිටීමේ නිවාඩු දීම ;

* පළාත් පාලන සේවා පනතේ 2(2) වන සහ 19(2) වන වගන්තිය ද බලන්න

(ඉ) සභාවේ සේවයේ නිලධරයන් සහ සේවකයන් විසින් ඔවුන්ගේ වෙන් වෙන් කාර්ය නිසි පරිදි ඉටු කිරීම ;

(ඊ) සභාවේ සහ කමිටුවල රැස්වීම් විධිමත් කිරීම ;

(උ) මහා නගරයේ කටයුතුවලට ආනුෂංගික සියලු ඇස්තමේන්තු, අය වැය ලේඛන, ප්‍රකාශ සහ වාර්තා පිළියෙළ කිරීමේ දී භාවිත කළ යුතු ආකෘති ;

(ඌ) මහා නගරයේ ගිණුම් තැබීම සඳහා වූ ආකෘති ;

(එ) මේ ආඥාපනතේ කාර්ය සඳහා තැබීමට හෝ භාවිත කිරීමට නියමිත පොත්, නාම ලේඛන හෝ ලේඛන කිසිවක් සඳහා වූ ආකෘති.

(2) පහත සඳහන් කාරණා ඇතුළු ව, ගොඩනැගිලි, ගොඩනැගිලි කටයුතු සහ නිර්මාණ්ත :—

(අ) අලුත් වීථිවල එක පෙළට, මට්ටම්, පළල සහ එම වීථි තැනීම ;

(ආ) අලුත් ගොඩනැගිලිවල බිත්තිවල, අත්තිවාරම්වල, වහළවල සහ දුම් කවුලුවල ව්‍යුහය සහ ස්ථායිතාව, ගිනි ඇති වීම වැළැක්වීම සහ සෞඛ්‍ය කාර්ය ;

(ඇ) උදන්වල සහ තරප්පුවල ව්‍යුහය, මනුෂ්‍ය වාසය සඳහා භාවිත කිරීමට අදහස් කර ඇති කාමරවල උස ප්‍රමාණය සහ වාතාශ්‍රය සහ ගෙබිම්වල ව්‍යුහය සහ මට්ටම් ;

(ඈ) වාතය නිදහසේ සංසරණය වීම සඳහා ගොඩනැගිලි අවට තිබිය යුතු ඉඩෙහි ප්‍රමාණවත් බව සහ ගොඩනැගිලිවල වාතාශ්‍රය ;

(ඉ) අංගනවල සහ ගොඩනැගිලි ආශ්‍රිත විවෘත බිම් ප්‍රදේශවල ගල් ඇල්ලීම ;

(ඊ) භාවිත කළ යුතු ද්‍රව්‍යවල තත්ත්වය ;

(උ) අසළ ගොඩනැගිලි සමඟ ගත් විට ගොඩනැගිලි ඉදිරි සීමාව ;

(ඌ) ගොඩනැගිල්ල වීථියකට යාව ඇති යාබද ගොඩනැගිලි පේළියකින් එකක් වූ විට ගොඩනැගිලිවල ඉදිරි පෙනුම ;

(එ) අලුත් ගොඩනැගිලි සඳහා හෝ පවතින ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ සලකා බැලීම සඳහා ගාස්තු අය කිරීම.

(3) පහත සඳහන් කටයුතු හා කරුණු ද ඇතුළත් ව, ජලාපවහනය :—

(අ) කාණු, ජල වැසිකිළි, කැසිකිළි, කුණු දිය බක්කි, නාන ස්ථාන හා සනීපාරක්ෂක උපකරණ සැලසුම් කිරීම, තැනීම හෝ වෙනස් කිරීම, ජල වැසිකිළි දොර හැරීම, බිත්තිවල, මිදුල්වල සහ විවෘත ස්ථාන වල ගල් ඇල්ලීම;

(ආ) සියලු කාණු, ජල වැසිකිළි සහ වෙනත් සනීපාරක්ෂක උපකරණ පරීක්ෂා කිරීම හා පිරිසිදු කිරීම සඳහා ගාස්තු නියම කිරීම හා අය කර ගැනීම;

(ඇ) ජලාපවහන වැඩ ක්‍රියාත්මක කරන තැනැත්තන්ට බල පත්‍ර නිකුත් කිරීම සහ ඒ බල පත්‍ර නිකුත් කරනු ලැබිය හැකි වන්නේ සහ පාවිච්චි කරනු ලැබිය හැකි වන්නේ යම් කොන්දේසිවලට යටත් ව ද ඒ කොන්දේසි, එම වැඩ ක්‍රියාත්මක කළ යුතු ආකාරය සහ එම බලපත්‍ර සඳහා ගාස්තු නියම කිරීම සහ අය කර ගැනීම;

(ඈ) සභාව විසින් තනනු ලැබූ හෝ සභාව සතු කරනු ලැබූ හෝ සභාව විසින් පවත්වා ගෙන යනු ලබන වීථි හෝ පාරවල් නොවන අලුත් වීථි සහ පාරවල් හෝ පවත්නා වීථි හෝ පාරවල් සඳහා නිසි හා ප්‍රමාණවත් කසළ කාණු සහ ජලාපවහන ක්‍රම සැපයීම;

(ඉ) පොදු වැසිකිළි භාවිතය විධිමත් කිරීම සහ එම වැසිකිළි භාවිත කරන තැනැත්තන්ට තිබිය යුතු සදාචාර පැවතුම්.

(4) පානය සඳහා සැපයුතු ඇතුළු ජල කර්මාන්ත :—

(අ) පොදු ප්‍රයෝජනය හෝ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා සපයනු ලබන ජලය අපතේ යෑම, අයුතු ලෙස පාවිච්චි කිරීම, අනිසි ලෙස පරිභෝජනය කිරීම හෝ අපවිත්‍ර කිරීම වැළැක්වීම;

(ආ) පිළිවෙළින්, ජලය ගෙන යෑම, පාවිච්චියට දීම, විධි මත් කිරීම, හා රැස් කර තැබීම සඳහා යොදා ගනු ලබන නළ, කපාට, කරාම, කුණ්ඩ, කසළ පෝච්චි, ජල වැසිකිළි සහ වෙනත් උපකරණ හා භාජන හෝ ඉන් කිසිවක් පාවිච්චි කරන ආකාරය විධාන කිරීම සහ ඒවායෙහි හෝ ඉන් කිසිවක ප්‍රමාණය, ස්වභාවය, ශක්තිය, ද්‍රව්‍යය සහ ඒවා හෝ ඉන්

කිසිවක් පිළියෙළ කරන ක්‍රමය, ඒවායේ හෝ ඉන් කිසිවක පිහිටුම්, නැතහොත් ඒවා හෝ ඉන් කිසිවක් වෙනස් කිරීම, ඉවත් කිරීම, අලුත් කිරීම හා අලුත්වැඩියා කිරීම යන මේවා නියම කිරීම;

(ඇ) පොදු ජල සම්පාදනය ජල නළ යෙදීමෙන් විධිමත් කිරීම සහ එම ජල නළ පාවිච්චිය විධිමත් කිරීම;

(ඈ) පෞද්ගලික සේවා මගින් ජලය සැපයීම හා ඒ සඳහා යොදා ගත යුතු ද්‍රව්‍ය හා තිරවුරු විධිමත් කිරීම;

(ඉ) මිනුම් ක්‍රමයට ජලය සැපයීම හා ඒ කාර්යය සඳහා හෝ සම්බන්ධයෙන් යොදා ගනු ලබන ද්‍රව්‍ය, මීටර්, ඇම්පන්න සහ තිරවුරු ද විධිමත් කිරීම;

(ඊ) ගෘහ කාර්යයන් නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම කළ යුතු වන්නේ යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියමයන් හා කොන්දේසි සහ එසේ සපයනු ලබන ජලය සඳහා ගෙවිය යුතු මිල ගණන් විධිමත් කිරීම;

(උ) ජලය සැපයීම සඳහා ලැබිය යුතු මුදල් අය කර ගැනීමේ කාර්ය පටිපාටිය නියම කිරීම; සහ

(ඌ) ජල කර්මාන්තවලින් සපයනු ලබන ජලය සැපයීමට හා පාලනය කිරීමට අදාළ වූ සහ අවශ්‍ය යැයි සභාවට පෙනී යන්නා වූ වෙනත් සෑම කාර්යයක්.

(5) පහත සඳහන් කරුණු ඇතුළු ව සනීපාරක්ෂාව :—

(අ) කරදර වැළැක්වීම හා නතර කිරීම;

(ආ) මල මූත්‍ර ඉවත් කිරීම සහ බැහැරලීම සහ එසේ ඉවත් කිරීම සහ බැහැරලීම සඳහා ගාස්තු නියම කිරීම සහ අය කර ගැනීම;

(ඇ) සියලු ම කාණු, වැසිකිළි, වළ වැසිකිළි, කාණු දිය වළවල්, අළු වළවල් හා සනීපාරක්ෂක උපකරණ පරීක්ෂා කිරීම, විධිමත් කිරීම, පවත්වා ගෙන යාම හා පිරිසිදු කිරීම, මනුෂ්‍ය වාසය සඳහා නුසුදුසු ගොඩනැගිලි හෝ ගොඩනැගිලි කොටස් වසා දැමීම සහ ඒවා මනුෂ්‍ය වාසය සඳහා යොදා ගැනීම තහනම් කිරීම;

(ඈ) පෞද්ගලික ස්ථානවල කසළ ශෝධනය;

(ඉ) අසාදක රෝගවලින් පෙළෙන තැනැත්තන් භාර ගැනීම සඳහා පිහිටුවා ඇති නිවාස හෝ ස්ථාන විධිමත් කිරීම සහ එම නිවාස හෝ ස්ථාන පාවිච්චි කිරීම සහ ඒවායෙහි නැවතී සිටීම සඳහා ගාස්තු නියම කිරීම හා අය කර ගැනීම ;

(ඊ) තාවකාලික ගොඩනැගිලි හා අසාදිත භාණ්ඩ පිරිසිදු කිරීම, විෂබීජ නාශනය කිරීම හා විනාශ කිරීම සහ ගොඩනැගිලි පිරිසිදු කිරීම සහ විෂබීජ නාශනය කිරීම ;

(උ) ඌරන් ඇති කිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම ;

(ඌ) මැලේරියා රෝගය වැළැක්වීම සහ මදුරුවන් ද ලෙඩ බෝ කරන කෘමීන් ද විනාශ කිරීම ;

(එ) අස්හල්වලට සහ ගවහල්වලට බල පත්‍ර දීම, ඒවා විධිමත් කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ;

(ඒ) (සභාව විසින් පිහිටුවන ලද නාන ස්ථාන සහ සතුන් නාවන ස්ථාන හැර) නාන සහ සතුන් නාවන ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ඇතුළු ව රෙදි සේදීම සහ නෑම.

(6) පහත සඳහන් කරුණු ඇතුළු ව වීථි :—

(අ) වීථි දියුණු කිරීම, සෑදීම, අලුත්වැඩියා කිරීම, වීථිවලට ජලය යෙදීම සහ වීථි ආලෝකමත් කිරීම ;

(ආ) වීථිවල, පාරවල්වල සහ ඇළවල්වල බාධක සහ ප්‍රසර්පණ වැළැක්වීම සහ නතර කිරීම ;

(ඇ) වීථිවල රථවාහන ගමනාගමනය විධිමත් කිරීම ;

[1983 අංක 5 § 2.] (ඈ) යම් වීථියක හෝ වීථියකට යාව පිහිටි සේ දැන්වීම් පුවරු හා වෙනත් තාවකාලික ව්‍යුහයන් ඉදි කිරීම හෝ යම් වර්ගයක සැරසිල්ලක් කිරීම හා ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද යම් අවසර පත්‍ර සඳහා ගාස්තු අය කිරීම.

(7) පහත සඳහන් කරුණු ඇතුළු ව, ඉඩම් සහ දේපළ :—

(අ)*මහා නගරය ඇතුළත ඇති ගොඩනැගිලි, ඉඩම් සහ ගෙපත් වර්ග කිරීම සහ තක්සේරු කිරීම ;

---

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලිහිල් කරන ලදි—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

(ආ) මහා නගරය තුළ පිහිටි ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන් ගේ නම් හා ලිපිනය මහා නගර සභා කාර්යාලයෙහි ලියාපදිංචි කිරීම. එම නම් හා ලිපිනය ලියාපදිංචි කරන ලද නාම ලේඛන පරීක්ෂා කිරීම සහ එසේ ලියාපදිංචි කිරීම හා පරීක්ෂා කිරීම සඳහා ගාස්තු නියම කිරීම හා අය කර ගැනීම ;

(ඇ) මහා නගරය තුළ පිහිටි නිශ්චල දේපළ පිළිබඳ උකස් හා එම උකස් හිමියන්ගේ ලිපිනය මහා නගර සභා කාර්යාලයෙහි ලියාපදිංචි කිරීම, එම උකස් ලියාපදිංචි කරන ලද නාම ලේඛන පරීක්ෂා කිරීම සහ එසේ ලියාපදිංචි කිරීම හා පරීක්ෂා කිරීම සඳහා ගාස්තු නියම කිරීම හා අය කර ගැනීම ;

(ඈ)*වරිපනම් බදු හෝ බදු අය කර ගැනීම සඳහා තහනම් කරන ලද නිශ්චල දේපළ විකිණීමේ ලිඛිත දැන්වීම් එම ලියාපදිංචි උකස් හිමියන්ට තැපැල් කිරීම ;

(ඉ) පෞද්ගලික හෝ පොදු ඉඩම්වල මැනීම් සහ වැටවල් ඉදි කිරීම සහ ආරක්ෂා කිරීම ;

(ඊ) පොදු තණ බිම් බලාගැනීම සහ විධිමත් කිරීම සහ ඒ බිම් භාවිතය සඳහා ගාස්තු අය කිරීම.

(8) පහත සඳහන් දේ ඇතුළු ව, වෙළෙඳ පොළවල්, පොළවල්, බේකරි සහ ආහාර ද්‍රව්‍ය :— [1957 අංක 15 § 10.]

(අ) බේකරිවලට සහ ඒවායේ සේවයේ නියුක්ත තැනැත්තන්ට බල පත්‍ර නිකුත් කිරීම සහ බේකරි සහ ඒවායේ සේවයේ නියුක්ත තැනැත්තන් ද පාන් සෑදීම සහ ඒවායේ තත්ත්වය ද විධිමත් කිරීම, පාලනය කිරීම, පවත්වා ගෙන යෑම හා පරීක්ෂා කිරීම ;

(ආ) ගවාදි සතුන් සහ වෙනත් ඇති කරන සතුන් විකිණීම සඳහා වූ වෙළෙඳ ස්ථාන ඇතුළු ව, පෞද්ගලික මෙන් ම පොදු වෙළෙඳ පොළවල් හා පොළවල් පිහිටුවීම සහ ඒ වෙළෙඳ පොළවල් සහ පොළවල් හා ඒවායේ ඇති ගොඩනැගිලි, වෙළෙඳ හල්, බඩු, වෙළෙඳ කුටි, කොටු සහ බක්කි විධිමත් කිරීම, පාලනය කිරීම හා පාවිච්චි කිරීම සහ ඒවායේ හෝ ඒවාට පිවිසෙන මාර්ගවල කරදර හෝ බාධා වැළැක්වීම ; 1957 අංක 15 § 10.] [1957 අංක 15 § 10.]

* වරිපනම් හා තක්සේරු ආඥපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලියිල් කරන ලදී—එකී ආඥපනතේ 76 වන වගන්තිය බලන්න.

(ඇ) මහා නගරය තුළට ගෙනෙන ලද අපථ්‍ය මස්, මාළු හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය තහනම් කිරීම, අහිමි කිරීම, ඉවත් කිරීම හා විනාශ කිරීම සහ ඒවා විකිණීම නැතහොත් විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම වැළැක්වීම ;

(ඈ) යථා පරිදි බල පත්‍ර ලත් ස්ථානවල හැර වෙනත් ස්ථානවල ගව වෙළෙඳ හල් පැවැත්වීම තහනම් කිරීම, ඒ වෙළෙඳ හල් පැවැත්වීම සඳහා බල පත්‍ර නිකුත් කිරීම හෝ ඒ බල පත්‍රවල කොන්දේසි කඩ කරනු ලැබූ අවස්ථාවල දී ඒ බල පත්‍ර අවලංගු කිරීම ;

(ඉ) යම් අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය කරමින් විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති ද්‍රව්‍ය තහනම් කිරීම සහ ඉවත් කිරීම ;

(ඊ) පවත්නා මිල ගණන්වල ලැයිස්තුවක් සකස් කිරීම හා පළ කිරීම ;

(උ) මැනීමෙන් හෝ කිරීමෙන් හෝ මිටි වශයෙන් හෝ කැලි වශයෙන් හෝ භාණ්ඩ විකිණීමේ ක්‍රමය විධිමත් කිරීම ;

[1957 අංක 15 § 10.]

(ඌ) යම් පොදු හෝ පෞද්ගලික වෙළෙඳ පොළක හෝ යම් ආහාර ද්‍රව්‍යයක් යම් මිලකට වැඩියෙන් නොවිකිණිය යුත්තේ ද ඒ මිල (තොග මිල හා සිල්ලරට මිල යන දෙක ම) නියම කිරීම ;

(ඍ) පණ ඇති සතුන් විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම.

(9) ගෝඝාතක ස්ථාන භාවිත කිරීම සඳහා ගාස්තු නියම කර අය කරගැනීම ඇතුළු ව, ගෝඝාතක ස්ථානවල කළමනාකරණය හා පාලනය සහ එම ස්ථානවල සතුන්ට හිංසා කිරීම වැළැක්වීම.

(10) අයාලේ යන ගවයන් සඳහා වූ කොටුවල සතුන් තැබීම සඳහා ගාස්තු නියම කිරීම, පැවැත්වීම හා අය කිරීම ඇතුළු ව අයාලේ යන ගවයන් සහ එම කොටුවල සතුන් කොටු කර තැබීමේ වියදම.

*වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය කින් නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි බලසහිත නොවිය යුතු ය.—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

(11) ගවයින් සඳහා නිරෝධායන ස්ථාන පවත්වාගෙන යාම සහ විධිමත් කිරීම, එහි රඳවා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම, ගව ආදී සතුන් සහ බල්ලන් එන්නත් කිරීම සහ ප්‍රතිශක්තිකරණය සඳහා පහසුකම් සැපයීම. [1987 අංක 19 § 4 (ආ)]

(12)*දේපල තක්සේරු කිරීම සහ වරිපනම් හා බදු එකතු කිරීම ඇතුළුව, ආදායම.

(13) මේ ආඥාපනත යටතේ කිරීමට හෝ පිළිපැදීමට නියමිත යම් ක්‍රියාවක්, කාරණයක් හෝ දෙයක් සඳහා පැනවිය යුතු හෝ අය කළයුතු ගාස්තු සහ අයකිරීම් නියම කිරීම.

(14) හිසකෙස් සකස් කරන්නන්ගේ සහ කරණවෑමියන්ගේ සාප්පුවලට සහ සැලුන්වලට බලපත්‍ර නිකුත් කිරීම, ඒවා විධිමත් කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම.

(15) පීඩාකාරී හෝ අන්තරායදායක කර්මාන්ත හෝ ව්‍යාපාර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම.

(16) මුදල් මාරු කරන්නන්ට බල පත්‍ර දීම.

(17) (සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද විගණකවරුන් නොවන) ගණකාධිකාරීවරයන්ට හා විගණකවරුන්ට බල පත්‍ර දීම.

(18)†ගින්නෙන් ඇති විය හැකි අන්තරායවලින් මහජනයා ආරක්ෂා කිරීම ද ඇතුළු ව, පොදු විනෝද ස්ථාන සඳහා බල පත්‍ර දීම, එම ස්ථාන විධිමත් කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම.

(19) හෝටල්වල, සාප්පුවල හා වෙළඳ පොළවල් නොවන වෙනත් තැන්වල ආහාර හෝ බීම ද්‍රව්‍ය විකිණීම හෝ විකිණීමේ කාර්ය සඳහා ගබඩා කිරීම හෝ නිෂ්පාදනය කිරීම ඇතුළුව, එම ද්‍රව්‍ය විකිණීම හෝ විකිණීමේ කාර්ය සඳහා ගබඩා කිරීම හෝ නිෂ්පාදනය කිරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම.

(20) පහත සඳහන් කටයුතු හා කරුණු ද ඇතුළු ව, සංචාරක වෙළෙන්දන් :—

(අ) සංචාරක වෙළෙන්දන් පිළිබඳ අධීක්ෂණය හෝ පාලනය ;

---

* වරිපනම් හා තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ කෙරෙහි අදාළ කිරීම ලිහිල් කරන ලදී—එකී ආඥාපනතේ 76 වන වගන්තිය බලන්න.

† ප්‍රසිද්ධ රඟුම් දැක්වීම් ආඥාපනතේ 5(2) වන වගන්තිය ද බලන්න.

(ආ) ඒ අධීක්ෂණය හෝ පාලනය කිරීමේ කාර්යය සඳහා බල පත්‍ර නිකුත් කිරීම සහ එම බල පත්‍රවලට අනුයුක්ත කළ යුතු කොන්දේසි ;

(ඇ) යම් නිශ්චිත භාණ්ඩයක් විකිණීම හෝ යම් නියමිත ස්ථානයක හෝ ප්‍රදේශයක භාණ්ඩ විකිණීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම.

(21) පහත සඳහන් කටයුතු ඇතුළු ව, ලොන්ඩරි හා රෙදි සේදීම :—

(අ) (සභාව විසින් පිහිටුවන ලද පොදු ලොන්ඩරි හැර) ලොන්ඩරි සහ ලොන්ඩරිකරුවන් සඳහා බල පත්‍ර දීම, එම ස්ථාන හා තැනැත්තන්ගේ කටයුතු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ;

(ආ) ලොන්ඩරි පරීක්ෂා කිරීම සහ ලොන්ඩරි වැඩවල නියුක්ත තැනැත්තන් සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම ;

(ඇ) ලොන්ඩරි ආලෝක කිරීම, සංවාතනය කිරීම, පිරිසිදු කිරීම, ඒවාට ජලාපවහන ක්‍රම යෙදීම සහ ජලය සැපයීම ;

(ඈ) ලොන්ඩරිකරුවන් භාරයේ තිබෙන භාණ්ඩ මඟින් ආසාදනය වීම හා රෝග බෝවීම වැළැක්වීම ;

(ඉ) ලොන්ඩරි මඟින් ද ලොන්ඩරිවලට යැවෙන සහ ලොන්ඩරිවලින් පිට කෙරෙන භාණ්ඩ මඟින් ද ආසාදන හා සංස්පර්ශක රෝග පැතිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට පහසුකම් ඇති කිරීම.

(22) නවාතැන් ගෙවල්වලට, ආපන ශාලාවලට, කෑම විකුණන ස්ථානවලට සහ තේ සහ කෝපි කඩවලට බල පත්‍ර දීම, ඒවා ලියාපදිංචි කිරීම සහ විධිමත් කිරීම.

(23) පහත සඳහන් කටයුතු හා කරුණු ද ඇතුළුව, කිරි පට්ටි :—

(අ) කිරි පට්ටි, කිරි දෙනුන්ගේ මඩු, කිරි හල්, කිරි ගබඩා, කිරි පට්ටිකරුවන්, කිරි දෙනුන් පාලනය කරන්නන් සහ කිරි සපයන්නන් සඳහා බලපත්‍ර දීම, එම ස්ථාන හා ඒ තැනැත්තන් ලියාපදිංචි කිරීම හා විධිමත් කිරීම ;

(ආ) කිරි පට්ටි හා කිරි හරකුන් පරීක්ෂා කිරීම සහ කිරි පට්ටිවල නියුක්ත හෝ විකිණීම සඳහා කිරි බෙදා හැරීමෙහි නියුක්ත තැනැත්තන් සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම ;

(ඇ) කිරි දෙනුන් පාලනය කිරීම හෝ කිරි පට්ටිකරුවන්ගේ වෘත්තිවල යෙදෙන්නන් නැවතී සිටින කිරි පට්ටි හා කිරි දෙනුන්ගේ මඩු ආලෝක කිරීම, සංවාතය කිරීම, පිරිසිදු කිරීම, ඒවාට ජලාපවහන ක්‍රම යෙදීම සහ ජලය සැපයීම ;

(ඈ) කිරි තබා තිබෙන ස්ථානවල, කිරි හල්වල සහ විකිණීම සඳහා කිරි තබා තිබෙන භාජනවල පිරිසිදුකම ;

(ඉ) කිරි අපාසාදනය වීමෙන් හා දූෂණය වීමෙන් ආරක්ෂා කර ගැනීමට කිරි සපයන්නන් සහ කිරි සිල්ලරට විකුණන්නන් විසින් ගෙදිය යුතු පූර්වෝපක්‍රම ;

(ඊ) කිරි ප්‍රමිති කිරීම හා නියමිත ප්‍රමිතියට අඩු කිරි විකිණීම වැළැක්වීම ;

(උ) (උකු කළ හෝ මුදවාපු කිරි ඇතුළු ව) කිරි හෝ කිරි තෙල් හෝ වෙඬරු හෝ කේජු හෝ ආදර්ශකයක ඇති නියමිත කිරි, කිරි තෙල්, වෙඬරු හෝ කේජු ගත යේවායෙහි විය යුතු සාමාන්‍ය සංඝටක කිසිවක යම් ඌනතාවක් හෝ එකතු කළ යම් බාහිර දෙයක් හෝ යම් අනුපාතයක ජලය හෝ නිසා, තත් කාල යෙහි වලංගුව පවතින යම් ප්‍රඥප්තියක, අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක කාර්යයන් සඳහා, ඒ කිරි හෝ කිරි තෙල් හෝ වෙඬරු හෝ කේජු නියම කිරි, කිරි තෙල්, වෙඬරු හෝ කේජු හෝ නොවන බවට හෝ සෞඛ්‍යයට හානිකර බවට හෝ වූ පූර්ව නිගමනයක්, ඊට පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තුරු, ඇති වන්නේ ද ඒ ඌනතාව, බාහිර ද්‍රව්‍යය හෝ ජල අනුපාතය නිශ්චය කිරීම ;

(ඌ) කිරි පට්ටිවල මාර්ගයෙන් අසාදක රෝග හෝ සංස්පර්ශක රෝග පැතිරී යෑම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට පහසුකම් සැලැස්වීම.

(24) බල පත්‍ර දෙන ලද කිරි පට්ටි නොවන ස්ථානවල ඇති කරන කිරි දෙනුන් ලියාපදිංචි කිරීම, එම කිරි දෙනුන් තබා ඇති ගොඩනැගිලි හෝ ගොඩනැගිලිවල කොටස්වල පිරිසිදුකම හා ඒවාට ජලාපවහන ක්‍රම යෙදීම සහ එකී කිරි දෙනුන් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු අය කිරීම.

(25) ජේන්දපළවල් පිහිටුවීම, පවත්වා ගෙන යෑම හා විධිමත් කිරීම.

(26) ගිනි නිවන හමුදාවේ සහාය ලබා ගත හැක්කේ යම් නියම යන් හා කොන්දේසි මත ද ඒ නියමයන් හා කොන්දේසි විධිමත් කිරීම සහ ඒ සහාය සඳහා ගාස්තු නියම කිරීම හා අය කිරීම.

(27) යම් විථියක, පාරක, ඇළක හෝ මැවක සිට පෙනෙන පරිදි දැන්වීම් තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම හෝ පාලනය කිරීම සහ එසේ දැන්වීම් තැබීම සහ ප්‍රදර්ශනය කිරීම පිළිබඳව සාදන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුකූල ව තබනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් වෙනුවෙන් ගාස්තු අය කිරීම.

(28) පහත දැක්වෙන මහජන සේවා පිහිටුවීම, පවත්වාගෙන යෑම, ක්‍රියා කරවීම හා සැපයීම සහ ඒ සම්බන්ධයෙන් ගාස්තු අය කර ගැනීම :—

(අ) ජල සම්පාදනය ;

(ආ) වීථි, පොදු ස්ථාන සහ පොදු ගොඩනැගිලි ආලෝකමත් කිරීම ;

(ඇ) විදුලි ආලෝකය හෝ විදුලි බලය සැපයීම ;

(ඈ) වෙළෙඳ පොළවල් ;

(ඉ) පොදු ස්ථාන, නාන ස්ථාන, ලොන්ඩරි හා සතුන් සෝදන ස්ථාන :

(ඊ) සභාව විසින් සැපයීමට යෝජනා සම්මත කර ගෙන ඇති වෙනත් යම් ආකාරයක මහජන සේවයක්.

[1987 අංක 19 § 4 (ආ)]

(29) කැළි කසළින් සහ මලාපවහනයෙන් අපවිත්‍ර වූ ජලයෙහි මසුන් ඇල්ලීම තහනම් කිරීම සහ වෙරළබඩ මසුන් ඇල්ලීමට ඇති බාධක ඉවත් කිරීම.

(30) ග්‍රැමෆෝන්, ශබ්ද විකාශන, ශබ්ද වර්ධන සහ ස්වයංක්‍රියව හෝ යාන්ත්‍රික ව ශබ්දය ප්‍රතිජනනය කරන වෙනත් උප කරණ තහනම් කිරීම, විධිමත් කිරීම හා පාලනය කිරීම ඇතුළු ව, කරදර නතර කිරීම.

[1979 අංක 42 §7.]

(30අ) මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු වන යම් බද්දක් සම්බන්ධයෙන් හෝ යම් බල පත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් හෝ අවශ්‍ය වන සියලු වාර වාර්තා සහ තොරතුරු සැපයීම ඇතුළුව, බදු නියම කිරීම.

[1987 අංක 19 § 4 (ඇ)]

(30ආ) කර්මාන්ත අපද්‍රව්‍ය විධිමත් කිරීම සහ පාලනය කිරීම.

(31) බල පත්‍ර දීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ පාලනය කිරීම පිණිස අතුරු ව්‍යවස්ථා සෑදීමට සභාවට බලය ඇත්තා වූ යම් ක්‍රියාවක්, කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් බල පත්‍ර නිකුත් කිරීමේ බලධරයාගේ පරම අභිමතය අනුව හෝ නිශ්චිත අවස්ථාගත තත්ත්වයන් යටතේ එම බල පත්‍ර ප්‍රතික්ෂේප කිරීම හා එකී අතුරු ව්‍යවස්ථා අනුව ක්‍රියා නොකිරීම හේතු කොට ගෙන එම බල පත්‍ර අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

(32) මෝටර් වාහන නවත්වා තැබීමේ ස්ථාන සැපයීමෙන් හා ඒ ස්ථානවල මෝටර් වාහන නවත්වා තැබීම සඳහා වූ නියමිත ගාස්තුව අය කර ගැනීමෙන් මහා නගර සභා ප්‍රදේශය ඇතුළත මෝටර් වාහන නවත්වා තැබීම පාලනය කිරීම : [1977 අංක 18 §2.]

එසේ වුව ද, මේ ඡේදයෙ ඉහතින් වූ විධිවිධාන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මෝටර් වාහන සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය.

273. යම් අතුරු ව්‍යවස්ථාවකින් නගරාධිපතිවරයා ඉදිරියෙහි තැබිම නියමිත වූ දැන්වීමක්, හරස් කැපුමක්, සැලැස්මක් හෝ වෙනත් ලියවිල්ලක් ඔහු වෙත භාර දෙනු ලැබීමෙන් හෝ යවනු ලැබීමෙන් පසු සාධාරණ කාලයක් ඇතුළත, යම් කර්මාන්තයක් ක්‍රියාවේ යෙදවීම යෝජනා කරන තැනැත්තකුට හෝ වෙනත් අයකු සඳහා එසේ යෝජනා කරන තැනැත්තාට, ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳ සිය අනුමතය හෝ අනුමත නොකිරීම ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. තවද, ඒ අනුමත නොකිරීම පිළිබඳ දැනුම් දීමෙන් පසු හෝ ඒ අනුමතය නොමැතිව එම කර්මාන්ත ආරම්භ කරනු ලැබී නම් හා එය යම් ආකාරයකින් යම් අතුරු ව්‍යවස්ථාවකට අනුකූල නොවන්නේ නම්, ඒ අතුරු ව්‍යවස්ථාවට අනුකූල නොවන්නා වූ ප්‍රමාණයට එම කර්මාන්තය බිඳ හෙළීමට හෝ ඉවත් කිරීමට සභාව විසින් සැලැස්විය හැකි ය. සැලසුම් අනුමත කිරීම හෝ අනුමත නොකිරීම.

274. යම් අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය වන සේ ආරම්භ කෙරුණු හෝ කෙරුණු යම් කර්මාන්තයක් 273 වන වගන්තිය යටතේ මහා නගර සභාවක් විසින් බිඳ හෙළන ලද හෝ ඉවත් කරන ලද යම් අවස්ථාවක දී හෝ ආරම්භ කිරීම හෝ කිරීම වෙනුවෙන් වරදකරු වන තැනැත්තා දණ්ඩනයකට යටත් වන යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ එසේ ආරම්භ කිරීම හෝ ක්‍රියාත්මක කිරීම වරදක් වන අවස්ථාවක දී, අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය වන ආකාරයෙන් හා තත්ත්වයෙන් එම කර්මාන්තය අඛණ්ඩව පවත්නා කාලය තුළ දී එය දිනපතා අඛණ්ඩව කෙරෙන වරදක් සේ සැලකිය යුතු නමුත් වරද සිදු කෙරුණු හෝ අතුරු ව්‍යවස්ථාව කඩ කෙරුණු පළමුවන දිනයේ සිට අවුරුද්දක් අවසන් වීමෙන් පසු එකී වරද වෙනුවෙන් දණ්ඩනයක් නියම නොකළ යුතු ය. අඛණ්ඩව කෙරෙන වරද.

275. යම් තැනැත්තකුගේ ක්‍රියාවකින් හෝ පැහැර හැරීමකින් මෙම ආඥාපනත යටතේ වූ යම් අතුරු ව්‍යවස්ථා කඩ කිරීමක් සිදු වීම නිසා මහා නගර සභාවක් විසින් වියදම් දරනු ලැබූ අවස්ථාවක දී, මෙම ආඥාපනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකී තැනැත්තාගෙන් ඒ වියදමෙහි මුදල සභාව විසින් අය කර ගත හැකි ය. වියදම් අය කර ගැනීම.

ඇතුළු වීමට ඇති අයිතිවාසිකම.

**276.** මේ ආඥාපනතේ විධිවිධාන උල්ලංඝනය කළ අවස්ථාවක දී මේ ආඥාපනතේ විධිවිධාන යටතේ බලය ලත් යම් තැනැත්තකු විසින්, ඒ විධිවිධානවලට යටත් ව, මේ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා කිසිවකින් ඒ තැනැත්තා වෙත පිරිනැමුණු බලතලවලට හානියක් නොමැති ව, පෞද්ගලික දේපළකට ඇතුළු වීම, යම් වැඩක් කිරීම සහ වියදම් කිසිවක් අය කර ගැනීම කළ හැකි ය.

---

## XIV වන කොටස

### මධ්‍ය පාලනය

අදක්ෂතාව ආදිය නිසා සභාව විසුරුවා හැරීමට අමාත්‍යවරයාට ඇති බලය.

[1977 අංක 24 § 11]

**277.** (1) කවර අවස්ථාවක දී වුවද,—

(අ) නගරාධිපතිවරයාගේ හෝ යම් මහා නගර සභාවක හෝ මහා නගර සභාවක යම් සභිකයකුගේ හෝ අදක්ෂතාව සහ නොමනා පාලනය ; හෝ

(ආ) මේ ආඥාපනත මගින් නැතහොත් වෙන යම් ලිඛිත නීතියක් මගින් නියම වී ඇති කාර්ය ඉටු කිරීම නගරාධිපතිවරයා විසින් හෝ යම් මහා නගර සභාවක් විසින් හෝ මහා නගර සභාවක යම් සභිකයකු විසින් හෝ නිරතුරුව ම පැහැර හැර තිබීම ; හෝ

(ඇ) නීතියේ විධිවිධානවලට අනුකූල ව ක්‍රියා කිරීම නගරාධිපතිවරයා හෝ යම් මහා නගර සභාවක් හෝ මහා නගර සභාවක යම් සභිකයකු හෝ නිරතුරුව ම ප්‍රතික්ෂේප කර තිබීම හෝ නොසලකා හැර තිබීම ; හෝ

(ඈ) මේ ආඥාපනත මගින් නැතහොත් වෙන යම් ලිඛිත නීතියක් මගින් පිරිනමා ඇති බලතල කිසිවක් නගරාධිපතිවරයා විසින් හෝ යම් මහා නගර සභාවක් විසින් හෝ මහා නගර සභාවක යම් සභිකයකු විසින් හෝ අනිසි ලෙස යොදවා තිබීම ; හෝ

(ඉ) රැස්වීම් පැවැත්වීම හෝ රැස්වීම්වලට පැමිණ සිටීම හෝ පවත්වන ලද රැස්වීමක දී ඡන්දය පාවිච්චි කිරීම හෝ රැස්වීමේ කටයුතු කිරීම හෝ නගරාධිපතිවරයා විසින් හෝ යම් මහා නගර සභාවක් විසින් හෝ මහා නගර සභාවක යම් සභිකයකු විසින් හෝ නිරතුරුව ම ප්‍රතික්ෂේප කර තිබීම

පිළිබඳ ව ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත් වුවහොත්, ඒ ඒ අවස්ථාවට අනුව, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්—

(i) නගරාධිපතිවරයා ධුරයෙන් පහ කළ හැකි ය; නැතහොත්

(ii) සභාවේ සියලුම සභිකයන් හෝ ඔවුනතුරින් යම් සභිකයකු හෝ ධුරයෙන් පහ කළ හැකි ය. එවිට 13(3) වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය; එසේ නැත හොත්

(iii) මහා නගර සභාව විසුරුවා හැරිය හැකි ය;

තවද ඒ නියමය හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතු ය.

(1අ) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර, (1) වන උපවගන්තියේ සඳහන් යම් කිසි කාරණයක් සම්බන්ධයෙන් තමා සෑහීමට පත්වීම් වස්, ඒ කාරණය ගැන මාස තුනක් වූ කාලසීමාවක් ඇතුළත පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාම ලත් අධිකරණ නිලධරයකු පත් කළ යුතු ය. එසේ පත් කරන ලද නිලධරයාට, ඒ පරීක්ෂණයට අදාළ ව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිසමක බලතල ඇත්තේ ය. [1977 අංක 24 §111.]

(1ආ) (අ) යම් කාරණයක් ගැන පරීක්ෂා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් විශ්‍රාම ලත් අධිකරණ නිලධරයකු (1අ) වන උප වගන්තිය යටතේ පත් කරන ලද විටක, අවස්ථාවට අනුව, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්— 1977 අංක 2 § 111.)

(i) නගරාධිපතිවරයාගේ ධුරය තාවකාලිකව නතර කොට, නගරාධිපතිවරයා ගේ බලතල ක්‍රියාත්මක කිරීමටත් නගරාධිපතිවරයාගේ කාර්ය ඉටු කිරීමටත් නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ නියෝජ්‍ය නගරාධිපති ධුරය හිස් වී ඇති අවස්ථාවක, නැතහොත් නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ ධුරය තාවකාලිකව නතර කොට ඇති අවස්ථාවක, නාගරික කොමසාරිස්වරයාට විධාන කළ හැකි ය; නැතහොත්

(ii) යම් සභිකයකුගේ ධුරය තාවකාලික ව නතර කළ හැකි ය; එසේත් නැතහොත්

(iii) සභාව තාවකාලික ව නතර කොට, සභාවේ සහ නගරාධිපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත් ඔහුගේ කාර්ය ඉටු කිරීමටත් නාගරික කොමසාරිස්වරයාට විධාන කළ හැකි ය.

(ආ) එසේ (1අ) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිල ධරයාගේ වාර්තාව ලැබුණු පසු, අමාත්‍යවරයා විසින් (1) වන උප වගන්තිය යටතේ නියමයක් කළ හැකි ය; නැතහොත් මේ උප වගන්තියේ (අ) ඡේදය යටතේ කළ නියමය අවලංගු කළ හැකි ය.

[1977 අංක 24 § 111.] (1ඇ) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් මහා නගර සභාවක නගරාධිපතිවරයා ධුර යෙන් පහ කරනු ලැබූ විටක ඒ නගරාධිපතිවරයාගේ සභික ධුරය ද අවසන් වන අතර, එසේ ඇති වන පුරප්පාඩුව පිරවීම සම්බන්ධ යෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) එවැනි ම ආකරයෙන් පළ කරනු ලබන යම් තදනන්තර නියමයක් මගින්—

[1974 අංක 8 § 2.] (අ) මේ ආඥාපනතින් හෝ වෙනත් ලිඛිත නීතියකින් සභාව හෝ නගරාධිපතිවරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ සතු කරනු ලැබුවා වූ ද එකී නියමයෙහි හෝ එම නියමය සංශෝධනය කරන වෙන යම් නියමයක හෝ නියමවල දැක්වෙන්නා වූ අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය හා කටයුතු සතුව සිටීමටත්, ක්‍රියාත්මක කිරීමටත්. ඉටු කිරීමට සහ කිරීමටත් විශේෂ කොමසාරිස්වරයකු හෝ විශේෂ කොමසාරිස්වරුන් ප්‍රකාශිත කාල සීමාවකට හෝ කලින් කල ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) විසුරුවා හරින ලද සභාව වෙනුවට මේ ආඥාපනතේ විධි විධානවලට අනුකූල ව අලුත් මහා නගර සභාවක් සංස්ථා පනය කළ යුතු යැයි අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි ය.

(3) මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක ම එම නියමය බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි විධාන ඇතුළත් විය යුතු අතර, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට එයට නීතියේ බලය ඇති විය යුතු ය.

[1974 අංක 8 § 2] (3අ) සභාව විසුරුවා හැරීමෙන් පසු සහ (2) වන උපවගන්තිය යටතේ විශේෂ කොමසාරිස්වරයකු හෝ විශේෂ කොමසාරිස්වරුන් පත් කිරීමෙන් පසු කවර විටක වුව ද, විසුරුවා හරින ලද මහා නගර සභාව වෙනුවට මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව එම මහා නගර සභා ප්‍රදේශය සඳහා අලුත් මහා නගර සභාවක් සංස්ථාපනය කළ යුතු යැයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍ය වරයා විසින් විධාන කළ හැකි ය.

(4) මේ වගන්තිය මගින් පිරිනමන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, සභාව විසුරුවා හැරීමේ සිට විශේෂ කොමසාරිස්වරයකු නොහොත් විශේෂ කොමසාරිස්වරුන් පත් කිරීම හෝ අලුත් සභාවක් සංස්ථාපනය කිරීම දක්වා හෝ පත් කරන ලද විශේෂ කොමසාරිස්වරයා හෝ විශේෂ කොමසාරිස්වරයන් ධුරය දැරීම අවසන් වීමේ සිට අලුත් සභාවක් සංස්ථාපනය කිරීම දක්වා යම් කාලයක් ගත වීම අවශ්‍ය වන කවර අවස්ථාවක දී වුව ද, ඒ කාලය තුළ දී— [1959 අංක 12 § 2.]

(අ) මේ ආඥාපනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් සභාව, නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වෙත පැවරුණු හෝ පිරිනැමුණු හෝ නියම කෙරුණු සියලු ම අධිනිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ කර්තව්‍ය නාගරික කොමසාරිස්වරයා සතු විය යුතු අතර ඔහු විසින් ඒවා ක්‍රියාවේ යෙදවීම ද ඉටු කිරීම ද සිදු කිරීම ද කළ යුතු ය; තව ද [1968 අංක 42 § 3.]

(ආ) නාගරික කොමසාරිස්වරයා, අවස්ථාවෝචිත පරිදි, විසුරුවා හරිනු ලැබූ සභාවේ හෝ විශේෂ කොමසාරිස්වරයාගේ හෝ විශේෂ කොමසාරිස්වරයන්ගේ අනුප්‍රාප්තිකයා විය යුතු ය. [1968 අංක 42 § 3.]

(4අ) සභාවක් විසුරුවා හරිනු ලැබූ විට (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ විශේෂ කොමසාරිස්වරයා හෝ විශේෂ කොමසාරිස්වරයන්— 1968 අංක 42 § 3.]

(අ) පත් කිරීම කරනු ලැබුවේ සභාව විසුරුවා හැරීමෙන් ඉක්බිති ව ම නම්, විසුරුවා හරිනු ලැබූ සභාවේ අනුප්‍රාප්තිකයා හෝ අනුප්‍රාප්තිකයන් විය යුතු ය; තව ද

(ආ) පත් කිරීම කරනු ලැබුවේ (4) වන උපවගන්තියෙහි සඳහන් අධිනිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ කර්තව්‍ය ඒ උපවගන්තිය යටතේ නාගරික කොමසාරිස්වරයා විසින් ක්‍රියවේ යෙදවීමෙන්, ඉටු කිරීමෙන් සහ සිදු කිරීමෙන් පසු ව නම්, නාගරික කොමසාරිස්වරයාගේ අනුප්‍රාප්තිකයා හෝ අනුප්‍රාප්තිකයන් විය යුතු ය.

(4ආ) 325 වන වගන්තියේ විධිවිධාන— [1968 අංක 42 § 3.]

(අ) විසුරුවා හරිනු ලැබූ සභාවක හෝ විශේෂ කොමසාරිස්වරයකුගේ හෝ විශේෂ කොමසාරිස්වරයන්ගේ මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ අනුප්‍රාප්තිකයා වන නාගරික කොමසාරිස්වරයකු සම්බන්ධයෙන් වූ විට, ඉහත කී 325 වන වගන්තියෙහි යම් පළාත් පාලන ආයතනයක් පිළිබඳ සියලු ම සඳහන් කිරීම්, අවස්ථාවෝචිත පරිදි,

විසුරුවා හරිනු ලැබූ සභාව හෝ විශේෂ කොමසාරිස්වරයා හෝ විශේෂ කොමසාරිස්වරයන් පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් සහ ඉහත කී 325 වන වගන්තියෙහි මහා නගර සභාවක් පිළිබඳ සියලු ම සඳහන් කිරීම් නාගරික කොමසාරිස්වරයා පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් සහ ඒ ආකාරයෙන් ම, සහ

(ආ) විසුරුවා හරිනු ලැබූ සභාවක හෝ නාගරික කොමසාරිස්වරයකුගේ මේ වගන්තියේ (4අ) වන උපවගන්තිය යටතේ අනුප්‍රාප්තිකයා වන විශේෂ කොමසාරිස්වරයකු සම්බන්ධයෙන් වූ විට, ඒ ඉහත කී 325 වන වගන්තියෙහි යම් පළාත් පාලන ආයතනයක් පිළිබඳ සියලු ම සඳහන් කිරීම්, අවස්ථාවෝචිත පරිදි, විසුරුවා හරිනු ලැබූ සභාව හෝ නාගරික කොමසාරිස්වරයා පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් සහ ඉහත කී 325 වන වගන්තියෙහි මහා නගර සභාවක් පිළිබඳ සියලු ම සඳහන් කිරීම් විශේෂ කොමසාරිස්වරයා පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් සහ ඒ ආකාරයෙන් ම

අවශ්‍ය මඳ වෙනස් කිරීම් සහිත ව, අදාළ විය යුතු ය.

[1968 අංක 42 §3.]

(5) යම් මහා නගරයක් සඳහා වූ මහා නගර සභාව විසුරුවා හරිනු ලැබීමෙන් පසු ඒ මහා නගරය සඳහා අලුත් මහා නගර සභාවක් සංස්ථාපනය කළ අවස්ථාවක, එම ආඥාපනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් සභාව වෙත පිහිටුවනු ලැබූ හෝ නියම කෙරුණු හෝ පැවරුණු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ කර්තව්‍ය අලුත් සභාව සංස්ථාපනය කරනු ලැබීමට පෙරාතුව ම ක්‍රියාවෙහි යෙදවූ, ඉටු කළ හා සිදු කළ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ අනුප්‍රාප්තිකයා අලුත් සභාව විය යුතු අතර, 325 වන වගන්තියේ විධිවිධාන, අලුත් සභාව සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ විට, ඒ වගන්තියෙහි යම් පළාත් පාලන ආයතනයක් පිළිබඳ සියලු ම සඳහන් කිරීම්, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා හෝ තැනැත්තන් පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් සහ ඒ වගන්තියෙහි මහා නගර සභාවක් පිළිබඳ සියලු ම සඳහන් කිරීම් අලුත් සභාව පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් සහ ඒ ආකාරයෙන් ම, අවශ්‍ය මඳ වෙනස් කිරීම් සහිත ව, අදාළ විය යුතු ය.

වාර්තාවල උද්ධෘත ඉල්ලීමට අමාත්‍යවරයාට ඇති බලය.

278. යම් මහා නගර සභාවක හෝ ඒ සභාවේ යම් ස්ථාවර හෝ විශේෂ කමිටුවක යම් වාර්තාවක යම් උද්ධෘතයක් තමාට සපයන ලෙස අමාත්‍යවරයා විසින් ලිඛිත නියමයක් මඟින් ඒ සභාවට නියම කළ හැකි අතර, ඒ සභාව අයුක්ති සහගත ප්‍රමාදයකින් තොරව ඒ නියමයට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

*සංඛ්‍යාලේඛන ඉල්ලීමට අමාත්‍යවරයාට ඇති බලය.*

279. යම් මහා නගර සභාවක ක්‍රියාකාරිත්වය, ආදායම සහ වියදම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් සුදුසු යැයි සලකනු ලබන සංඛ්‍යා ලේඛන ඔහු විසින් ඉල්විය හැකි අතර, ඒ සභාව අයුක්ති සහගත ප්‍රමාදයකින් තොරව ඒ නියමයට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

*පරීක්ෂණ පැවැත්වීමට අමාත්‍යවරයාට ඇති බලය.*

280. මේ ආඥාපනතින් හෝ යම් වෙනත් ලිඛිත නීතියකින් යම් මහා නගර සභාවක් වෙත පවරන ලද යම් කාර්යයක් හෝ වැඩක් එම සභාව විසින් නොකරනු ලබන බව යම් අවස්ථාවක අමාත්‍යවරයාට පෙනී ගියහොත්, ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පරිහානි හේතු ඇති බව සභාව විසින් දවස් පහළොවක් ඇතුළත පෙන්වනු ලැබුවහොත් මිස, ඒ කරුණෙහි සිද්ධි පරීක්ෂා කොට ඔහු වෙත වාර්තා කිරීමට විශේෂ නිලධරයකු පත් කරන බවත් ඒ කාර්යය ඉටු කිරීමේ හෝ වැඩය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි ඒ නිලධරයා විසින් සිතනු ලබන පියවර නිර්දේශ කිරීමට ඒ නිලධරයාට නියම කරන බවත් අමාත්‍යවරයා විසින් දැන්වීමක් මගින් සභාව වෙත දන්වනු ලැබිය හැකි ය. ඒ පරීක්ෂණය හැකි තාක් දුරට විවෘතාකාරයෙන් පැවැත්විය යුතු ය.

*අවශ්‍ය වැඩ කළ යුතු බව සභාවට නියම කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.*

281. 280 වන වගන්තිය යටතේ පත් කරන ලද නිලධරයාගේ හෝ 142 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් විශේෂ නිලධරයකුගේ වාර්තාව ලැබුණු විට, ඉටු කළ යුතු හෝ ක්‍රියාත්මක කළ යුතු කාර්යය හෝ වැඩය කුමක් දැයි අමාත්‍යවරයා විසින් නිශ්චය කළ හැකි අතර, ඒ කාර්යය හෝ වැඩය එකී නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාලය ඇතුළත ඉටු කළ යුතු යැයි හෝ ක්‍රියාත්මක කළ යුතු යැයි අමාත්‍යවරයා විසින් සභාවට නියම කළ හැකි ය.

*නියමය බලාත්මක කිරීමට ඇති බලය.*

282. 281 වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක නිශ්චිතව සඳහන් කාලය ඇතුළත එම නියෝගයට අනුකූල ව ක්‍රියා කිරීම යම් සභාවක් විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, එම කාර්යය ඉටු කිරීමට හෝ එම වැඩය කරන ලෙස නගරාධිපතිවරයාට විධාන කිරීම හෝ ඒ සඳහා වෙන යම් තැනැත්තකු පත් කිරීමත් ඒ තැනැත්තාට ගෙවිය යුතු පාරිශ්‍රමිකය නියම කිරීමත් ඒ පාරිශ්‍රමිකය හා එම වැඩයේ වියදම මහා නගර සභා අරමුදලින් ගෙවන ලෙස විධාන කිරීමත් අමාත්‍යවරයා විසින් කළ හැකි ය.

බද්දක් අය කරන ලෙස හෝ ණයක් ලබා ගන්නා ලෙස විධාන කිරීමට ඇති බලය.

283. (1) 281 වන වගන්තියෙහි සඳහන් යම් කාර්යයක් ඉටු කිරීමේ හෝ යම් වැඩක් කර ගෙන යෑමේ කාර්යය සඳහා, පහත සඳහන් ක්‍රම අතුරින් යම් එක ක්‍රමයකින් හෝ ඊට වැඩි ගණනකින් හෝ ඒ ක්‍රම සියල්ල ම මගින්, එනම්, මේ ආඥාපනත යටතේ යම් බද්දක් පැනවීමෙන් හෝ එකී යම් බද්දක් කලින් බල පැවැත් වූ ප්‍රමාණයට වඩා වැඩි කිරීමෙන් හෝ ණයක් ලබා ගැනීමෙන්, මුදල් ලබා ගන්නා ලෙස අමාත්‍යවරයා විසින් සභාවට විධාන කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතල ප්‍රකාර අමාත්‍යවරයා විසින් සභාවට ණයක් ලබා ගන්නා ලෙස විධාන කරන අවස්ථාවක, X වන කොටසේ සහ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක විධිවිධාන (ණයක් ලබා ගැනීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය අවශ්‍ය 191 වන වගන්තියේ විධිවිධාන හැර) එම කොටස යටතේ ලබා ගන්නා ලද ණයකට ඒ විධිවිධාන අදාළ වන ආකාරයෙන් හා ඒ ප්‍රමාණයට ම ඒ ණය සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

(3) මේ ආඥාපනතින් හෝ ඒ යටතේ බලය ලැබී ඇති උපරිම ප්‍රමාණයට වැඩි ප්‍රමාණයකින් යම් බද්දක් අය කිරීමට මේ වගන්තියේ ඉහත දැක් වූ විධිවිධාන කිසිවකින් සභාවකට බලය ලැබෙන්නේ යැයි සලකනු නොලැබිය යුතු ය නැතහොත් එසේ තේරුම් නොගත යුතු ය.

මහා නගරයේ හෝ කොට්ඨාශ වල සීමා හා සභික සංඛ්‍යාව වෙනස් කිරීමට හා සභාව විසුරුවා හැර එය ප්‍රතියෝජනය කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

[1977 අංක 24 § 112.]

284. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් යම් වේලාවක දී—

(අ) යම් මහා නගර සභාවක සීමා වෙනස් කිරීම;

(ආ) යම් මහා නගර සභාවක් සඳහා නියම කර ඇති සභික සංඛ්‍යාව වෙනස් කිරීම;

(ඇ) පවත්නා යම් මහා නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබ ඇති මහා නගරයේ යම් සීමා වෙනස් කිරීමකින් පසු සභාව විසුරුවා හැරීම ද එකී පවත්නා සභාව වෙනුවට මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව සංස්ථාපනය කරනු ලැබිය යුතු අලුත් මහා නගර සභාවක් ප්‍රතියෝජනය කරන ලෙස විධාන කිරීම ද යෝග්‍ය යැයි ඔහුට පෙනී ගිය කවර හෝ අවස්ථාවක දී එසේ කිරීම;

(ඈ) යම් මහා නගර සභාවක් වෙනුවට වෙනත් යම් පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කිරීමේ කාර්යය සඳහා ඒ මහා නගර සභාව විසුරුවා හැරීම

කළ හැකි ය.

***286.** (1) 284 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යවරයා විසින් යම් පවත්නා මහා නගර සභාවක් විසුරුවා හැර, එය, මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව සංස්ථාපනය කළ යුතු අලුත් මහා නගර සභාවකින් ප්‍රතිෂ්ඨාපනය කළ යුතු යැයි විධාන කරනු ලබන අවස්ථාවක, පවත්නා සභාව විසින් ඒ වන විටත් කරනු ලැබ ඇති කිසිවකට හානියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දිනයක සිට එම පවත්නා සභාව විසුරුවා හැරීම සිදු විය යුතු ය. තව ද මේ ආඥාපනතින් හෝ වෙනත් ලිඛිත නීතියකින් එම සභාව වෙත පිරිනැමී ඇති හෝ පැනවී ඇති හෝ පැවරී ඇති අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරින් කිසිවක් ඒ සභාව විසින් ඇතිව සිටීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම එදින සිට අවසන් විය යුතු ය.

284 වන වගන්තිය යටතේ සභාව විසුරුවා හැරීමේ ප්‍රතිඵලය

(2) පවත්නා සභාව විසුරුවා හැරීමින් 284 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයෙහි හෝ එම වගන්තිය යටතේ කරනු ලබන සඳහා තදනන්තර නියමයෙහි, ඒ නියමය බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි විධාන අමාත්‍යවරයා විසින් දිය හැකි අතර එය ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු, රට නීතියේ බලය ලැබිය යුතු ය.

(3) 284 වන වගන්තිය යටතේ සභාවක් විසුරුවා හැරීම හා ඒ වෙනුවට අලුත් සභාවක් සංස්ථාපනය කිරීම අතරතුර ඇති කාලය තුළ දී, මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් සභාව වෙත, නගරාධිපතිවරයා වෙත හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වෙත පැවරී ඇති හෝ පිරිනැමී ඇති හෝ පැනවී ඇති සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය හා කර්තව්‍ය ඇති ව සිටීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම කොමසාරිස්වරයා විසින් කළ යුතු ය.

(4) මහා නගරය සම්බන්ධයෙන් වූ සියලු කාර්ය සඳහා අලුත් සභාව, එය සංස්ථාපනය කරන ලද දිනයේ සිට, විසුරුවා හරින ලද සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතු අතර, 325 වන වගන්තියේ සියලු විධිවිධාන, අලුත් සභාව සංස්ථාපනය කිරීමේ දී අවශ්‍ය මද වෙනස් කිරීම් සහිත ව, එම වගන්තියේ යම් පළාත් පාලන ආයතනයක් ගැන ඇති සියලු සඳහන් කිරීම්, විසුරුවා හරින ලද සභාව සම්බන්ධයෙන් කරනු ලැබූ සඳහන් කිරීම් වූවාක් මෙන් ද එම වගන්තියේ මහා නගර සභාවක් ගැන ඇති සියලු සඳහන් කිරීම් අලුත් සභාව සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීම් වූවාක් මෙන් ද අදාළ විය යුතු ය.

*285 වන වගන්තිය 1977 අංක 24 දරන පනත මගින් ඉවත් කරන ලදී.

ඇතැම් අවස්ථාවල දී සභාවේ සහ නගරාධිපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කළ යුතු බව.
[1983 අංක 48 — § 13.]

**286අ.** නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා විසින් ධුර දැරීම අවසන් කිරීමේ හේතුවෙන් ස්වකීය කාර්යභාරය ඉටුකිරීමට සභාවට නොහැකි වන අවස්ථාවක, එම ධුර සම්බන්ධයෙන් පුරප්පාඩු ඇති වීම සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව එම පුරප්පාඩු පිරවීම අතර ගත වන යම් කාලයක් ඇතුළත, මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් සභාව, නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වෙත සතු කරනු ලැබූ හෝ පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ කර්තව්‍ය කොමසාරිස්වරයාට තිබිය යුතු ය. ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. ඉටු කරනු ලැබිය යුතු ය.

උපලේඛන සංශෝධනය කිරීම.

**287.** (1) අමාත්‍යවරයා විසින් කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින්, මේ ආඥාපනතේ යම් උපලේඛන යක විධිවිධාන සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ හැකි ය.

(2) මේ ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක එකී උපලේඛන ගැන ඇති සියලු සඳහන් කිරීම්, තත් කාලයෙහි බල පවත්නා උපලේඛන ගැන වූ සඳහන් කිරීම් ලෙස තේරුම් ගත යුතු ය.

අමාත්‍යවරයාගේ අතිරේක බලතල.

**288.** මේ ආඥාපනතින් අමාත්‍යවරයා වෙත පිරිනැමුණු හෝ පැනවුණු බලතල හෝ කාර්ය කිසිවක් හීන කිරීම පිණිස නොව ඊට අතිරේකව විය යුතු ය.

නියෝග සෑදීමේ බලය.
[1977 අංක 24 § 114.]

**289.** (1) මේ ආඥාපනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා පොදු වශයෙන් ද යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සෑදීමට මේ ආඥාපනතින් බලය දී හෝ නියම කර හෝ තිබේ නම්, ඒ කාරණය සඳහා ද, යම් කාරණයක් සම්බන්ධයෙන් නියම කරන ලෙස මේ පනතින් නියම කර තිබේ නම් ඒ කාරණය සඳහා ද අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදන ලද කිසි ම නියෝගයක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන තුරු සහ ඒ අනුමතය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තුරු වලංගු නොවන්නේ ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ඒ අනුමතය නිවේදනය කරනු ලැබූ විට, එය මෙහි ලා පනවනු ලැබුවාක් මෙන් වලංගු සහ බලසහිත විය යුතු ය.

## XV වන කොටස

### සාමාන්‍ය

**290.** පළාත් පාලන සේවා පනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකින් යම් මහා නගර සභාවක් වෙත හෝ ඒ සභාවේ නගරාධිපතිවරයා, නියෝජ්‍ය නගරාධිපතිවරයා, කොමසාරිස්වරයා හෝ වෙනත් නිලධරයකු වෙත පැවරී ඇති, වෙන් කොට දී ඇති හෝ පැනවී ඇති යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් ඒ සභාව විසින් හෝ එහි නගරාධිපතිවරයා, නියෝජ්‍ය නගරාධිපතිවරයා, කොමසාරිස්වරයා හෝ එහි වෙනත් නිලධරයා විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම මේ ආඥාපනතේ කිසිවකින් තහනම් වන්නේ යැයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ තේරුම් නොගත යුතු ය.

පළාත් පාලන සේවා පනතින් පිරිනැමුණු බලතල ආදිය ක්‍රියාත්මක කිරීම.

**291.** (1) නියමිත ගෙවල් කුලියට නොවැඩි කුලියකට කුලියට දී තිබෙන්නා වූ ද මහා නගරය ඇතුළත වූ ද සෑම ගෙයක ම ගෙහිමියා විසින්, වාසබද්ද ආරම්භ වීමේ දී හා යම් ගෙවල් කුලියක් ඉල්ලා සිටීමට හෝ ලබා ගැනීමට පෙරාතුව, ගෙහිමියාගේ නම සහ ලිපිනය ද, එම ගෙය මනුෂ්‍ය වාසය සඳහා සෑම අතින් ම සාධාරණ ලෙස සුදුසු තත්ත්වයක තබා ගැනීම සඳහා ගෙහිමියා කෙලින් ම වගකිවයුතු නොවන්නේ නම්, එසේ වගකිවයුතු තැනැත්තාගේ නම සහ ලිපිනය ද එම නිවසේ කුලී නිවැසියා වෙත ලියවිල්ලකින් භාර දිය යුතු ය.

ගෙහිමියන් විසින් කුලී නිවැසියන්ට සැපයිය යුතු තොරතුරු.

(2) යම් ගෙයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල ව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, එම ගෙයි ගෙහිමියාද ඒ පැහැර හැරීම නොකඩවා පවතින තුරු එම ගෙය සඳහා යම් ගෙවල් කුලියක් ඉල්ලා සිටින හෝ ලබා ගන්නා යම් තැනැත්තකු ද වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය.

(3) මේ වගන්තියෙහි—

"ගෙහිමියා" යන්න යම් ගෙයක් සම්බන්ධයෙන් වූ විට, ඉන් තත් කාලයෙහි දී එම ගෙයි ගෙවල් කුලිය ලැබීමට හිමිකම් ඇති තැනැත්තා අදහස් වන අතර, එම ගෙය හෝ එහි යම් කොටසක් අතුරු කුලී නිවැසියකුට කුලියට දෙන යම් කුලී නිවැසියෙක් ද ඊට ඇතුළත් වේ;

"නියමිත ගෙවල් කුලිය" යන්නෙන් මේ වගන්තියේ කාර්ය සඳහා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ඉඩම් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ගෙවල් කුලිය අදහස් වේ.

දැන්වීම් ආදිය භාර දීම.

292. (1) යම් තැනැත්තකු වෙත භාර දෙනු ලැබීමට මේ ආඥා පනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින්, නියෝගයකින් හෝ රීතියකින් නියමිත බලය දෙන ලද, සෑම දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක්—

(අ) එය, ඒ තැනැත්තාට භාර දීමෙන් හෝ එය, ඒ තැනැත්තා අන්තිමට පදිංචි ව සිටියේ යැයි දන්නා වාසස්ථානයෙහි සිටින ඔහුගේ පවුලේ වැඩිහිටි සාමාජිකයකුට හෝ සේවක යකුට භාර දීමෙන් ;

(ආ) එය, ඒ තැනැත්තාගේ නම ලියූ කවරයක බහා ඒ ඒ තැනැත්තා සාමාන්‍යයෙන් පදිංචි ව සිටින හෝ අවසන් වරට පදිංචි ව සිටියේ යැයි දන්නා වාසස්ථානයට හෝ ව්‍යාපාරයට කරගෙන යන හෝ අවසන් වරට ව්‍යාපාරය කරගෙන ගියේ යැයි දන්නා ස්ථානයට භාර දීමෙන් ; හෝ

(ඇ) එය, ඒ තැනැත්තා සාමාන්‍යයෙන් පදිංචි ව සිටින හෝ අවසන් වරට පදිංචි ව සිටියේ යැයි දන්නා වාසස්ථාන යට හෝ ව්‍යාපාරය පවත්වා ගෙන යන හෝ අවසන් වරට ව්‍යාපාරය පවත්වා ගෙන ගියේ යැයි දන්නා ස්ථානයට, ඔහුගේ නම ලියූ ලිපියක බහා ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන්,

භාර දෙනු ලැබිය හැකි ය :

එසේ වුව ද, දේපළ අයිතිකරුවන් ලියාපදිංචි කිරීම සඳහා සභාව විසින් විධිවිධාන සලස්වනු ලැබ ඇති හා ඒ විධිවිධාන අනුව, යම් දේපළ අයිතිකරුවකු තම නම සහ ලිපිනය ලියාපදිංචි කර ඇති අවස්ථාවක, ඒ සෑම ලේඛනයක් ම, එම ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියක බහා යැවීමෙන් භාර දිය යුතුය.

(2) ලියාපදිංචි තැපෑලෙන් යවන ලද සෑම දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක්, එම ලේඛනය බහා ලන ලද ලිපිය, එය තැපෑලේ සාමාන්‍ය ක්‍රියා මාර්ගයේ දී බෙදා දෙනු ලබන වේලාවේ දී භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද එය භාර දෙනු ලැබූ බව ඔප්පු කිරීමෙහි ලා, ඒ ලේඛනය ඇතුළත් ලිපිය නිසි පරිදි නාම හා ලිපිනය ලියා තැපෑලට දැමූ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතුය.

(3) යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දීමට මේ ආඥාපනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාව කින්, නියමයකින් හෝ රීතියකින් නියමිත හෝ බලය දෙන ලද දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක්, එම ස්ථානයේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ නම හෝ යම් වැඩිමනත් විස්තර

යක් එකතු නොකොට, එම ස්ථානයේ “ අයිතිකරු ” හෝ “ පදිංචි කරු ” යන විස්තරය ලියනු ලැබ ඇත් නම්, එහි නිසි පරිදි නම හා ලිපිනය ලියා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දීමට මේ ආඥාපනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින්, නියෝගයකින් හෝ රීතියකින් නියමිත හෝ බලය දෙන ලද දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක්, එය හෝ එහි සත්‍ය පිටපතක් ඒ ස්ථානයේ සිටින යම් වැඩිහිටි තැනැත්තකුට භාර දීමෙන් හෝ, සාධාරණ උද්යෝගයකින් යුක්ත ව එය භාර දෙනු ලැබිය හැකි එවැනි කිසි ම තැනැත්තකු ඒ ස්ථානයේ නොසිටී නම්, එය ඒ ස්ථානයෙහි යම් ප්‍රකට ව පෙනෙන කොටසක ඇලවීමෙන් දෙනු ලැබිය හැකි ය.

(5) මහා නගර සභාවකට දීමට, ඉදිරිපත් කිරීමට හෝ භාර දීමට මේ ආඥාපනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින්, නියෝගයකින් හෝ රීතියකින් නියමිත හෝ බලය දෙන ලද යම් දැන්වීමක්, ඉල්ලීමක් හෝ වෙනත් ලේඛනයක් සභාවේ ලේකම්වරයාට දෙනු ලැබී නම්, ඉදිරිපත් කරනු ලැබී නම් හෝ භාර දෙනු ලැබී නම්, ඒ දැන්වීම, ඉල්ලීම හෝ වෙනත් ලේඛනය සභාවට දෙන ලද ලෙස, ඉදිරිපත් කරන ලද ලෙස හෝ භාර දෙන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

වැඩ කරවීම හා වියදම් අය කර ගැනීම.

**293.** මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක හෝ රීතියක විධිවිධාන යටතේ යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු විසින් යම් වැඩක් කිරීමට නියමිත ව තිබී ඒ වැඩය කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ පැහැර හැරීම සඳහා යම් දණ්ඩනයක් පිණිස විධිවිධාන සලස්වා තිබුණේ හෝ නොතිබුණේ වී නමුදු, සභාව විසින් ඒ වැඩය කරවනු ලැබිය හැකි අතර, ඒ සම්බන්ධයෙන් දරනු ලැබූ වියදම්, ඒ වැඩය කළ යුතුව තිබුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ය. තව ද, ඒ වියදම් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, ඒ වියදම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් අය කර ගත හැකි විය යුතු ය.

පදිංචිකරුගෙන් ගාස්තු අය කර ගැනීමට ඇති බලය.

**294.** (1) 293 වන වගන්තියෙන් සඳහන් යම් වියදම් ගෙවීමක් යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු විසින් පැහැර හරි ලබන අවස්ථාවක, එකී යම් අයිතිකරුවකුට විරුද්ධ ව නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරා හෝ ආරම්භ කර තිබුණේ හෝ නොතිබුණේ වී නමුදු, අතිරේක ප්‍රතිකර්මයක් වශයෙන්, ඒ වියදම් සියල්ල ම හෝ ඉන් යම් කොටසක් ගෙවන ලෙස, ඒ අවස්ථාවේ හෝ ඊට පසු යම් අවස්ථාවක, ඒ අයිතිකරු යටතේ ඒ ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ පදිංචි ව සිටින තැනැත්තාට සභාව විසින් නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වියදම් සියල්ල ම හෝ ඉන් යම් කොටසක් ඉල්ලනු ලැබූ විට ඒ පදිංචිකරු විසින් ගෙවීම පැහැර හරිනු ලැබීමේ දී, එම වියදම් එම පදිංචිකරුගේ බඩු බාහිරාදිය විනිග්‍රහණය කිරීමෙන් අය කර ගනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ වියදම් ගෙවන හෝ වියදම් අය කර ගනු ලබන සෑම පදිංචිකරුවකු ම, ඒ වියදම් සම්බන්ධයෙන් ඔහු විසින් එසේ ගෙවන ලද හෝ ඔහුගෙන් එසේ අය කර ගන්නා ලද මුදල් ප්‍රමාණය, ඔහු විසින් ඔහුගේ ගෙහිමියාට ගෙවිය යුතු ගෙවල් කුලියෙන් අඩු කර ගැනීමට හා ඒ වියදම් ඔහුට සම්පූර්ණයෙන් ප්‍රතිපූරණය කරන තෙක් ඒ ගෙයි, ගොඩනැගිල්ලෙහි හෝ ඉඩමෙහි සන්නකය ඇති ව සිටීමට හිමිකම් ලැබිය යුතු ය.

පදිංචිකරුගේ බැඳීම සීමා කිරී

**295.** (1) යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක පදිංචිකරු විසින් තමාට ගෙවන ගෙවල් කුලියේ ප්‍රමාණය සහ ඒ ගෙවල් කුලිය ගෙවනු ලැබිය යුතු තැනැත්තාගේ ලිපිනය ද හෙළි කරන ලෙස සභාව විසින් ඔහුගෙන් ඉල්ලා සිටි විට එය සත්‍ය ලෙස හෙළි කිරීම අතපසු කරන්නේ හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් මිස, මේ ආඥාපනතින් එම ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරු ගෙන් අය කර ගත යුතු වියදම් ගෙවන ලෙස ඉල්ලීම් කරන අවස්ථාවේ දී, එම වියදම් අය කරනු ලබන ස්ථානය සම්බන්ධයෙන් ඔහු ගෙන් අය විය යුතු ව ඇති ගෙවල් කුලී ප්‍රමාණයට හෝ ඒ ඉල්ලීම කිරීමෙන් සහ ගෙවල් කුලිය ඔහුගේ ගෙහිමියාට නොගෙවිය යුතු ය යන දැන්වීම කිරීමෙන් පසු යම් අවස්ථාවක දී උපචිත වී ඔහු විසින් ගෙවිය යුතු ව ඇති ගෙවල් කුලී ප්‍රමාණයට වැඩි මුදලක් ගෙවීමට ඒ පදිංචිකරු යටත් නොවිය යුතු ය.

(2) එකී යම් පදිංචිකරුවකුගෙන් ඉල්ලනු ලැබූ මුදල, එසේ ඉල්ලනු ලැබූ වේලෙහි ඔහුගෙන් අය විය යුතුව තිබුණු හෝ ඉන් අනතුරුව උපචිත වූ ගෙවල් කුලියට වඩා වැඩි බව ඔප්පු කිරීමේ භාරය ඒ පදිංචිකරු වෙත පැවරෙන්නේ ය.

(3) ඉහත කී වැඩ සඳහා වූ වියදම් ගෙවීම සම්බන්ධයෙන් යම් අයිතිකරුවකු හා පදිංචිකරුවකු අතර ඇති කර ගනු ලැබූ යම් විශේෂ ගිවිසුමක් කෙරෙහි මෙහි සඳහන් කිසිවක් බල පාන ලෙස සලකනු නොලැබිය යුතු ය.

අයිතිකරු පැහැර හැරි වැඩ පදිංචිකරු විසින් කරවිය හැකි බව හා ගෙවල් කුලියෙන් වියදම් කඩු කරගත හැකි බව.

**296.** (1) යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු විසින් කරවීමට නියමිත වූ යම් වැඩක් ඒ අයිතිකරු විසින් කරවීම පැහැර හරිනු ලැබූ කවර හෝ විටක දී ඒ ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ පදිංචිකරු විසින් සභාවේ අනුමතය ඇතිව ඒ වැඩය කරවිය හැකි අතර, ඒ සඳහා වන වියදම්, අයිතිකරු විසින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය; නැතහොත්, කලින් කල ඒ අයිතිකරුට ඔහුගෙන් අය විය යුතු වන ගෙවල් කුලියෙන් ඒ මුදල අඩු කර ගනු ලැබිය හැකි ය.

(2) යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක පදිංචිකරු විසින් (1) වන උපවගන්තිය යටතේ දරන ලද වියදම්, එම උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ලෙස එම ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ ඒ පදිංචිකරු නෙරපීමට අයිතිකරු හිමිකම් නොලැබිය යුතු ය.

පදිංචිකරුවන් විසින් බාධා කරනු ලැබීම.

297. මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක හෝ රීතියක විධිවිධාන අතුරින් කිසිවක්, යම් ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන පරිදි කරගෙන යෑමට තමා අදහස් කරන බව එහි අයිතිකරු විසින් ඒ ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ පදිංචිකරු වෙත දැන්වීමෙන් පසුව, එසේ එය කරගෙන යාමෙහි ලා ඔහු විසින් එහි අයිතිකරු වළක්වනු ලැබුවහොත්, ඒ බව ඔප්පු කරනු ලැබූ විට හා අයිතිකරු විසින් කරනු ලබන ඉල්ලීමක් පිට, මහේස්ත්‍රාත්වරයකු හෝ නාගරික මහේස්ත්‍රාත්වරයකු විසින්, ඒ ගෙය, ගොඩනැගිල්ල හෝ ඉඩම සම්බන්ධයෙන්, මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ යම් නියෝගයක හෝ රීතියක විධිවිධාන ක්‍රියාත්මක වන පරිදි කරගෙන යෑම සඳහා අවශ්‍ය එකී සියලු වැඩ කරවීමට අයිතිකරුට ඉඩ දෙන ලෙස පදිංචිකරුට නියම කෙරෙන ලිඛිත ආඥාවක් කරනු ලැබිය හැකි අතර, සුදුසු යැයි තමා කල්පනා කරන්නේ නම්, ඒ ඉල්ලීමට හෝ ආඥාවට අදාළ ගාස්තු ඒ අයිතිකරුට ගෙවන ලෙස ඒ පදිංචිකරුට ආඥා කළ හැකි ය. තවද, ආඥාවේ දින සිට දවස් අටක් ඉකුත් වීමෙන් පසුවත් ඒ වැඩ කරවීමට අයිතිකරුට ඉඩ දීම ඒ පදිංචිකරු විසින් තව දුරටත් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ඒ පදිංචිකරු වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, ඔහු එසේ ප්‍රතික්ෂේප කිරීම කරගෙන ගිය සෑම දිනයක් සඳහා රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද යටත් විය යුතු ය. 1986 අංක 39§61

අයිතිකරු හා පදිංචිකරු යන දෙදෙනාගෙන් එක් කෙනකු විසින් වත් වියදම් නොගෙවූ විට ප්‍රතිකර්මය.

298. යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු හා පදිංචිකරු යන දෙදෙනාගෙන් එක් කෙනෙකු විසින් වත් සභාව විසින් දරන ලද වියදම් නොගෙවනු ලැබුවහොත්, ඒ වියදම දරනු ලැබුවේ යම් ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ගෙය, ගොඩනැගිල්ල හෝ ඉඩම ඒ වියදමේ මුදල විෂයෙහි ලා පළමුවන වැය බරක් වන අතර, සභාව විසින් එය එලෙස අය කර ගනු ලැබිය හැකි විය යුතු ය.

නගරාධිපතිවරයා. ආදීන් ස්ථානවලට ඇතුළුවීම පිළිබඳ විධිවිධාන.

299. (1) මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක හෝ රීතියක විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, නගරාධිපතිවරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හෝ තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙන ලද යම් නිලධරයකු හිරු උදාවත් හිරු බැසීමත් අතර යම් වේලාවක දී, පදිංචිකරුවන්ට සාධාරණ දැනුම්දීමකින් පසු ව, මහා නගරය ඇතුළත පිහිටි යම් ගොඩ නැගිල්ලකට ඇතුළුව අවශ්‍ය යැයි පෙනී යන යම් පරීක්ෂණයක් හෝ විභාගයක් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) පරීක්ෂණයක කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා යම් ස්ථානයකට ඇතුළු වීමට මේ ආඥාපනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින්, නියෝගයකින් හෝ රීතියකින් නගරාධිපතිවරයාට හෝ වෙනත් තැනැත්තකුට බලය පවරා ඇති කවර හෝ අවස්ථාවක, නගරාධිපතිවරයා හෝ එකී වෙනත් තැනැත්තා හිරු උදාව සහ හිරු බැසීම අතර යම් වේලාවක දී ඒ ස්ථානයට ඇතුළු විය හැකි නමුත් (දැනුම්දීමක් කිරීම අවශ්‍ය නොවන බවට මේ ආඥාපනතින් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති අවස්ථාවලදී හැර) ස්ථානයට ඇතුළු වීම සඳහා වූ තම අදහස පිළිබඳ ව සාධාරණ දැනුම්දීමක් එහි අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත කළ යුතු ය.

(3) නගරාධිපතිවරයා හෝ ඉහත කී පරිදි බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු යම් ස්ථානයකට ඇතුළු වීම වළක්වන හෝ වැළැක්වීමට තැත් කරන හෝ ඒ ස්ථානයකට ඇතුළු වීමට ඔහුට ඉඩ දීම ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

1986 අංක 39 §62]

දණ්ඩනයට අමතරව සභාවේ දේපළවලට වන හානි පියවිය යුතු බව.

300. යම් ක්‍රියාවක්, අතපසු කිරීමක්, පැහැර හැරීමක් හෝ නොකර හැරීමක් නිසා යම් තැනැත්තකු මේ ආඥාපනත යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබුවහොත් සහ ඒ තැනැත්තාගේ එකී ක්‍රියාව, අතපසු කිරීම, පැහැර හැරීම හෝ නොකර හැරීම හේතු කොට ගෙන මහා නගර සභාවක යම් දේපළකට අලාභයක් සිදු වුවහොත්, එම වරද සඳහා නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අමතරව, ඔහු විසින් ඒ අලාභය පියවනු ලැබිය යුතු අතර, එම අලාභයේ ප්‍රමාණය පිළිබඳව මත භේදයක් ඇති විට, එය ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. තව ද, එම අලාභයේ මුදල අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක් වූවාක් මෙන් අය කර ගනු ලැබිය යුතු ය.

*පෞද්ගලික දේපළ වලට කරන ලද වැඩි දියුණු කිරීම වෙනු වෙන් වියදම අය කර ගැනීම.*

301. මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ, යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු විසින් කරවිය යුතු වැඩ අතුරින් යම් වැඩක් කරවීමේ දී මහා නගර සභාවක් විසින් යම් වියදමක් දරන ලද අවස්ථාවක, සභාව විසින් ඒ වියදමේ මුදල මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් අය කර ගත හැකි ය; නැතහොත් සුදුසු යැයි සභාව කල්පනා කරන්නේ නම්, එකී මුළු වියදම් ප්‍රමාණය පියවීමට සෑහෙන වාරික ගණනකින් ඒ මුදල ඒ සඳහා වර්ෂයකට සියයට නවයක පොලිය ද සමග අවුරුදු පහක් නොඉක්ම වන කාලයක් ඇතුළත ගෙවීමට එකී අයිතිකරු සමග ගිවිසුමකට එළඹිය හැකි අතර, ඒ මුදල් අය විය යුතු වූ විට, මේ ආඥාපනත යටතේ වරිපනම් අය කර ගනු ලබන ක්‍රියා මාර්ගයෙන් ම ඒවා ද අය කර ගනු ලැබිය හැකි ය.

*වන්දි ගෙවීම.*

302. මේ ආඥාපනතින් හෝ ඒ යටතේ සභාව හෝ එහි නිලධරයන් හෝ සේවකයන් වෙත පැවරී ඇති බලතල අතුරින් යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් යම් අලාභයක් විඳින්නට සිදු වන සියලු තැනැත්තන් හට මහා නගර සභාවක් විසින් මහා නගර සභා අරමුදලින් වන්දි ගෙවිය හැකි ය.

*වන්දි තීරණය කිරීම.*

303. (1) මෙහි අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති විට හැර මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක හෝ රීතියක විධිවිධාන යටතේ වන්දි අලාභ, ගාස්තු හෝ වියදම් ගෙවිය යුතු වූ සියලු අවස්ථාවල දී, තබයක් ඇති වූ විට සහ අවශ්‍ය නම්, එය කොටස් කිරීමේ ක්‍රමය පහත සඳහන් ආකාරයෙන් සොයා දැනගෙන තීරණය කරනු ලැබිය යුතු ය.—

(අ) හිමිකම් පාන මුදල රුපියල් එක් සියය නොඉක්මවන අවස්ථාවක, හිමිකම් පෑම් ගැන ලඝු නඩු විභාගයකින් පසු, මහෙස්ත්‍රාත්වරයකු හෝ නාගරික මහෙස්ත්‍රාත්වරයකු විසින්;

(ආ) හිමිකම් පාන මුදල රුපියල් එක් සියය ඉක්මවන නමුත් රුපියල් එක්දහස් පන්සියය නොඉක්මවන අවස්ථාවක, ප්‍රාදේශීය අධිකරණ බලය ඇති ප්‍රාථමික අධිකරණය විසින්;

(ඇ) හිමිකම් පාන මුදල රුපියල් එක්දහස් පන්සියය ඉක්මවන අවස්ථාවක, ප්‍රාදේශීය අධිකරණ බලය ඇති දිසා විනිශ්චයකරු විසින්

(2) (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් වූ අවස්ථාවල දී, හිමිකම් පෑම, ඒ සඳහා සිවිල් නඩුවක් පැවරීමෙන් කරනු ලැබිය යුතු ය. පිළිවෙළින් ප්‍රාථමික අධිකරණවලට සහ දිසා අධිකරණවලට ඉදිරිපත් කරනු ලබන නඩු විභාග කොට තීරණය කිරීම විධිමත් කෙරෙන තත් කාලයෙහි පවත්නා නීතියෙන් නියමිත වූ කාර්ය පටිපාටිය අනුව ඒ නඩුව විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් කරන ලද තීරණයකින් අතෘප්ත යම් තැනැත්තකු විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 320 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනා කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ වූ තීරණයකින් අතෘප්ත යම් තැනැත්තකු විසින්, ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනා කල හැකිය. ඒ සෑම අභියාචනයක්ම අභියාචනා අධිකරණය වෙත අභියාචනා කිරීම සම්බන්ධයෙන් පිළිවෙළින් ප්‍රාථමික අධිකරණ කාර්ය සංවිධාන පනතෙහි සහ සිවිල් නඩු විධාන සංග්‍රහයේ LVIII වන පරිච්ඡේදයෙහි වූ විධිවිධානවලට යටත් විය යුතු ය.

අලාභ අය කර ගැනීම.

**304.** 303 වන වගන්තිය යටතේ තීරණය කරන ලද වන්දි, අලාභ, ගාස්තු හෝ වියදම් මුදල ගෙවන ලෙස ඉල්ලීමෙන් දවස් හතක් ඇතුළත, එය ගෙවීමට යටත් තැනැත්තා විසින් ගෙවනු නොලැබුවහොත්, ඒ පැහැර හැරීම ගැන මහේස්ත්‍රාත්වරයාට පැමිණිලි කරනු ලැබිය හැකි අතර, ඒ මුදල ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් වුවාක් මෙන් අය කර ගනු ලැබිය යුතු ය.

බල් පත්‍ර ආදිය සඳහා ගාස්තු. [1979 අංක 42 § 8.]

**305.** (1) යම් තාවකාලික ඉදිකිරීමක් තැනීමට හෝ යම් ප්‍රක්ෂේපනයක් තැංවීමට සභාව විසින් හෝ නගරාධිපතිවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ අවසර දෙනු ලබන අවස්ථාවක, ඒ බලපත්‍රය හෝ අවසරය සඳහා සභාව විසින් ගාස්තුවක් අය කළ හැකි අතර, එසේ අය කරනු ලබන ගාස්තු ප්‍රමාණය සභාව විසින් කලින් කල තීරණය කළ යුතු ය:

එසේ වුව ද, ඒ කිසි ම ගාස්තුවක් රුපියල් එක් දහස නොඉක්මවිය යුතු අතර, ඒ ගාස්තු මහා නගර සභා අරමුදලේ බැරට ගෙවිය යුතු ය.

(2) සභාවට අයත් යම් භූමියක් තාවකාලිකව පරිහරණය කිරීම සඳහා අවසර දෙන ලද හෝ ගම් බල පත්‍රයක් ප්‍රදානය කරන ලද අවස්ථාවක, සභාව විසින් කලින් ළක නියම කරනු ලැබිය හැකි ගාස්තු ප්‍රමාණ අනුව එම පරිහරණය කිරීම පවත්නා කාලය අනුව ඒ භූමිය සඳහා සභාව විසින් කුලියක් අය කරනු ලැබිය හැකිය.

**306.** (1) සභාව විසින් කවර හෝ කරදරයක් සම්බන්ධයෙන් යම් නඩුවක් මෙහෙයවිය හැකි අතර, දඩ හෝ දණ්ඩන මුදල් කිසිවක් අය කර ගැනීම සඳහා ද යම් ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක හෝ රීතියක විධිවිධානවලට එරෙහි ව වරදක් කරන යම් තැනැත්තකුට දඬුවම් කිරීම සඳහා ද නඩු කටයුතු ආරම්භ කිරීමට නියම කළ හැකි ය. තව ද ඒ නඩු පැවරීමේ හෝ වෙනත් නඩු කටයුතුවල වියදම් මහා නගර සභා අරමුදලින් ගෙවීමට නියම කිරීම ද සභාව විසින් කළ හැකි ය. නෛතික හා වෙනත් කටයුතු.

(2) කරදරයක් පවතින බව යම් තැනැත්තකු විසින් නගරාධිපතිවරයාට පැමිණිලි කරනු ලැබූ අවස්ථාවක, එසේ කරනු ලැබූ පැමිණිල්ල ගැන සභාව විසින් පරීක්ෂා කළ යුතු අතර, ඒ කරදරය නතර කරන ලෙස හෝ ඊට ප්‍රතිකර්ම යොදන ලෙස ද නියම කළ හැකි ය.

(3) කරදරයක් නතර කිරීම හෝ ඊට ප්‍රතිකර්ම යෙදීම සඳහා හෝ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන්, මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ යම් නියෝගයක හෝ රීතියක විධිවිධාන ක්‍රියාත්මක කරන ලෙස නගරාධිපතිවරයාට හෝ සභාවට බල කිරීම සඳහා හෝ බලය අනියි ලෙස හෝ නීති විරෝධී ලෙස ක්‍රියාත්මක කිරීමෙන් නගරාධිපතිවරයා හෝ සභාව වළක්වාලීම සඳහා මැන්ඩාමුස් ආඥාවක් මගින් හෝ වෙනත් නඩු කටයුත්තක් මගින් නගරාධිපතිවරයාට හෝ සභාවට විරුද්ධව කටයුතු කිරීමෙන් යම් තැනැත්තකු මෙහි ඇතුළත් වූ කිසිවකින් වළක්වන ලෙස තේරුම් නොගත යුතු ය.

**307.** (1) මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක හෝ රීතියක විධිවිධාන යටතේ කරන ලද හෝ කිරීමට අදහස් කරනු ලැබූ යම් දෙයක් සම්බන්ධයෙන්, යම් මහා නගර සභාවකට හෝ නගරාධිපතිවරයාට හෝ සභාවේ යම් සභිකයකුට නොහොත් නිලධරයකුට හෝ සභාවේ හෝ නගරාධිපතිවරයාගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකුට විරුද්ධ ව කිසි ම නඩුවක්, සාධාරණ නිශ්චිතභාවයකින් යුක්තව ඒ නඩුවේ නිමිත්ත ද ඒ නඩුවේ යෝජිත පැමිණිලිකරුගේ සහ ඔහුට නීතිඥවරයෙක් හෝ අනුයෝජිතයෙක් සිටී නම්, ඒ නීතිඥවරයාගේ හෝ අනුයෝජිතයාගේ නම සහ පදිංචි ස්ථානය ද ප්‍රකාශ කරමින් ලියවිල්ලකින් වූ දැන්වීමක් සභාව හෝ විත්තිකරු වෙත දෙනු ලැබීමෙන් එක් මාසයක් ඉකුත් වන තුරු පවරනු නොලැබිය යුතු ය. සභාවට විරුද්ධව නඩු පැවරීම සීමා කිරීම.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සෑම නඩුවක් ම, නඩු නිමිත්ත පැන නැගීමෙන් පසු ඊළඟ මාස තුන ඇතුළත පවරනු ලැබිය යුතු අතර, එය ඉන්පසු පවරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නඩුවක් පිළිබඳ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, එම නඩුව පවරනු ලැබීමට මත්තෙන්, පැමිණිලිකරුට ප්‍රමාණවත් හානි පූරණයක් ඉදිරිපත් කරනු ලබනහොත්, එකී යම් නඩුවක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ නඩුවේ දී පැමිණිලිකරු විසින් කිසිවක් අය කර නොගත යුතු අතර, පැමිණිලිකරුගෙන් සිය නඩු ගාස්තු ලබා ගැනීමට විත්තිකරු හිමිකම් ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ හානි පූරණයක් ඉදිරිපත් කරනු නොලැබුවහොත්, ඒ නඩුවේ විත්තිකරු විසින්, ඒ නඩුව විභාග වෙමින් පවතින අධිකරණයේ අවසරය ඇතිව, වාද පිරීමට පෙර ඕනෑම වේලාවක තමා විසින් සුදුසු යැයි සිතනු ලබන මුදලක් ඒ අධිකරණයට ගෙවීම නීත්‍යනුකූල වන අතර, ඉන් පසු, අධිකරණයට මුදල් ගෙවීමට විත්තිකරුවන්ට ඉඩ ලැබෙන අනෙක් නඩුවලදී මෙන් ඒ නඩු කටයුත්ත පවත්වා ගෙන යා යුතු ය.

අපරාධ නඩු පැවරීම සීමා කිරීම.

208. මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයෙකු හෝ නාගරික මහේස්ත්‍රාත්වරයෙකු විසින් විභාග කරනු ලැබිය හැකි යම් වරදක් සම්බන්ධයෙන් වූ පැමිණිල්ල, ඒ වරද සිදු කිරීමෙන් පසු ඊළඟට එළඹෙන මාස හය ඇතුළත ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, ඒ වරද සඳහා මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ නියෝගයක් හෝ රීතියක් යටතේ යම් දඩයකට හෝ දණ්ඩනයකට කිසිම තැනැත්තකු යටත් නොවිය යුතු ය:

[1986 අංක 39§63]

එසේ වුවද, 234 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ විට, ඒ වරද සිදු කිරීමෙන් පසු ඊළඟට එළඹෙන මාස දොළහ ඇතුළත යම් වේලාවක දී පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

සභිකයන් ආදීන් ආරක්ෂා කිරීම.

309. යම් මහා නගර සභාවක් විසින් කරන ලද හෝ නොකර හරින ලද කිසි ම කාරණයක් හෝ දෙයක් හා යම් මහා නගර සභාවක් ඇතුළු වූ කිසි ම ගිවිසුමක් සහ සභාවේ විධානය යටතේ යම් සභිකයකු විසින් හෝ සභාවේ යම් නිලධරයකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ නොකර හරින ලද කිසි ම කාරණයක් හෝ දෙයක්, එසේ කරන ලද හෝ නොකර හරින ලද කාරණය හෝ දෙය හෝ එසේ එළඹුණු ගිවිසුම සභාවේ, නගරාධිපතිවරයාගේ, නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ හෝ කොමසාරිස්වරයාගේ බලතලවලට හා කාර්යවලට හෝ සම්බන්ධ වූ මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක, නියෝගයක හෝ

ඊතියක හෝ වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සද්භාවයෙන් කරන ලද නම් හෝ නොකර හරින ලද නම් හෝ එළඹෙන ලද නම්, ඒ කාරණය, දෙය හෝ ගිවිසුම නිසා යම් සභිකයකු හෝ එකී යම් නිලධරයකු හෝ වෙනත් තැනැත්තකු පෞද්ගලිකව භාවර වූ හෝ යම් නඩුවකට, වගකීමකට, හිමිකම් පෑමකට හෝ ඉල්ලීමකට යටත් නොවිය යුතු අතර, සභාව විසින් හෝ ඉහත කී පරිදි ක්‍රියා කරන සභිකයකු හෝ සභාවේ නිලධරයකු හෝ වෙනත් තැනැත්තකු විසින් දරන ලද වියදම් මහා නගර සභා අරමුදලින් දැරිය යුතු අතර මහා නගර සභා අරමුදලින් ආපසු ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, සභාවේ ගිණුම් විගණනයේ දී ඉඩ නොදෙනු ලැබිය හැකි වූ ද, යම් සභිකයකු විසින් අනුමත කරනු ලැබුවා වූ හෝ අනුමත කිරීමෙහිලා සම්බන්ධ වූ ද යම් ගෙවීමක මුදල අධිභාරයක් වශයෙන් ඔහුගෙන් අය කර ගැනීමට ඇති බැඳීමෙන් ඒ සභිකයා මේ වගන්තියේ වූ කිසිවක් හේතු කොට ගෙන නිදහස් නොවිය යුතු ය.

විත්තිකරුගේ ගාස්තු ආදිය මහා නගර සභා අරමුදලින් ගෙවිය හැකි බව.

310. වෙනත් යම් බලතලවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, යම් නඩුවක, අපරාධ නඩුවක හෝ වෙනත් නඩු කටයුත්තක විත්තිකරු සභාවේ සභිකයකු හෝ නිලධරයකු හෝ සභාවේ අනුයෝජිතයකු හෝ සේවකයකු වන අවස්ථාවක, ඒ නඩුව, අපරාධ නඩුව හෝ වෙනත් නඩු කටයුත්තක විභාග කොට තීරණය කරනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය විසින් අන්‍යාකාරයකින් විධාන කරන තාක් දුරට හැර, මහා නගර සභාවක් විසින්, සුදුසු යැයි සභාව කල්පනා කරන්නේ නම්, නඩුවේ දී, අපරාධ නඩුවේ දී හෝ නඩු කටයුත්තේ දී නැතහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගාස්තු, අය කිරීම්, වියදම්, අලාභ, දඩ වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ විත්තිකරු විසින් ගෙවිය යුතු මුදල් සියල්ල හෝ ඉන් යම් කොටසක් හෝ මහා නගර සභා අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

සභිකයන් හා අනිකුත් අය රජයේ සේවකයන් විය යුතු බව.

**311.** සෑම සභිකයෙක් ම හා යථා පරිදි පත් කරනු ලැබූ සභාවේ සෑම නිලධරයකු ම හෝ සේවකයකු ම සහ සභාව විසින් හෝ ඒ වෙනුවෙන්, භාවර හෝ නාගරික වරිපනම් බද්දක්, බද්දක්, ගෙවල් කුලියක් හෝ ජේන්දයක් හෝ නාගරික ඉඩමක් අරහයා හෝ ඒ හා සම්බන්ධ යම් ගෙවීමක්, එකතු කිරීම භාර දෙනු ලැබ ඇති සෑම කොන්ත්‍රාත්කරුවකු ම හෝ අනුයෝජිතයකු ම සහ ඒ කොන්ත්‍රාත්කරු හෝ අනුයෝජිතයා විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති සෑම සේවකයකු ම හෝ වෙනත් තැනැත්තකු ම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

වරද සඳහා දණ්ඩනය.
[1981 අංක 61 § 12.]

**312.** අන්‍යාකාර විධිවිධාන සලසා ඇතොත් හැර, මේ ආඥා පනතේ විධිවිධාන යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම එවැනි සෑම වරදක් සඳහා ම රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ ඒ වරද සම්බන්ධයෙන් අවධානය යොමු කරවමින් නගරාධිපති වරයාගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව හෝ නොකඩව කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට, වරද කරගෙන යනු ලබන එක් එක් දිනයක් සඳහා රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

නඩු පැවරීම මහේස්ත්‍රාත්වරයා ඉදිරියෙහි විය යුතු බව.

**313.** මේ ආඥාපනත යටතේ වූ සෑම නඩු පැවරීමක් ම මහේස්ත්‍රාත්වරයකු හෝ නාගරික මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි කළ යුතු අතර, එය දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධානවලින් පාලනය විය යුතු ය. තව ද, මේ ආඥාපනතින් හෝ යම් අතුරු ව්‍යවස්ථාවකින් විධිවිධාන සලස්වා ඇති සම්පූර්ණ දඩය හෝ දණ්ඩනය ඒ මහේස්ත්‍රාත්වරයාගේ සාමාන්‍ය අධිකරණ බල සීමාවන් ඉක්මවන්නක් වුව ද ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ඒ සම්පූර්ණ දඩය හෝ දණ්ඩණය නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

දඩ මුදල් යෙදවීම

**314.** මේ ආඥාපනත ප්‍රකාර යම් දඩයක් නියම කරන මහේස්ත්‍රාත්වරයා විසින් අය කර ගනු ලබන මුදලින් දෙකෙන් එක් කොටසකට වැඩි නොවන යම් කොටසක් දැනුම්දෙන්නාට ප්‍රදානය කළ හැකි අතර, ඉතිරි මුදල හෝ දැනුම්දෙන්නාට මුදලක් ප්‍රදානය කරනු නොලබන්නේ නම් ඒ දඩයේ සම්පූර්ණ මුදල සභාවට ගෙවන ලෙස ආඥා කළ යුතු ය.

ගින්නක් නිවීමේ අති බලතල හා ඈදීම.

**315.** (1) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ යම් මහා නගර සභාවක් විසින් පවත්වා ගෙන යනු ලබන ගිනි නිවන හමුදාවක අධිකාරීවරයා විසින් හෝ එය භාර වෙනත් නිලධරයා විසින් කලින් කල සභාව විසින් නිකුත් කරනු ලබන නියමයන්ට යටත් ව, ඒ ගිනි නිවන හමුදාවේ භටයන්ට හා ස්වේච්ඡාවෙන් ඔහුට සේවය කිරීමට ඉදිරිපත්වන වෙනත් යම් තැනැත්තන්ට අණ දෙමින්, ඔහු විසින් හෝ ඔහුගේ අණට යටත් තැනැත්තන් මගින්, ගින්නක් නිවීමේ කාර්යය සඳහා—

(අ) එසේ කිරීමෙන් ගිනි නිවන හමුදාවේ ක්‍රියාවලියට බාධා කරන තැනැත්තන් කිසිවකු ඉවත් කිරීම ;

(ආ) හානියක් සිදු වන්නේ නම් එය ඉතා අඩුවෙන් සිදු වන ආකාරයට යම් ස්ථානයක් කඩා ඇතුළු වීම හෝ කඩා දමා එය හරහා යෑම හෝ එය සන්තකයට ගැනීම හෝ එය බිඳ හෙළීම ;

(ඇ) යම් දිස්ත්‍රික්කයක ප්‍රධාන ජල නාළවල සහ පයිප්පවල ජලය වසා දැමීම සහ යම් ළිඳක හෝ වැංකියක ජලය ප්‍රයෝජන යට ගැනීම ; සහ

(ඈ) ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම සඳහා යථායෝග්‍ය යැයි පෙනී යන සියලු දේ සාමාන්‍යයෙන් කිරීම හා සියලු පියවර ගැනීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ බලතල යථා පරිදි ක්‍රියාත්මක කිරීමේ දී සිදු වූ යම් අලාභයක්, ගින්නෙන් සිදු වන හානි සම්බන්ධයෙන් වූ යම් රක්ෂණ ඔප්පුවක අර්ථානුකූලව, ගින්නෙන් සිදු වූ අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

316. පොලිස්පතිගේ හා අධිකාරිවරයන්ගේ වැටුප් සහ බැරැක්ක, ආරෝග්‍යශාලා, අවි ආයුධ හා වෛද්‍ය සේවකයන් පිළිබඳ වියදම් ඇතුළත් නොවූ, යම් මහා නගර සභාවක පොලිස් හමුදාවේ වාර්ෂික වියදම්, සභාවේ මහා නගර සභා අරමුදලින් ගෙවිය යුතු ය : පොලීසියේ වියදම.

එසේ වුව ද, පොලිස් විෂය භාර අමාත්‍යවරයා විසින් එවැනි හමුදාවක සංඛ්‍යාව හා වියදම් නියම කිරීම නීත්‍යානුකූල වන අතර, ඔහුගේ අනුමතය නොමැති ව, සභාව විසින් එහි අඩු කිරීමක් නොකළ යුතු ය.

317. (1) එක් එක් අවුරුද්දේ සභාවේ කටයුතු පිළිබඳ සාමාන්‍ය සමීක්ෂණයක් අන්තර්ගත වන වාර්තාවක් පළාත් පාලන කොමසාරිස්වරයා විසින් පිළියෙළ කොට ඒ මහා නගර සභාවේ නගරාධිපතිවරයාට යැවිය යුතු අතර, නගරාධිපතිවරයා විසින්, ඒ වාර්තාව ලැබීමෙන් පසු සභාවේ ඊළඟට පැවැත්වෙන රැස්වීමේ දී සභිකයන්ගේ දැන ගැනීම පිණිස ඒ වාර්තාව සභාගත කිරීමට සැලැස්විය යුතු ය. එක් එක් මහ නගර සභාවේ කටයුතු ගැන පළාත් පාලන කොමසාරිස් වරයාගේ වාර්ෂික වාර්තාව.

(2) (1) වන උප වගන්තියෙහි සඳහන් වාර්තාව සකස් කිරීමේ කාර්යය සඳහා, පළාත් පාලන කොමසාරිස්වරයා විසින් හෝ ඒ කාර්යය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින්—

(අ) යම් මහා නගර සභාවක් විසින් හෝ එය වෙනුවෙන් ප්‍රයෝජනයට ගනු ලබන, පදිංචියට ගනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් පොදු ගොඩනැගිල්ලක්, නිශ්චල දේපළක් හෝ ආයතනයක් හෝ යම් මහා නගර සභාවක විධානය යටතේ කර ගෙන යනු ලබන වැඩක් පරීක්ෂා කිරීම ;

(ආ) යම් මහා නගර සභාවක සන්තකයේ පවතින හෝ එහි පාලනය යටතේ වූ යම් පොතක් හෝ ලේඛනයක් ඉල්ලීම හා පරීක්ෂා කිරීම ; සහ

(ඇ) ආදායම සහ වියදම පිළිබඳ ගිණුම්, සභාවේ හෝ සභාවේ යම් කමිටුවක වැඩ කටයුතු හෝ කාර්යයන් සම්බන්ධයෙන් වූ වාර්තා හෝ ලේඛනවල පිටපත් හා පළාත් පාලන කොමසාරිස්වරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි වෙනත් තොරතුරු සපයන ලෙස යම් මහා නගර සභාවකට නියම කිරීම

කරනු ලැබිය හැකි ය.

---

## XVI වන කොටස

### අන්තර්කාලීන සැකසීම් හා විවිධ විධිවිධාන

පවත්නා මහා නගර නොකඩව පැවතිය යුතු බව.

**318.** මේ ආඥාපනත ක්‍රියාත්මක වන දිනයේ දී පවත්නා පිළිවෙළින් වූ කොළඹ, මහනුවර හා ගාල්ල මහා නගර මේ ආඥාපනතේ විධිවිධානවලට යටත් ව මහා නගර වශයෙන් නොකඩව පැවතිය යුතු අතර, මේ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ මහා නගර ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ සේ සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය.

පවත්නා මහා නගර සභා නොකඩව පැවතිය යුතු බව.

**319.** මේ ආඥාපනත ක්‍රියාත්මක වන දිනයේ දී සංස්ථාපිත ව පවත්නා පිළිවෙළින් වූ කොළඹ, මහනුවර හා ගාල්ල මහා නගර සභා මේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද සේ සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු අතර, ඒ එක් එක් සභාවක සභිකයන්ගේ ධුර කාලය, එකී සභිකයන් තෝරා පත් කර ගැනීමට යෙදුණු මහා ඡන්ද විමසීමේ කාලයේ දී මේ ආඥාපනත ක්‍රියාත්මකව තිබුණේ නම් තීරණය කරනු ලබන ආකාරයට ම තීරණය කරනු ලැබිය යුතු ය.

පවත්නා අතුරු ව්‍යවස්ථා ආදිය නොකඩව පැවතිය යුතු බව.

**320.** කොළඹ, මහනුවර හා ගාල්ල මහා නගරවල හා ඒවාට බල පෑවා වූ ද ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ පළ කරන ලද්දා වූ ද සියලු ප්‍රකාශන, නියම, නිවේදන, රීති, නියෝග හා අතුරු ව්‍යවස්ථා සහ එකී යම් ප්‍රඥප්තියක් යටතේ කොළඹ, මහනුවර හා ගාල්ල මහා නගර සභා විසින් ඇති කරන ලද හෝ කරන ලද හෝ ප්‍රදානය කරන ලද සියලු තනතුරු, ධුර, පත්වීම්, ගිවිසුම්, තක්සේරු, අගැයීම්, ලේඛන, බල පත්‍ර සහ අවසර දීම් ද, පනවන ලද වරිපනම් බදු හා බදු ද, මේ ආඥාපනතේ විධිවිධානවලට පටහැනි නොවන තාක් දුරට, නොකඩව බලසහිතව පැවතිය යුතු අතර, අවස්ථෝචිත පරිදි, මේ ආඥාපනත යටතේ පළ කරන ලද සේ, ඇති කරන ලද සේ, සාදන ලද සේ, ප්‍රදානය කරන ලද සේ හෝ පනවන ලද සේ සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

කොළඹ, මහනුවර හා ගාල්ල මහා නගර සභාවල දේපළ ආදිය පිළිබඳ විශේෂ විධිවිධාන.

**321.** (1) ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් ප්‍රකාර පිළිවෙළින් කොළඹ, මහනුවර සහ ගාල්ල මහා නගර සභා වෙත සතු කරනු ලැබූ හෝ එකී සභා සඳහා භාරයක් ලෙස දරනු ලැබූ කවර හෝ ආකාරයක සියලු චංචල හෝ නිශ්චල දේපළ සහ ඒවායේ සියලු සම්බන්ධතා, ඒ සභා විසින් භුක්ති විඳින ලද සියලු අයිතිවාසිකම් සමඟ, මෙම ආඥාපනතේ කාර්යයන් සඳහා එකී සභා වෙත සතු වී තිබීම හෝ භාරයක් ලෙස දැරීම නොකඩ ව පැවතිය යුතු ය.

(2) පිළිවෙළින් කොළඹ, මහනුවර හා ගාල්ල මහා නගර සභා විසින් මීට පෙර ගන්නා ලද හා ලබා ගන්නා ලද ණය ද, පිළිවෙළින් එම සභා විසින්, නොකඩ ව ගැනීම හා ලබා ගැනීම කළ හැකි ය.

(3) කොළඹ මහා නගරය ඇතුළත පිහිටි තැබෑරුම්වල සිල්ලරට අරක්කු හා රම් විකිණීම සඳහා සුරා බදු ආඥාපනත යටතේ හෝ ඒ ආඥාපනත ප්‍රකාර නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා ද ඒ සම්බන්ධයෙන් ද ගෙවිය යුතු සියලු මුද්දර ගාස්තු මහා නගර සභා අරමුදල සඳහා ගැනීමට හා ලබා ගැනීමට කොළඹ මහා නගර සභාවට හිමිකම් තිබිය යුතු ය.

ජල කර්මාන්ත සඳහා ගාල්ල හා මහනුවර සභාවලට රජයෙන් දෙන ලද ණය.

**322.** ජල කර්මාන්ත ඉදි කිරීම සඳහා ණයක් ප්‍රදානය කිරීමට බලය දෙන යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ මහනුවර සහ ගාල්ල මහා නගර සභා දෙකෙන් කවර සභාවකට වුව ද ණයට දී ඇති සෑම වෙන් වෙන් මුදල් ප්‍රමාණ හෝ වාරික ඉල්ලා සිටීමට හා ලබා ගැනීමට රජයට ඇති අයිතිවාසිකමට මේ ආඥාපනතෙහි සඳහන් කිසිවක් බල පාන්නේ ඇතැයි නොසැලකිය යුතු ය. එකී වෙන් වෙන් මුදල් ප්‍රමාණ හෝ වාරික, ඉහත කී පරිදි ඒ මුදල් ණයට දෙනු ලැබූ සභාවේ වරිපනම් බදු හා බදු, ගෙවල් කුලී සහ වෙනත් සියලු ආදායම් හා දේපළ කෙරෙහි නොකඩව ම වැය බරක් විය යුතු ය.

කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ ඇතැම් කොටස් ගාල්ලට අදාළ කිරීම. [1973 අංක 38 §2.]

**323.** (1) කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ 9 වන, 10 වන, 12 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන, 23 වන, 24 වන, 33 වන හා 34 වන වගන්ති ගාල්ලේ මහා නගර සභා ප්‍රදේශයට අදාළ විය යුතු ය.

(2) එකී ආඥාපනතේ ඉහත සඳහන් වගන්ති අදාළ කිරීමේ දී පහත සඳහන් සුළු වෙනස් කිරීම් බලසහිත විය යුතු ය :—

(අ) "ජල කර්මාන්ත ඉංජිනේරුවරයා" යන යෙදුම වෙනුවට "නගරාධිපතිවරයා" යන වචනය ආදේශ කළ යුතු ය;

(ආ) ගාල්ල ජල කර්මාන්ත ආඥාපනතේ හෝ එහි යම් සංශෝධනයක විධිවිධාන යටතේ වරිපනම් බද්දක් අය විය යුතුව තිබෙන තාක්, කොළඹ මහා නගර සභා ජල

කර්මාන්ත ආඥාපනතේ 18 වන වගන්තියෙහි "මහා නගර සභා ආඥාපනත" යන වචන වෙනුවට "1891 ගාල්ල ජල කර්මාන්ත ආඥාපනත" යන වචන ආදේශ කර තුබූ ලෙස එම වගන්තිය කියවිය යුතු ය;

(ඇ) කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ 33 වන වගන්තියෙහි "මේ යටතේ සාදන ලද නියෝග" යන යෙදුම මේ ආඥාපනත යටතේ සාදන ලද හෝ සෑදනු ලැබූ ලෙස සලකනු ලබන අතුරු ව්‍යවස්ථා විද්‍රිබද සඳහනක් ලෙස ගත යුතු ය.

[1973 අංක 38 §

(3) ගාල්ලේ මහා නගර සභාව විසින් එකී කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතෙහි වූ උපලේඛනයේ ඇතුළත් නියෝගවලින් කිසිවක්, අවශ්‍යාව අනුව අවශ්‍ය විය හැකි වෙනස් කිරීම් සහිත ව ගාල්ලේ මහා නගර සභා ප්‍රදේශයට අදාළ කිරීම මේ ආඥාපනතෙන් විධිවිධාන සැලැස්වෙන ආකාරයෙන් සාදා පළ කරනු ලබන අතුරු ව්‍යවස්ථා මගින් කළ හැකි ය.

කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ ඇතැම් විධිවිධාන මහනුවරට අදාළ කිරීම. [1973 අංක 38 §3.]

323ආ. (1) මෙහි එකොළොස් වන උපලේඛනයේ දැක්වෙන වෙනස් කිරීම්වලට යටත් ව, කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ 3, 4, 7 වන වගන්ති හා 9 සිට 44 දක්වා වූ (දෙකම ඇතුළු ව) වගන්ති ද එහි උපලේඛනයේ දැක්වෙන නියෝග ද මහනුවර මහා නගර සභා ප්‍රදේශයට අදාළ විය යුතු ය.

(2) (1) වැනි උපවගන්තිය මගින් මහනුවර මහා නගර සභා ප්‍රදේශයට අදාළ කෙරෙන විධිවිධාන හා ජල කර්මාන්ත සම්බන්ධයෙන් ඒ මහා නගර සභා ප්‍රදේශයට අදාළ වන අතුරු ව්‍යවස්ථා කිසිවක විධිවිධාන අතර යම් ගැටුමක් හෝ නොගැළපීමක් ඇති වූ විටක, (1) වන උපවගන්තිය මගින් අදාළ කෙරෙන විධිවිධාන, ඒ ගැටුම හෝ නොගැළපීම ඇතිතාක් දුර ඒ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අභිභවා බල පැවැත්විය යුතු ය.

කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන මහා නගර සභාවලට අදාළ කිරීමෙහි ලා අමාත්‍ය ක්‍රියාව ඇති බලය. [1973 අංක 38 §.]

323ඇ. අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන සියල්ල හෝ එයින් කිසිවක් යම් මහා නගර සභා ප්‍රාදේශයක අවශ්‍යතාවන් සපුරාලනු පිණිස, නියමයෙහි දැක් විය හැකි වෙනස් කිරීම් සහිතව, ඒ මහා නගර සභා ප්‍රදේශයට අදාළ කල හැකි ය.

වෙනත් ලිඛිත නීතිවල අර්ථ විග්‍රහය.

**324.** (1) යම් මහා නගරයක් හෝ යම් මහා නගර සභාවක් හෝ එහි යම් සභාවක සභාපතිවරයා, සහකාර සභාපතිවරයා, සභිකයන් නිලධරයන් හෝ සේවකයන් සම්බන්ධයෙන්, එසේ අදාළ වන යම් ලිඛිත නීතියක හෝ යම් ලේඛනයක හෝ ලියවිල්ලක, කෙලින් ම සහ අන් අයුරකින් කර ඇති සෑම සඳහන් කිරීමක් ම, මේ ආඥාපනතේ හෝ තත් කාර්ය සඳහා තත් කාලයෙහි අදාළ වන වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලින් හෝ ඒ යටතේ සංස්ථාපිත, තෝරා පත් කර ගන්නා ලද හෝ පත් කරන ලද අවස්ථෝචිත පරිදි පිළිවෙළින් වූ මහා නගරයක් හෝ සභාවක් හෝ සභාවේ නගරාධිපතිවරයා, නියෝජ්‍ය නගරාධිපතිවරයා, සභිකයන්, නිලධරයන් හෝ සේවකයන් සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම් ලෙස (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව තේරුම් ගත යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියකින් සභාවට හෝ එහි සභාපතිවරයාට, සහකාර සභාපතිවරයාට, නගරාධිපතිවරයාට, නියෝජ්‍ය නගරාධිපතිවරයාට, සභිකයන්ට, නිලධරයන්ට හෝ සේවකයන්ට පිරිනැමී ඇති හෝ නියම වී ඇති හෝ සතු වී ඇති සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය මේ ආඥාපනතේ විධිවිධානවලට යටත් ව ක්‍රියාවේ යෙදවිය යුතු ය, ඉටු කළ යුතු ය, කළ යුතු ය.

(3) මේ ආඥාපනත ක්‍රියාත්මක වන දිනයේ දී යම් ලිඛිත නීතියකින් සභාපතිවරයා හෝ සහකාර සභාපතිවරයා විසින් ක්‍රියාවේ යෙදවිය යුතුව හෝ ඉටු කළ යුතු ව හෝ කළ යුතු යැයි නියමිත සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය, එදින හා එදිනෙන් පසු, මේ ආඥාපනතේ විධිවිධානවලට යටත් ව, සභාව විසින් ක්‍රියාවේ යෙදවිය යුතු ය, ඉටු කළ යුතු ය, කළ යුතු ය :

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන 32 වන වගන්තියේ යම් මහා නගර සභාවක් වෙත පිරිනැමී ඇති බලය පවරා දීමේ බලතලවලට බල පාන ලෙස නොසැලකිය යුතු ය.

මහා නගර සභා පළාත් පාලන ආයතනවල අනුප්‍රාප්තිකයා වන බව.

[1971 අංක 48 § 29.]

**325.** (1) මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව මහා නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබූ මහා නගරයක්, නගර සභා ආඥාපනත හෝ සුළු නගර සභා ආඥාපනත හෝ ගම්සභා ආඥාපනත යටතේ සංස්ථාපිත යම් පළාත් පාලන ආයතනයක පාලනය යටතට ගැනෙන සම්පූර්ණ පරිපාලන ප්‍රදේශයෙන් සමන්විත වන යම් අවස්ථාවක—

(අ) මහා නගර සභාව සංස්ථාපනය කරනු ලැබූ දිනයේ සිට, ඒ පරිපාලන ප්‍රදේශය සම්බන්ධයෙන් වූ සියලු කාර්යයන් සඳහා ඒ මහා නගර සභාව ඒ පළාත් පාලන ආයතනයේ අනුප්‍රාප්තිකයා විය යුතු අතර, එම දිනට පෙරාතුව ම වූ දින දී ඒ පළාත් පාලන ආයතනය විසුරුවා හැරී සේ සලකනු ලැබිය යුතු ය;

(ආ) ඒ පළාත් පාලන ආයතනය විසින් යථා පරිදි නිකුත් කරනු ලැබ හෝ ප්‍රදානය කරනු ලැබ එකී දිනයෙහි බලාත්මක ව පවතින සියලු බල පත්‍ර සහ අවසර පත්‍ර, මේ ආඥා පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මහා නගර සභාව විසින් මේ ආඥාපනත යටතේ යථා පරිදි නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) ඉහත කී ලෙස විසුරුවා හරින ලද සේ සලකනු ලබන දින වන විට ඒ පළාත් පාලන ආයතනයේ සේවයෙහි නියුක්තව සිටි සියලු නිලධරයන් සහ සේවකයන්, පළාත් පාලන සේවා පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක විධිවිධානවලට යටත් ව, මහා නගර සභාවේ නිලධරයන් හා සේවකයන් විය යුතු අතර, ඉහත කී විධිවිධාන වලට යටත් ව, ක්‍රියාත්මක කළ හැකි තාක් දුරට, ඔවුන් ඒ පළාත් පාලන ආයතනය යටතේ ධුර දැරූ භාවයෙන් ම සහ එම නියම හා කොන්දේසි මත ම, ස්වකීය ධුර දැරිය යුතු ය :

එසේ වුව ද, අනවශ්‍ය යැයි මහා නගර සභාව විසින් සලකනු ලබන යම් තනතුරක් හෝ ධුරයක්—

(i) ඒ ධුරය හෝ තනතුර අහෝසි කරන අවස්ථාවේ දී එය දරන තැනැත්තා පළාත් පාලන සේවයේ සාමාජිකයකු නොවන යම් විටක, සිය ධුරය හෝ තනතුර ඒ පළාත් පාලන ආයතනය විසින් අහෝසි කරනු ලැබී නම් එබඳු අවස්ථාවක දී එම ධුරය හෝ තනතුර දරන්නා ලැබීමට හිමිකම් ලබන්නා වූ වන්දි මුදල හෝ මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි වන්දි මුදල ගෙවනු ලැබීමට ; හෝ

(ii) ඒ ධුරය හෝ තනතුර දරන්නා පළාත් පාලන සේවයේ සාමාජිකයකු වන යම් විටක, පළාත් පාලන සේවා පනත යටතේ ඔහුට ලැබීමට හිමිකම් තිබිය හැකි වන්දි මුදල හෝ වෙනත් ප්‍රදානයක් ගෙවනු ලැබීමට

යටත් ව, මහා නගර සභාව විසින් අහෝසි කරනු ලැබිය හැකිය.

(ඇ) එකී දිනය වන විට ඒ පළාත් පාලන ආයතනයේ හෝ ඊට අයත් වූ හෝ එය වෙත පැවරී තුබූ සියලු අයිතිවාසිකම්, බලතල, කාර්ය, කර්තව්‍ය, වරප්‍රසාද, වගකීම්, ආරක්ෂා හා පරිහාර, මේ ආඥාපනතේ විධිවිධානවලට යටත් ව, ඒ පළාත් පාලන ආයතනයට කෙලින් ම අනුප්‍රාප්ත මහා නගර සභාව වෙත පැවරීම, අයත් වීම හෝ සතු වීම සිදු විය යුතු අතර ඒ මහා නගර සභාව කවර හෝ වූ සියලු ආකාරයෙන් ඒ පළාත් පාලන ආයතනයේ අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඉ) අවස්ථාවෝචිත පරිදි, නගර සභා ආඥාපනත හෝ සුළු නගර සභා ආඥාපනත හෝ ගම් සභා ආඥාපනත හෝ යටතේ ඒ පළාත් පාලන ආයතනය විසින් සාදනු ලැබ එකී දිනයේ දී බලාත්මකව පවතින සියලු අතුරු ව්‍යවස්ථා, මේ ආඥාපනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, නොකඩ ව බලාත්මක ව පැවතිය යුතු අතර, ඒවා මහා නගර සභාව විසින් මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය : [1971 අංක 48 § 29.]

එසේ වුව ද, මේ ඡේදයේ කුමක් සඳහන් වුව ද, යම් නගර සභාවක හෝ සුළු නගර සභාවක හෝ ගම් සභාවක් සභා රැස්වීම්වල ගණපූරණය නියම කරමින් ඒ සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් නොකඩව බලාත්මකව නොපැවතිය යුතු අතර, ඉහත කී නගර සභාවේ හෝ සුළු නගර සභාවේ හෝ ගම් සභාවේ අනුප්‍රාප්තිකයා වන හෝ අනුප්‍රාප්තිකයා වූ මහා නගර සභාව සම්බන්ධයෙන් 1951 ජනවාරි මස 1 වන දිනට හෝ එදිනට පසුව බලාත්මකව නොපවතින ලෙස සැලකිය යුතු ය; [1971 අංක 48 § 29.] 1971 අංක 48 § 29.]

(ඊ) ඒ පළාත් පාලන ආයතනයේ හෝ එයට බල පාන්නා වූ සහ ඒ පළාත් පාලන ආයතනය සංස්ථාපනය කරනු ලැබුවේ යම් ප්‍රඥප්තියක් යටතේ ද ඒ ප්‍රඥප්තිය නොවන යම් ලිඛිත නීතියක් යටතේ පළ කරනු ලැබුවා වූ හෝ සාදනු ලැබුවා වූ ද එකී දිනයේ දී බලාත්මක ව පැවැති වූ ද සියලු ප්‍රකාශන, නියම, නිවේදන, රීති, නියෝග හා අතුරු ව්‍යවස්ථා මේ ආඥාපනතේ විධිවිධාන වලට අනනුකූල නොවන තාක් දුරට, මේ ආඥාපනත යටතේ මහා නගර සභාව සම්බන්ධයෙන් හෝ මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා පළ කරන ලද හෝ සාදන ලද ප්‍රකාශන, නියම, නිවේදන, රීති, නියෝග හා අතුරු ව්‍යවස්ථා වූවාක් මෙන් නොකඩව බලාත්මකව පැවතිය යුතු ය. එසෙත් ඒ බලාත්මක වීම, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා හෝ මහා නගර සභාව විසින් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ වෙනස් කිරීමට යටත් විය යුතු ය;

(උ) එකී දිනය වන විට ඒ පළාත් පාලන ආයතනය විසින් දරන ලද සියලු ණය, බැඳීම් හා බැඳී සිටීම් ද, ලියා අත්සන් කරන ලද හෝ එළඹෙන ලද සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර ද, ඒ පළාත් පාලන ආයතනය විසින්, එය සමඟ හෝ එය වෙනුවෙන් කිරීමට බැඳී සිටින සියලු කරුණු හා දේවල් ද මහා නගර සභාව විසින් දරන ලද, ලියා අත්සන් කරන ලද, එළඹෙන ලද ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් හා

සාධන පත්‍ර ලෙස ද මහා නගර සභාව විසින්, එය සමඟ හෝ එය වෙනුවෙන් කිරීමට බැඳී සිටින කරුණු හා දේවල් ලෙස ද සලකනු ලැබිය යුතු ය;

(ඍ) එකී දිනය වන විට ඒ පළාත් පාලන ආයතනයට අය විය යුතු ව තුබූ සියලු වරිපනම් බදු, බදු, කුලී, රේන්ද, දඩ මුදල්, දණ්ඩන මුදල් සහ මුදල්, මහා නගර සභාවට අය විය යුතු ව තුබූ ලෙස සලකනු ලැබිය යුතු ය;

(එ) එකී දිනය වන විට ඒ පළාත් පාලන ආයතනය විසින් හෝ ඊට විරුද්ධව ආරම්භ කර තුබූ හෝ ආරම්භ කළ හෝ ආරම්භ කළ හැකිව තුබූ සියලු සිවිල් නඩු, අපරාධ නඩු, අභියාචන හෝ වෙනත් නීති කෘත්‍ය, මේ ආඥා පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, නොකඩව පවත්වාගෙන යාම හෝ ආරම්භ කිරීම මහා නගර සභාව විසින් හෝ මහා නගර සභාවට විරුද්ධ ව කළ හැකි ය;

(ඒ) එකී දිනයට පෙර යම් කිසි අධිකරණයක් විසින් ඒ පළාත් පාලන ආයතනයේ වාසියට හෝ ඒ පළාත් පාලන ආයතනයට විරුද්ධව කරන ලද සියලු තීන්දු ප්‍රකාශ හෝ ආඥා, මහා නගර සභාවේ වාසියට හෝ මහා නගර සභාවට විරුද්ධව කරන ලද තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඔ) එකී දිනය වන විට ඒ පළාත් පාලන ආයතනයේ ප්‍රාදේශීය අරමුදලේ බැරට තිබෙන ශේෂය සහ ඒ හා සම්බන්ධ යම් ආයෝජනයකින් පැන නැගුණු සියළු පොළී හෝ ලාභ ද එකී ආයෝජනයන් කිසිවක මුළු මුදලක් සමඟ මහා නගර සභාවේ මහා නගර සභා අරමුදලට මාරු කොට ඒ අරමුදල වෙත සතු කළ යුතු ය;

(ඕ) එකී දිනය වන විට ඒ පළාත් පාලන ආයතනය විසින් කරනු ලැබ ඇති සියලු තක්සේරු කිරීම්, අගැයීම්, මිනුම් හා බෙදා වෙන් කිරීම්, මහා නගර සභාව විසින් පිළිවෙළින් සම්මත කරන ලද හා සාදන ලද ලෙස සලකනු ලැබිය යුතු ය;

(ක) එකී දිනය වන විට, ඒ පළාත් පාලන ආයතනය වෙත සතු කර තුබූ හෝ එය විසින් නීත්‍යනුකූලව මිලට ගෙනු තුබූ හෝ අත් කර ගෙන තුබූ හෝ බද්දට ගෙන තුබූ හෝ එයට යුක්ත්‍යක් කර ගැනීම සඳහා භාර දී තුබූ හෝ වෙනත් කවර හෝ ආකාරයකින් එයට පවරනු ලැබ තුබූ හෝ ඒ පළාත් පාලන ආයතනය සඳහා භාරයක් වශයෙන් දරනු ලැබූ හෝ ඒ පළාත් පාලන ආයතනයේ සන්තකයෙහි හෝ පාලනය යටතේ තුබූ සියලු චංචල හා නිශ්චල දේපළ එකී දිනය වන විට ඒ දේපළට සම්බන්ධ,

අනුබද්ධ හෝ අදාල භාරවලට, සෘණ භාරවලට, බැඳීම්වලට, අවශේෂිතවලට, පරවශතාවලට හෝ වෙනත් අවහිරවලට යටත්ව සහ එකී දිනය වන විට ඒ දේපළට සම්බන්ධ, අනුබද්ධ, හෝ අදාළ නියම හා කොන්දේසි මත, මහා නගර සභාව විසින් හෝ මහා නගර සභාව වෙනුවෙන් භාරයක් වශයෙන් දැරිය යුතු ය ;

(ග) ඒ පළාත් පාලන ආයතනය විසින්, එය සංස්ථාපනය කරනු ලැබුවේ යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ ද ඒ විධිවිධානවලට අනුකූලව, ඒ පළාත් පාලන ආයතනයේ ධුර කාලයේ අවසාන අවුරුද්ද තුළ, ඊළඟට එළඹෙන අවුරුද්ද සඳහා වූ අය වැය ලේඛනය සකස් කොට සම්මත කළ යුතු අතර, සියලු වරිපනම් බදු, බදු සහ බල පත්‍ර ගාස්තු තක්සේරු කොට පැනවිය යුතු ය. තව ද, ඒ අය වැය ලේඛනය, වරිපනම් බදු, බදු සහ ගාස්තු, මේ ආඥා පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මහා නගර සභාව විසින් මේ ආඥාපනත යටතේ අවස්ථෝචිත පරිදි සම්මත කරනු ලැබූ, තක්සේරු කරනු ලැබූ හෝ පනවනු ලැබූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව මහා නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබූ මහා නගරයක්, නගර සභා ආඥාපනත හෝ සුළු නගර සභා ආඥාපනත හෝ ගම් සභා ආඥා පනත යටතේ සංස්ථාපිත යම් පළාත් පාලන ආයතනයක පාලනය යටතට ගැනෙන සම්පූර්ණ පරිපාලන ප්‍රදේශයෙන් සමන්විත නොවන යම් අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ව්‍යතිරේක, අනුවර්තන සහ සුළු වෙනස් කිරීම් වේ නම් ඒ ව්‍යතිරේක, අනුවර්තන සහ සුළු වෙනස් කිරීම් සහිතව, (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු යැයි අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය. තව ද විශේෂිත වශයෙන් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, අමාත්‍යවරයා විසින්, එකී යම් නියමයක් මගින්, අනපේක්ෂිත හෝ විශේෂ අවස්ථාවලට සරිලන විධිවිධාන සැලැස්වීම සඳහා හෝ තීරණය කිරීම හෝ යථාවත් කිරීම සඳහා මේ ආඥා පනතින් කිසි ම විධිවිධානයක් හෝ කිසි ම බලාන්විත විධිවිධානයක් සලස්වා නැති යම් ප්‍රශ්නයක් හෝ කරුණක් තීරණය කිරීම හෝ යථාවත් කිරීම සඳහා අවශ්‍ය වෙතැයි අමාත්‍යවරයා විසින් සලකනු ලැබිය හැකි සියලු විධාන නිකුත් කරනු ලැබිය හැකි ය. 1971 අංක 48 29.]

(3) මේ වගන්තියේ කාර්ය සඳහා—

"පළාත් පාලන ආයතනය" යන්නෙන්—

(අ) එය නගර සභා ආඥාපනත සම්බන්ධයෙන් වන විට නගර සභාවක් ද;

(ආ) සුළු නගර සභා ආඥාපනත සම්බන්ධයෙන් වන විට සුළු නගර සභාවක් ද;

1971 අංක 48 § 29.]

(ඇ) ගම් සභා ආඥාපනත සම්බන්ධයෙන් වන විට ගම් සභාවක් ද

අදහස් වේ.

සංක්‍රාන්තික කාලය සඳහා වූ නියම.

326. (1) අනපේක්ෂිත හෝ විශේෂ අවස්ථා කිසිවක් පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා හෝ යම් මහා නගරයක හෝ යම් මහා නගර සභාවක කටයුතුවල පරිපාලනය සම්බන්ධයෙන් පැන නැගිය හැකි වූ ද, ඒ සඳහා මේ ආඥාපනතෙහි කිසි ම විධිවිධානයක් හෝ කිසි ම බලාත්මක විධිවිධානයක් සලස්වා නොමැති වූ ද යම් ප්‍රශ්නයක් හෝ කරුණක් තිරණය කිරීම හෝ යථාවත් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියම්යන් සෑදීම නීත්‍යනුකූල විය යුතු ය.

(2) ඒ සියලු නියමයන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට, නීතියේ බලය ලබන අතර, ඒවා මෙහි ලා පැනවූවාක් මෙන් වලංගු හා බලාත්මක විය යුතු ය.

අර්ථ නිරූපනය.

327. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ආඥාපනතෙහි—

[1981 අංක 33 § 2]

"වාර්ෂික වටිනාකම" යන්නෙන්—

(අ) යම් ස්ථානයක් කුලියට දී නොමැති අවස්ථාවක, සියලු පොදු වරිපනම් හා බදු ගෙවීමට කුලී නිවැසියා විසින් භාරගනු ලැබුවේ නම් හා ඒ ගෙවල් කුලිය අය කර ගැනීමට තරම් යෝග්‍ය තත්ත්වයකින් යම් නිවාසයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම හා යථා තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා පිරිවැයක් වෙතොත්, එය දැරමේ වගකීම ගෙහිමියා විසින් භාරගනු ලැබුවේ නම්, එක් වර්ෂයක් තවත් වර්ෂයක් අනුව සලකා බලන විට, ඒ නිවාසය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත සඳහා යම් කුලී නිවැසියකු විසින් ගෙවීමට යුක්ති සහගත ලෙස බලාපොරොත්තු වන්නා වූ වාර්ෂික ගෙවල් කුලියද,

(ආ) යම් ස්ථානයක් කුලියට දී ඇති අවස්ථාවක, සියලු පොදු වරිපනම් හා බදු ගෙවීමේ වගකීම කුලී නිවැසියකු විසින් භාරගනු ලැබුවේ නම් හා ඒ ගෙවල් කුලිය අය කර ගැනීමට තරම් යෝග්‍ය තත්ත්වයකින් යම් නිවාසයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන්නා වූ අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම හා යථා තත්ත්වයෙන් පවත්වා ගෙන යෑම සඳහා පිරිවැයක් වෙතොත්, එය දැරීමේ වගකීම ගෙහිමියා විසින් භාරගනු ලැබුවේ නම්, එක් වර්ෂයක් තවත් වර්ෂයක් අනුව සලකා බලන විට, ඒ කුලී නිවැසියා විසින් ඒ නිවාසය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත සඳහා ගෙවීමට යුක්ති සහගත ලෙස බලාපොරොත්තු වන්නා වූ වාර්ෂික ගෙවල් කුලිය නැතහොත් පොදු වරිපනම් හා බදු ගෙවීමේ වගකීම කුලී නිවැසියා විසින් භාරගනු ලැබූ අවස්ථාවක සහ ඒ ගෙවල් කුලිය අය කර ගැනීමට තරම් යෝග්‍ය තත්ත්වයකින් ඒ නිවාසය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන්නා වූ අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම හා යථා තත්ත්වයෙන් පවත්වා ගෙන යෑම සඳහා පිරිවැයක් වෙතොත්, එය දැරීමේ වගකීම ගෙහිමියා විසින් භාරගනු ලැබූ අවස්ථාවක ගෙවන ලද නියම වාර්ෂික ගෙවල් කුලිය යන දෙකින් වැඩි ගෙවල් කුලිය ද

අදහස් වේ :

එසේ වුව ද, වාර්ෂික වටිනාකම ආගණනය කිරීමේ දී කුලියට නොදුන් කවර වූ හෝ යම් කාලපරිච්ඡේදයක් සඳහා කිසිදු සහනයක් හෝ අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය.

"ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක්" යන්නෙන් 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනත මගින් ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් අදහස් වේ;

"පාලම" යන්නට යම් බෝක්කුවක්, සොරොව්වක්, වේල්ලක්, හෝ බැම්මක් ඇතුළත් වේ.

"ගොඩනැගිල්ල" යන්නට මනුෂ්‍ය වාසස්ථානයක කාර්ය සඳහා හෝ නොඑසේ වූ යම් ගෙයක්, පැල්පතක්, මඩුවක් හෝ වහලය සහිත කොටුවක් ද යම් බිත්තියක් ද ඇතුළත් වේ;

"ඇළ" යන්නට, ඒ ඇළේ පැති, ඇදගෙන යන මාර්ග, ඉවුරු, කාණු සහ අගල් සමග එහි ඉවුරේ සිට අනික් ඉවුර දක්වා වූ ජල මාර්ගයේ සම්පූර්ණ ජල මාර්ග ප්‍රදේශය ඇතුළත් වේ;

"කරත්තය" යන්නෙන්, ගොනකු හෝ ගොනුන් විසින් හෝ මී හරකකු හෝ මී හරකුන් විසින් අදිනු ලබන සෑම වාහනයක් ම අදහස් වේ;

"කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මේ ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වන අතර, ඒ සභාවේ යම් නියෝජ්‍ය හෝ සහකාර නාගරික කොමසාරිස්වරයෙක් සහ නාගරික කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය හෝ සහකාර නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙක් ද, කොමසාරිස්වරයාගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම සඳහා මේ ආඥාපනතින් හෝ ඒ යටතේ බලය පවරනු ලැබූ, ඒ සභාවේ යම් නිලධරයෙක් ද ඒ නිලධරයාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණයට ඊට ඇතුළත් වේ;

"පළාත් පාලන කොමසාරිස්වරයා" යන්නට යම් නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්වරයෙක් ඇතුළත් වේ;

"සභාව" හෝ "මහා නගර සභාව" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මේ ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වේ;

"සභිකයා" යන්නෙන් යම් සභාවක සාමාජිකයෙක් අදහස් වේ;

"ඡන්ද විමසීම් නිලධරයා" යන්නෙන් එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පත් කරන ලද ඡන්ද විමසීම් නිලධරයා අදහස් වන අතර, එසේ පත් කරනු ලැබූ යම් සහකාර ඡන්ද විමසීම් නිලධරයෙක් ද ඊට ඇතුළත් වේ;

"පළාත් පාලන සේවය" යන්නෙන්, පළාත් පාලන සේවා පනතින් සංස්ථාපනය කරනු ලැබූ පළාත් පාලන සේවය අදහස් වේ;

"මහේස්ත්‍රාත්වරයා" යන්නෙන්, මහා නගරයක් ඇතුළත අධිකරණ බලය ඇති යම් මහේස්ත්‍රාත්වරයෙක් අදහස් වේ;

"නගරාධිපතිවරයා" සහ "නියෝජ්‍ය නගරාධිපතිවරයා" යන යෙදුම්වලින්, පිළිවෙළින්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූල ව තෝරා පත් කර ගන්නා ලද නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අදහස් වේ; [1977 අංක 24 § 115.]

"සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා" යන්නෙන්, සභාවක යම් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු අදහස් වන අතර, ඒ සභාවේ යම් සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයෙක් සහ ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හෝ ඒ සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත් කරන ලද යම් තැනැත්තෙක් ඊට ඇතුළත් වේ;

"මහා නගරය" යන්නෙන්, මේ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ මහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශිත හෝ ප්‍රකාශිත යැයි සලකනු ලබන යම් ප්‍රදේශයක් අදහස් වේ.

"නාගරික මහෙස්ත්‍රාත්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ මහා නගරය සඳහා මේ ආඥාපනත යටතේ පත් කරන ලද නාගරික මහෙස්ත්‍රාත්වරයා අදහස් වන අතර, එසේ පත් කරන ලද යම් අතිරේක නාගරික මහෙස්ත්‍රාත්වරයෙක් ද ඊට ඇතුළත් වේ;

"කරදරය" යන්නට දෘෂ්ටි, ආඝ්‍රාණ හෝ ශ්‍රවණ ඉන්ද්‍රියට පීඩාවක්, ප්‍රකෝපනයක්, අප්‍රසන්නතාවයක්, හිංසාවක්, අන්තරායක් හෝ අලාභයක් ඇති කරවන හෝ ඇති කර වීමට ඉඩ ඇති, එසේ නැතහොත් සෞඛ්‍යයට හෝ දේපළට අන්තරායදායක හෝ හානිකර හෝ එසේ අන්තරායදායක හෝ හානිකර වීමට ඉඩ ඇති යම් ක්‍රියාවක්, නොකර හැරීමක් හෝ දෙයක් ඇතුළත් වේ;

"අයිතිකරු" යන්නට, එම වචනය යොදනු ලබන්නේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ද ඒ ස්ථානයේ කුලිය තත් කාලයේ තමා වෙනුවෙන් ම හෝ වෙනත් යම් තැනැත්තකුගේ අනුයෝජිතයා හෝ භාරකරු වශයෙන් ලබා ගන්නා නොහොත් ඒ ස්ථානය කුලී නිවැසියකුට කුලිය දෙනු ලැබී නම් ඒ කුලිය ලබා ගන්නා තැනැත්තා ඇතුළත් වේ;

"ස්ථානය" යන්නට, සියලු ගේ දොර, ගොඩනැගිලි, ඉඩම් සහ පරවශතා ඇතුළත් වන අතර, ඒ පරවශතා අයිතිව තිබෙන්නේ යම් දේපළකට ද නැතහොත් ඒවා භුක්ති විඳිනු ලබන්නේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි කොටසක් ලෙස ඒ පරවශතා සියල්ල සලකනු ලැබිය යුතු ය;

" නියමිත " යන්නෙන්, මේ ආඥාපනත යටතේ සැදනු ලද හෝ සාදන ලද සේ සලකනු ලබන යම් අතුරු ව්‍යවස්ථාවකින් නියමිත බව අදහස් වේ;

" පොදු " යන්න, යම් කාණුවකට, බෝක්කුවකට, අගලකට හෝ පලතුරු, එළවළු හෝ මිනිස් පරිභෝජනය පිණිස වූ වෙනත් ඉක්මණින් නරක්වනසුළු ආහාර ද්‍රව්‍ය විකිණීම සඳහා වෙළෙඳ පොළක් වශයෙන් සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන (පොදු වෙළෙඳ පොළක් නොවන) යම් ස්ථානයක් අදහස් වේ;

" නිසි නිලධරයා " යන්නෙන්, මහා නගර සභාවක විධානය අනුව, යම් වීථියක හෝ වීථියක් සම්බන්ධයෙන් කරනු ලබන හෝ කිරීමට ඇති යම් වැඩක් භාර නිලධරයා අදහස් වේ;

" පොදු " යන්න, යම් කාණුවකට, බෝක්කුවකට, අගලකට හෝ ජල මාර්ගයකට අදාළ ව යොදනු ලබන විට, එය සභාව වෙත සතු කරනු ලැබූ කාණුවක්, අගලක් හෝ ජල මාර්ග යක් බව ඉන් අදහස් වේ;

"මහජන වෙළෙඳ පොළ " යන්නෙන්, ඉවත් කරනු ලැබූ යම් ප්‍රඥප්තියක් යටතේ මහජන වෙළෙඳ පොළක් ව මේ දක්වා පැවති යම් ස්ථානයක් හෝ සභාවේ යෝජනා සම්මතයක් මගින්, මහජන වෙළෙඳ පොළක් ලෙස මින් පසු ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි යම් ස්ථානයක් අදහස් වේ;

" ගඟ " යන්නට යාත්‍රා කළ හැකි සියලු පොදු ජල මාර්ග, වැව් සහ සියලු ඇළදොළ යනා ජල මාර්ග හා ඒවාට අයත් වේලි ඇතුළත් වේ;

" වීථිය " යන්නට, මාර්ගය සහ ඊට යාබද යම් ගෙයක ප්‍රධාන බිත්තිය අතර පිහිටියා වූ ද, යම් ස්තරනයකින්, ආලින්දයකින් හෝ වෙනත් ව්‍යුහයකින් ආවරණය කරනු ලැබුවා වූ හෝ නොලැබුවා වූ ද (රජයේ දේපළක් හෝ පෞද්ගලික දේපළක් නොවන) ඉඩම් ද සමග, මහජනයාට මාර්ග අයිතියක් ඇත්තා වූ ද, මංමාවතක් වන්නා වූ හෝ නොවන්නා වූ ද යම් පාරක්, චතුරශ්‍රයක්, මිදුලක්, සමාවක්‍රයක්, පටු මඟක් හෝ මංමාවතක්, ගඟක් හෝ ඇළක් ද ඊට අයත් හෝ සම්බන්ධ සියලු කාණු, වේලි හා අගල් ද, සියලු පොදු විවෘත ස්ථාන ද, මහා නගරයක් ඇතුළත වූ යම් පොදු පාලමක් හෝ දියමංකඩක් උඩින් වූ මාර්ග ප්‍රවේශය ද, යම් වීථියක හෝ පාරක ආරක්ෂාව හෝ ප්‍රයෝජනය සඳහා වෙන් කරනු ලැබූ, ඊට යාබද මුඩු බිම් ද ඇතුළත් වේ;

"වාහනය" යන්නට, යම් රිය මැදිරියක්, කරත්තයක්, රිය පෙට්ටියක් හෝ ට්‍රෑම් රථයක් සහ ගොඩබිම ගමනාගමන මාර්ගයක් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන හෝ ගනු ලැබිය හැකි, යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරවන වාහනයක් නොවන සෑම කෘත්‍රිම ගමනාගමන උපක්‍රමයක් ම ඇතුළත් වේ;

"වැඩය" යන්නට, යම් ගොඩනැගිල්ලක්, බිත්තියක්, පසා බැම්මක්, දුම් කවුළු කූලක්, දුම් නළයක්, පලංචි බිමක්, පාරක්, ළිඳක්, කාණුවක්, ගොඩබිසින පාලමක්, වාප්පුවක්, වැටක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ගොඩනැගීම, නැවත ගොඩනැගීම, කඩා දැමීම, විවර කිරීම, කැපීම, එකතු කිරීම සහ වෙනස් කිරීම හෝ වෙනත් කවර හෝ එවැනි ක්‍රියාවක් ඇතුළත් වේ.

(2) මේ ආඥාපනතේ කාර්ය සඳහා —

(අ) යම් තැනැත්තකුට යම් ස්ථානයක වූ ගොඩනැගිල්ලක නිදන කාමරයක් ඇත්තේ නම් සහ ඔහු එය කලින් කල ප්‍රයෝජනයට ගන්නේ නම්, ඒ තැනැත්තා ඒ ස්ථානයේ පදිංචි ව සිටින්නේ යැයි හෝ ඔහු ඒ ස්ථානයේ පදිංචිකරුවකු යැයි සලකනු ලැබිය යුතු ය;

(ආ) යම් තැනැත්තකු එකී ගොඩනැගිල්ලේ ඇතැම් අවස්ථාවල නොසිටීම නිසා හෝ වෙනත් ස්ථානයක වූ ගොඩනැගිල්ලක නිදන කාමරයක් ඔහුට තිබීම හෝ ඔහු විසින් එය කලින් කල ප්‍රයෝජනයට ගැනීම හෝ නිසා ඒ තැනැත්තා පළමුව සඳහන් ස්ථානයෙහි පදිංචිය අවසන් කර ඇත්තේ යැයි හෝ ඔහු ඒ ස්ථානයේ පදිංචිකරුවකු ලෙස සිටීම අවසන් වී ඇත්තේ යැයි සලකනු නොලැබිය යුතු ය;

එසේ වුව ද, පළමු සඳහන් ගොඩනැගිල්ලට කවර හෝ වේලාවක ආපසු පැමිණීමට හා ආපසු පැමිණීමට ඇති අදහස අත් නොහැරීමට ඔහුට නිදහස තිබේ නම් පමණක් එසේ සලකනු නොලැබිය යුතු ය: තව ද

(ඇ) ආඥාපනතක් හෝ ප්‍රඥප්තියක් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමකට, සඳහන් කරනු ලැබූ ආඥාපනත හෝ ප්‍රඥප්තිය සංශෝධනය කෙරෙන යම් ප්‍රඥප්තියක් ද ඒ වෙනුවෙන් ආදේශ කරන ලද යම් ආඥාපනතක් හෝ ප්‍රඥප්තියක් ද එකී යම් ආඥාපනතක් හෝ ප්‍රඥප්තියක් යටතේ සාදන ලද්දේ වූ ද තත් කාලයෙහි බල පවත්නා වූ ද රීති, නියෝග, අතුරු ව්‍යවස්ථා, නිවේදන හෝ නියම යන් ද ඇතුළත් වේ.

(3) මේ ආඥාපනතේ කාර්ය සඳහා—

(අ) යම් වීථියක්, ගොඩනැගිල්ලක්, කාණුවක් හෝ වැඩක් ගොඩ නැගීම හෝ කිරීම යන්නට—

(i) යම් වීථියක දිගෙහි හෝ පළලෙහි සෑම වැඩි කිරීමක් හෝ එහි මට්ටමෙහි වෙනස් කිරීමක් ;

(ii) අලුත් අත්තිවාරම් දැමීම හෝ පවත්නා අත්තිවාරම මත වැඩිමනත් බිත්ති බැඳීම සිදු වන සෑම වෙනස් කිරීමක් ;

(iii) බිම් මහල දක්වා හෝ බිම් මහලට පහත දක්වා කඩා දමන ලද හෝ බිම් මහල තෙක් පහළට රාමු සැකිල්ල පමණක් ඉතිරි ව තිබෙන්නා වූ හෝ ඝණත්ව පරිමාණයෙන් එක් අර්ධයක් ඉවත් කරනු ලැබ තිබෙන්නා වූ යම් ගොඩනැගිල්ලක් නැවත ඉදි කිරීම ;

(iv) මුරකරුවකු වශයෙන් හැර යම් මනුෂ්‍යයකුගේ නිවසනය පිණිස මුල දී ගොඩනගනු නොලැබූ යම් ගොඩනැගිල්ලක් නිවාසයක් බවට පරිවර්තනය කිරීම ;

(v) එක් නිවාසයක් ලෙස පමණක් මුල දී ගොඩනගන ලද ගොඩනැගිල්ලක් එක් නිවාසයකට වඩා වැඩි නිවාස ගණනකට පරිවර්තනය කිරීම ;

(vi) යම් කාණුවක දිග ප්‍රමාණයෙහි සෑම වැඩි කිරීමක් හෝ එහි පරිමාණයේ වෙනස් කිරීමක් හෝ ඒ කාණුවට සම්බන්ධ උපකරණවලට කරනු ලබන සෑම එකතු කිරීමක් හෝ යම් කාණුවක් හෝ උපකරණයක් නැවත ඉදි කිරීම

ඇතුළත් වේ ; තවද

(ආ) යම් වීථියක්, ගොඩනැගිල්ලක්, කාණුවක හෝ වෙනත් වැඩක් වෙනස් කිරීම යන්නට, මේ ආඥාපනත යටතේ හෝ ඒ වෙනස් කිරීම සිදු වන කාලයේ බල පවත්නා යම් අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ විධිවිධාන සලස්වන ලද යම් කරුණකට අදාළ වන සෑම වෙනස් කිරීමක් ම ඇතුළත් වේ.

[1969 අංක 4 § 2.] (4) ගෙවල් කුලී පනත අදාළ වන යම් ස්ථානයක වාර්ෂික වටිනාකම මේ පනතෙහි කාර්යයන් සඳහා නිශ්චය කිරීමේ දී සහ ඒ ස්ථානයේ වාර්ෂික කුලිය ඒ නිශ්චය කිරීමේ කාර්යයන් සඳහා තක්සේරු කිරීමේ දී මහා නගර සභාවක් විසින් ඒ පනතේ විධිවිධාන සැලකිල්ලට නොගත යුතු ය.

## පළමුවන උපලේඛනය

### පක්ෂපාතිත්වයේ හා ධුරයේ දිවුරුම

(167 වන වගන්තිය.)

...........................වන මම ශ්‍රී ලංකා ජනරජයට අවනත වන බවට ද, පක්ෂපාත වන බවට ද, ශ්‍රී ලංකා ජනරජයට හිතැතිව සහ අවංකව සේවය කරන බවට ද,..............................................වශයෙන් මගේ ධුරයට අයත් කාර්යයන් යථා පරිදි සහ අවංකව සහ මගේ පූර්ණ හැකියාව, දැනුම හා විනිශ්චය අනුවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා නීතියට අනුකූලවත් ඉටු කරන බවට ද, ශ්‍රී ලංකා ජනරජයේ නීති හා ව්‍යවහාර අනුව ද භයක්, පක්ෂභජනයක්, දයාවක් හෝ ද්වේෂයක් නොමැතිව ද සැම සියලු දෙනාට ම සාධාරණයත්, යුක්තියත් ඉටු කරන බවට ද ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රතිඥා දෙමින් දිවුරුම් දෙමි.

..............................................

19................ මස.........වන දින, ................... දී ය

මා ඉදිරිපිට දී.

සමාදාන විනිශ්චයකාරවරයා.

---

## දෙවන උපලේඛනය

මහා නගර සභාවලට දෙනු ලබන මුද්දර ගාස්තු හා ගාස්තු— (185 වන වගන්තිය.)

1. (අ) බෝට්ටු ආඥාපනත

(ආ) ගෝඝාතක ආඥාපනත ;

(ඇ) වාහන ආඥාපනත ; සහ

(ඈ) ඒ කාර්යය සඳහා යම් විශේෂ විධිවිධානයක් සලස්වන වෙනත් ප්‍රඥප්තියක්

මගින් මහා නගර සභාවලට වෙන් කොට දෙනු ලබන සියලු මුද්දර ගාස්තු හා ගාස්තු.

2. (අ) නැව්තොට සංවිධායක ආඥාපනත ;

(ආ) විෂ, අබින් හා අන්තරාදායක ඖෂධ ආඥාපනත ;

(ඇ) තුවක්කු ආඥාපනත ;

(ඈ) සුරා බදු ආඥාපනත ; සහ

(ඉ) ඛනිජ තෙල් ආඥාපනත

(ඊ) පුපුරන ද්‍රව්‍ය ආඥාපනත, 1902 §1986 අංක 59 [64]

යටතේ මහා නගරය ඇතුළත යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් ක්‍රියාත්මක කිරීමේ බලය පැවරෙන බලපත්‍ර වෙනුවෙන් ගාස්තු වශයෙන් හෝ මුද්දර ගාස්තු වශයෙන් ගෙවනු ලබන සියලු මුදල්.

(අ) අධිකරණ සංවිධාන පනතේ 40(2) වන වගන්තිය යටතේ වූ ඇතුළත් කර ගැනීමේ සහතිකය වෙනුවෙන්, නීතිඥවරයන් වන;

(ආ) නොතාරිස් ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන හෝ සාදනු ලබන බලපත්‍ර, සහතික පත්‍ර හා ප්‍රකාශ වෙනුවෙන්, නොතාරිස්වරයන් වන;

1979 අංක 42 [9.]

(ඇ) බඩු උකස් ගන්නන් පිළිබඳ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර වෙනුවෙන්, බඩු උකස් ගන්නන් වන;

(ඈ) නොතාරිස් කෙනෙකු වශයෙන් හෝ ඖෂධවේදියකු වශයෙන් හෝ සුදුසුකම් ලබා ගැනීම පිණිස යම් තැනැත්තකු බැඳී සිටීමට පළමු කොට ම යටත් වන ආධුනිකතා ගිවිසුම් සම්බන්ධයෙන් හෝ යම් ගිවිසුමක් වෙනුවෙන්

මහා නගරයේ නිවැසියන් විසින් ගෙවනු ලබන සියලු මුද්දර ගාස්තු.

[1979 අංක 42 [9.]

3අ. මහා නගර සභාවේ පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමකට අදාළව කරන ලද පැවරීම්, උකස්, බැඳුම්කර, තෑගි කිරීම් සහ බදුකර වෙනුවෙන් මුද්දර ගාස්තු පනත යටතේ ගෙවන ලද සියලු මුද්දර ගාස්තු.

4. සමාගම් පනත යටතේ විගණකවරුන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා මහා නගරයේ වැසියන් විසින් ගෙවන ලද සියලු ගාස්තු

---

(235 වන වගන්තිය.)

## තුන්වන උපලේඛනය

### තක්සේරු දැන්වීමේ ආකෘතිය

..........................................මහා නගරය

මහා නගර සභා කාර්යාලය,

19..........................................

අංකය :.................

..........................................................................................වෙතටයි.

මෙහි පහත සඳහන් දේපළ සම්බන්ධයෙන් මෙහි පහත දක්වා ඇති මුදල් මහා නගර සභා ආඥාපනත අනුව ඔබගෙන් අය කර ගැනීම පිණිස තක්සේරු කිරීමට මහා නගර සභාව නියම කර තිබෙන බව දතයුතු යුතුයි :

| තක්සේරු කළ දේපළ | තක්සේරු කළ වාර්ෂික වටිනාකම | ගෙවිය යුතු වරිපනම් බදු මුදල සහ අවුරුද්දේ දී ඒවා සම්පූර්ණයෙන් ගෙවිය යුතු කාල |
|---|---|---|
| | | 19..............මස...... වන දින හෝ ඊට පෙර රු............ |
| | | 19..............මස......වන දින හෝ ඊට පෙර රු............ |
| | | 19..............මස......වන දින හෝ ඊට පෙර රු............ |
| | | 19..............මස......වන දින හෝ ඊට පෙර රු............ |
| | | නැතහොත් අවස්ථානුකූලව |

භාර දුන් දිනය :...............

19...............මස...... වන දින.

ඉහත පෙන්වා ඇති ප්‍රමාණ අනුව ද ඒ දිනවලදී ද ඉහත දක්වෙන වරිපනම් බද්ද (බදු) මහා නගර සභා කාර්යාලයේදී ගෙවන ලෙස ඔබට මෙයින් නියම කරනු ලැබේ. එය ගෙවීම පැහැර හැරියහොත් එකී මුදල ගාස්තුවක් සමග අය කර ගැනීම පිණිස මහා නගර සභාව විසින් බල පත්‍රයක් නිකුත් කරනු ඇත.

## සතරවන උපලේඛනය

(245 වන වගන්තිය.) [1979 අංක 42 § 10]

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් ම සඳහා ... | 25 | 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා— | | |
| (අ) එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 10 | 0 |
| (ආ) එය වෙළෙඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... ... | 5 | 0 |
| සෑම කරත්තයක් ම සඳහා ... ... ... | 20 | 0 |
| සෑම අත්කරත්තයක් ම සඳහා ... ... ... | 10 | 0 |
| සෑම රික්ෂෝවක් ම සඳහා ... ... ... | 7 | 50 |
| සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා... ... | 15 | 0 |
| සෑම අලියකු ම සඳහා ... ... ... | 50 | 0 |

රෝදවල විෂ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානයක් තුළ පමණක් වෙළෙඳ කටයුතු සඳහා භාවිත කැරෙන අත් කරත්ත සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිත නොකැරෙන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් වේ.

මේ උපලේඛනයේ "වෙළෙඳ කටයුතු" යන යෙදුමට, යම් වෙළෙඳ ව්‍යාපාරයකට හෝ කර්මාන්තයකට සම්බන්ධ ව, විකිණීම සඳහා වුව ද අන්‍ය කාර්යයක් සඳහා වුව ද, යම් භාණ්ඩයක් හෝ බඩු හෝ ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් හෝ, ගෙන යෑම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

---

## පස්වන උපලේඛනය

(252 වන වගන්තිය.)

ගෙවීම් පැහැර හරින්නන්ට විරුද්ධව නිකුත් කෙරෙන විනිග්‍රහන බල පත්‍රයේ ආකෘතිය

.............................සහ ඔහුගේ සහකාරයන් වෙත ය.

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ පිළිවෙළින් වූ නම් ඉදිරියෙහි දක්වා ඇති වරිපනම් බදු මුදල (නැතහොත් අවස්ථෝචිත පරිදි මහා නගර සභා ආඥාපනතේ...........වන වගන්තිය යටතේ ගෙවීමට නියම කර තිබෙන බදු මුදල) ගෙවිය යුතු හෙයින් ද, එම වෙන් වෙන් මුදල් එකී තැනැත්තන් විසින් සභාවට ගෙවීම පැහැර හැර තිබෙන හෙයින් ද, එම තැනැත්තන් විසින් එකී මුදල් ගෙවන ලෙස ඉල්ලමින් ඔවුන් වෙත දැන්වීම් භාර කිරීමෙන් පසුව ද එකී මුදල් ඔවුන්ගෙන් නමවින් අය විය යුතුව තිබෙන හෙයින් ද;

එකී තැනැත්තන්ගේ දේපළ හෝ ඉහත කී උපලේඛනයෙහි සඳහන් දේපළක හෝ එය මත ඔබට පෙනෙන්නට තිබෙන කවර හෝ යම් තැනැත්තකුගේ චංචල දේපළ හෝ නොපමාව තහනම් කොට, එසේ එකී එක් එක් දේපළ තහනම් කරනු ලැබූ දින සිට සම්පූර්ණ දවස් අටක් ඇතුළත දී ඒ තැනැත්තන්ගේ නම් ඉදිරිපිට පිළිවෙලින් දක්වා ඇති එකී වෙන් වෙන් මුදල් එකී ආඥාපනතේ 255 වන වගන්තිය යටතේ අය විය යුතු ගාස්තුත් සමඟ ගෙවනු නොලැබුවහොත්, තහනම් කරනු ලැබූ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අය විය යුතු වරිපනම් බද්ද (අවස්ථානුකූල ව, බද්ද) හා ගාස්තුව ගෙවා යම් මුදලක් ඉතිරිව තිබේ නම් එම මුදල එසේ විකුණූ දේපළෙහි අයිතිකරුට හෝ හවුල් අයිතිකරුවන්ට ගෙවන ලෙස ද මෙම බල පත්‍රය ප්‍රකාර ඔබ කුමක් කර තිබේ ද යන්න....................මස ....................වන දින හෝ ඊට පෙර මා වෙත සහතික කරන ලෙස ද ඔබට මෙසින් නියම කරනු ලැබේ.

උපලේඛනය

| ගෙවීම් පැහැර හැරි තැනැත්තන්ගේ නම් | දේපලවල විස්තරය | දේපළ පිහිටි ස්ථානය | වරිපනම් බද්දේ හෝ බද්දේ මුදල | එකතුව |
|---|---|---|---|---|
| | | | | |

19.......... ..............මස....................වන දින...... ........ ..............
දී මගේ අත්සනින් නිකුත් කරන ලදී.

[1971 අංක 48 § 16.]

ඒ. බී.
නාගරික කොමසාරිස්.

(බදු සම්බන්ධයෙන් වූ විට අවශ්‍ය පරිදි ආකෘතිය හා උපලේඛනය වෙනස් කළ යුතු ය)

---

(253 වන වගන්තිය.)

හයවන උපලේඛනය

ගෙවීම් පැහැර හරින්නන්ට විරුද්ධ ව නිකුත් කෙරෙන විනිශ්චය බල පත්‍රයේ ආකෘතිය

.........................යන ඔහුගේ සහකාරයාට වෙත ය.

මෙහි උපලේඛනයෙහි පළමුවන තීරයෙහි නම් සඳහන් තැනැත්තන් එහි තුන්වන තීරයෙහි දැක්වෙන දේපළ පිළිබඳව ගෙවිය යුතු එහි දෙවන තීරයෙහි දක්වා ඇති කුලිය සම්බන්ධයෙන් මහා නගර සභාවට ණයගැතිව සිටින හෙයින් ද, එකී මුදල නොගෙවා දවස් දහහතරක් (හෝ දවස් දහහතරකට වැඩි කාලයක්) ගත වී තිබෙන හෙයින් ද, එකී තැනැත්තන්ට අයිතිව මහා නගරය තුළ පිහිටි

දේපළ හෝ එකී උපලේඛනයෙහි සඳහන් දේපළක හෝ එය මත ඔබට පෙනෙන්නට තිබෙන කවර හෝ තැනැත්තකුගේ වංචල දේපළ හෝ නොපමාව තහනම් කොට, එසේ එකී එක් එක් දේපළ තහනම් කරනු ලැබූ දින සිට සම්පූර්ණ දවස් අටක් ඇතුළත දී ඔවුන්ගේ නම් ඉදිරිපිට පිළිවෙළින් දක්වා ඇති එකී වෙන් වෙන් මුදල් මහා නගර සභා ආඥාපනතේ 255 වන වගන්තිය යටතේ අය විය යුතු ගාස්තුත් සමග ගෙවනු නොලැබුවහොත්, තහනම් කරනු ලැබූ දේපළවලින් හැකිතාක් ආසන්නතම ලෙස ප්‍රමාණවත් විය හැකි කොටසක් විකුණා, ඉන් ලැබූ මුදලින් අය විය යුතුව තිබෙන කුලිය හා ගාස්තු ද ගෙවා යම් මුදලක් ඉතිරිව තිබේ නම් එය ද නොවිකුණා ඉතිරි ව තිබෙන දේපළ ද ඒ දේපළෙහි අයිතිකරුට හෝ හවුලේ අයිතිකරුවන්ට භාර දෙන ලෙස ද මෙම බල පත්‍රය ප්‍රකාර ඔබ නමක් කර තිබේ ද යන්න.....................මස.....................වන දිනට පෙර සභාව වෙත සහතික කරන ලෙස ද ඔබට මෙයින් නියම කරනු ලැබේ.

උපලේඛනය

| ගෙවීම පැහැර හැරි තැනැත්තන්ගේ නම | කුලියේ මුදල | කුලිය අය විය යුත්තේ කවර ස්ථානයක් සඳහා ද යන වග |
|---|---|---|
| | | |

**සැලකිය යුතුයි :** "දවස් දහතරක්" හා "දවස් දහහතරකට වැඩි කාලයක්" යන පාඨ අවස්ථාවෝචිත පරිදි යෙදිය යුතුය.

ඒ. බී.,
නාගරික කොමසාරිස්.

[1971 අංක 48 § 17.]

---

**හත් වන උපලේඛනය**

(259 වන වගන්තිය.)

**විකුණුම් සහතිකය**

ද.....................සි..........තැනැත්තා, මහා නගර සභා ආඥාපනත යටතේ.........
.........මහා නගර සභාවට වරිපනම් බදු (හෝ බදු) ගෙවීමට යටත් වී ගාස්තුත් ඇතුළුව රුපියල්.....................ක් ගෙවිය යුතුව තිබුන නමුත්, එම මුදල ගෙවීම පැහැර හැරි හෙයින් ද:

එම ආඥාපනත අනුව විනිශ්චය බලපත්‍රයක් නිකුත් කරනු ලැබ එකී..............
නමැත්තාගේ (දේපළ මෙහි විස්තර කරන්න) යන දේපළ.......    ....මස
.....................වන දින දී විකුණනු ලැබ,.....................නැමැත්තා විසින් රුපියල්............කට එම දේපළ මිළයට ගෙන එකී................. විසින් එකී මුදල යථා පරිදි ගෙවන ලැබූ හෙයින් ද:

එකී විකිණීම හා මිළයට ගැනීම යථා පරිදි සිදු කරනු ලැබූ බව හා එකී දේපළ සියලු බැඳීම්වලින් තොරව මින් මතු එකී.............වෙත හා ඔහුගේ උරුමක්කාරයන්, පොල්මිකාරයන්, අද්මිනිස්ත්‍රාසිකාරයන් හා ලැබුම්කාරයන් වෙත සඳහට ම සතු කර දෙන ලද බව ඉහත කී මහා නගර සභාවේ නාගරික කොමසාරිස් වූ.................වන මවිසින් එකී ආඥාපනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙයින් ප්‍රකාශ කර සිටින බව දැනගත යුතු ය.

[1971 අංක 48 § 18.]

19..........මස............වන දින....................දී මගේ අත්සනින් තිකුත් කරන ලදී.

ඒ. බී.
නාගරික කොමසාරිස්

[1971 අංක 48 § 18.]

---

අවවන උපලේඛනය

**සභාව විසින් මිළයට ගැනීමේ සහතිකය**

(263 වන වගන්තිය.)

(මෙහි වරිපනම් බද්ද හෝ බද්ද විස්තර කරන්න.)

විශයෙන්

**මහා නගර සභාවට.............ගි.................. ගෙන් අය විය යුතු මුදල වන රුපියල්.................. ක මුදලක් හා ගාස්තු සහ අයකිරීම් සඳහා අය විය යුතු** මුදල වන රුපියල්..................ක තවදුරටත් වූ මුදලක් එකී තැනැත්තා විසින් නොගෙවූ හෙයින් ද;

**මහා නගර සභා ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව, එකී...............ට අයත් මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම තහනම් කොට විකුණා එකී මහා නගර සභාවට අය විය යුතු එකී රුපියල්...............ක මුදලේ කොටසක් වෙනු** වෙත් (හෝ අවශ්‍යාවෝපිත පරිදි, සම්පූර්ණ මුදල වෙනුවෙන්)..................මස **...............වන දින දී එකී දේපළ එකී මහා නගර සභාව වෙනුවෙන් මිළයට ගනු ලැබූ හෙයින් ද:**

පහත සඳහන් දේපළ—එනම්,...............(මෙහි දේපළ විස්තර කරන්න.) විකුණනු ලැබ,........ .. විසින් මහා නගර සභාව වෙනුවෙන් රු.......…ට මිළයට **ගෙන එකී මුදල සභාවට බැර කර තිබෙන බව හා එකී දේපළ සියලු බැඳීම්වලින් තොරව මින් මතු එකී සභාව වෙත සඳහට ම සතු කරදෙන ලද බව හා සතු කර දෙනු ලබන බව ඉහත කී මහා නගර සභාවේ නාගරික කොමසාරිස් වූ............. වන මවිසින් එකී ආඥාපනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙයින් සහතික කරන බව දැනගත යුතු ය.**

[1971 අංක 48 § 19.]

**19......( ...වන දින ......දී මාගේ අත්සනින් තිකුත් කරන ලදී.**

**ඒ. බී.,**
**නාගරික කොමසාරිස්.**

[1971 අංක 48 § 19.]

## නමවන උපලේඛනය

### වාස බද්ද අවසන් කිරීමේ දැන්වීමේ ආකෘතිය

(266 වන වගන්තිය.)

................වෙතටයි.

................යන දේපළ සඳහා................දී ඔබ විසින්................මහා නගර සභාවට ගෙවිය යුතුව තිබුණ ගෙවල් කුලිය................නොගෙවා තිබෙන බැවින්, ................මහා නගර සභාව විසින් මහා නගර සභා ආඥාපනතේ 266 වන වගන්තිය යටතේ ක්‍රියා කරමින් ඔබ හා................මහා නගර සභාව අතරේ ඇතිව තිබුණ වාස බද්ද මෙයින් අවසන් කරමින්, මෙම දැන්වීම ඔබ වෙත භාර කරනු ලැබූ දින සිට මාසයක් ගත වීමේදී හෝ ඊට ප්‍රථම එකී ස්ථානයෙන් ඉවත් වන ලෙස වැඩි දුරටත් ඔබට නියම කරනු ලැබේ.

මෙම දැන්වීමෙන් නියම කරන පරිදි ඔබ එකී ස්ථානයෙන් ඉවත්ව නොගොස් සිටියහොත්, ඔබ ද ඔබ යටතේ හෝ ඔබගේ අවසරය ඇතිව එකී ස්ථානයේ පදිංචිව සිටින සියලු දෙනා ද එයින් ඉවත් කරනු ලැබේ.

---

## දසවන උපලේඛනය

### ඉවත් කිරීමේ බල පත්‍රයේ ආකෘතිය

(266 වන වගන්තිය.)

................සහ ඔහුගේ සහායකයන් වෙතටයි.

................මහා නගර සභාව විසින් මහා නගර සභා ආඥාපනතේ 266 වන වගන්තිය යටතේ ක්‍රියා කරමින් මෙහි උපලේඛනයෙහි පළමුවන තීරයෙහි දැක්වෙන දිනයන්හි දී දෙවන තීරයෙහි දක්වා ඇති තැනැත්තන්ට කුලියට දී තිබෙන තුන්වන තීරයෙහි දක්වා ඇති ස්ථානය පිළිබඳ වාස බද්ද අවසන් කරමින් එකී දැන්වීම භාර දීමේ දින සිට මාසයක් ගත වීමේ දී හෝ ඊට පෙර එකී ස්ථානයෙන් ඉවත් වන ලෙස දැන්වීමක් නිකුත්කරනු ලද නමුත් එකී දැන්වීමට අනුකූලව එකී තැනැත්තන් එකී ස්ථානයෙන් ඉවත්ව නොගිය බැවින්:

මෙහි නම් සඳහන් තැනැත්තන් හා ඔවුන් යටතේ හෝ ඔවුන්ගේ අවසරය පිට පදිංචි ව සිටින සියලු දෙනා ම නොපමාව එම ස්ථානයෙන් ඉවත් කිරීමට ඔබට මෙයින් බලය පවරන අතර, මෙම බල පත්‍රය අනුව ඔබ විසින් කුමක් කරන ලද දැයි..............දින දී හෝ ඊට පෙර ඔබ විසින් සභාව වෙත සහතික කර සිටිය යුතු ය.

උපලේඛනය

| දැන්වීම භාර කළ දින | දැන්වීම භාර කරනු ලැබූ තැනැත්තන්ගේ නම | බල පත්‍ර ක්‍රියාවෙහි යෙදවිය යුතු වන්නේ කුමන ස්ථානය |
|---|---|---|
| | | |

[1973 අංක 38 § 4.]
(323අ වන වගන්තිය.)

**එකොළොස්වන උපලේඛනය**

කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන මහනුවර මහා නගර සභා ප්‍රදේශයට අදාළ කිරීමේ දී ඒවා වෙනස් කිරීම.

(1) 7 වන වගන්තියෙහි—

(අ) "කොළඹ මහා නගර සභා ප්‍රදේශය," යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභා ප්‍රදේශය," යන යෙදුම ආදේශ කරන්න;

(ආ) "කොළඹ මහා නගර සභා ප්‍රදේශයේ," යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභා ප්‍රදේශයේ." යන යෙදුම ආදේශ කරන්න; තව ද

(ඇ) "මහා නගර සභා ප්‍රදේශය තුළ වෙයෙන්නන් විසින් ගෘහ්‍ය කාර්ය යන් සඳහා නොමිලේ ප්‍රයෝජනයට ගැනීම පිණිස පහසුකම් සැලසෙන සේ ජලකණු, වතුරමල්, විවෘත ජලාශ හෝ පොම්ප ඒ වීථිවල ඉදි කළ යුතු ය" යන යෙදුම වෙනුවට "පහසුකම් සැල සෙන සේ ජලකණු, වතුරමල්, විවෘත ජලාශ හෝ පොම්ප ඒ වීථිවල ඉදි කළ යුතු ය" යන යෙදුම ආදේශ කරන්න.

(2) 13 වන වගන්තියේ "හා මේ ආඥාපනතින් සභාව වෙත පැවරෙන" යන යෙදුම අත්හරින්න.

(3) 14 වන වගන්තියේ "කොළඹ මහා නගර සභා ප්‍රදේශය" යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභා ප්‍රදේශය" යන යෙදුම ආදේශ කරන්න.

(4) 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "කොළඹ ප්‍රාථමික අධිකරණ යේ විනිශ්චයකාරවරයා විසින්" යන යෙදුම වෙනුවට "මහනුවර ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්" යන යෙදුම ආදේශ කරන්න.

(5) 21 වන වගන්තියේ "ගෘහ්‍ය නොවන කාර්යයක් සඳහා" යන යෙදුම අත්හරින්න.

(6) 44 වන වගන්තියේ— .

(අ) "කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ" යන යෙදුම වෙනුවට "මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ" යන යෙදුම ආදේශ කරන්න; තව ද

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "කොළඹ මහේස්ත්‍රාත්වරයාගේ" යන යෙදුම වෙනුවට "මහනුවර මහේස්ත්‍රාත්වරයාගේ" යන යෙදුම ආදේශ කරන්න.

(7) එහි උපලේඛනයේ—

(අ) 4 වන නියෝගයේ "මේ උපලේඛනයේ 'අ' ආකෘතිය අනුව මහා නගර සභාව සමග කලින් ගිවිසුමකට ඇතුළත් ව නොසිටිය හොත්" යන වචනවල සිට ඒ නියෝගයෙහි අග දක්වා වූ සියලු ම වචන හා ඉලක්කම් වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කරන්න :—

"අවස්ථාවෝචිත පරිදි මේ උපලේඛනයේ 'අ' ආකෘතිය හෝ 'එ' ආකෘතිය අනුව මහා නගර සභාව සමග කලින් ගිවිසුමකට ඇතුළත් ව නොසිටියහොත්, යම් පෞද්ගලික සේවයකින් ඇද ගත් ජලය යම් කර්මාන්තයක්, නිෂ්පාදනයක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් හෝ යම් සැරසිලි හෝ යාන්ත්‍රික කාර්යයක් සඳහා හෝ ඉඩම්වලට ජලය සැපයීමේ කාර්යයන් සඳහා පාවිච්චි නොකළ යුතු ය :

එසේ වුව ද, එබඳු ගිවිසුමක් ඇති කර ගන්නා තුරු සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා යටතේ යම් තැනැත්තකු විසින් සභාව සමග ඇති කර ගත් යම් ගිවිසුමක් සියලු ම කාර්ය යන් සඳහා මේ නියෝග යටතේ ඇති කරගත් ගිවිසුමක් ලෙස සැලකිය යුතු ය.";

(ආ) 4 වන නියෝගයට ඉක්බිති ව පහත සඳහන් අලුත් නියෝගය අන්තර්ගත කරන්න:—

"4අ. අයිතිකරු හෝ පදිංචිකරු විසින් මහා නගර සභාව සමග මේ උපලේඛනයේ අඩංගු විය හැකි 'උ' හෝ 'ඌ' ආකෘතියෙහි වූ ගිවිසුමකට කලින් ඇතුළත් ව නොසිටියහොත්, ගෘහ්‍ය කාර්ය යන් සඳහා කිසි ම අයිතිකරුවකුට හෝ පදිංචිකරුවකුට පෞද්ග ලික ජල සේවයක් ලබා නොදිය යුතු ය.";

(ඇ) 17 වන නියෝගය වෙනුවට පහත සඳහන් අලුත් නියෝගය ආදේශ කරන්න:—

"17. යම් සේවයක් ඉදි කිරීමෙහි ලා පාවිච්චි කරනු ලබන සියලු ම නළ හා සවි කළ යුතු දේ මේ නියෝගවල අන් ලෙසකින් නිශ්චය කොට නොමැතහොත් ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් අනුමත කරන ලද ඝනකමින් හා ස්වභාවයෙන් යුක්ත විය යුතු ය.";

(ඈ) 31 වන නියෝගයෙහි "ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා" යන යෙදුම වෙනුවට "ගෘහ්‍ය හෝ ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා" යන යෙදුම ආදේශ කරන්න;

(ඉ) 32, 33, 34, 35 සහ 36 වන නියෝග වෙනුවට පහත සඳහන් නියෝග ආදේශ කරන්න:—

"32. සම්පූර්ණයෙන් හෝ කොටසක් පහත සඳහන් කාර්යයන් සඳහා පරිහරණය කරන ගොඩනැගිල්ලකට සපයනු ලබන ජලය ගෘහ්‍ය නොවන කාර්යයක් සඳහා සැපයෙන ලෙස සැලකිය යුතු ය.

එනම්:—

(අ) 1 වන පන්තියේ වාණිජ කාර්යයන්—

සේවයෙහි නියුක්ත හෝ සේවයෙහි යොදා ලද තැනැත්තන්ගේ ශුද්ධ සනීපය සඳහා ජලය පාවිච්චි කරනු ලබන පෞද්ගලික දන්ත රෝග චිකිත්සාගාර, පෞද්ගලික සාත්තු නිවාස, පෞද්ගලික ආරෝග්‍ය ශාලා, පෞද්ගලික බෙහෙත් ශාලා සහ පෞද්ගලික ශල්‍යාගාර ඇතුළු ව, යම් කර්මාන්තයක් හෝ නිෂ්පාදනාගාරයක් පවත්වා ගෙන යාමේ හෝ කර ගෙන යාමේ කාර්යයන්.

(ආ) 2 වන පන්තියේ වාණිජ කාර්යයන්—

කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වැඩි දියුණු කිරීමෙහි ලා ඉහත 1 වන පන්තියේ සඳහන් තැනැත්තන් නොවන තැනැත්තන් හට ආහාරපාන සැපයීම සඳහා ජලය පාවිච්චි කරනු ලබන යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම; ඒ කර්මාන්තයට හෝ ව්‍යාපාරයට පහත සඳහන් ස්ථාන ඇතුළත් වේ:—

(1) හෝටල් සහ බේකරි.

(2) බත් කඩ.

(3) භෝජනාගාර.

(4) ආපන ශාලා.

(5) (අධ්‍යාපනික හෝ ආගමික ආයතනවලට අනුබද්ධිත බෝඩිම නොවන) පෞද්ගලික බෝඩිම්.

(6) (වත්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලා නොවන) පෞද්ගලික නවාතැන්.

(7) පෞද්ගලික නේවාසිකාගාර හෝ ආගන්තුක නිවාස.

(8) සුරාපාන ශාලා.

(9) තැබෑරුම්.

(10) කිරි හල්

(11) අයිස්ක්‍රීම් කඩ.

(12) ඡායාරූප ශාලා.

(13) කැන්ටින්.

(14) කාතිවල්.

(15) පොළවල්.

(16) සමාජ ශාලා.

(17) සිනමා හල්.

(18) නාට්‍ය ශාලා.

(19) විනෝද ස්ථාන.

(20) බැටරි (විදුලිය ගබඩා කිරීමේ සෛල) අලුත්වැඩියා කරන්නෝ.

(21) (මහ නගර සභාවේ ප්‍රධාන වෙළෙඳ සැලේ එළවලු කඩ නොවන) එළවලු කඩ.

(22) (මහා නගර සභාවේ ප්‍රධාන වෙළෙඳ සැලේ මල්කරුවන් නොවන) මල්කරුවෝ.

(23) මහා නගර සභාවේ ප්‍රධාන වෙළෙඳ සැලේ පැළ වෙළෙඳ සැල් නොවන) පැළ වෙළෙඳ සැල්.

(24) ගොඩනැගිලි වැඩ, මහා නගර සභා පාරවල් නොවන පාරවල් තැනීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කර්යයන්.

(25) නිර්මාණාත්මක වැඩ.

(26) බාබර් සාප්පු.

(27) මුදල් ගෙවා ජල ස්නානය කිරීමේ ස්ථාන.

(28) යම් සේවා නළයකට හෝ ප්‍රධාන නළයකට නිත්‍ය ලෙස හෝ තාවකාලික ලෙස විශේෂ උපකරණ හෝ සම්බන්ධක සවි කර ඇති ස්ථාන, පිහිනුම් තටාක නැතහොත් ගෙවතුවලට හෝ ගෙම්දුල්වලට ජලය සැපයීමේ කටයුතු.

(29) මත්ස්‍ය තටාක.

(30) කිරි පට්ටි.

(31) ඌරු කොටු, අශ්වයන් හා ගවයන් ඇති කරන ස්ථාන.

(32) මේ වර්ගයට ඇතුළත් වෙතැයි කලින් කල සභාව විසින් යෝජනාවක් මගින් ප්‍රකාශයට පැමිණවිය හැකි වෙනත් කර්මාන්ත හෝ ව්‍යාපාර.

(ඇ) කාර්මික කාර්යයන්—ප්‍රධාන වශයෙන් ජලය මත රඳා පවතින, යම් කර්මාන්තයක් හෝ නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යෑම හෝ කරගෙන යෑම. ඒ කර්මාන්තයට හෝ නිෂ්පාදනාගාරයට පහත සඳහන් ස්ථාන ඇතුළත් වේ:—

(1) යන්ත්‍ර සිසිල් කිරීම හෝ වාෂ්ප උත්පාදනය කිරීම සඳහා ජලය උපයෝගි කරගන්නා කර්මාන්ත ශාලා.

(2) නිෂ්පාදිත සෑදීම සඳහා ජලය උපයෝගි කරගන්නා කර්මාන්ත ශාලා.

(3) සිසිල් බීම කර්මාන්ත ශාලා.

(4) අයිස් කර්මාන්ත ශාලා.

(5) සායම් කර්මාන්ත.

(6) ලොන්ඩරි.

(7) සිරප් කර්මාන්ත ශාලා සහ වියලි ද්‍රව්‍ය පින් කිරීම් නොවන පින් කිරීමේ කර්මාන්ත.

(8) පවත්වා ගෙන යනු ලබන කර්මාන්ත සම්බන්ධයෙන් වාහන, යන්ත්‍ර සහ වෙනත් උපකරණ සේදීම සඳහා ජලය පාවිච්චි කරන මෝටර් වාහන සර්විස් කරන ස්ථාන, ගරාජ් සහ වැඩ පොළවල්.

(9) හම් පදම් කරන ස්ථාන.

(10) සිමෙන්ති කොන්ක්‍රීට් බඩු සාදන ස්ථාන.

(11) බෝතල් සෝදන සාප්පු සහ ඉස්කාගාර.

(12) මත්පැන් නිෂ්පාදනාගාර.

(13) රසායන ද්‍රව්‍ය නිෂ්පාදනාගාර.

(14) විද්‍යුත් ලෝහාලේපන කර්මාන්ත.

(15) සබන් කර්මාන්ත ශාලා.

(16) ශීතකරණ ආගාර.

(17) සකස් කිරීමේ හා ඇසිරීමේ ආයතන.

(18) ගඩොල්, උළු සහ පිඟන් කර්මාන්ත ශාලා.

(19) මේ වර්ගයට ඇතුළත් වෙතැයි කලින් කල සභාව විසින් යෝජනාවක් මගින් ප්‍රකාශයට පැමිණවිය හැකි වෙනත් කර්මාන්ත.

33. පළාත් පාලන ආයතනවලට, ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවට, නැව් සමාගම්වලට විශාල ප්‍රමාණවලින් සැපයෙන සියලු ම ජලය හා මේ වර්ගයට ඇතුළත් වෙතැයි කලින් කල සභාව විසින් යෝජනාවක් මගින් ප්‍රකාශයට පැමිණ විය හැකි වෙනත් විශාල ප්‍රමාණවලින් සැපයෙන ජලය, ගෘහ්‍ය කාර්යයන් නොවන කාර්යයන් සඳහා සපයනු ලබන ජලය ලෙස සැලකිය යුතු ය.

34. මෙහි මීට පෙර සඳහන් කරන ලද වර්ගවලට ඇතුළත් නොවන සෑම පෞද්ගලික ජල සේවයක් ම ගෘහ්‍ය කාර්යයන් සඳහා වූ ජල සම්පාදන ලෙස සැලකිය යුතු ය.

35. මීටර් මාර්ගයෙන් ස්ථානවලට සපයනු ලබන ජලය පිළිබඳ මිල පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) 1 වන පන්තියට ඇතුළත් වාණිජ කාර්යයන් සඳහා ගැලුම් 1,000 කට රු. 1.50; 2 වන පන්තියට ඇතුළත් වාණිජ කාර්යයන් සඳහා ගැලුම් 1,000 කට රු. 1.65.

(ආ) කාර්මික කාර්යයන් සඳහා ගැලුම් 1,000 කට රු. 1.65.

(ඇ) විශාල ප්‍රමාණවලින් සැපයෙන ජලය සඳහා ගැලුම් 1,000 කට රු. 1.39.

(ඈ) ඒ සම්බන්ධ වරයකම්, හෝ ඒ වෙනුවට නියමිත මුදලක්, නොගෙවිය යුතු ස්ථාන සම්බන්ධයෙන් ගෘහ්‍ය කාර්යයන් සඳහා සැපයෙන ජලය වෙනුවෙන් සභාව විසින් කලින් කල යෝජනාවක් මගින් නියම කළ හැකි ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් සභාව විසින් අය කරනු ලැබිය හැකි ය.

(ඉ) 'ඇ' ඡේදයෙහි සඳහන් ස්ථාන හැර ගෘහ්‍ය කාර්යයන් සඳහා ගැලුම් 1,000 කට රු. 1.00.

(ඊ) මාසයකට වැඩි නොවූ කාලයක් තාවකාලික ලෙස සැපයෙන ජලය වෙනුවෙන් ගැලුම් 1000 කට රු. 1.65.

36. මීටර් මාර්ගයෙන් හැර අන් ලෙසකින් ජලය සපයනු ලබන අවස්ථාවක, තාවකාලික මීටරයක් මගින් හෝ ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් නිශ්චය කෙරෙන පරිදි ස්ථානවල පාවිච්චි කෙරෙතැයි පෙනෙන ජල ප්‍රමාණය පදනම් කොට ගත් තක්සේරුවක් සභාව විසින් කළ හැකි ය.";

(ඊ) 40 වන නියෝගයෙහි "35 (5) වන නියෝගයෙහි," යන යෙදුම වෙනුවට "36 වන නියෝගයෙහි," යන යෙදුම ආදේශ කරන්න);

(උ) 'අ' සහ 'ඉ' ආකෘතිවල "කොළඹ මහා නගර සභාව" යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභාව" යන යෙදුම ආදේශ කරන්න;

(ඌ) 'අ' ආකෘතියෙහි—

(i) 4 වන ඡේදයේ "හා ඒ යටතේ පනවන ලද නියෝගවල විධි විධාන" යන යෙදුම වෙනුවට "හා ඒ යටතේ පනවන ලද නියෝගවල විධිවිධාන මහනුවර මහා නගර සභාවට අදාළ වන තාක්" යන යෙදුම ආදේශ කරන්න; තව ද

(ii) "කොළඹ දී අත්සන් කරන ලදී." යන යෙදුම එන සවර තැනක වුව ද ඒ වෙනුවට "මහනුවර දී අත්සන් කරන ලදී." යන යෙදුම ආදේශ කරන්න.

(එ) 'ආ', 'ඇ', 'ඉ', සහ 'ඊ' ආකෘතිවල "19......මස......වන දින කොළඹ දී ය." යන යෙදුම වෙනුවට "19......මස......වන දින මහනුවර දී ය." යන යෙදුම ආදේශ කරන්න;

(ඒ) 'ඇ' ආකෘතියෙහි "කොළඹ, ජල කර්මාන්ත ඉංජිනේරු තැන වෙත ය." යන යෙදුම වෙනුවට "මහනුවර, ජල කර්මාන්ත ඉංජිනේරු තැන වෙත ය." යන යෙදුම ආදේශ කරන්න;

(ඔ) 'ඉ' ආකෘතියෙහි "කොළඹ මහා නගර සභාව" යන යෙදුම වෙනුවට "මහනුවර මහා නගර සභාව" යන යෙදුම ආදේශ කරන්න; තව ද

(ඕ) 'ඊ' ආකෘතියට ඉක්බිති ව මේ පහත දැක්වෙන අලුත් ආකෘති ඇතුළත් කරන්න :—

### "ඩ" ආකෘතිය

### ගෘහස්ථ කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස වූ ගිවිසුම

(4අ වන නියෝගය.)

මෙහි මින් මතු "අයිතිකරු" යනුවෙන් සඳහන් වනු ලබන (සම්පූර්ණ නම)............... එක් පාර්ශ්වයකට ද මහනුවර මහා නගර සභාව අනික් පාර්ශ්වයට ද ඇති ව ..............පිහිටි අංක..................දරන ස්ථානයට ගෘහස්ථ කාර්යයන් සඳහා මීටර් මාර්ගයෙන් හෝ අන් ලෙසකින් ජලය සැපයීම පිණිස ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

2. ගෘහස්ථ කාර්යයන් සඳහා එකී ස්ථානයට ජලය සැපයීම අනුමත කිරීම සැලකිල්ලට ගෙන, මෙහි මින් මතු සඳහන් කෙරෙන කොන්දේසි පිළිපැදීමට අයිතිකරු මෙයින් එකඟ වෙයි :—

(අ) අඟල්...........මීටරයක් මගින් ජලය සැපයිය යුතු ය.

(ආ) අයිතිකරු විසින් මහනුවර මහා නගර සභාවට මීටර් කුලිය වශයෙන් රුපියල්................ ත්‍රෛමාසිකව ගෙවිය යුතු ය, නැතහොත් ගෙවීමට සැලැස්විය යුතු ය.

(ඇ) එක් එක් මාසය තුළ සපයන ලද ජල ප්‍රමාණය වෙනුවෙන් ගැලුම් දහසකට රුපියල්..................බැගින් අයිතිකරු විසින් මහනුවර මහා නගර සභාවට ගෙවිය යුතු ය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතු ය.

3. (මහා නගර සභාවේ ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් ස්ථාපනය කරන ලද්දේ නම්) ඒ පෞද්ගලික ජල සේවාවල ඇස්තමේන්තු කළ පිරිවැය, මීටරය හෝ මීටර් සවි කිරීමේ පිරිවැය හා සභාව විසින් අනාගතයේ දී කරනු ලබන අලුත් වැඩියා කිරීම්, විශාල කිරීම් හා වෙනස් කිරීම් සියල්ල පිළිබඳ ඇස්තමේන්තු කළ පිරිවැය ද, මහා නගර සභාවේ ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් ඉල්ලා සිටි කල්හි, අයිතිකරු විසින් ගෙවිය යුතු ය.

4. මීටර් කුලිය හෝ සපයන ලද ජලය සඳහා වූ ගාස්තුව ගෙවිය යුතු දින සිට දින තිහක් ඇතුළත මහා නගර සභාව වෙත ගෙවනු නොලැබුවහොත් වෙන ම සේවාවක් ලැබීමේ අයිතිවාසිකම් අහිමි විය යුතු අතර මහා නගර සභාව විසින් සැපයුම නවත්වා දැමිය හැකි ය.

5. කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන හා ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන මහනුවර මහා නගර සභාවට අදාළ වන තාක් ඒවා මෙ ගිවිසුමේ කොටසක් ලෙස ගත යුතු අතර ඉන් පසු එකී ආඥාපනතේ වගන්ති කිසිවක් යටතේ සෑදිය හැකි යම් නියෝගවලින් ද මේ ගිවිසුමේ පාර්ශ්වකරුවන් බැඳී සිටිය යුතු ය.

6. තමා ගිවිසුම අවසන් කිරීමට අදහස් කරන බව දක්වෙන දැන්වීමක් එක් එක් පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වය වෙත හත් දවසකට කලින් භාර දීමෙන් එය අවසන් කළ හැකි ය. එය එසේ අවසන් කරනු ලැබූ විටක, අලුත් ගිවිසුමක් ඇතිකරගන්නා තුරු, ස්ථානය අයිතිකරු විසින් වෙන ම සේවාවක් උපයෝගී කර ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

7. ජල මීටරය හා එහි පිරිද්දුම්වල සුරක්ෂිතභාවය ගැන වගකීමට අයිතිකරු තව දුරටත් පොරොන්දු වන අතර ඒවාට සිදුවන යම් හානියක් හෝ අලාභයක් පිරිමැසීමට ඔහු එකඟ වෙයි.

8. මේ ස්ථානයට නොකඩවා ජලය සැපයීම සහතික නොකෙරෙන අතර ප්‍රධාන නළවල පීඩනය මඳ වීම හේතුකොටගෙන හෝ වෙන යම් කරුණක් හේතුකොටගෙන සැපයීම ඇනහිට විටක එකී ස්ථානයට ජලය ප්‍රවාහණය කිරීමට සභාව බැඳී නොසිටියි.

9. එකී ස්ථානයේ පදිංචිකරුවන්ගේ වෙනසක් සිදුවීමට ආසන්න කවර විටක වුව ද අයිතිකරු විසින් විධිමත් ලෙස දන්වීමක් කළ යුතු අතර සභාව සමඟ අලුත් ගිවිසුමක් ඇති කර ගන්නා තුරු කිසිම පදිංචිකරුවකු සේවාව උපයෝගී කර ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

........................

ස්ථානයේ අයිතිකරු.

සාක්ෂිකරුවෝ :

1....................

2....................

................ ...........වීදියේ අංක ........... දරන ස්ථානය

........................................

මහනුවර මහා නගර සභාව වෙනුවෙන් ජල කර්මාන්ත ඉංජිනේරු තැන.

19...................... වන දින,

මහනුවර,

මහා නගර සභාවේ දීය.

(4අ වන නියෝගය)

"ඌ" ආකෘතිය

**ගෘහ්‍ය කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස වූ ගිවිසුමෙහි ආකෘතිය**

(අයිතිකරු නොවූයෙන් මෙහි මින් මතු "පදිංචිකරු" යනුවෙන් හඳුන්වනු ලබන)........ ... ............................ එක් පාර්ශ්වයකට ද මහනුවර මහා නගර සභාව අනික් පාර්ශ්වයට ද ඇති ව.......................... .......... පිහිටි අංක ........ ..................දරන ස්ථානයට ගෘහ්‍ය කාර්යයන් සඳහා මීටර් මාර්ගයෙන් හෝ අන් ලෙසකින් ජලය සැපයීම පිණිස ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

2. ගෘහ්‍ය කාර්යයන් සඳහා එකී ස්ථානයට ජලය සැපයීම අනුමත කිරීම සැලකිල්ලට ගෙන, මෙහි මින් මතු සඳහන් කෙරෙන කොන්දේසි පිළිපැදීමට පදිංචිකරු මෙයින් එකඟ වෙයි :—

(අ) අඟල්........ .............. මීටරයක් මඟින් ජලය සැපයිය යුතු ය.

(ආ) මීටර් කුලිය වශයෙන් පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවට රුපියල්..... ... ................ ත්‍රෛමාසික ව ගෙවිය යුතු ය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතු ය.

(ඇ) එක් එක් මාසය තුළ සපයන ලද ජල ප්‍රමාණය වෙනුවෙන් ගැලුම් දහසකට රුපියල්............................. බැගින් පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවට ගෙවිය යුතු ය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතු ය.

3. සේවා සම්බන්ධ කිරීම, මීටරය හෝ මීටර් ස්ථාපනය කිරීම සහ ඒවාට අනාගතයේදී කරනු ලබන අලුත්වැඩියා කිරීම් සියල්ල ද පිළිබඳ තක්සේරු කළ පිරිවැය, මහා නගර සභාවේ ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් ඉල්ලා සිටි කල්හි පදිංචිකරු විසින් ගෙවිය යුතු ය.

4. මීටර් කුලිය හෝ සපයන ලද ජලය සඳහා වූ ගාස්තුව ගෙවිය යුතු දින සිට දින තිහක් ඇතුළත මහා නගර සභාව වෙත ගෙවනු නොලැබුවහොත් එවන ම සේවාවක් ලැබීමේ අයිතිවාසිකම් අහිමි විය යුතු අතර මහා නගර සභාව විසින් සැපයුම නවත්වා දැමිය හැකි ය.

5. කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන හා ඒ යටතේ පනවන ලද නියෝගවල විධිවිධාන මහනුවර මහා නගර සභාවට අදාළ වන තාක් ඒවා මේ ගිවිසුමේ කොටසක් ලෙස ගත යුතු අතර දැන් පසු එකී ආඥාපනතේ විගත්ති කිසිවක් යටතේ සෑදිය හැකි යම් නියෝගවලින් ද මේ ගිවිසුම් පාර්ශ්වකරුවන් බැඳී සිටිය යුතු ය.

6. තමා ගිවිසුම අවසන් කිරීමට අදහස් කරන බව දැක්වෙන දැන්වීමක් එක් එක් පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වය වෙත මාස එකකට කලින් භාරදීමෙන් එය අවසන් කළ හැකි ය. එය එසේ අවසන් කරනු ලැබූ විටක, අලුත් ගිවිසුමක් ඇති කරගන්නාතුරු ඒ ස්ථානයේ කුලී නිවැසියා විසින් වෙන ම සේවාවක් උපයෝගී කර ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

7. ජල මීටරය සහ එහි පිරිද්දුම්වල සුරක්ෂිත භාවය ගැන වගකීමට පදිංචිකරු තවදුරටත් පොරොන්දු වන අතර ඒවාට සිදුවන යම් හානියක් හෝ අලාභයක් පිරිමසාලීමට ඔහු එකඟ වෙයි.

8. පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවේ රු. ............ ක් වූ මුදලක් මෙයින් තැන්පත් කරනු ලබන අතර එකී මුදල ජල මීටරය සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලකට හා පදිංචිකරුගෙන් සභාවට අය විය යුතු වෙනත් ගාස්තු කිසිමකට හිලව් කළ හැකි ය.

9. මේ ස්ථානයට නොකඩවා ජලය සැපයීම සහතික නොකෙරෙන අතර ප්‍රධාන නළවල පීඩනය මඳ වීම හේතුකොට ගෙන හෝ වෙන යම් කරුණක් හේතුකොට ගෙන සැපයුම ඇනහිටි විටක එකී ස්ථානයට ජලය ප්‍රවාහණය කිරීමට සභාව බැඳී නොසිටියි.

10. පදිංචිකරු මෙම ස්ථානයෙන් ඉවත් ව යෑමට අදහස් කරන කවර විටක වුව ද ඔහු විසින් සභාව වෙත විධිමත් දැන්වීමක් කළ යුතු ය. එවිට අලුතෙන් එන පදිංචිකරු විසින් සභාව සමග අලුත් ගිවිසුමක් ඇති කර ගන්නා තුරු සභාව විසින් ජල සම්පාදනය කපා හැරීමට හිමිකම් ලැබිය යුතු ය.

.........................................

ස්ථානයේ කුලී නිවැසියා/පදිංචිකරු.

සාක්ෂිකරුවෝ :

1......................

2......................

...............වීදියේ / පාරේ, අංක ................

දරන ස්ථානය,

..................................

මහනුවර මහා නගර සභාව වෙනුවෙන්
ජලකර්මාන්ත ඉංජිනේරු තැන.

19.. ............... වන දින,
මහනුවර,
මහා නගර සභාවේ දීය.

"ඒ" ආකෘතිය

## ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස වූ ගිවිසුම් ආකෘතිය

(4 වන නියෝගය)

(මෙහි මින් මතු "පදිංචිකරු" යනුවෙන් හඳුන්වනු ලබන)........ ............ එක් පාර්ශ්වයකට ද මහනුවර මහා නගර සභාව අනෙක් පාර්ශ්වයට ද ඇතිව, ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

2. ගෘහ්‍ය නොවන කාර්යයන් සඳහා, එනම්, (අ), (ආ) ආදිය සඳහා එකී ස්ථානයට ජලය සැපයීම අනුමත කිරීම සැලකිල්ලට ගෙන, මෙහි මින් මතු සඳහන් කෙරෙන කොන්දේසි පිළිපැදීමට.................... වන පදිංචිකරු මෙයින් එකඟ වෙයි:—

(අ) අගල්.................. ..... මීටරයක් මගින් ජලය සැපයිය යුතු ය;

(ආ) ත්‍රෛමාසික මීටර් කුලිය වශයෙන් පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවට රුපියල්.... ...................... ක් වූ මුදලක් කල් තියා ගෙවිය යුතු ය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතු ය;

(ඇ) එක් එක් මාසය තුළ සපයන ලද ජල ප්‍රමාණය වෙනුවෙන් ගැලුම් දහසකට රුපියල්....... ......... බැගින් පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවට ගෙවිය යුතුය; නැතහොත් ගෙවීමට සැලැස්විය යුතු ය; පළමු වන ගෙවීම....................... පළමුවන දින කළ යුතුය.

3. මීටර් කුලිය හෝ සපයන ලද ජලය සඳහා වූ ගාස්තු ගෙවිය යුතු දින සිට දින පහළොවක් ඇතුළත මහා නගර සභාව වෙත ගෙවනු නොලැබුවහොත් සේවාව උපයෝගී කර ගැනීමේ අයිතිවාසිකම අහිමිවිය යුතු අතර මහා නගර සභාව විසින් සැපයුම නවත්වා දැමිය හැකිය.

4. කොළඹ මහා නගර සභා ජල කර්මාන්ත ආඥාපනතේ විධිවිධාන හා ඒ යටතේ පනවන ලද නියෝගවල විධිවිධාන මහනුවර මහා නගර සභාවට අදාළ වන තාක් ඒවා මේ ගිවිසුමේ කොටසක් ලෙස ගත යුතු අතර මින් පසු එකී ආඥාපනතේ වගන්ති කිසිවක් යටතේ සෑදිය හැකි යම් නියෝග වලින් ද මේ ගිවිසුමේ පාර්ශ්වකරුවන් බැඳී සිටිය යුතු ය.

5. තමා ගිවිසුම අවසන් කිරීමට අදහස් කරන බව දැක්වෙන දැන්වීමක් එක් එක් පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වය වෙත................. දවසකට කලින් භාර දීමෙන් එය අවසන් කළ හැකිය. එය එසේ අවසන් කරනු ලැබූ විටක අලුත් ගිවිසුමක් ඇතිකරගන්නා තුරු ස්ථානය අයිතිකරු විසින් වත් එහි පදිංචිකරු විසින් වත් සේවාව උපයෝගී කර ගැනීමේ හිමිකම් නොලැබිය යුතුය.

6. ජල මීටරය හා එහි පිරිද්දුම්වල සුරක්ෂිතභාවය ගැන වගකීමට පදිංචිකරු තවදුරටත් පොරොන්දු වන අතර ඒවාට සිදු වන යම් හානියක් හෝ අලාභයක් පිරිමසා දීමට ඔහු එකඟ වෙයි.

7. පදිංචිකරු විසින් මහනුවර මහා නගර සභාවේ රු........................ ක් වූ මුදලක් මෙයින් තැන්පත් කරනු ලබන අතර එකී මුදල ජල මීටරය සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලකට හා පදිංචිකරුගෙන් සභාවට අයවිය යුතු වෙනත් ගාස්තු කිසිවකට හිලව් කළ හැකි ය.

19......... ක් වූ........ ........... ... මස ......... වන දින මහනුවර දී අත්සන් කරන ලදී.

.................................,
පදිංචිකරු.

.................................
මහනුවර මහා නගර සභාව වෙනුවෙන්
ජලකර්මාන්ත ඉංජිනේරු තැන.

අත්සන්වලට සාක්ෂි :
1......................
2......................

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 34 දරන මහා නගර සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2014 ඔක්තෝබර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 ඔක්තෝබර් මස 24 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

# 2014 අංක 34 දරන මහා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2014 ඔක්තෝබර් මස 23 වැනි දින]

එල්. ඩී.—ඕ. 3/2014

(252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2014 අංක 34 දරන මහා නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

2. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 215 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එකී ආඥාපනතේ 215ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

*(252 අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතට 215ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

"අන්තර්කාලීන විධිවිධාන.

215ආ. 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත පරිදි වූ මහා නගර සභා ආඥාපනතේ 215අ වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන පිළිවෙලින් 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුව පැවැත් වූ ඡන්ද විමසීම්වල ප්‍රතිඵල ප්‍රකාර ස්ථාපිත කරනු ලැබූ මහා නගර සභාවකට ඉදිරිපත් කරනු ලබන යම් අයවැයකට හෝ පරිපූරක අයවැයකට අදාළ නොවිය යුතු ය.".

3. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2017 අංක 20 දරන මහ නගර සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2017 ඔක්තෝබර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2017 ඔක්තෝබර් මස 13 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

# 2017 අංක 20 දරන මහ නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 ඔක්තෝබර් මස 12 වන දින]

එල්.ඩී.—ඕ. 49/2017.

(252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2017 අංක 20 දරන මහ නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

252 වන අධිකාරයේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"මහ නගර සභාවල සංයුතිය.

5. (1) එක් එක් මහ නගර සභාවක් -

(අ) ඒ මහ නගර සභාව සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු සහ තෝරා යැවිය යුතු සභිකයන් සංඛ්‍යාවෙන් සියයට හැටකට සමාන වන, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 3ඈ සහ 3ඇ වගන්ති යටතේ පළ කරන ලද නියමවල නිශ්චිතව දක්වා ඇති කොට්ඨාස සංඛ්‍යාව මත පදනම් වී, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන, සභිකයන් සංඛ්‍යාවකින්;

(ආ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තිය යටතේ තෝරා යැවිය යුතු සභිකයන් වන, ඒ මහ නගර සභාව සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු සහ තෝරා යැවිය යුතු සභිකයන් සංඛ්‍යාවෙන් සියයට හතළිහකට සමාන සභිකයන් සංඛ්‍යාවකින්; සහ

(ඇ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සියයට හතළිහක් සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම උපවගන්තියේ කාර්යය සඳහා එකී සියයට හතළිහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස, පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.